210 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 210 - இல. 2
**Volume 210 - No. 2**

**2012** ජූලි 18 වන බදාදා
2012 யூலை 18, புதன்கிழமை
**Wednesday, 18th July, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
    විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අර්බුදය

**පාර්ලිමේන්තු විවාද මාධ්‍යවල සමබරව පළ නොකිරීම:**
    විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ ප්‍රකාශය

**වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත:**
    නියෝගය

**කල් තැබීමේ යෝජනාව:**
    ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
    பல்கலைக்கழக விரிவுரையாளர்களின் பிரச்சினை

**பாராளுமன்ற விவாதங்களை ஊடகங்களில் நேர்மையற்றமுறையில் அறிக்கையிடல்:**
    எதிர்க்கட்சி முதல்வரினது கூற்று

**துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம்:**
    கட்டளை

**ஒத்திவைப்புப் பிரேரணை:**
    சிரேஷ்ட பிரஜைகளுக்கான கொடுப்பனவு

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
    Crisis of University Lecturers

UNFAIR MEDIA REPORTING OF PARLIAMENTARY DEBATES:
    Statement by Leader of the Opposition

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY:
    Order

ADJOURNMENT MOTION:
    Allowance for Senior Citizens

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2012 ජූලි 18 වන බදාදා*
*2012 யூலை 18, புதன்கிழமை*
*Wednesday, 18th July, 2012*

*අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2012 ජූලි මස 18වන බදාදා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනා හට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව- [අග්‍රාමාත්‍ය සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2011 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් සහ 2011 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්. - [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා (දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க - சுதேச மருத்துவத்துறை பிரதி அமைச்சர்)
(The Hon. C.P.D. Bandaranaike - Deputy Minister of Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) යක්කල, නුවර පාර, අංක 160/2 හි පදිංචි එන්.කේ.ඩී. සෝමදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දොම්පෙ, පැලහැල, අංක 80/1 හි පදිංචි කේ.කේ. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බෙම්මුල්ල, විගොඩ, නො. 58හි පදිංචි බී.ඒ.එස්. දයා කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාවතගම, ඉහුරුවත්ත, වටරක, කටුගම්පොල ගෙදර පදිංචි දුමින්ද සාගර තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නිට්ටඹුව, හොරගොල්ලවත්ත, යටරවුම් පාර, නො. 92හි පදිංචි ඩබ්ලිව්.එම්.එස්. වර්ණකුලසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.
ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කන්තලේ, අග්බෝපුර, පාසල පිටුපස, අංක. 33හි පදිංචි ටී.ජී. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පරගස්තොට, පැල්පොල හන්දිය, නො. 161හි පදිංචි කේ. සෝමසිරි රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## වෙන්දේසි කළ රන් සංචිත : විස්තර
## ஏலமிடப்பட்ட தங்க ஒதுக்கம்: விபரம்
## AUCTIONED GOLD RESERVES : DETAILS

0686/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) 2010 සැප්තැම්බර් 01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් වෙන්දේසි කරන ලද ශ්‍රී ලංකා රජයේ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වෙන්දේසි කරන ලද රත්තරන්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජය විසින් රත්තරන් මිල දී ගැනීමට ගෙවූ මිල ගණන් කවරේද;

(iv) රාජසන්තක කරන ලද රත්තරන් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලට එක් කරනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට අයත් රත්තරන් ප්‍රමාණයක් පසු ගිය වසර දෙක තුළ විකුණනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රත්තරන්වල අලෙවි මිල කවරේද;

(iii) එම රත්තරන් විකිණීම ටෙන්ඩර් කැඳවීමක් හෝ වෙන්දේසි කිරීමක් මඟින් සිදු කරන ලද්දේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 செப்டம்பர் 01ஆம் திகதியன்றுள்ளவாறு, இலங்கை அரசாங்கத்தின் தங்க ஒதுக்கத்தில் மத்திய வங்கியினால் ஏலமிடப்பட்ட தொகை யாதென்பதையும்;

(ii) மேற்படி ஏலத்தில் விடப்பட்ட தங்கத்தின் பெறுமதியை ஐ.அ.டொலர்களிலும் இலங்கை நாணயத்திலும் யாதென்பதையும்;

(iii) அரசாங்கத்தினால் தங்கம் என்ன விலைக்கு கொள்வனவு செய்யப்பட்டது என்பதையும்;

(iv) பறிமுதல் செய்யப்பட்ட தங்கம் ஏதேனும் இலங்கை மத்திய வங்கி ஒதுக்கத்தில் சேர்க்கப்பட்டதா என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) கடந்த இரண்டு வருடங்களில் அரசாங்கத்திற்குச் சொந்தமான தங்கம் ஏதாவது விற்பனை செய்யப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், தங்கத்தின் விற்பனை விலை எவ்வளவு என்பதையும்;

(iii) இத்தங்க விற்பனை விலைமனுக்கோரல் மூலமா அல்லது ஏலவிற்பனை மூலமா மேற்கொள்ளப்பட்டது என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the amount of gold reserves of the Government of Sri Lanka auctioned through the Central Bank as at 01st September, 2010;

(ii) the value of the gold auctioned as above, in US Dollars and Sri Lankan Rupees, separately ;

(iii) the prices at which the gold was bought by the Government; and

(iv) whether any confiscated gold has being added to the Central Bank reserves?

(b) Will he inform this House-

(i) whether any gold owned by the Government has been sold during last two years;

(ii) if so, the selling price of the gold; and

(iii) whether such sale of gold was done through tenders or auctions?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව එහි විදෙස් සංචිතවලින් කොටසක් රත්රන්වලින් පවත්වාගෙන යන අතර ලෝක වෙළෙඳ පොළ මිල ගණන් වෙනස් වීම මත පදනම්ව ලාභ ඉපැයීම අරමුණු කර ගනිමින් රත්රන් වෙළෙඳ කටයුතුවල (මිල දී ගැනීම හා විකිණීම) යෙදී සිටී. මෙම අරමුණ සඳහා, 2010 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ට්‍රෝයි අවුන්ස එකකට ඇමෙරිකානු ඩොලර් 1,062.10ක් 1,391.00 අතර අනුපාතයකට අන්තර්ජාතික වෙළෙඳ පොළෙන් රත්රන් මිල දී ගෙන ඇත. කෙසේ වුවද, මේ කාල පරිච්ඡේදය තුළ රජය වෙනත් කිසිදු රත්රන් මිල දී ගැනීමක් සිදුකොට නැත.

(iv) 2010 වසර තුළ නැත.

(ආ) (i) පසු ගිය වසර දෙක තුළ රජය රත්තරන් විකුණා නැත. රත්තරන් සංචිත කළමනාකරණ කටයුතුවල කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රත්තරන් විකුණා තිබේ.

(ii) 2009-2010 කාල පරිච්ඡේදය තුළ ට්‍රෝයි අවුන්ස එකකට ඇමෙරිකන් ඩොලර් 1066.20 සිට 1397.70 දක්වා අනුපාතයකට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රත්තරන් විකුණා තිබේ.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව තම විදෙස් සංචිත කළමනාකරණ මෙහෙයුම්වල කොටසක් ලෙස පමණක් රත්තරන් වෙළෙඳ කටයුතු පවත්වාගෙන යයි. එම නිසා ටෙන්ඩර් හෝ වෙන්දේසි පටිපාටියක් පැන නොනඟී. රත්තරන් වෙළෙඳාම් කරන කටයුතු සිදු කරන්නේ යථා කාල පදනම මත අන්තර්ජාතිකව පිළිගත් ආයතන සමඟ ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් අනුගමනය කරමින් තරගකාරී වෙළෙඳ පොළ මිළ ගණන් මතය.

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, with the present climate of the Greece Bonds that were bought and lost out, with the EPF which is an ill-timed investment that has been made, you are basically defending that the Central Bank has the capacity to buy and sell gold at the proper time. But, with what has happened in Greece and the EPF matter, is it not prudent that it goes through a more open tender process? This happens in all countries.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you just ask the Question. The Hon. Minister will answer it.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

For the last two years, as I have explained here, we have not sold gold.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Have you explained it?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Yes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

What I am saying is, in terms of the financial prudence which the Central Bank seems to have - [*Interruption.*] In the case of Greece Bonds what has happened? EPF and ETF -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, I appreciate your contribution to this matter. But, the fact of the matter is that these are procedures which are followed by all banks. If you make this suggestion, certainly I will convey it to the Central Bank and ask whether they could consider it because they can always improve the situation. But, this is the way that it has continued for a long time.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Please ask your Supplementary Question No. 2.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

It maybe the procedure followed in Sri Lanka but all central banks in the world do go on an open and transparent basis which is professional. But, that is what is lacking here. When you were the Minister of Finance, none of this nonsense ever happened. What I am basically saying is this. When there are people who do not understand the transparency, that is the problem we face. So, I am telling you -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, I am very grateful that you put me on the *murunga aththa*, but we will consider what you say.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I do not want to put you on the *murunga aththa*.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, please ask your third Supplementary Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

The third Supplementary Question that I would like to ask is this. You basically did not answer the Question I asked about the gold that was confiscated in 2010. There were many instances where it was mentioned that "KP" had 19 vessels and almost 110 tons of gold. Also, it was on record that the army managed to seize two containers of gold. So, where is that gold now?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

You have asked a Question and I have answered it. If you ask another specific Question - [*Interruption*.] No, that is not related to this Question.

## තැනිපිට තේ ජනපදය : විදුලිය
## தெனிபிட்ட தேயிலை குடியிருப்பு பிரதேசம் : ன்சாரம்
## THENIPITA TEA COLONY : ELECTRICITY

1352/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර, කුරුවිට, මහවත්තකන්ද සිට තැනිපිට තේ ජනපදය දක්වා විදුලිය ලබා දීම සඳහා විදුලි පරිණාමකයක් (Transformer) ස්ථාපිත කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පරිණාමකය (Transformer) සවි කර තිබියදීත් තැනිපිට තේ ජනපද ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) විදුලිය ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) இரத்தினபுரி மாவட்டத்தின் இரத்தினபுரி குருவிட்ட மஹவத்தகந்த தொடக்கம் தெனிபிட்ட தேயிலை குடியிருப்பு வரை மின்சாரம் வழங்குவதற்காக மின்மாற்றி (Transformer) ஒன்று பொருத்தப்பட்டுள்ள தென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மின்மாற்றி பொருத்தப்பட்டுள்ள போதிலும் தெனிபிட்ட தேயிலை குடியிருப்புப் பிரதேச மக்களுக்கு மின்சாரம் வழங்கப்படாமைக் கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) இப்பிரதேச மக்களுக்கு மின்சாரம் வழங்குவதற் காக நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்;

(iv) மின்சாரம் வழங்கப்படுமெனில் அத்திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that an electricity transformer has been installed for the purpose of supplying electricity from Mahawatta Kanda to the Thenipita Tea Colony in Kuruvita in Ratnapura District?

(b) Will he state-

(i) the reasons for not supplying electricity to Thenipita Tea Colony although a transformer has been installed as stated above;

(ii) whether allocations have been made for supplying electricity to the people of the aforesaid area;

(iii) if so, the amount that has been allocated; and

(iv) if electricity is supplied, the date on which it will be done?

(c) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

තැනිපිට ප්‍රදේශය සඳහා මීට කලකට පෙර බටතොට මහවත්තකන්ද යෝජනා ක්‍රමය යටතේ උපපොළක් මඟින් 2010.09.17 දින විදුලිය සපයා ඇත. ඒ අනුව එම යෝජනා ක්‍රමයෙන් තැනිපිට හේන ප්‍රදේශයේ වැඩි කොටසක විදුලිය ආවරණය වී ඇත.

එහෙත් එම කොටසේ විදුලිය ආවරණය නොවූ තවත් නිවෙස් 10ක් පමණ ඇති අතර, ඒවාට විදුලිය ලබා ගැනීමට හැකි වන පරිදි අලුතින් තරාපැවියක් පිහිටුවීමට සැලසුම් කර ඉදි කිරීම් කටයුතු නිම කර තිබූ නමුත්, මංවර හෙළි කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා රාජ්‍ය දැව සංස්ථාව මඟින් අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයක් සිදු වීම තුළ විදුලිය කැවීමට ප්‍රමාද වී තිබුණි.

කෙසේ වෙතත් මේ වන විට අදාළ මංවර කටයුතු නිම කර මෙම ව්‍යාපෘතිය සඳහා විදුලිය කවා ඇත.

(ආ) (i) ඉහත පිළිතුරට අනුව අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) ව්‍යාපෘතිය නිම කිරීමට වැය වූ මුදල රුපියල් හතලිස් පන්ලක්ෂ අසූහය දහස් අටසීයකි (රු.4,586,800/=).

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. මෙවැනි විදුලි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කළත්, ප්‍රමාණවත් පරිදි සහ නියමිත කාලයට වැසි නොලැබීම නිසා විදුලි සැපයුමේ අඛණ්ඩතාව පිළිබඳව පසු ගිය වකවානුවේ දැඩි අවදානම් සහගත තත්ත්වයක් ඇති වෙලා තිබුණා. ඔබතුමා නිතර කියනවා, අඛණ්ඩතාව පවත්වාගෙන යන්න උත්සාහ කළා කියලා. දැන් ඒ තිබුණු තර්ජිත තත්ත්වය ඉවත් වෙලා තිබෙනවාද? එහෙම නැත්නම් තවමත් තර්ජිත තත්ත්වයේද බලාගාර ආශ්‍රිත ජලාශ සහ බලාගාර තිබෙන්නේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මේ තත්ත්වය පිළිබඳව මා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා. පිට පිට මෝසම් වැසි 3ක් අඩාල වුණා. 2011 දී නිරිත දිග මෝසම් වැස්ස, 2011 දී ඊසාන දිග මෝසම් වැස්ස, ඒ වාගේම 2012 දී නිරිත දිග මෝසම් වැස්ස හැටියට මෝසම් වැසි 3ක් පිට පිට අඩාල තත්ත්වයට පත් වුණා. එම නිසා මුළු ජල විදුලි උත්පාදන ශක්තිය සියයට 18ක සීමාවකට තමයි ඒ වසර ඇතුළත අපට ජලය ලැබී තිබෙන්නේ.

සාමාන්‍යයෙන් සියයට 35ත්- 45ත් අතර ප්‍රමාණයක් ජලයෙන් විදුලිය නිපදවනවා. ජලයෙන් විදුලිය නිපදවීම නිසා ඇත්තටම අපේ ආයතනයටත් මූල්‍යමය වශයෙන් ඉතා පහසුවක් වුණා. මොකද, ජලය නොමිලයේ ලැබෙන නිසා. ඒ වාගේම අපේ විදුලි පද්ධතිය පාලනය කරන්නේ අපයි. විදුලි පද්ධතියේ ඉල්ලුම පාලනය කරන්නේ - ජලය විදුලියෙනුයි. මේ මෑතකදී අපට වැසි ප්‍රමාණයක් ලැබුණා. එම වැසි ප්‍රමාණය සකසුරුවමින් භාවිත කරමින්, ඊළඟ මෝසම් වැස්ස බලාපොරොත්තු වන ඔක්තෝබර් මාසය දක්වා විදුලි සැපයුම අඛණ්ඩව පවත්වා ගෙන යන්න අපි බලාපොරොත්තු වනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ බලාපොරොත්තු වන ආකාරයට මෝසම් වැසි නොලැබුණොත් විදුලි සැපයුම අඛණ්ඩව පවත්වා ගෙන යන්නට වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය සතුව තිබෙනවාද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඇත්තටම මීට පෙර වර්ෂාව නැති වුණාම - 1995 සිටම -විදුලිය කපන්න සිද්ධ වුණා. නමුත් අපේ රජය 2005 සිට තාප විදුලි බලය ශක්තිමත්ව ගොඩ නඟපු නිසා අද අපට එයට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති වෙලා තිබෙනවා. නමුත් සම්පූර්ණයෙන්ම සිද්ධ වෙලා නැහැ. පුත්තලම විදුලි බලාගාරය සම්පූර්ණයෙන්ම ස්ථාවර බල පද්ධතියක්. ලබන අවුරුද්දේ අගෝස්තු මාසයේදී පුත්තලම විදුලි බලාගාරයේ දෙවන කොටසේ කටයුතු අවසන් වන තෙක් විදුලි අර්බුදයට මුහුණ දීම සඳහා අපි විවිධ උපක්‍රමවලියක් හඳුනා ගෙන තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම විදුලිය ඉතිරි කිරීමේ වැඩ පිළිවෙළක් හඳුනා ගෙන තිබෙනවා. එතැනදී මේ අර්බුදකාරී කාල වකවානුව පිය මං කරන්න ජනතාවගේ සහාය තදින් බලාපොරොත්තු වනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයෙන් නිතරම නැඟෙන මැසිවිල්ල තමයි ඔබතුමන්ලා ගෙවිය යුතු මුදල් නිසි පරිදි එම අමාත්‍යාංශයට ගෙවන්නේ නැහැයි කියන එක. ඔබතුමන්ලා කියන්නේ ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලට මේ නියඟයේ බලපෑම නිසා පසු ගිය කාලයේත් පාඩුවක් වුණාය කියලායි. ඇත්තටම එහෙම පාඩුවක් සිදු වුණාද කියලාත්, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට ගෙවිය යුතු මුදල් කවදාද ගෙවන්නේ කියලාත් දැන ගන්න කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න දෙකක් එක ප්‍රශ්නයකින් අහනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඛනිජ තෙල් ව්‍යාපාරයත්, විදුලිබල ව්‍යාපාරයත් රජය ගෙන යන්නේ සේවාවක්

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

හැටියටයි. ලාභ උපයන වාණිජ පරමාර්ථ මත නොවෙයි. ලංකා විදුලිබල මණ්ඩලයට බනිජ තෙල් ලබා දෙන විට, ඇතැම් තෙල් වර්ග යම් කිසි සහනාධාරයකට ලබා දෙනවා. ඇතැම් තෙල් වර්ගවලට සහනාධාරයක් නැහැ.

උදාහරණයක් වශයෙන් ඩීසල් ගනිමු. ඩීසල් ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන්නේ වෙළෙඳ පොළේ මිලටමයි. නමුත් අඩු සල්ෆ දැවිතෙල් අපට යම් සහන මිලකට ලැබෙනවා. විදුලිබල මණ්ඩලයට ලැබෙන ඒ සහනය විදුලිබල මණ්ඩලයත් සහනයක් හැටියට තමයි ජනතාවට ලබා දෙන්නේ. අද විදුලි ඒකකයක් නිපදවලා නිවසට ගෙන යන්න රුපියල් 22.54ක් වැය වෙනවා. නමුත් අපි විදුලි ඒකකයක් විකුණන්නේ රුපියල් 16කටයි. ඒ අනුව අපට විශාල පාඩුවක් සිද්ධ වෙනවා.

පසු ගිය කාලයේ, පසු ගිය පෙබරවාරි 15 වෙනි දා බනිජ තෙල් මිල ගණන් ඉහළ දැම්මා. මේ නිසා විදුලිබල ක්ෂේත්‍රයේ වියදම් දෙගුණයක් වුණා. මේ නියංකාරී තත්ත්වය නිසා ඒක තවත් උත්සන්න වුණා. මොකද, අද සියයට 85ක්, 90ක් විදුලිය නිපදවන්නේ තෙල් ආශ්‍රිතවයි. අපේ විදුලි අය ක්‍රමය වෙනස් කරලා මේ බර ජනතාවගෙන් අය කර ගන්න අපි කටයුතු නොකළ නිසා අපට ලොකු මූල්‍ය හිඟයක් තිබෙනවා. ඒ නිසා ඇත්තටම අපට බනිජ තෙල් නීතිගත සංස්ථාව වාගේ ආයතනවල බිල් ගෙවීමේ අපහසුතාවක් පැන නැඟිලා තිබෙනවා. පසු ගිය මාස 04ක කාලයේ විදුලිබල මණ්ඩලයේ ඇති වුණ මූල්‍ය අපහසුතාවලින් සියයට 90කටම හේතුව බනිජ තෙල් මිල ඉහළ දැමීමයි. මේ සියලු ප්‍රශ්න ගැන කල්පනා කරලා බලලා කෙටි කාලීන සහ මධ්‍ය කාලීන විසඳුමක් යෝජනා කරන්න මේ සම්බන්ධයෙන් කැබිනට් අනු කමිටුවක් පත් කරලා තිබෙනවා. ඉදිරි කාලයේදී මේ සඳහා විසඳුමකට ඇවිල්ලා බලශක්ති ක්ෂේත්‍රයේ මූල්‍යමය වශයෙන් සමබරතායි තත්ත්වයක් පවත්වා ගෙන යන්න අපි බලාපොරොත්තු වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -2295/'12 - (1), ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ණය/ප්‍රදාන ආපසු ගෙවීමේ කාල සීමාව : විස්තර
## கடன்கள் / மானியங்கள் மீள்செலுத்துகைக் காலம்: விபரம்
## PAYBACK PERIOD OF LOANS/GRANTS : DETAILS

1063/'11

7. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව සහ යුරෝපා සංගමය යනාදී රටවල් සහ ආයතන විසින් පසුගිය වර්ෂ 15 තුළ ලබා දී ඇති ණය හෝ ප්‍රදාන වෙනුවෙන් එකී ණය මුදල් හෝ ප්‍රදානයන් ගෙවා නිමවන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාලසීමාව එක් එක් රට හෝ ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சீனா, அமெரிக்கா, இந்தியா, சர்வதேச நாணய நிதியம், உலக வங்கி, ஆசிய அபிவிருத்தி வங்கி, சர்வதேச கூட்டுறவுக்கான ஜப்பானிய வங்கி மற்றும் ஐரோப்பிய ஒன்றியம் போன்ற நாடுகளினாலும் நிறுவனங்களினாலும் கடந்த 15 வருடங்களாக வழங்கப்பட்ட கடன்கள் அல்லது மானியங்களின் காலப்பகுதியின் முடிவின்போது செலுத்தப்படவுள்ள மொத்தத் தொகையினை அமெரிக்க டொலர்களிலும்;

(ii) இக்கடன்களின் சராசரி மீளச்செலுத்தல் கால அளவினை நாடுகள் அல்லது நிறுவனங்கள் வாரியாக வெவ்வேறாகவும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state separately-

(i) the total amount in US Dollars to be paid at the end of the period of loans or grants lent for the last 15 years by the countries and institutions as follows: China, USA, India, IMF, World Bank, ADB, JBIC and EU ; and

(ii) the average pay back period of loans per country or institution separately ?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා රජය ලබා ගත් ප්‍රදාන වෙනුවෙන් ආපසු ගෙවීමක් සිදු නොකරයි.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හොඳටම දන්නවා, ශ්‍රී ලංකා රජය ලබා ගත් ප්‍රදානවලට -ඒ කියන්නේ, grantsවලට- ආපසු ගෙවීමක් සිදු කරන්නේ නැහැ කියලා.

ප්‍රශ්නයෙහි සඳහන් රටවල් හා ආයතන විසින් පසු ගිය වර්ෂ 15 තුළ ශ්‍රී ලංකා රජයට ලබා දුන් ණය මුදල් වෙනුවෙන් එකී ණය මුදල් ගෙවා නිම වන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඒ ඒ රට හෝ ආයතනය අනුව පහත දැක් වේ. දැන් මම ඒ සටහන කියවනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා ඉස්සෙල්ලා උත්තර දුන්නේ මොන කොටසටද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ප්‍රදාන. You have asked for grants. You have asked, ".... and grants".

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Yes, loans and grants.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

So, I am disposing of the grants.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I want to know what the total grant is and I certainly know that there is no payback on grants.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Okay. I have the details of the grants as well as the loans here with me. - [*Interruption.*] No. Do not jump the gun. You have asked for grants and loans. So, I cleared the air by saying that we need not discuss grants because there is no payback on that. But, since you wanted further information, I wanted to give you the details of grants. If you are not interested, I can leave that out and it will be included in Hansard. So, I will now deal with the loans.

ප්‍රශ්නයෙහි සඳහන් රටවල් හා ආයතන විසින් පසු ගිය වර්ෂ 15 තුළ ශ්‍රී ලංකා රජයට ලබා දුන් ණය මුදල් වෙනුවෙන් එකී ණය මුදල් ගෙවා නිම වන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඒ ඒ රට හෝ ආයතනය අනුව පහත දැක් වේ.

ඇ.එ.ජ. ඩොලර් මිලියන

| රට හෝ ආයතනය | ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය | | ලබා ගත් ණය මත ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| | ප්‍රදාන | ණය | |
| චීනය | 105.3 | 2,962.2 | 4,901.6 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 225.0 | 33.0 | 86.1 |
| ඉන්දියාව | 29.2 | 864.8 | 982.4 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල* | නැත | 2,197.0 | 2,452.0 |
| ලෝක බැංකුව | 344.8 | 1,784.3 | 2,303.0 |
| ආසියානු සංවර්ධන බැංකුව | 313.6 | 3,352.9 | 4,642.7 |
| ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව | නැත | 11.4 | 19.0 |
| යුරෝපා සංගමය | 114.5 | ඉහත කාල පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකා රජය යුරෝපා සංගමයෙන් ණය ලබා ගෙන නොමැත. | |
| මුළු එකතුව | 1,132.4 | 11,205.6 | 15,336.8 |

සටහන් -

* 2011 ජූලි දක්වා ඇතුළත් කර ඇත.

ඒ ඒ විනිමය අනුපාතයන් ඇ.එ.ජ.ඩොලර් ඒකකයට පරිවර්තනය කිරීමේදී වර්ෂාවසාන අගයන් උපයෝගී කරගෙන ඇත. පුරෝකථනයන් සඳහා 2010 දෙසැම්බර් 31 දිනට පැවැති විනිමය අනුපාතිකයන් සලකා ඇත.

ගෙවිය යුතු සමස්ත ණය ප්‍රමාණය සඳහා වාරික ගෙවීම්, පොලිය ගෙවීම් හා අදාළ වෙනත් ගාස්තු ගෙවීම් ආදී සියල්ලෙහි එකතුව දක්වා ඇත.

(ii) එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාලසීමාව එක් එක් රට හෝ ආයතනය අනුව පහත දැක්වේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබෙනවා, මේ ණය ආපසු ගෙවීමේ සාමාන්‍ය කාල සීමාව. ඔබතුමා හොඳට දන්නවා එක එක ණය සම්බන්ධයෙන් එක එක කොන්දේසි තිබෙනවා; එක් එක් කාල සීමාවන් තිබෙනවා කියා. ඔබතුමාට උත්තර දෙන්න ඕනෑ නිසා අපි ඒකේ average එක හැදුවා. Average එක පහත පරිදියි තිබෙන්නේ.

| රට හෝ ආයතනය | එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාල සීමාව, වර්ෂ |
|---|---|
| 1 චීනය | 12.2 |
| 2 ඇමෙරිකා එක්සත් ජනපදය | 24.5 |
| 3 ඉන්දියාව | 13.6 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 5.2 |
| 4 ලෝක බැංකුව | 23.1 |
| 5 ආසියානු සංවර්ධන බැංකුව | 21.0 |
| 6 ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ බැංකුව | 9.0 |
| යුරෝපා සංගමය | ඉහත කාල පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකා රජය යුරෝපා සංගමයෙන් ණය ලබා ගෙන නොමැත. |

(ආ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් දන්නවා, ආණ්ඩුව අධික ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා කියලා. රටක් සංවර්ධනය කිරීමට ණය ගැනීම අවශ්‍යයි. නමුත් ණය ගෙවීමේ හැකියාව සම්බන්ධයෙන් පොඩි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන එක අපට පෙනෙනවා. 1948 ඉඳන් 2005 ජනවාරි-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අතුරු ප්‍රශ්නය තමයි අහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න වෙලාවෙන් පස්සේ ඔබතුමාට කථාවකට අවස්ථාව ගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
1948 සිට 2005 වෙනකම් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,784ක්ව තිබුණු ණය ප්‍රමාණය දැන් ඇමෙරිකානු ඩොලර් මිලියන 5,980 දක්වා වැඩි වෙලා තිබෙනවා. පසු ගිය අවුරුදු හය තුළ - 2005 සිට 2011 දක්වා කාලය තුළ- තුන් ගුණයකින් වැඩි වෙලා තිබෙන මේ ණය ප්‍රමාණයට සාපේක්ෂව රටේ ආදායම වැඩි වෙලාත් නැහැ, රටේ වත්කම් ප්‍රමාණය වැඩි වෙලාත් නැහැ. ඔබතුමන්ලා ණය ගුලකට ආණ්ඩුව ගෙන යනවාද, නැද්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කොහෙත්ම නැහැ. ඒකට ඉතාම කෙටි පිළිතුර මෙයයි. අපි අපේ ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 124 සිට සියයට 85 දක්වා අඩු කරලා තිබෙනවා. අනාගතයේදී අපි එය තවත් අඩු කරනවා. ඒ නිසා ඒක ගැන තීරණය කරන්නේ ආණ්ඩුවයි. අපේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 120ක්ව තිබුණා, සියයට 103ක්ව තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා බලන්න, අද සෑම ජාත්‍යන්තර නිරීක්ෂක ආයතනයක්ම කියනවා, වර්ෂයෙන් වර්ෂය ණය ප්‍රමාණය අඩු කිරීම ගැන මේ ආණ්ඩුවට ප්‍රශංසා කරන්න ඕනෑ කියලා. අපි ණය ගන්නවා කියලා තමුන්නාන්සේලා ඊයෙත් අපට චෝදනා කළා. ණය අරගෙන, වැඩි පොලී ප්‍රමාණයක් තිබෙන ණය අපි return කරනවා. ඒවා ගෙවා දමලා අඩු පොලී ප්‍රමාණ තිබෙන දීර්ඝ කාලීන ණයවලට අපි යනවා. ඒ නිසා ඒ කළමනාකරණය භාර දීලා තිබෙන්නේ රජයටයි. අපේ ආර්ථිකයට එය ලෙහෙසියෙන්ම දරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපට කිසිම සැකයක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දළ දේශීය නිෂ්පාදිතයත් එක්ක සාපේක්ෂව බැලුවාම ණයබරතාව අඩු වෙලා තිබෙනවායි කියලා ඔබතුමා කිව්වාට අනෙක් පැත්තට බැලුවොත් රටේ ආදායමත් සමඟ ගෙවන්න තිබෙන ණයබරතාවත් සියයට 72 සිට 121ට වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ සමස්ත ආදායමට වැඩිය ණයබරතාව තිබෙනවා. එහෙම නම් සාපේක්ෂව මේ දෙක අතර තිබෙන වෙනස මොකක්ද? රටේ ආදායමට අනුව ගෙවන්න හැකියාවක් නැත්නම් -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාට කියන්න ඕනෑ, කරුණාකරලා අර කුණු බෝක්කු ඉන්ස්පෙක්ටර් - drainage inspector - කෙනෙක් වාගේ මේ ආර්ථික ප්‍රශ්න අහන්න එපා කියලා. අද ලෝකයේම යම් යම් ආර්ථික ක්‍රියා මාර්ගයන් ගන්නවා. අද හැම රටක්ම පාහේ එහෙමයි. අද ඇමෙරිකාවේ reserve currencyවල තත්ත්වය මොකක්ද? ඒ සල්ලි ඒ ගොල්ලෝ ගන්නවා. ඒ ගොල්ලෝ ඒවා යොදා ගෙන ආර්ථිකය දියුණු කරනවා. දියුණු කරලා ඒ ණය ගෙවනවා. එතකොට තමයි ඒ අනුපාතය අඩු වන්නේ. පුංචි කුණු බෝක්කුවක් අරගෙන, "මෙන්න මෙහෙම වෙලා තිබෙනවා, මෙකේ වතුර යන්නේ නැහැ." කියලා කියනවා වාගේ දෙයක් මේ.

ගාන්ධිතුමා මොකක්ද කිව්වේ? ඒ කාලයේත් දැන් ඔබතුමා ඔය කියනවා වාගේම වාර්තාවක් ගෙනාවා, "මේ විධියට ඉන්දියාවට අමාරුයි. නිදහස ලබා ගත්තොත් මේ ණය ගෙවන්න බැරි වෙයි" කියලා. එතුමා කිව්වා, “Sir, this is a drainage inspector’s report.” So, I have to refer to this as a drainage inspector’s question. That is all.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ඔබතුමා වරදවා එලෙස කථා කිරීම සම්බන්ධයෙන්.

ඔය අසික්කිත උත්තර දීම සම්බන්ධයෙන් අපට අහන්න තිබෙන එකම දේ මෙයයි. ඔබතුමන්ලා කියන වචනවලින් ප්‍රශ්නයක් නැහැ. අහිංසක ජනතාවට අද ජීවත් වන්න බැරි තත්ත්වයක් තියෙද්දී, තමුන්නාන්සේලා ණයබරතාවෙන් රට ගෙනියන කොට රටේ වත්කම්, Greece Bonds වල [බාධා කිරීම්] අතුරු ප්‍රශ්නය අහමුකෝ ඉස්සෙල්ලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අදාළ නැති ප්‍රශ්න නේ අහන්නේ. එක එක ප්‍රශ්න අහන්න පුළුවන්.

නමුත් අද අපේ මාතෘකාවට අදාළ ප්‍රශ්න අහන්න. තමුන්නාන්සේ මේ අනික් ඒවා ගැන ප්‍රශ්න අහනවා නම් මටත් ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක තනතුරට ඉල්ලලා පැරදුණේ ඇයි? ඒකට උත්තර දෙනවාද? ඒ නිසායි මම කියන්නේ අදාළ ප්‍රශ්න අහන්න ඕනෑ කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මානසික ප්‍රශ්නයක් තිබෙනවා වාගේ. මම අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැතිව එතුමා මගෙන් ප්‍රශ්න අහනවා. ගරු ඇමතිතුමාට තිබෙන්නේ මම අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්කෝ අපි ඔක්කොම relevant questionsවලට එන්න ඕනෑ. නැත්නම් දෙගොල්ලෝම irrelevant questions සාකච්ඡා කරන්න ඕනෑ. රවි කරුණානායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ irrelevant දේවල් ගැන සාකච්ඡා කරලා අපට විතරක් relevant දේවල් ගැන කථා කරන්න බැහැ නේ. අන්න ඒකයි ප්‍රශ්නය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. අප මුදල් සම්බන්ධයෙන් අහන කොට එතුමා දේශපාලන ප්‍රශ්නවලට යනවා නම් අන්න ඒක තමයි අදාළ නැත්තේ. මම තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ මේකයි. ඇමතිතුමනි, ඔබතුමන්ලා සියයට එකහමාරේ පොලියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන් ණය ගන්න කොට ඔබතුමන්ලාගේ බොරු කරන ආණ්ඩුව චීනයට ගිහින් සියයට අටට, HSBC බැංකුවට ගිහිල්ලා සියයට හයට ණය ගන්නේ ඇයි? මේවා ගෙවන්නේ ජනතාව. ඔබතුමන්ලා නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, පිළිතුරු දෙන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳට අහගන්න. ඉතාම අදාළ විධියට ඔබතුමාට මම කිසිම තරහක් නැතිව උත්තර දෙන්නම්. අපි මේවා සංසන්දනාත්මකව බලන්න ඕනෑ. සමහර multilateral institutions තිබෙනවා, ඒවායේ සහනදායක පොලී ක්‍රම තිබෙනවා. මම නැහැ කියන්නේ නැහැ. නමුත් ඒ ණය ප්‍රමාණය අපට මදි. අපි IMF එකෙන් ගත්තොත්, ඒකට තිබෙන්නේ Balance of Payment support. You know that very well. අපේ වෙළෙඳ ශේෂයේ, ගෙවුම් ශේෂයේ ප්‍රශ්න තියෙන කොට IMF එක නීතියෙන් ණය දෙන්න බැඳී සිටිනවා. ඒ නිසා එක එක අවස්ථාවට ඒ ඒ ණය ක්‍රමය අනුව අප ඒවාට එකඟ වෙනවා. ඒකට තමයි රජයක් තිබෙන්නේ. රජය මේවා ඔක්කොම පරීක්ෂා කර බලා ඒ ව්‍යාපෘතියේ හැටියට ණය ගන්නවා.

හැම දෙයටම අපට ලෝක බැංකුවෙන් ණය ගන්නට පුළුවන් නම් හොඳයි; ජයිකා එකෙන් ගන්නට පුළුවන් නම් හොඳයි. නමුත් ඒ ප්‍රමාණය මදි, අපේ සංවර්ධන වේගයට. සංඛ්‍යා ලේඛන අරගෙන බලන්න. ඒ මුදල් අපට අවශ්‍යයි. ඒ මුදල් අර ගෙන අප මොනවා ද කර තිබෙන්නේ? අධිවේගී මාර්ග හදා තිබෙනවා. අහස්යාත්‍රා තොටුපළවල් හදා තිබෙනවා. ඒ වාගේම harbours හදා තිබෙනවා. විදුලි බලය නිපදවන්න යොදා තිබෙනවා. Infrastructureවලට අපි මුදල් වැය කරනවා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මොකක් ද අප දන්නේ නැහැ. අපේ ප්‍රතිපත්තිය නම් පැහැදිලිවම infrastructureවලට ණය අරගෙන ඒවා කරනවා කියන එකයි. අප හංගන්නේ නැහැ. ඕනෑ නම් තවත් ණය ගන්නවා. මොකද, අපට විශ්වාසයක් තිබෙනවා, මේ ව්‍යාපෘතිවලට මුදල් යොදා අපේ රටේ ධනය වැඩි කර ගන්නට පුළුවන්ය කියා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8, ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Ravi Karunanayake said, මහත්මා ගාන්ධි අශික්ෂිත ප්‍රශ්න ඇහුවා - [බාධා කිරීම්] ලජ්ජා නැතිව -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
No, that is not a point of Order.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, there are

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

Members of Parliament in this House. I would like you to -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
No, that is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. Sir, he has violated the Exchange Control regulations. - [*Interruption.*]

## මැදගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල : ප්‍රතිසංස්කරණය
## மெதகம கோட்டக்கல்வி அலுவலகக் கட்டிடம்: மறுசீரமைப்பு
## MEDAGAMA DIVISIONAL EDUCATION OFFICE BUILDING : RENOVATION

1353/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල අධ්‍යාපන කලාපයට අයත්, මැදගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි වහලය දිරාපත් වී විනාශ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති බවත්;

(ii) එම තත්ත්වය කාර්යාලයේ සේවකයින්ගේ ජීවිතවලට අනතුරුදායක මෙන්ම පරිපාලන කටයුතු අඩාළ කිරීමටද හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, ඒ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனறாகலை மாவட்டத்தின் பிபிலை கல்வி வலயத்திற்குரிய, மெதகம கோட்டக்கல்வி அலுவலகம் அமைந்துள்ள கட்டிடத்தின் கூரை இற்றுப்போய் அழிவடையும் அச்சுறுத்தலுக்கு முகங்கொடுத்துள்ளதென்பதையும்;

(ii) இந்த நிலைமையானது அலுவலக ஊழியர்களின் உயிருக்கு ஆபத்தாகும் என்பதைப் போன்றே நிருவாக நடவடிக்கைகள் பாதிக்கப்படுவதற்கும் காரணமாக அமைந்துள்ளதென்பதையும்,

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த அலுவலகக் கட்டிடத்தை உடனடியாக மறுசீரமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், மறுசீரமைப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் திகதி யாதென்பதையும்;

(iii) இதற்காக தற்போது நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அப்பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) the roof of the building which houses the Medagama Divisional Education Office which comes under the Bibile Education Zone in Monaragala District is facing the danger of destruction as result of decay; and

(ii) this situation has become a threat to the lives of the workers there and it has also hampered the administrative activities of the office?

(b) Will he inform this House-

(i) whether he will take steps to renovate this office building speedily;

(ii) if so, the date on which the renovation work will be started;

(iii) whether allocations have been made for this purpose by now; and

(iv) if so, the amount that has been allocated?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. (ඌව පළාත් සභාවේ ලේකම්ගේ ලිපියට අනුව)

(ii) ඔව්. (ඌව පළාත් සභාවේ ලේකම්ගේ ලිපිය අනුව)

(ආ) (i) ඌව පළාත් සභාවේ ලේකම් දන්වා එවූ පරිදි මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2011.04. 29 වැනි දින ප්‍රතිපාදන ලබා දී ඇත.

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ඵලදායී නොවන බැවින් නව ගොඩනැගිල්ලක් ඉදි කර දෙන ලෙස කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් ඉල්ලීමක් කර ඇති බැවින් 2011.07.27 වැනි දින නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු කර ඇති බව ඌව පළාත් සභාවේ ලේකම් දන්වා ඇත.

(iii) ඔව්. (ඌව පළාත් සභාවේ ලේකම්ගේ ලිපිය අනුව)

(iv) 2012 වාර්ෂික අධ්‍යාපන ක්‍රියාත්මක සැලැස්ම මඟින් රුපියල් මිලියන 3ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර දැනටමත් එහි ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව ඌව පළාත් ලේකම් විසින් දන්වා එවා ඇත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබේද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana) )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රශ්නයක්. මෙය පළාත් සභාවට අයිති බව මම දන්නවා. මේ සම්බන්ධයෙන් ඉක්මනට ක්‍රියා මාර්ගයක් ගන්න කියලායි ඉල්ලන්න තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11-2296/'12 -(1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-1200/'11-(2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි (අ) ප්‍රශ්නයේ (iv) වැනි කොටසින් අවම වැටුප් ප්‍රමාණය ගැන අසා තිබෙනවා. මේ මාසයේ ඉඳලා අවම වැටුප වැඩි කර තිබෙනවා. ඒ නිසා මේ උත්තරයේ තිබෙන එක නිවැරදි නැහැ. ඒකත් සකස් කරලා උත්තරය දෙන්න මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වැත්තෑවේ කාබනික පොහොර නිෂ්පාදනාගාරය : ස්ථානය වෙනස් කිරීම
வேத்தேவ சேதனப் பசளை உற்பத்திக்கூடம் : இடமாற்றம்
WETTAWA ORGANIC FERTILIZER PLANT : RELOCATION

1359/'11

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, වැත්තෑවේ කාබනික පොහොර නිෂ්පාදනාගාරය, ජනාකීර්ණ මාවතක් ආසන්නයේ ස්ථාපිත කර ඇති බවත්;

(ii) ඒ හේතු කොට ගෙන ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට දැඩි තර්ජන එල්ල වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය සලකා බලා එම කාබනික පොහොර නිෂ්පාදනාගාරය ජන ශූන්‍ය ප්‍රදේශයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එය නැවත ස්ථාපනය කිරීමට යෝජිත ස්ථානය කවරේද;

(iv) එම ස්ථානයේ පොහොර නිෂ්පාදනාගාරය ස්ථාපිත කිරීමට ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா மாவட்டத்தின் கட்டான பிரதேச சபைக்குரிய வேத்தேவ சேதனப் பசளை உற்பத்திக்கூடம் மக்கள் செறிவுமிக்க வீதியொன் றின் அருகில் அமைக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) இதன் காரணமாக பகுதிவாழ் மக்களின் சுகாதா ரத்திற்கு தீவிர அச்சுறுத்தல் தோன்றியுள்ள தென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி நீர் நிலைமையைக் கருத்திற்கொண்டு மேற்படி சேதனப் பசளை உற்பத்திக்கூடத்தை மக்கள் இல்லாத பிரதேசமொன்றில் நிறுவ நடவடிக்கை எடுப்பாரா;

(ii) இதற்காக ஏற்கனவே திட்டம் தயாரிக்கப் பட்டுள்ளதா;

(iii) ஆமெனில் அதனை மீள்நிறுவ உத்தேசித் துள்ள இடம் யாது;

(iv) அவ்விடத்தில் பசளை உற்பத்திக் கூடத்தை நிறுவ எடுக்கும் காலம் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that-

(i) the Organic Fertilizer Plant of Wettawa which comes under the Katana Pradeshiya Sabha area of Gampaha District, has been established near a busy street; and

(ii) as a result, the health of the people of that area is under threat?

(b) Will he inform this House-

(i) whether action will be taken to establish that organic fertilizer plant in an isolated area, taking the above-mentioned situation into consideration;

(ii) whether plans in that respect have been made by now;

(iii) if so, of the place where it is proposed to be relocated; and

(iv) of the period of time required to establish the fertilizer plant at that location ?

(c) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

අදාළ කාබනික පොහොර නිෂ්පාදනාගාරය රද්දොළුගම සිට මුතුවාඩියට මායිම්ව පිහිටා ඇත.

(ii) නැත.

එබඳු තත්ත්වයක් සම්බන්ධයෙන් කරුණු තහවුරු වී නැත.

(ආ) (i) නැත.

දැනට පවත්නා කාබනික පොහොර නිෂ්පාදනාගාරයම පුළුල් ඉඩක පවත්වාගෙන යාම පිණිස එම ඉඩමට බටහිර දෙසින් පිහිටි අක්කර 5ක් පමණ වන වෙනත් ඉඩමක් අත්පත් කර ගැනීමට කටයුතු කිරීමට නියමිතය.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නැත.

## මහපොළ ශිෂ්‍යත්වය : ආදායම් සීමාව
மகாபொல புலமைப்பரிசில் : வருமான எல்லை
MAHAPOLA SCHOLARSHIP : INCOME LIMIT

2297/’12

15. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල සිසුන්ට මහපොළ ශිෂ්‍යත්වය ලබා දීමේදී සලකා බලන දෙමාපියන්ගේ වාර්ෂික ආදායම් සීමාව කවරේද;

(ii) මහපොළ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් එම ආදායම් සීමාව අවසන් වරට සංශෝධනය කරන ලද වර්ෂය කවරේද;

(iii) මහපොළ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් එම සංශෝධනය කිරීමට පෙර පැවති එම ආදායම් සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன அமைச்சரும், மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பல்கலைக்கழகங்கள் மற்றும் ஏனைய உயர் கல்வி நிறுவனங்களின் மாணவர்களுக்கு மகா பொல புலமைப்பரிசில் வழங்குகையில் கவனத் தில் எடுக்கப்படும் பெற்றோர்களின் வருடாந்த வருமான எல்லை யாதென்பதையும்;

(ii) மகாபொல புலமைப்பரிசில் தொடர்பான மேற் படி வருமான எல்லை இறுதியாக திருத்தப்பட்ட ஆண்டு யாதென்பதையும்;

(iii) மகாபொல புலமைப்பரிசில் தொடர்பான மேற் படி திருத்தம் மேற்கொள்ளப்படுவதற்கு முன்னர் காணப்பட்ட மேற்படி வருமான எல்லை யாதென் பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) the annual income limit of the parents, which is considered when awarding Mahapola Scholarships to the students of universities and other higher educational institutes;

(ii) the year in which the above-mentioned income limit pertaining to the Mahapola Scholarship was revised last; and

(iii) the income limit that was taken into account prior to the above-mentioned revision made with regard to the Mahapola Scholarship ?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පවුලේ මුළු වාර්ෂික ආදායම රුපියල් 300,000/-ක් හෝ ඊට අඩු අයකු විය යුතු අතර,

අදාළ ශිෂ්‍යයාගේ පවුලේ සිටින වයස අවුරුදු 19ට අඩු පාසල් අධ්‍යාපනය ලබන එක් සහෝදරයෙක්/ සහෝදරියක් වෙනුවෙන් රුපියල් 24,000/- බැගින් උපරිමය තිදෙනෙකු සඳහා රුපියල් 72,000/-ක සහනයක්ද,

අදාළ ශිෂ්‍යයාගේ පවුලේ සිටින විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන, එහෙත් මහපොළ හෝ ශිෂ්‍යාධාර හිමිකම් නොලබන එක් සහෝදරයෙක්/ සහෝදරියක් වෙනුවෙන් රුපියල් 36,000/- බැගින් ද සහනයක් ඉහත වාර්ෂික ආදායමට එකතු කර ලබා දෙනු ලැබේ.

(ii) 2008 වර්ෂයේදී.

(iii) පවුලේ මුළු වාර්ෂික ආදායම රු. 240,000/-ක් හෝ ඊට අඩු අයෙකු විය යුතු අතර,

අදාළ ශිෂ්‍යයාගේ පවුලේ සිටින වයස අවුරුදු 18ට අඩු පාසල් අධ්‍යාපනය ලබන එක් සහෝදරයෙක්/ සහෝදරියක් වෙනුවෙන් රු. 15,000/- බැගින් උපරිමය තිදෙනෙකු සඳහා රු. 45,000/- ක සහනයක්ද,

අදාළ ශිෂ්‍යයාගේ පවුලේ සිටින විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන එහෙත් මහපොළ හෝ ශිෂ්‍යාධාර හිමිකම් නොලබන එක් සහෝදරයෙක්/ සහෝදරියක් වෙනුවෙන් රු. 20,000/- බැගින් සහනයක්ද ඉහත වාර්ෂික ආදායමට එකතු කර ලබා දී ඇත.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා මහපොළ ශිෂ්‍යත්වය සහ ශිෂ්‍යාධාර නිසා අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කර ගෙන යන්න විශාල ශක්තියක් ලැබෙන බව. සමහර ළමයින් මේ ගන්නා මුදලින් දුප්පත් දෙමවුපියන්ව නඩත්තු කරන්න යම් මුදලක් ගෙවල්වලට යවන තත්ත්වයක් පවා තිබෙනවා. අපේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාත් ඒක පිළිගන්නවා ඇති. නමුත් මේ ලබා දෙන මුදල කිසි සේත්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැ, අද පවතින උද්ධමනය නිසා. මේ සුළු මුදලින් ජීවත් වෙන්න අමාරු තත්ත්වයකයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා පිළිතුරේ සඳහන් කළා, මහපොළ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ආදායම් සීමාව අවසන් වරට සංශෝධනය කරලා තිබෙන්නේ 2008 වර්ෂයේ කියලා. දැන් උදාහරණයක් විධියට ගත්තාම ශිෂ්‍යාධාර යටතේ ශිෂ්‍යයෙකුට ගෙවන්නේ රුපියල් 2,000යි. මහපොළ ශිෂ්‍යත්වය යටතේ ගෙවන්නේ රුපියල් 2,500යි. ඒ වාගේම වැඩිම ලකුණු ගන්නා ළමයින් 200ට වැඩිපුර ගෙවන්නේ රුපියල් 50යි. ඒ කියන්නේ මහපොළ ශිෂ්‍යත්වය යටතේ ශිෂ්‍යයෙකුට රුපියල් 2,500ක් ගෙවද්දී, ලංකාවේ වැඩිම ලකුණු ගත්ත ළමයින් 200ට රුපියල් 2,550 ගණනේයි ගෙවන්නේ. මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, මේ මුදල වැඩි කරන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවාද කියලා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා දීර්ඝ ප්‍රකාශයක් කළා.

දෙමවුපියන්ගේ වාර්ෂික ආදායම 1994 දී රුපියල් 90,000ක් ලෙසද, 2000 දී රුපියල් 1,20,000ක් ලෙසද, 2002 දී රුපියල් 1,44,000ක් ලෙසද, 2004 දී රුපියල් 2,40,000ක් ලෙසද, වරින් වර ඉහළ දමා ඇති අතර, අවසාන වරට 2008 දී එම සීමාව ලක්ෂ තුන දක්වා ඉහළ ගෙන ගොස් තිබෙනවා. ක්‍රමානුකූලව තිබෙන සාධකයන් අනුව සලකමින්, ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාත්, මුදල් අමාත්‍යාංශයත් එකතු වෙලා මේක කරලා තිබෙනවා. ඒ නිසා අද තිබෙන වාතාවරණයක් ගැන බොහෝ කලබලකාරී ලෙස ගරු මන්ත්‍රීතුමා අර්ථ නිරූපණය කරන ආකාරයෙන් මේ වැඩිවීම් මදියි කියන එක දැනට නම් අපට පිළිගන්නට බැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ මේ ප්‍රශ්නය අවබෝධ කර ගත්තේ නැති බවයි පෙනෙන්නේ. මගේ ප්‍රශ්නය අනුව ප්‍රධාන වශයෙන් ඇහුවේ, ශිෂ්‍යාධාර යටතේ ශිෂ්‍යයෙකුට ලබා දෙන රුපියල් 2,500ක් නැත්නම් රුපියල් 2,000ක් වන මේ මුදල වැඩි කරන්නට ක්‍රියා මාර්ග ගන්නවාද කියලා යි. තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති, භාණ්ඩ මිල වැඩි වීම නිසා ජීවත් වන්නට තිබෙන අමාරුකම් අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට මේ මුදලින් නඩත්තු වන්නට බැරි බව. අධ්‍යාපන ඇමතිතුමා කියන විධියට රුපියල් 2,500කින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුටවත් ජීවත් වන්නට බැරි තත්ත්වයකුයි තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ නිසා මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ගය ගැනයි ගරු ඇමතිතුමාගෙන් මා අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි සියලු සාධකයන් සැලකිල්ලට ගෙන තමයි වැඩි කිරීම් කරලා තිබෙන්නේ. එසේ නැතිව ගරු මන්ත්‍රීතුමා කියන ආකාරයට හදිසි යෝජනා අනුව කිසිම අවස්ථාවක වැඩි කිරීම් කරලා නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා අහනවාද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මා පිළිගන්නවා වැඩි කිරීම් කරලා නැති බව. ඒ නිසා තමයි වැඩි කරන්න කියලා ඉල්ලීමක් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වැඩි කිරීම් කරලා නැති බව මා පිළිගන්නවා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ මේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් මේ මුදල වැඩි කිරීමක් කරන්නය කියලා යි. මා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අවශ්‍ය නැහැ නේ. මා ඔබතුමාට දෙවතාවක්ම පිළිතුර දීලා තිබෙනවා. ඔබතුමා තුන්වැනි වතාවටත් ඒ ප්‍රශ්නයම අහනවා. අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කර තිබෙන සැලකිලි හා ඇති කර තිබෙන වැඩ පිළිවෙළවල් රාශියක් සහ ඊට අතිරේකව ලබා දී තිබෙන සහනයන් ගැන ගරු ඇමතිතුමාත් සති දෙකකට ඉස්සර වෙලා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා. ඒ කිසිවක් -[බාධා කිරීමක්] ඔබතුමා ඔහොම ඉන්න. ඒ කිසිම දෙයක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලැබෙන්නේ නැහැයි කියන පදනම යටතේ ඉඳගෙන එක කරුණක් ගැන පමණයි ගරු මන්ත්‍රීතුමා අද කථා කරන්නේ. [බාධා කිරීමක්]

## කොරියානු රැකියා අවස්ථා : ඉල්ලුම්පත්
## கொரிய தொழில்வாய்ப்புகள்: விண்ணப்பங்கள்
## KOREAN EMPLOYMENT OPPORTUNITIES: APPLICATIONS

1865/'11

3. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2011 වර්ෂයේදී කොරියානු රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දීමට ගිවිසුම්ගත රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා කොරියාවෙන් මෙරටට ගෙන්වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) මුල් අවස්ථාවේදී බෙදා දුන් ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) ගෙන්වන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව ඉල්ලුම්කරුවන්හට ලබා දීමට ප්‍රමාණවත් වූයේද;

(v) නොඑසේ නම්, නැවත කොරියාවෙන් ඉල්ලුම්පත් මෙරටට ගෙන්වූයේද;

(vi) අමතරව අවශ්‍යවූ එම ඉල්ලුම්පත් මෙරටදී මුද්‍රණය කළේ නම්, ඒවා මුද්‍රණය කළ ආයතනය කුමක්ද;

(vii) එම ආයතනය රාජ්‍ය ආයතනයක් නොවේ නම්, එහි අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කොරියාවේ රැකියා අවස්ථාවන් සඳහා බඳවා ගන්නා ක්‍රියාපටිපාටිය කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டில் கொரிய அரசாங்கத்தினால் இலங்கைக்கு வழங்குவதற்கு உடன்படிக்கை செய்துகொள்ளப்பட்டுள்ள ழில்வாய்ப்புக்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இது தொடர்பாக கொரியாவிலிருந்து இலங் கைக்கு வரவழைக்கப்பட்ட விண்ணப்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) முதலாம் கட்டத்தில் பகிர்ந்தளிக்கப்பட்ட விண்ணப்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) வரவழைக்கப்பட்ட விண்ணப்பங்களின் எண்ணிக்கை விண்ணப்பதாரர்களுக்கு வழங்கு வதற்கு போதியதாக இருந்தனவா என்பதையும்;

(v) இன்றேல், மீண்டும் கொரியாவிலிருந்து விண்ணப்பங்கள் இந்நாட்டுக்கு வரவழைக்கப் பட்டதா என்பதையும்;

(vi) மேலதிக விண்ணப்பங்கள் இந்நாட்டில் அச்சிடப் பட்டிருப்பின் அவற்றை அச்சிட்ட நிறுவனம் யாதென்பதையும்;

(vii) இந்நிறுவனம் அரச நிறுவனமாக இல்லாவிடின் அதன் உரிமையாளரின் பெயர் மற்றும் முகவரி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) கொரியாவின் தொழில் வாய்ப்புக்களுக்கு ஆட் சேர்க்கும் நடைமுறை யாதென்பதை அவர் குறிப் பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he inform this House-

(i) the number of employment opportunities agreed to be provided to Sri Lanka by the Korean Government in year 2011;

(ii) the number of applications brought to this country from Korea for the aforesaid purpose;

(iii) the number of applications distributed in the first instance;

(iv) whether the number of applications brought were sufficient to be provided to the applicants;

(v) if not, whether applications were brought to this country from Korea again;

(vi) if the additional number of applications required were printed in this country, the name of the institution which printed them; and

(vii) if the aforesaid institution is not a Government institution, the names and addresses of its owners?

(b) Will he state the procedure adopted in recruiting persons for employment opportunities in Korea?

(c) If not, why?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2011 වර්ෂයේ දී පැවැත්වූ කොරියානු භාෂා විභාගයෙන් 9998ක් සඳහා නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සහ 1215ක් සඳහා ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර, ගිවිසුම්ගත රැකියා අවස්ථා 7500ක් ලබා දීමට කොරියානු මානව සම්පත් දෙපාර්තමේන්තුව එකඟ වී ඇත.

(ii) කොරියාවෙන් ඉල්ලුම්පත් 45,000 විභාග අයදුම්පත් ලෙස මෙරටට එවන ලදී.

(iii) මධ්‍යස්ථාන 28කදී මෙම ඉල්ලුම්පත් බෙදා දීම සිදු කරන ලදී. මුල් අවස්ථාවේ දී කොරියාවෙන් ගෙන්වූ ඉල්ලුම්පත් 45,000 පහත පරිදි මධ්‍යස්ථාන අතරේ බෙදා හරින ලදී.

| මධ්‍යස්ථාන | | ඉල්ලුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අම්පාර | 900 |
| 02 | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | 1700 |
| 03 | බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය | 3000 |
| 04 | මඩකලපුව | 300 |
| 05 | රත්මලාන | 500 |
| 06 | මීගොඩ | 500 |
| 07 | පොලිස් ක්‍රීඩාංගනය - කොළඹ | 3000 |
| 08 | ගාල්ල | 2200 |
| 09 | කඩවත | 2700 |
| 10 | මීරිගම | 300 |
| 11 | තංගල්ල | 2500 |
| 12 | තිස්සමහාරාමය දිස්ත්‍රික් කාර්යාලය | 1000 |
| 13 | යාපනය | 250 |
| 14 | කළුතර | 2400 |
| 15 | නුවර | 3500 |
| 16 | කෑගල්ල | 2200 |
| 17 | කුරුණෑගල | 2500 |
| 18 | පන්නල දිස්ත්‍රික් කාර්යාලය | 1000 |
| 19 | මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය | 250 |
| 20 | දඹුල්ල | 1750 |
| 21 | මාතර ප්‍රාදේශීය කාර්යාලය | 2700 |
| 22 | මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය | 1500 |
| 23 | නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය | 1000 |
| 24 | තමන්කඩුව දිස්ත්‍රික් කාර්යාලය | 1200 |
| 25 | හලාවත | 1450 |
| 26 | රත්නපුරය ප්‍රාදේශීය කාර්යාලය | 3000 |
| 27 | ත්‍රිකුණාමලය | 1000 |
| 28 | වවුනියාව | 700 |

(iv) නැත.

(v) කොරියාවෙන් ඉල්ලුම්පත් ගෙන්වීම සඳහා කාලයක් නොතිබුණු බැවින් අමතර ඉල්ලුම්පත් 14,000ක් මෙරට දී මුද්‍රණය කිරීමට කොරියානු මානව සම්පත් ආයතනයෙන් අවසර ලබා ගන්නා ලදී.

(vi) කොරියානු මානව සම්පත් ආයතනයෙන් අවසර ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ඉල්ලුම්පත් මුද්‍රණය කරන ලදී.

(vii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රාජ්‍ය ආයතනයක් වේ.

(ආ) 1. කොරියානු භාෂා පරීක්ෂණය පැවැත්වීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම හා ප්‍රවේශ පත්‍ර ලබා දීම. මෙහිදී,

* විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම්
* ප්‍රවේශපත් නිකුත් කරන මධ්‍යස්ථාන හා දින
* විභාග ගාස්තු පිළිබඳව
* විභාගය දිනයේ දී රැගෙන ආයුතු දේ.
* පරීක්ෂණය පැවැත්වෙන ස්ථාන, දින සහ වේලාව පිළිබඳව දැනුම් දීමක් කරනු ලැබේ.

2. භාෂා පුහුණුව පැවැත්වීම.

3. කොරියානු භාෂා පරීක්ෂණය පැවැත්වීම.

4. කොරියානු භාෂා පරීක්ෂණයේ ප්‍රතිඵල නිවේදනය කිරීම.

5. භාෂා පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

6. රැකියා අපේක්ෂකයින්ගේ තොරතුරු අන්තර්ජාලයට යොමු කිරීම.

7. කොරියානු මානව සම්පත් දෙපාර්තමේන්තුව මඟින් රැකියා අපේක්ෂකයින් තෝරා ගැනීමෙන් පසු රැකියා ගිවිසුම් අත්සන් කිරීම.

8. රැකියාලාභීන්ට ශාරීරික පුහුණුව ලබා දීම.

9. කොරියානු මානව සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු හා රැකියාලාභීන්ට වීසා ලැබීම.

10. මුදල් ගෙවීමෙන් පසු රැකියාලාභීන්ගේ ලිපිගොනු සම්පූර්ණ කිරීම.

11. රැකියාලාභීන් විදේශගත කරවීම සඳහා සූදානම් කිරීම හා විදේශගත කිරීම.

(ඇ) පැන නොනඟී.

## ආපදා කළමනාකරණ අමාත්‍යාංශය : විදේශ ශිෂ්‍යත්ව
## அனர்த்த முகாமைத்துவ அமைச்சு: வெளிநாட்டுப் புலமைப்பரிசில்கள்
## MINISTRY OF DISASTER MANAGEMENT : FOREIGN SCHOLARSHIPS

2023/’11

**4. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sunil Handunnetti)

ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මඟින් 2010 හා 2011 වර්ෂ තුළදී නිලධාරින්ට ලබා දී ඇති විදේශ ශිෂ්‍යත්ව කවරේද;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(ii) එම ශිෂ්‍යත්ව ලබා දී ඇති නිලධාරින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனர்த்த முகாமைத்துவ அமைச்சு மற்றும் அதன் கீழுள்ள நிறுவனங்கள் மூலமாக 2010 மற்றும் 2011 ஆம் ஆண்டுகளில் உத்தியோகத்தர்களுக்கு வழங்கப்பட்டுள்ள வெளிநாட்டுப் புலமைப் பரிசில்கள் யாவை;

(ii) மேற்படி புலமைப்பிரிசில்கள் வழங்கப்பட்டுள்ள உத்தியோகத்தர்களின் பெயர்கள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Will he inform this House-

(i) the foreign scholarships that have been awarded to the officials by the Ministry of Disaster Management and the institutions coming under its purview, within the years 2010 and 2011?

(ii) the names of officials who have been awarded the above-mentioned scholarships ?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| | 2010 | | 2011 |
|---|---|---|---|
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | නැත | - | නැත |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය | - | කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත්උපාධිය |
| | | - | චන්ද්‍රිකා කාලගුණ විද්‍යාව සහ ලෝක දේශගුණය හා සම්බන්ධ පශ්චාත් ඩිප්ලෝමාව |
| ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය | නැත | - | නැත |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | නැත | - | නැත |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | නැත | - | නැත |

(ii)

| | 2010 | | 2011 |
|---|---|---|---|
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | - කේ.ඩී. සුජීව මහතා (කාලගුණ විද්‍යාඥ) | - | පී.එම්. ජයකොඩි මිය (කාලගුණ විද්‍යාඥ) |
| | | - | ඩී.ජී. ප්‍රනාන්දු මිය (කාලගුණ විද්‍යාඥ) |
| | | - | ටී.එම්.එන්. පීරිස් මහතා (කාලගුණ විද්‍යාඥ) |

(ආ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 5-2106/'11-(1), ගරු රෝසි සේනානායක මහත්මිය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝසි සේනානායක මහත්මිය වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බාල පෙට්‍රල් ඉතිරි තොගය : ක්‍රියා මාර්ග
## எஞ்சிய தரங்குறைந்த பெற்றோல்: நடவடிக்கை
## REMAINING STOCK OF SUB-STANDARD PETROL: ACTION TAKEN

2081/'11

9. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පසු ගිය කාල සීමාවේදී ආනයනය කරන ලද බාල පෙට්‍රල් තොගයෙන් ඉන්ධන පිරවුම්හල් වෙත නිදහස් කර ඇති පෙට්‍රල් ප්‍රමාණය කොපමණද;

(ii) එම තොගයෙන් නිදහස් කර නොමැති ප්‍රමාණය කොපමණද;

(iii) නිදහස් නොකරන ලද එම ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(iv) බාල ඉන්ධන බව සහතික කර ගැනීමෙන් පසු ඉතිරි තොගයෙන් ඉන්ධන නිදහස් කිරීමක් කර තිබේද;

(v) ඉතිරි ඉන්ධන තොගය සම්බන්ධයෙන් ගන්නා හෝ මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பெற்றோலியக் கூட்டுத் தாபனத்தினால் கடந்த காலப்பகுதியில் இறக்குமதி செய்யப்பட்ட தரங்குறைந்த பெற்றோல் தொகையிலிருந்து எரிபொருள் நிரப்பும் நிலையங்களுக்கு விடுவிக்கப்பட்டுள்ள பெற்றோலின் அளவு யாது;

(ii) மேற்படி தொகையில் இருந்து விடுவிக்கப்படாத அளவு யாது;

(iii) விடுவிக்கப்படாத மேற்படி எரிபொருளின் பெறுமதி யாது;

(iv) தரங்குறைந்த எரிபொருள் என உறுதிசெய்யப்பட்ட பின்னர் எஞ்சிய எரிபொருள் தொகையிலிருந்து எரிபொருள் விடுவிக்கப்பட்டுள்ளதா;

(v) எஞ்சிய எரிபொருள் தொகை சம்பந்தமாக மேற்கொள்ளப்படுகின்ற அல்லது ஏற்கெனவே மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Industries:

(a) Will he inform this House-

(i) the quantity of petrol that has been released to the filling stations, out of the sub-standard stock of petrol that was imported by the Ceylon Petroleum Corporation in the recent past;

(ii) the quantity that has not been released out of the aforesaid stock;

(iii) the value of the aforesaid quantity of fuel that has not been released;

(iv) whether a quantity of fuel has been released out of the remaining stock of fuel after the aforesaid stock of fuel was identified to be a sub-standard stock; and

(v) the action that is to be taken or that has been taken with regard to the remaining stock of fuel ?

(b) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) බැරල් 146,102කි.

(ii) බැරල් 17,185කි.

(iii) ඇමෙරිකානු ඩොලර් 2,105,918.64කි.

(iv) නැත.

(v) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් ඉන්ධන බැරල් 17,185ක් ENOC ආයතනය වෙත බැරලයක් ඇමෙරිකානු ඩොලර් 128.983 බැගින් මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,216,573.86 වන ලෙස 2012.03.07 වන දින අපනයනය කර ඇත. මෙහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඇමෙරිකානු ඩොලර් 110,655.23ක ලාභයක් උපයන ලදී.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-2288/'12-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලොකු ලූනු වගාවෙන් සිදු වූ පාඩුව : වන්දි
## பெரிய வெங்காயச் செய்கைச் சேதம் : நட்டஈடு
## DAMAGE TO BIG ONION CULTIVATION: COMPENSATION

2082/'11

14. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේදී ලොකු ලූනු වගා කිරීම සඳහා ගොවීන්ට ලබා දුන් බීජ ප්‍රරෝහණය නොවීමේ හේතුව මත වගා අසාර්ථක වීම නිසා ඔවුන්ට සිදු වූ පාඩුව ගණනය කර තිබේද;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(ii) ඒ අනුව අක්කරයකට ලොකු ලූනු වගාවෙන් සිදු වූ පාඩුව කොපමණද;

(iii) බීජ ප්‍රරෝහණය නොවීම නිසා හානියට පත්වූ ලොකු ලූනු වගා බිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත තත්ත්වය නිසා පීඩාවට පත් ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත පරිදි වගා හානි වූ ගොවීන් සඳහා වන්දි ගෙවා අවසන්කර තිබේද;

(ii) එසේ නම්, අක්කරයක් සඳහා ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(iii) වන්දි ගෙවා නොතිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රරෝහණය නොවුණු ලොකු ලූනු බීජ ආනයනය කරන ලද ආයතනයේ හෝ ආයතනවල විස්තර කවරේද;

(ii) එම ආයතනවලට තත්ත්වයෙන් බාල බීජ ගෙන්වීම සඳහා අවසර ලබා දුන් අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டில் பெரிய வெங்காயப் பயிர்ச் செய்கைக்காக விவசாயிகளுக்கு வழங்கப்பட்ட விதைகள் முளைக்காதிருந்ததன் அடிப்படையில் பயிர்ச்செய்கை வெற்றியளிக்காததன் காரணத்தினால் இவர்களுக்கு நேரிட்ட நட்டம் கணிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இதற்கிணங்க பெரிய வெங்காயச் செய்கையினால் ஒரு ஏக்கருக்கு ஏற்பட்ட நட்டம் எவ்வளவென்பதையும்;

(iii) விதைகள் முளைக்காமையினால் எத்தனை ஏக்கர் பெரிய வெங்காயச் செய்கைக் காணிகளுக்கு சேதமேற்பட்டதென்பதையும்;

(iv) மேற்படி நிலைமை காரணமாக பாதிக்கப்பட்டுள்ள விவசாய குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) தற்போது மேற்கண்டவாறு பயிர்ச்செய்கை சேதங்களுக்கு முகம்கொடுத்த விவசாயிகளுக்கு நட்டஈடு செலுத்தி முடிவடைந்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், ஒரு ஏக்கருக்காக செலுத்தப்பட்ட நட்டஈட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(iii) நட்டஈடு செலுத்தப்படவில்லையெனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) முளைக்காத பெரிய வெங்காய விதைகளை இறக்குமதி செய்த நிறுவனத்தின் அல்லது நிறுவனங்களின் விபரங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி நிறுவனங்களுக்கு தரத்தில் குறைவான விதைகளை இறக்குமதி செய்வதற்கு அனுமதி வழங்கியவர்கள் யாவரென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state-

(i) whether the loss caused to the farmers owing to the failure of crops which happened as a result of the non-germination of the seeds given to them for cultivating big onions in year 2010, has been estimated;

(ii) accordingly, the loss incurred per acre of big onion cultivation;

(iii) the total acreage of big onion cultivation that was damaged owing to the non-germination of seeds; and

(iv) the number of farmer families that were affected as a result of the above situation?

(b) Will he inform this House-

(i) whether the payment of compensation, for farmers whose cultivations have been damaged as stated above, has been completed;

(ii) if so, the amount of compensation paid per acre; and

(iii) if compensation has not been paid, the reasons for it?

(c) Will he state-

(i) the details of the institution or institutions that imported the seeds that did not germinate; and

(ii) the persons who authorized those institutions to import low quality seeds?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2010 වර්ෂයේදී ලොකු ලූනු වගා කිරීම සඳහා බීජ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ගොවීන් අතර බෙදා හැරීමක් සිදු කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග අංක 23 (2) යටතේ ප්‍රශ්නය. ගරු අනුර දිසානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අර්බුදය
### பல்கலைக்கழக விரிவுரையாளர்களின் பிரச்சினை
### CRISIS OF UNIVERSITY LECTURERS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොවිසඳී ඉදිරියට ඇදෙමින් ඇති විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අර්බුදය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට අපේක්ෂා කරනවා.

පසු ගිය ජුලි 04වන දා ආරම්භ වූ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැඩ වර්ජනයට දැනට සති දෙකක් ඉක්මවා ගොස් තිබෙන අතර මේ වන විට විශ්වවිද්‍යාලවල අධ්‍යාපන කටයුතු මුළුමනින්ම අඩාළ වී තිබෙනවා. එමෙන්ම පසු ගිය දා විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින්ගේ වැඩ වර්ජනය නිසාද විශ්වවිද්‍යාල කිහිපයක් වසා දැමුණා. ජනාධිපති ලේකම් සමඟ සාකච්ඡා වට 02ක් පැවතුණත් කිසිදු ප්‍රගතියක් මේ වන තෙක් අත්කරගෙන නැහැ. ප්‍රශ්නයට සෘජුවම මැදිහත් විය යුතු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා මෙම ප්‍රශ්නය මාගේ විෂය පථයට අදාළ නොවන්නාක් සේ සලකා හැසිරෙමින් සිටිනවා. ජනාධිපතිවරයා ද මෙතෙක් විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනය සමඟ කිසිදු නිල සාකච්ඡාවක් පවත්වා නැහැ. ඒ වෙනුවට වැඩ වර්ජනය ඇරඹීමට ආසන්න කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත් ආචාර්යවරුන් කීප දෙනෙක් මහනුවර ජනාධිපති මන්දිරයට කැඳවා සාකච්ඡාවක් පැවැත්වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාකච්ඡාවක් වූවත් එය මාධ්‍ය සන්දර්ශනයක් පමණයි.

පසු ගිය වසර දෙකකට ආසන්න කාලය තුළදී මේ රටේ ඉහළම බුද්ධිමය ප්‍රජාව වුණු විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්ට උද්ඝෝෂණ, පිකටිං, විරෝධතා, පෙළපාළිවල නිරත වීමට සිදු වුණා. ඔවුන් පාරට බැස උද්ඝෝෂණ කරමින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඔවුන් අරගල කරන්නේ තමන්ගේ වැටුප වැඩි කර ගැනීම ප්‍රමුඛ ඉලක්කය කරගෙන නොවෙයි.

වැඩ වර්ජනයේ නිරත වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ පළමු හා ප්‍රමුඛතම ඉල්ලීම නම් රටේ අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන ලෙසයි. ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරනවා යයි, පංචබල කේන්ද්‍රය කරනවා යයි, ක්ෂිතිජයට ඉහළින් බලන දරුවෙක් ගොඩ නඟනවා යයි කියන ආණ්ඩුව 2005 සිට මේ වන විට අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන සියයට 50කින් කප්පාදු කර තිබෙනවා.

2005 දී සියයට 3.5ක් වූ අධ්‍යාපන ප්‍රතිපාදන 2011 දී සියයට 1.86ක් දක්වා පහත බැස තිබෙනවා. මේ නිසා අද වන විට විශේෂයෙන්ම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය බලවත් අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඒක නිසායි ආචාර්යවරුන්ගේ අරගලයේ ප්‍රමුඛතම ඉල්ලීම බවට සියයට 6ක අධ්‍යාපන ප්‍රතිපාදන ඉල්ලීම පෙරට ඇවිත් තිබෙන්නේ. අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කිරීමට ආණ්ඩුව මුල් පියවර තබන්නේ නම් සිය වැටුප් යම්තාක් දුරට හෝ පසුපසට ගැනීම ගැන පවා සිතා බැලිය හැකි යැයි ආචාර්යවරුන් ප්‍රකාශ කර තිබෙනවා.

ආචාර්යවරුන්ගේ දෙවන ඉල්ලීම වී තිබෙන්නේ විශ්වවිද්‍යාලවලට කෙරෙන දේශපාලන මැදිහත්වීම වහා නතර කරන ලෙසයි. උපකුලපතිවරුන් පත් කිරීමේදීත්, පාලක සභා පත් කිරීමේදීත් විශ්විවද්‍යාලවල ස්වාධීනත්වය සහ ගරුත්වය ආරක්ෂා කිරීම අතිශය වැදගත් කටයුත්තක්. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය රැක ගැනීමට නම් එම ඉල්ලීම ඉතා ඉක්මනින් ඉටු කළ යුතු බව අප අදහස් කරනවා.

එසේම අධ්‍යාපනය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේදී විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ මතය විමසන ලෙසටත් ඔවුන් ඉල්ලීමක් කර තිබෙනවා. දැන් අධ්‍යාපනයේත් උසස් අධ්‍යාපනයේත් තීන්දු ගන්නේ ඒ ඒ ඇමතිවරයාට වුවමනා ලෙස මිස රටේ ජාතික අවශ්‍යතා සලකා ගෙන නොවේ. එක් එක් ජනාධිපතිවරයාගේ කාලයේදීත්, එක් එක් අධ්‍යාපන අමාත්‍යවරයාගේ කාලයේදීත් ඔවුන් කැමැති කැමැති ලෙස විවිධ පාසල් වර්ග හඳුන්වා දීම මෙයට කදිම උදාහරණයක්. කිසිදු දැක්මක් නැති ඒ එක් එක් වර්ගීකරණයන්ගේ, නාමකරණයන්ගේ අනිටු ප්‍රතිඵල බුක්ති විඳීමට සිදු වී ඇත්තේ අපේ රටේ දරු පරම්පරාවටයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ඉහළම බුද්ධිමය ප්‍රජාව ලෙස විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ඉල්ලීම - අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේදී ඔවුන්ගේ දායකත්වය ලබා ගන්නා ලෙස කරන ඉල්ලීම- අධ්‍යාපනයේ අනාගතය වෙනුවෙන් කරන ඉල්ලීමක්. වග කිවයුතු ආණ්ඩුවක් නම් ආචාර්යවරුන් මෙවැනි ඉල්ලීමක් කරන තෙක් බලා නොඉඳ ඔවුන්ගේ දායකත්වය අධ්‍යාපනයේ සුබසිද්ධිය වෙනුවෙන් ලබා ගත යුතුයි. ඒත් මේ ආණ්ඩුව, එවැනි ඉල්ලීමක් කර තිබියදී පවා එය නොසලකා හැර කටයුතු කරමින් සිටිනවා.

වැඩ වර්ජනයේ නිරත වන ආචාර්යවරුන්ගේ සිව්වන ඉල්ලීම නම් ඔවුන්ගේ වැටුප් ප්‍රශ්නයට පොරොන්දු වූ පරිදි විසඳුමක් ලබා දෙන ලෙසයි. එම වැටුප් ඉල්ලීම සාධාරණ බවට මා මීට කලින් මේ ගරු සභාවේ විශේෂ ප්‍රකාශයක් කළ අවස්ථාවේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා පවා එය පිළිගත්තා. එතුමා මටත් වඩා ඉදිරියට ගොස් මහාචාර්යවරුන්ගේ වැටුප ලක්ෂ දෙකද ඉක්මවිය යුතු බව පැවසුවා. නමුත් දැන් එම වැටුප් ඉල්ලීම නොසලකා හරිමින් සිටිනවා පමණක් නොව, ආණ්ඩුව විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයටත්, එහි සභාපතිවරයාටත් තර්ජනය කරන තත්ත්වයට පවා පත් වී තිබෙනවා. මෙය ඉතාම බරපතළ තත්ත්වයක්. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනයේ සභාපතිවරයා මාධ්‍ය හරහා ප්‍රකාශ කර තිබුණා, ඔහුට ජීවිත තර්ජන පවා එල්ල වෙමින් තිබෙන බව.

[ගරු අනුර දිසානායක මහතා]

අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ සිටිය යුතු ආචාර්යවරුන්ගේ ප්‍රමාණය 5800ක් වුවත්, දැනට සේවයේ යෙදී සිටින්නේ 4200ක් පමණයි. එනම් ආචාර්යවරු 1600 දෙනෙකුගේ හිඟයක් පවතිනවා. මෙවැනි තත්ත්වයන් තුළ පවා, අතිශය දුෂ්කරතා මැද මේ විශ්වවිද්‍යාල ආචාර්යවරු සිටින්නේ රටට හා අධ්‍යාපනයට ඇති ආදරය නිසායි. එවන් පිරිසකට ප්‍රමාණවත් වැටුප් වැඩි වීමක් ලබා දී ඔවුන්ගේ ගරුත්වයත් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියත් ආරක්ෂා කර ගත යුතුයි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ මෙම ඉතාම සාධාරණ ඉල්ලීම් වහාම ඉටු කර, විශ්වවිද්‍යාල පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීමට කඩිනම් ක්‍රියා මාර්ග ගන්නා ලෙස අපි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට කියා සිටිනවා. එසේම මේ පිළිබඳ උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරනවා.

1. විශ්වවිද්‍යාල ආචාර්යවරු ඉල්ලා ඇති වැටුප් වැඩි වීම සාධාරණ බව ඔබතුමා පිළිගන්නේද?

   පළමුකොටම එය අත්‍යවශ්‍යයි.

2. එම වැටුප් වැඩි වීම ලබා දීමට කෙතරම් කාලයකදී කටයුතු කරනු ලබන්නේද?

   ඒ සඳහා විවිධ අවස්ථාවලදී පොරොන්දු ලබා දී තිබුණද, ඒ පොරොන්දු ගඟට කැපූ ඉනි සේ නිකම් ගහගෙන ගිහින් තිබෙනවා, ගරු ඇමතිතුමනි. එම නිසා තමයි මේ ප්‍රශ්නය මේ තරම් උග්‍ර තත්ත්වයකට පත් වී තිබෙන්නේ.

3. අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට 6ක් වෙන් කළ යුතු බවට වන ඉල්ලීම ඔබතුමා පිළිගන්නේද?

   එය කරන එක නොකරන එක පසුව කථා කරන්න. ඒ ඉල්ලීම පිළිගන්නවාද කියා ඔබතුමාගෙන් මා දැන ගන්න කැමැතියි.

4. අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ඉහළ දැමීමට කටයුතු කරන්නේද? එම කරුණු සඳහා ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් පිළිතුරු අපේක්ෂා කරමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි. ඒ වාගේම ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාටත් මගේ ස්තුතිය පළ කරන්න කැමැතියි, මේ කරුණු මතු කරලා මට ඒවාට උත්තර දෙන්න අවස්ථාව ලබා දීම ගැන.

පළමුවෙන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ කරපු විස්තරය හරහා මතු කරපු ප්‍රශ්නවලට උත්තර දෙමින්, අවසානයේ එතුමා කෙළින්ම අහපු ප්‍රශ්න ටිකට උත්තර දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි එතුමාගේ විස්තරයෙන් මතු කරපු පළමුවන කාරණය තමයි, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්නය. මේක තමයි UNESCO මතය. මේක අපි පිළිගන්නවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියයට 6ක ප්‍රමාණය කියන්නේ UNESCO එක හිතන විධියට, ඔවුන් විස්තර කරන විධියට අධ්‍යාපනය සඳහා මුළු රටම වියදම් කරන මුදල. දරුවාට දෙමවුපියෝ වියදම් කරන මුදල් - season ticket එකට, uniform එකට, පොත් ගන්න, international ඉස්කෝලවලට - [බාධා කිරීම්] මා කියන තුරු පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන තුරු මා අහගෙන හිටියා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමා ඔබතුමාට ඉඩ දෙනවා නම් මා ආපහු උත්තර දෙන්නම්.

ඉතාම සශ්‍රීක අධ්‍යාපන මට්ටමක් රටක තිබෙන්න නම් අඩුම වශයෙන් ඒ රට අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වැය කළ යුතුයි. අපි රජයක් හැටියට වෙන් කරන්නේ සියයට 2ට ආසන්න ප්‍රමාණයක්. ඒ, සාමාන්‍යයෙන් සියයට 1.86ක් පමණ. ඊට අමතරව සමහර වෘත්තීය පුහුණු පාඨමාලා, තරුණ සේවා සභාව හරහා ගෙන යන පාඨමාලා, ධීවර අමාත්‍යාංශය යටතේ ගෙන යන පාඨමාලා, ආරක්ෂක අමාත්‍යාංශය ගෙන යන පාඨමාලා සේරම සඳහා සියයට 0.22ක් විතර වැය වනවා. මේකට එකතු වන්න ඕනෑ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්මලා දරුවන්ට වියදම් කරන සල්ලි, tuitionවලට වියදම් කරන සල්ලි, international ඉස්කෝලවල ඉගෙන ගන්නා දරුවන්ට වියදම් කරන සල්ලි, දරුවෝ පිට රට යවලා උගන්වන්න වියදම් කරන සල්ලි. මේක තමයි UNESCO මතය.

රටක සශ්‍රීක, හොඳ අධ්‍යාපන ක්‍රමයක් පවතින්න නම් ඒ රටේ ආදායමයෙන් සියයට 6ක් අධ්‍යාපනයට යන්න ඕනෑ. මේක තමයි තිබෙන මතය. අපි රජය හැටියට වියදම් කරන සියයට 2.2ට මේ රටේ දෙමවුපියෝ වියදම් කරන සල්ලි -දරුවන් පිට රට යවලා උගන්වන්න වියදම් කරන සල්ලි, මේ රටේ international ඉස්කෝලවලට වියදම් කරන සල්ලි, මේ රටේ පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට වියදම් කරන සල්ලි, දරුවාගේ බස් එකට වියදම් කරන සල්ලි, ගුරුවරයෙක් ගෙදරට ගෙනැවිත් දරුවාට උගන්වන සල්ලි, tuition පන්තිවලට වියදම් කරන සල්ලි, බාහිර පාඨමාලාවලට වියදම් කරන සල්ලි යන මේ සියල්ල- එකතු කර ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සියයට 5ක් විතර අධ්‍යාපනය සඳහා වියදම් කරනවා. ඒක ඉතා හොඳ තත්ත්වයක්.

ආචාර්ය සංගමයත් පෙන්වා දෙනවා මම දැක්කා, අධ්‍යාපනය සඳහා සියයට 6ට වැඩියෙන් වෙන් කරන රටවල්. මේ අතර රටවල් වර්ග දෙකක් තිබෙනවා. එයින් එක වර්ගයක සියලු රටවල් අධ්‍යාපනයට සල්ලි අය කරනවා. ඉතියෝපියාව, නේපාලය, භූතානය වාගේ අධ්‍යාපනය ඉතාම පහළ මට්ටමක තිබෙන රටවල් දෙවැනි රටවල් වර්ගයට ගැනෙනවා. ඒ අය තමයි සියයට 7, 8, 9 වියදම් කරන්නේ.

අධ්‍යාපනය සඳහා මුදල් අය කරනවා නම් මේක හරි ලෙහෙසියි. මේකේ තිබෙන දුෂ්කරතාව පිළිබඳව මම දැන් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. දළ ජාතික නිෂ්පාදනය අරගෙන නේ ඔබතුමා කථා කරන්නේ. ගිය අවුරුද්දේ දළ ජාතික නිෂ්පාදනයෙන් රජයේ ආදායම කීයද, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි? ගිය අවුරුද්දේ රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් රජයට හම්බ වෙච්ච ආදායම කීයද? සියයට 14.3යි. රාජ්‍ය ආදායම හා ප්‍රතිදාන යන දෙකේම එකතුව සියයට 14.5යි. විදේශ ප්‍රතිදාන සියයට 0.2යි. එතකොට ගිය අවුරුද්දේ රජයේ මුළු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14.3යි. ඒ සියයට 14.3න් තමයි සියයට 6ක් ඉල්ලන්නේ. ඒකෙන් ඉල්ලන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔබතුමා ඉන්නකෝ මම කථා කරලා ඉවර වෙනකල්. UNESCO එක කියන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් රටේ අධ්‍යාපනයට සියයට 6ක් යන්න ඕනෑ කියලායි. ඒක හරි. හැබැයි, ආචාර්ය සංගමය ඉල්ලන්නේ රාජ්‍ය ආදායමෙන් -රාජ්‍ය ආදායම කියන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14.3යි- සියයට 6ක් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න කියලායි. [බාධා කිරීමක්] මම මගේ කථාව ඉවර වුණාට පස්සේ ආචාර්ය සංගමයේ ඉල්ලීම් ලේඛනය මම ඔබතුමාට පෙන්වන්නම්. ඔබතුමා අරගෙන බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට රජයේ ආදායම වන ඒ සියයට 14.3න් වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප්වලට සියයට 5.4ක් වැය වෙනවා. සහනාධාරවලට සියයට 3.3ක් වැය වෙනවා. ණය පොලී සඳහා සියයට 5.6ක් වැය වෙනවා. ඒ අනුව සියයට 14.3ක් වැය වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සම්පූර්ණ ණය සියයට 15.5ක් වෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
නැහැ, නැහැ. මම මේ කියන්නේ පොලිය. මේ රටේ වැටුප් හා වේතන නොගෙවා, ණය පොලී නොගෙවා, සහනාධාර නොදී, ඒ කියන්නේ පොහොර සහනාධාරය, සමෘද්ධි සහනාධාරය, පිං පඩි, තෙල්වලින් ලබන පාඩුව, විදුලියෙන් ලබන පාඩුව, ඒ සියල්ල නැතිව දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 14.3ක් වන රජයේ ආදායමෙන් සියයට 6ක් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න කියන එක මොන තරම් හාස්‍යජනක ඉල්ලීමක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මම නැවතත් කියන්න කැමැතියි, සියයට 6ක් නොවෙයි ඊට වඩා වැය කරන්න පුළුවන් අධ්‍යාපනය සඳහා සල්ලි අය කරනවා නම්.

අපි සල්ලි අය කරන්නේ නැහැ, අදටත්, හෙටටත්, අනාගතයටත්. රජයේ ඒ නිදහස් අධ්‍යාපනය නොමිලේ -[බාධා කිරීමක්] අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඉන්න, මට කතා කරන්න ඉඩ දීලා. අපි නොමිලේ අධ්‍යාපනය සහතික කරනවා. ඒක අපි පිළිගන්නවා.

අනුර දිසානායක මන්ත්‍රීතුමා දිගින් දිගටම කථා කරමින් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. මා දන්නේ නැහැ, එතුමා ඒ විස්තර කොහෙන්ද සොයා ගත්තේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාලවලට වෙන් කරපු මුදල් වැඩි වෙලා තිබෙන්නේ මෙන්න මේ විධියටයි. 2000 වර්ෂයේ රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. 2005 වර්ෂයේ රුපියල් මිලියන 10,200ක් වෙන් කරලා තිබෙනවා. 2010 වර්ෂයේ රුපියල් මිලියන 19,600ක් වෙන් කරලා තිබෙනවා. 2012 වර්ෂයේ රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබෙනවා. මා දන්නේ නැහැ, එතුමා කොහෙන් ඒ සූත්‍රය සොයා ගත්තාද කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට වෙලාව දෙනවාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔව්. දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා පෙන්වා දුන්නේ -

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
සියයට ගණනයි. ඒක තමයි. ඉඳ ගන්න, ඉඳ ගන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඉතින් මට කථා කරන්න දෙන්න. මා එය පිළිගන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ඔබතුමා කිව්වා, ණය ප්‍රතිශතය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 103 සිට 79 දක්වා අඩු වෙලා තිබෙනවාය කියලා. එතකොට ඔබතුමා එයට ප්‍රතිශතය ගන්නවා. මෙයට ප්‍රතිශතය ගන්නේ නැහැ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගන්නේ නැතුව නොවෙයි. දැන් ඉඳ ගන්නකෝ. දැන් ඉඳ ගන්න. ඇත්ත තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි 2000 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වෙන් කර තිබෙන ප්‍රතිපාදන රුපියල් බිලියන 5, රුපියල් බිලියන 10.2, රුපියල් බිලියන 19.6, රුපියල් බිලියන 25 දක්වා නොකඩවා වැඩි කරලා තිබෙනවා; නොකඩවාම වැඩි කරලා තිබෙනවා. හැබැයි ඊට වඩා වැඩි වේගයකින් රටේ දළ ජාතික නිෂ්පාදනය වැඩි වී තිබෙන නිසා ප්‍රතිශතයේ අඩු වීමක් තිබෙනවා. එම නිසා නැවතත් මා කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියයට 6 කියන්නේ, රටක අධ්‍යාපනය සඳහා ඒ රට විසින් වැය කළ යුතු මුදලයි කියලා. අපි ඒ ආසන්නයේ ඉන්න රටක්. රජය වියදම් කරන සියයට 2.2 හා පෞද්ගලික අංශයේ ජනතාව තම දරුවන්ට වියදම් කරන මුදල් ගත්තාම අපි ඒ ආසන්නයේ ඉන්න රටක්. ඒක තව වැඩි වනවා නම් හොඳයි. ඒකේ කිසි වරදක් නැහැ. ඒක වැඩි වනවා නම් ඉතාම හොඳයි. හැබැයි මතක තබා ගන්න ඕනෑ, රජයේ ආදායම දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 14.3යි කියලා. ඒකෙන් තමයි මේ සියයට 6ක් ඉල්ලන්නේ. ඒකෙන් පඩි ගෙවන්න බැහැ; පිං පඩි ගෙවන්න බැහැ; සමෘද්ධි සහනාධාරය දෙන්න බැහැ; පොහොර සහනාධාරය දෙන්න බැහැ; මොකක්වත් කරන්න බැහැ. [බාධා කිරීමක්] අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට ආයෙත් වෙලාව දෙන්න බැහැ. පොඩ්ඩක් ඉන්න. ඔබතුමාට ආයෙත් වෙලාව දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟ ප්‍රධාන කාරණය තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් ප්‍රශ්නය. මගේ කාලයේ, අතිගරු ජනාධිපතිතුමාගේ දෙවෙනි පාලන කාලය තුළ - මේ කෙටි කාලය තුළ- මේ රටේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුගේ වැටුප මුල් පියවරේදී; ආරම්භ කරන පියවරේදී සියයට 73.88ක් වැඩි කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් වැටුපේ උපරිමයේ ඉන්නවා නම් ඔහුට සියයට 83.61ක් වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ කවදාවත් අවුරුදු එකහමාරක කාලයක් තුළ, -අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම යටතේ- විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට නොවෙයි මේ රටේ කිසිම රජයේ නිලධාරියෙකුට මෙයින් භාගයකින්වත් වැටුප වැඩි වෙලා නැහැ. නැවත කිව්වොත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ ආරම්භයේ වැටුප සියයට 73.88ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයට ගිහින්

[ගරු එස්.බී. දිසානායක මහතා]

තිබෙනවා නම් සියයට 83.61ක් වැඩි කරලා තිබෙනවා. සාමාන්‍ය කථිකාචාර්යවරයෙකුගේ ආරම්භයේ වැටුප සියයට 69.73ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයේ ඉන්නවා නම් සියයට 82.12ක් වැඩි කරලා තිබෙනවා. සහාය කථිකාචාර්යවරයෙකුගේ ආරම්භයේ වැටුප සියයට 66.12ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයේ ඉන්නවා නම් සියයට 71.88ක් වැඩි කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I වෙනි ශ්‍රේණියේ වැටුප, ඔහු ආරම්භයේ ඉන්නවා නම් සියයට 61.13ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයේ ඉන්නවා නම් සියයට 65.89ක් වැඩි කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වෙනි ශ්‍රේණියේ වැටුප, ඔහු ආරම්භයේ ඉන්නවා නම් සියයට 58.68ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයේ ඉන්නවා නම් සියයට 61.53ක් වැඩි කරලා තිබෙනවා. කථිකාචාර්යවරයකුගේ වැටුප, ඔහු ආරම්භයේ ඉන්නවා නම් සියයට 52.39ක් වැඩි කරලා තිබෙනවා. ඔහු වැටුපේ උපරිමයේ ඉන්නවා නම් සියයට 54.23ක් වැඩි කරලා තිබෙනවා. කථිකාචාර්යවරයකුගේ (පරිවාස) වැටුප ආරම්භයේදී සියයට 36.64ක් වැඩි කරලා තිබෙනවා; උපරිමයේදී සියයට 39.12ක් වැඩි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩිවීම ඉලක්කම්වලින් කිව්වොත් මේ අවුරුදු එකහමාර තුළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-වරයෙකුගේ වැටුප රුපියල් 78,426.25කින් වැඩි කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලික වැටුපද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
වැටුප. මූලික වැටුප නොවෙයි, වැටුප. මූලික වැටුප නොවෙයි. මූලික වැටුප වැඩි වුණ ගණනත් මම කියන්නම්. මූලික වැටුප රුපියල් 17,000කින් වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථිකාචාර්යවරයෙකුගේ වැටුප රුපියල් 70,940.60කින් වැඩි කරලා තිබෙනවා. සහායක කථිකාචාර්යවරයකුගේ වැටුප රුපියල් 57,000කින් වැඩි කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ වැටුප රුපියල් 45,100කින් වැඩි කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ වැටුප රුපියල් 39,800කින් වැඩි කරලා තිබෙනවා. සාමාන්‍ය කථිකාචාර්යවරයෙකුගේ වැටුප රුපියල් 29,115කින් වැඩි කරලා තිබෙනවා. ආධුනික කථිකාචාර්යවරයෙකුගේ වැටුප රුපියල් 18,944කින් වැඩි කරලා තිබෙනවා. මේ කෙටි කාලය තුළ සියයට 39 සිට සියයට 83 දක්වා වැටුප් වැඩි වීමක් ලබා ගත්තු කිසිම රාජ්‍ය සේවකයෙකු නැහැ. කිසිම රාජ්‍ය සේවයක් නැහැ. මෙහෙම වැටුප් වැඩි වීමක් මෙතෙක් ඉතිහාසයේ අපේ ලංකාවේ කිසිම රාජ්‍ය සේවකයෙකුට හෝ රජයේ සේවයකට දීලාත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අපට කියනවා, මේ ආචාර්යවරුත් එක්ක සාකච්ඡා කිරීම, ඔවුන්ට ඇහුම් කන් දීම කරන්නය කියලා. ඒක ඉතාම හොඳ වැඩක්. පසු ගිය දවස්වල අපි ආචාර්ය සංගමයට කිව්වා, "අපි දවස් දෙකක් මේ ආචාර්යවරුත් එක්ක වැඩ මුළුවක් තියලා මේ ප්‍රශ්නය ගැන කථා කරමු" කියලා. "බොහොම හොඳයි" කියලා ගිහිල්ලා ලියුමක් එවනවා, නායකත්ව පුහුණුව වහාම නතර කරන්න,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

දෙවැනි කාරණය හැටියට කියනවා, විදේශ දරුවන්ට ශිෂ්‍යත්ව දීම වහාම නතර කරන්නය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආචාර්යවරුන්ගේ ඉල්ලීම්වල තුන් හතර පොළකම සඳහන් කර තිබෙනවා, අපේ ආචාර්යවරුන්ට පශ්චාත් උපාධිය, ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා, පුහුණුවීම් ලබා ගැනීම සඳහා විදේශීය රටවල ශිෂ්‍යත්ව ලබා දීමට ප්‍රමුඛත්වය දිය යුතුයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඉල්ලීම් මාලාවේම තිබෙනවා, එහෙත් පිට රට දරුවන්ට අපි දෙන ශිෂ්‍යත්ව සියය වහාම නතර කරන්නය කියලා. මට තේරෙන්නේ නැහැ, ආචාර්ය සංගමය මේ කාරණා දෙක එකට ගැළපුවේ කොහොමද කියලා. පටන් ගත්ත තැන ඉඳලාම කියනවා, පෞද්ගලික අධ්‍යාපනය, පෞද්ගලික අධ්‍යාපනය, පෞද්ගලික විශ්වවිද්‍යාල, මේවා නවත්වන්න; නවත්වන්න; නවත්වන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කියලා, යටින් කියනවා, "අපේ දරුවෝ දෙදෙනෙකුට රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනවල ඉගෙනීම සඳහා රජය විසින් මුදල් ලබා දිය යුතුයි." කියලා. කොහොමද මේ ඉල්ලීම්? පටන් ගත්ත තැන ඉඳලා පෞද්ගලික අධ්‍යාපනයට ගහලා, ගහලා, ගහලා යටින් කියනවා, "අපේ දරුවෝ දෙදෙනෙකුට රාජ්‍ය හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනවල ඉගෙනීම සඳහා රජය වැය බර දැරිය යුතුයි." කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවාට අපි කොහොමද සාධාරණයි කියන්නේ? මේවා කරන්න පුළුවන් දේවල්ද?

අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඊළඟට කථා කළා, ආචාර්ය සංගමය මතු කරන දේශපාලන මැදිහත්වීම් ගැන. අපට ඇත්තටම මැදිහත් වෙන්න ඕනෑ නැහැ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි විශ්වවිද්‍යාල පාලනය කරන්න ඕනෑ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසිනුයි. නමුත් එහෙම එකක් තිබුණේ නැහැ. විශ්වවිද්‍යාල පාලනය කළේ ශිෂ්‍ය සංගම් විසින්. ඒක පිටුපස ඒ කාලයේ හිටියේ ජනතා විමුක්ති පෙරමුණ. අද ඉන්නේ පෙරටුගාමී පක්ෂය. දැන් අපි ඒවා කඩලා තිබෙනවා. අපි දැන් ශිෂ්‍යයන්ට ඕනෑ විධියට විශ්වවිද්‍යාල පාලනය කරන්න දෙන්නේ නැහැ. දැන් ආචාර්යවරුන් අතට බලය දීලා තිබෙනවා. ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාල ඇතුළේ මේ ආචාර්යවරුන්ට කොට කලිසමක් ඇඳගෙන උදේට පිට්ටනියේ ව්‍යායාම කිරීම තහනම් කළා. මේකට ඔබතුමන්ලා එකඟද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දිග කලිසම අඳින්න පුළුවන්ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
දිග කලිසම අඳින්න පුළුවන්. කොට කලිසම ඇඳගෙන විශ්වවිද්‍යාලය තුළ ව්‍යායාම කරන්න බැහැ. මෙහෙම කියන්නේ, මහාචාර්යවරුන්ටයි. ඒ වාගේම කිසිම ශිෂ්‍යයකුට විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු එක්ක තනියම කථා කරන්න බැහැ. මේකට තමුන්නාන්සේලා එකඟයිද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, -

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
පොඩ්ඩක් ඉන්න. මම මේ උත්තර දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආචාර්ය සංගමයෙන් ඔබතුමාට ආපු ලියැවිල්ලක් තිබෙනවා නේද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අන්න ඒ ලියැවිල්ලේ, මේ අසවල් අංකය දරන ඉල්ලීම යි කියලා කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මට ඒවා කියන්න බැහැ. ඒකේ තිබෙනවා 300ක් විතර. මම මේ කියන්නේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න අහන්න බැහැ මේ වෙලාවේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මම මේ කියන්නේ සමස්තයක් හැටියට- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ ඔළුවේ තිබෙන ඒවා කියන්න එපා. ඒක අසාධාරණයි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
නැහැ, නැහැ. මගේ ඔළුවේ තිබෙන ඒවා නොවෙයි කියන්නේ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දේශපාලන අත පෙවීම කියන කාරණය ගැනයි මම මේ කියන්නේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට library එකේ ඕනෑවට වඩා ඉන්න තහනම්. විශ්වවිද්‍යාල දරුවන්ට විශ්වවිද්‍යාලය ඇතුළේ කිසිම විධියකට ඉංග්‍රීසියෙන් කථා කිරීම තහනම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොහේද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
සියලු විශ්වවිද්‍යාලවල. නමුත් අද ඒවා නැහැ. හැබැයි අදටත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔය කියන්නේ 1970 එකක්.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
1970 එකක් නොවෙයි. [බාධා කිරීමක්] මේවා මම එන කොට තිබුණු ඒවා. මේ කාරණයේදී අපි මැදිහත් වෙලා උප කුලපතිවරුන් ශක්තිමත් කරලා, පීඨාධිපතිවරුන් ශක්තිමත් කරලා ඒ අන්තගාමී දේශපාලන සංවිධාන විශ්වවිද්‍යාල පාලනය කිරීම නතර කළා. ඒ නිසා කැටවලට සල්ලි එකතු කර ගන්න බැරිව, මොකක්වත් කර ගන්න බැරිව අසරණ වෙලා හිටපු ශිෂ්‍යයෝ ටික ජවිපෙ එක දාලා ගිහිල්ලා පෙරටුගාමී පක්ෂය අල්ලා ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අප හැමදාම කියනවා වාගේ විශ්වවිද්‍යාලය ඇතුළට දේශපාලන අත පෙවීම් අවශ්‍ය නැහැ. හැබැයි විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාලයක් ලෙස ගොඩ නැඟීම සඳහා ආචාර්යවරු, මහාචාර්වරු, පීඨාධිපතිවරු එකට වැඩ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආචාර්යවරු, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, උපකුලපතිවරු හතර දෙනෙක් ඉන්නවා. ඒක අමතක කරන්න එපා. මේ අය තමයි මේ තීන්දු ගන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ විශ්වවිද්‍යාලයේ සියලු පීඨාධිපතිවරු ඉන්නවා. විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු වෙනුවෙන් වෙනම නියෝජිතයෝ ඉන්නවා. මේ අය තමයි තීන්දු ගන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල Senate එක තමයි අධ්‍යාපනය පිළිබඳව සියලු තීන්දු ගන්නේ. මේකේ ඉන්න සියලු දෙනා ආචාර්යවරුයි. පීඨාධිපතිවරු පත් කරන්නේ කවුද? උපකුලපතිතුමා එහෙන් නම් තුනක් එව්වාම ජනාධිපතිතුමා එක්කෙනෙක්ව පත් කරනවා. [බාධා කිරීමක්] මගේ කාලයේ නැහැ. ඒකයි මම මේ කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Senate එකේ ඉන්නේ සියලුම ආචාර්යවරුයි. ඒ අය -Heads of Departmentsලා- තමයි තීන්දු ගන්නේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යාපන, අධ්‍යාපන නොවන, පරිපාලන, පරීක්ෂණ වාගේ විවිධ අංශ සඳහා කමිටු 15ක් පත් කරලා තිබෙනවා. මේ කමිටු පහළොවේම ඉන්නේ විශ්වවිද්‍යාල ආචාර්යවරුයි. මේ අය නිරන්තරයෙන් සාකච්ඡා කරමින් තමයි මේ කාරණය කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම කියන්න කැමැතියි, මේ සියයට හයේ කථාව හරියට තේරුම් ගන්න කියලා. UNESCO එක කියන්නේ මොකක්ද? ලෝකයේ වෙලා තිබෙන්නේ මොකක්ද? අපේ රටේ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒක තේරුම් ගත්තා නම් අපට මෙහෙම චෝදනා කරන එකක් නැහැ. ආචාර්යවරුන්ගේ වැටුප් වැඩිවීම් ගැන කියනවා නම්, මේ වැඩි කරපු වැටුප් ප්‍රමාණය කවදා හරි ලංකාවේ තවත් කොතැන හරි වැඩි කරලා තිබෙනවාද කියලා බලන්න.

ඒ නිසා අවසාන වශයෙන් අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්න ටිකට මම උත්තර දෙනවා.

(1) විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඉල්ලා ඇති වැටුප් වැඩිවීම සාධාරණ බව ඔබතුමා පිළිගන්නේද? නැහැ.

(2) එම වැටුප් වැඩිවීම ලබා දීමට කොතරම් කාලයකදී කටයුතු කරනු ලබන්නේද? අදාළ නැත.

(3) අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 6%ක් වෙන් කළ යුතු බවට වන ඉල්ලීම ඔබතුමා පිළිගන්නේද? ඒ ඉල්ලීම හොඳ ඉල්ලීමක්. දැනටම අපි ඒ ආසන්නයේ සිටිනවා.

(4) අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස ඉහළ දැමීමට කටයුතු කරන්නේද? අධ්‍යාපනය සඳහා අපි නොකඩවාම මුදල් වැඩි කරලා තිබෙනවා. ඉදිරියටත් තව තවත් මුදල් වැඩි කරනවා.

බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

## පාර්ලිමේන්තු විවාද මාධ්‍යවල සමබරව පළ නොකිරීම : විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ ප්‍රකාශය

## பாராளுமன்ற விவாதங்களை ஊடகங்களில் நேர்மையற்றமுறையில் அறிக்கையிடல்: எதிர்க்கட்சி முதல்வரினது கூற்று

## UNFAIR MEDIA REPORTING OF PARLIAMENTARY DEBATES : STATEMENT BY LEADER OF THE OPPOSITION

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

I want to raise one issue. On Thursday, 5th July, 2012, the Chief Government Whip raised a question about speeches not being covered in the "Daily Mirror". At that time, I also got up and referred to a speech that I had made, which had received only one sentence in the "Financial Times". If at all, it is a question of correcting it.

Anyway, I find that on the 9th of July, there has been a reply. If whatever I said was wrong, they could have corrected it or if they had some other position, I do not mind. But, I find that this statement involves all the Members of the House. They want to educate all the Members of the House on what the "Financial Times" has done and about the economy. I think that is completely uncalled for. If I have said something and they want to talk about me, that is a different matter. I can always reply. So, you must stop this habit of the newspapers who feel that they can educate the whole House.

I know some of us have been here from the time the economy was opened; the different Debates we had; the second round of liberalization in 1989/1990 when the economy had a downturn and a negative growth in 2001; thereafter how the monies were spent and how the economy was handled during the war. Even yesterday, I made a statement to which the Hon. (Dr.) Sarath Amunugama replied. Today, there was an argument between the Government and the Opposition. So, if there is anything more that the "Financial Times" can contribute, other than a swollen head, I am sure that we are more than willing to listen. When a statement is made to say that they want to draw attention to something that is wrong, there is no problem about it as long as it does not amount to misleading the House.

Firstly, they said that it is recently that I started speaking on it. I want to tell the Hon. Deputy Speaker, I have been speaking about these issues in Sinhalese, both in the House and outside the House. It is only recently I addressed in English. Therefore, anyone who had read the Sinhala or Tamil media could have followed it. I am sorry if the Editor, "Financial Times" and the staff are unable to understand Sinhalese or Tamil.

Secondly, he has said that the charge I made is that these people are all covering up the manipulating of the stock exchange and they will not expose it because they are part of it. Now, he claims he had done it and given a whole lot of exposure. But, none of them had any reference to the share market being manipulated. It is just a sale of prices and comments. Once they said, when the stock exchange was dipping Browns shares were purchased by the State. There were a few references to Laugfs Gas, but nowhere have they said that there was a manipulation or there were hints of manipulation or some people suspect it. If they have done that and I have missed it, I would certainly be happy to stand corrected on that matter.

On the same day, Monday 9 th July, 2012, when they replied, I find that they have also taken two pages out to defend the Stock Exchange in a way that even some of the members of the private sector are quite ashamed of. But, I do not want to go into the details on it. As far as I am concerned, if there is professionalism in the "Financial Times" or in any other business page, there has to be ethics for the journalists, ethics for the editor and ethics for the directors. If the "Financial Times" have those ethics, I will be more than happy if they can publish that. Then, we can judge their professionalism. Without that, we cannot. There are ethics for Members of Parliament and when we do not follow them, everyone shouts from inside the House and outside the House. So, if they have the ethics, first publish that. Then, we can see whether they have followed that.

When I happened to travel to Beijing on a visit, I did meet the Editor of the "Financial Times". He was going for the IOTA Conference on a delegation which was with the SriLankan Airlines. There was a representative of the "Daily News" Business Page - that is a State enterprise, I would not talk about it - and the Editor. SriLankan Airlines, as you know, has made losses. The Government might defend it in this House. We will attack it. But, those are issues that have to be discussed in any financial paper. So, if you are found travelling on it - whether the "Financial Times" paid for the ticket or whether SriLankan Airlines paid for the ticket - I do not know - that is certainly not a position you should be in. So, if they tell their ethics, then I would like to certainly judge them by their standard. I do not want to take any more of your time.

For people who want to educate this House, all I can say on behalf of the House is, the fool who knows that he is a fool can for that reason be a wise man. But, the fool who thinks that he is wise is indeed called a fool. The second applies to the Editor. With that thought, I conclude.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I will bring this matter to the notice of the Hon. Speaker and inform you as to what steps he would take. That is a very relevant statement.

## වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත: නියෝගය
## துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம் : கட்டளை
## PORTS AND AIRPORTS DEVELOPMENT LEVY: ORDER

[අ. භා. 2.14]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 මැයි 09 දිනැති අංක 1757/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.06.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය."

මේ ගැසට් පත්‍රිකාවේ තිබෙන්නේ මොනවාද කියලා මම මුලින්ම පැහැදිලි කළ යුතුයි. මේ ගැසට් පත්‍රයේ අඩංගු වෙලා තිබෙන්නේ 2012 අය වැය යෝජනා අනුව වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු, ඒ කියන්නේ Ports and Airports Development Levy - PAL - යම් යම් ක්ෂේත්‍රවලට යම් යම් ව්‍යවසායයන් සඳහා නිදහස් කිරීම ගැනයි. එය පසු ගිය අය වැය ලේඛනයේත් සඳහන් කළා. නමුත් එය සවිබල කිරීම සඳහා, ක්‍රියාත්මක කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍යයි. ඊට අදාළ අංශ වන්නේ මේවායි. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ බදු විරාමයක් සඳහා සුදුසුකම් ලත් යම් ව්‍යවසායක් විසින් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ වන යම් භාණ්ඩයක් ආනයනය කිරීමේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කොන්දේසිවලට යටත්ව එම භාණ්ඩය ආනයනය කිරීම. එම භාණ්ඩ ආනයනය කරන කොට මේ PAL එක බලපවත්වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17අ උප වගන්තිය යටතේ බදු විරාමයක් සඳහා සුදුසුකම් ලත් ඉදි කිරීම් කටයුතු හා සම්බන්ධ යම් ව්‍යවසායක් විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේදී ලබා ගත නොහැකි සහ ඒ බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්දේශ කළ පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ නොවන ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන භාණ්ඩ ආනයනය කිරීමේදීත් ඒ PAL එක බලපාන්නේ නැහැ.

අනෙක් එක, මෙම ගැසට් පත්‍රයේ අංක 1 (iii) හි සඳහන් සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගම, සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගම සහ සීමාසහිත ශ්‍රීලන්කන් කේටරින් පුද්ගලික සමාගම යන ආයතන නමින් ආනයනය කරන ලද අන්තර්ජාතික ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා යොදා ගනු ලබන භාණ්ඩ -මෝටර් වාහන සහ පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා භාණ්ඩ මෙයට ඇතුළත් වන්නේ නැහැ- ආනයනය කිරීම. එතැනදීත් මේ PAL එක බලපාන්නේ නැහැ.

ඊට අමතරව මෙයින් බලාපොරොත්තු වන්නේ, 2008 දෙසැම්බර් මස 31වැනි දින 1582/15 දරන ගැසට් නිවේදනයේ දැක්වෙන පරිදි ශීර්ෂ අංක 29.00 යටතේ ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය කිරීමේදී සියයට 2ක සහනදායී වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු අනුපාතයක් අය කිරීමයි. අදාළ රාජ්‍ය ආයතනයෙන්, ඒ කියන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව එය ලබා දීමට හැකි වන පරිදි සංශෝධනය කිරීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ සහන සඳහා තමයි අද අප පාර්ලිමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තු වන්නේ. මේ කාණ්ඩ හතරම ඒකාබද්ධ කරන දැක්ම මොකක්ද? ඒක පසු ගිය අය වැය තුළින් ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට මේ ගරු සභාවට හෙළිදරවු කළා. අපි එකින් එක ගනිමු.

ඉස්සර වෙලාම අපි ගනිමු අවසානයේ මම සඳහන් කරපු කාරණය. ඒ කියන්නේ මේ රටට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය කිරීම පිළිබඳ කාරණයයි. අද අපේ විදේශ විනිමය පිට රටවලට යන ක්ෂේත්‍ර දිහා බලන කොට අපට පෙනෙනවා ඖෂධ ගෙන්වීමේදී විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපට වැය කරන්න සිද්ධ වන බව. සමහර ඖෂධ අත්‍යවශ්‍යයි. ඒවායේ මට්ටම අනුව ඒ ගෙවීම කරලා අප ඒවා ලබා ගන්නවා. නමුත් විශාල ප්‍රමාණයක් තිබෙනවා, බොහෝ විට අප මේවා ආනයනය කරන්නේ අපේ තරම්වත් සංවර්ධනය නොවුණු නිෂ්පාදන කර්මාන්ත තිබෙන රටවලින්.

ඒ මට්ටමේ සෞඛ්‍යයට අදාළ නිෂ්පාදන බංග්ලාදේශයෙන් අප ගොඩාක් ගේනවා. ඉන්දියාවෙන් ගොඩාක් ගේනවා. පාකිස්තානයෙන් ගේනවා. තායිලන්තයෙන් ගේනවා. ඒවා මේ රටේ නිෂ්පාදනය කිරීමට සියලුම පහසුකම් ලබා දෙන්නට අප ප්‍රතිපත්තියක් වශයෙන් තීරණය කර තිබෙනවා. දැනටමත් රත්මලානට ගියොත් පේනවා, අපේ රටේ යම් යම් පරිමාණයේ ඖෂධ නිෂ්පාදනය කෙරෙන බව. ඒවාට දිරි දීමක් වශයෙන් අපේ ප්‍රධාන ඉල්ලුම්කරුවා වන්නේ අපේ රජයයි. අපේ සෞඛ්‍ය සේවය සඳහා අතිවිශාල මුදල් ප්‍රමාණයක් රජය වාර්ෂිකව වැය කරනවා. ඒවායින් විශාල මුදල් ප්‍රමාණයක් විදේශ විනිමය හැටියට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු ගණනක් මේ ගැන නොයෙක් තර්ක, විතර්ක, චෝදනා එල්ල කර තිබෙනවා. මේවා ඔක්කොම පිට රටින් ගෙන ආ යුතු ද, මේවා හරි විධියට වර්ගීකරණය කර තිබෙනවා ද, අවශ්‍ය ප්‍රමාණය මෙහි ගබඩා කර තිබෙනවා ද ආදී වශයෙන් දහසක් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේ රටට ඖෂධ ගෙන ඒම ගැන පරීක්ෂා කරන කමිටුවට මා පත් කර තිබුණා. දස දහස් ගණන් බෙහෙත් ගෙනෙන්නට ඕනෑ. ඒවා ගොඩ ගහගෙන තිබෙන්නට බැහැ. අවශ්‍ය වෙලාවට තිබෙන්නටත් ඕනෑ. ඒවායේ ජීවිත කාලය තුළ රැක ගන්නටත් ඕනෑ. ඒක සංකීර්ණ ප්‍රශ්නයක්. මම පුදුම වුණා, නව තාක්ෂණය, කොම්පියුටර් පවා යොදවා තිබුණේ නැහැ.

අද ලංකාවේ දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වෙළඳ පොළක් රජය තුළින්ම සකස් කර තිබෙනවාය කියන එක අපට පිළිගන්නට පුළුවන්. ඒ තමයි අපේ නිදහස්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

සෞඛ්‍ය ප්‍රතිපත්තිය. අපේ ගරු එස්.බී. දිසානායක අමාත්‍යතමා දැන් ටිකකට ඉස්සල්ලා රජය අධ්‍යාපනය සඳහා වැය කරන මුදල් ප්‍රමාණය ගැන පැහැදිලි කළා. ඒ හා සමානව විශාල මුදලක් අප වැය කරනවා, අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයටත්. කමක් නැහැ. ඒක කළ යුතු නැහැ කියා කවුරුත් කියන්නේ නැහැ. විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ හුඟක් ඉතිරි කිරීම් කරන්නට පුළුවන් යම් යම් භාණ්ඩ මේ රටේ නිෂ්පාදනය කිරීමෙන්. දැන් ඒක අපේ ප්‍රතිපත්තියක්. ඒ ගැන අය වැය ලේඛනයෙන් ගරු ජනාධිපතිතුමා පැහැදිලි කළා. ඒ සඳහා යම් යම් ක්‍රියා මාර්ග ගන්නට ඕනෑ; ඒවා නිෂ්පාදනය කරන කොම්පැනිත් එක්ක සාකච්ඡා කරන්නට ඕනෑ; ඒ අයට අවශ්‍ය පහසුම් සපයා දෙන්නට ඕනෑ. මේක ඉතාම තරගකාරී ක්ෂේත්‍රයක් බව අප මතක තබා ගන්නට ඕනෑ.

බොහෝ විට අර වෙනස -ලාභය- ඉතාම සුළු එකක්. හුඟ දෙනෙක් මුදල් හම්බ කරන්නේ මේවා මහා තොග පිටින් විකිණීම තුළින්. නැතුව එක භාණ්ඩයක් තුළින් විතරක් නොවෙයි. අනෙක් අතට, අද ජාත්‍යන්තර වශයෙන් ඒක අපේ අධ්‍යාපනයටත් සම්බන්ධයි. හුඟාක් දුරට research and development සඳහායි. මේවා පිළිබඳව නිතර පර්යේෂණ කරන්න ඕනෑ. නිතර අලුත් නිපදවීම් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒවා වෙළෙඳ පොළට යවන්න ඉස්සරවෙලා trial periods තිබෙනවා. ඒ trials කරලා ඒවා වෙළෙඳ පොළට දමන්න ඕනෑ. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා කිව්වා වාගේ අද අධ්‍යාපනය ගැන කථා කරන කොට විශ්වවිද්‍යාල ගැන විතරක් කථා කරන්න බැහැ. මේ වාගේ පර්යේෂණ ආයතන, මේ වාගේ වෘත්තීය පුහුණු ආයතන වැඩි කරන්න ඕනෑ. සමහරවිට අර සියයට 6 වැඩි කරන්න වෙන්නේ ඒ අංශවලට වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ රජයේ ප්‍රතිපත්තියක් තමයි මේ සියලුම පහසුකම් දෙන්න, මේ රට තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්තයක් ඇති කිරීම. ඉන්දියාවට කරන්න පුළුවන් නම්, බංග්ලාදේශයට කරන්න පුළුවන් නම් අපිට කරන්න බැරි ඇයි? දැනටමත් කොටසක් කෙරෙනවා. ඒ නිසා ඒ හා සම්බන්ධිත සහනයන් දෙනවා. ඒ සහනයන්ගෙන් එකක් තමයි මේ Ports and Airports Development Levy එක අයින් කිරීම. ඒකත් සියලු දේම දෙන්නේ නැහැ. අපි අර්ධ වශයෙන් සහනයක් දෙන්න බලනවා. ඒකට හේතුව ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දෙවැනි කොටස බලන්න ඕනෑ. ඒ infrastructure development කියන එක. මොන පක්ෂයෙන් ආවත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ තනතුරට එන තෙක්, ඊට කලින් දෙපැත්තේම අපි යටිතල පහසුකම් සඳහා වැය කරපු මුදල් ප්‍රමාණය මදියි කියන එක අපට පිළිගන්න සිද්ධ වෙනවා. අද ඒක සංවර්ධනයේ 'අ' යනු, 'ආ' යනු බවට පත් වෙලා තිබෙනවා. අද ලෝකයේ කොයිම රටක්වත් සංවර්ධනය කරන්න බැහැ පාරවල් හදන්නේ නැත්නම්, අධිවේගී මාර්ග හදන්නේ නැත්නම්, විශේෂයෙන්ම ගුවන් තොටුපොළවල් සහ නැව් තොටුපොළවල් හදන්නේ නැත්නම්. ඒවා හදන්නේ නැත්නම් අපට ශීඝ්‍ර සංවර්ධනයකට යන්න බැහැ. ඒ අවම ආයෝජනය කරන්න ඕනෑ.

අද ලෝකයම බලන්නේ චීනය දිහායි. බලන්න, චීනය කොයි තරම් හොඳට ඒ ගොල්ලන්ගේ කර්මාන්ත දියුණු කරලා තිබෙනවාද, ඒ ගොල්ලන්ගේ භාණ්ඩ පිට රටවලට විකුණලා තිබෙනවාද කියලා. මුළු ලෝකයේම වෙළෙඳ පොළවල් අල්ලා ගන්න චීනයට පුළුවන් වෙලා තිබෙනවා. ඉස්සර නම් අල්ලා ගත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල වෙළෙඳ පොළවල්. අද ඉතාම දියුණු බටහිර රටවල, ඇමෙරිකාව, යුරෝපය වැනි රටවල පවා වෙළෙඳ ශේෂය ගත්තොත් විශාල වශයෙන් චීන භාණ්ඩ ගන්න තමයි ඒ ගොල්ලන් මුදල් වැය කරන්නේ. අද මේ වන විට ඇමෙරිකාවේ විවාදය යනවා, ඔබාමා සහ රොම්නි අතර. ඒගොල්ලන් මොකක්ද කියන්නේ?

දෙගොල්ලන්ම කියන්නේ, ඉස්සර විධියට අපට බැහැ, චීනයෙන් බඩු ගෙනෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ, අපි පුළුවන් තරම් දේශීය කර්මාන්ත වැඩි කරන්න ඕනෑ කියලායි. සමහරු අහනවා, ඔයාට තිබුණු කාලයේ ඒක කර ගන්න බැරි වුණේ ඇයි කියා. අනෙක් කෙනා කියනවා, රොම්නි, ඔයා විචෘත ආර්ථිකයකට යන නිසා ඔයා මේවාට මේ රටේ දේශීය වශයෙන් ඉඩ දෙන්නේ නැති වෙයි කියා. ඉතින්, තර්ක විතර්ක තිබෙනවා. නමුත් කවුරුත් පිළිගන්නවා යටිතල පහසුකම් හදා ගන්නා තුරු ඒ වෙළෙඳ ක්ෂේත්‍රයට යන්න බැහැ, ආදායම ලබා ගන්න ක්ෂේත්‍රයට යන්න බැහැ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඩිංගකට ඉස්සර වෙලා විරුද්ධ පක්ෂයේ අපේ හිතවත් මන්ත්‍රීතුමා ඇහුවා, ඇයි එහෙම නම් ඔච්චර වියදම් කරන්නේ කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියාගෙන ආවේ මෙන්න මේකයි. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහනවා, ඇයි මෙච්චර ණය ගන්නේ කියා; ඇයි මෙච්චර වැඩ කරන්නේ කියා. පාරවල් හදන්නේ ඇයි, නැව් තොටු පොළවල් හදන්නේ ඇයි, මේ විධියට අහස් යාත්‍රාංගණ හදන්නේ ඇයි කියලා අහනවා. ඒක අපේ ප්‍රතිපත්තිය. අපේ ප්‍රතිපත්තිය තමයි ශීඝ්‍රව යටිතල පහසුකම් ලබා දීලා මේ රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය නිෂ්පාදනය වැඩි කිරීම. නිෂ්පාදනය වැඩි කරන්නේ නැතිව ස්ථිරසාර ආර්ථික පදනමක් දමන්න බැහැ. අපේ අනෙක් යම් යම් ක්ෂේත්‍රවලින් මුදල් එන එක හොඳයි. සංචාරක ක්ෂේත්‍රයෙන්, ඒ වාගේම විදේශ රටවලින් මෙහේට සල්ලි එවන එක අත්‍යවශ්‍යයි. ඒවායෙන් අපට හොඳ සහනයක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට බලශක්තිය නිෂ්පාදනය නොකරන රටක්. ඒ නිසා තෙල් අර්බුද ඇති වෙනවා. ඒ නිසා පුළුවන් තරම් අපේ රටේ නිෂ්පාදනය වැඩි කරලා, විදේශ විනිමය මේ රටට ලබා ගන්න පුළුවන් තත්ත්වයක් අද ඇති කරන්න ඕනෑ. ඉතින් ඒ සඳහා අපේ මහින්ද චින්තන තුළින්, පසු ගිය අය වැය තුළින් පැහැදිලි උත්තර දීලා තිබෙනවා. ලංකාවේ පිහිටීම අනුව කේන්ද්‍රස්ථාන, නිෂ්පාදන මූලස්ථාන ඇති කිරීමට අපි කටයුතු කරනවා. අපේ භූගෝලීය පිහිටීම මුල් කරගෙන, අප වටේම තිබෙන සුවිශේෂ වෙළෙඳ පොළවල් මුල් කරගෙන ඒ මූලස්ථාන ඇති කරන්න -hub status ඇති කරන්න- කටයුතු කරනවා. මා අද තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, තවත් අවුරුදු 6ක්, 7ක් යන කොට ඉන්දියාවේ ජනතාවගෙන් තුනෙන්

පංගුවක් මධ්‍යම පාන්තිකයන් බව. චීනයේ නැග එන මධ්‍යම පන්තියක් තිබෙනවා. ඒක ගැන මා කථා කරන කොට අපේ හිතවත් අනුර කුමාර දිසානායක මැතිතුමා ඒ ගැන ටිකක් චකිතයකින් ප්‍රකාශ කළා, එහෙම වෙයිද, සමාජය එහෙම වෙනස් වෙයිද කියලා.

හැම සමාජයකම සියයට 5ක්, 10ක් ඉතාම පහළ මට්ටමේ, අන්ත දුගී අය ඉන්න පුළුවන්. නමුත් අද සමාජ විපර්යාසය නම් ඒ කට්ටිය සිටියත් අර දුප්පත් කියපු කොටස්වලින් මධ්‍යම පන්තියට සංක්‍රමණය වීමයි. ඒක මුළු ආසියාවේම සිද්ධ වන දෙයක්. ලංකාවට විතරක් ඒක වෙනස් කරන්න බැහැ. එහෙම නම් අපි යටිතල පහසුකම් ඇති කරන්න ඕනෑ; මේ රටට ආයෝජන ගෙන්වා ගන්න ඕනෑ. අවංකවම කියනවා නම් අපි මීට වඩා දියුණු වෙන්න ඕනෑ, විදේශ ආයෝජන ලබා ගැනීමට.

අද රටවල් අතර විශාල තරගයක් තිබෙනවා. බලන්න අද කාම්බෝජය සහ මියන්මාරය දිහා. ඒ ගොල්ලොත් අපි වාගේම බෞද්ධ රටවල්. සමහර අය කියනවා, බෞද්ධ රටවල්වලට මොකටද ඔච්චර සල්ලි; මෙච්චර ආයෝජනයක් අවශ්‍ය නැහැ; අපිට අපිස් ජීවිතයක් ගත කරන්න පුළුවන් කියලා. මේ ආදී වශයෙන් කියලා තිබෙනවා අපි ඉඳලා හිටලා පත්තරවල දකිනවා. නමුත් අද බලන්න කාම්බෝජය, මියන්මාරය, වියට්නාමය, තායිලන්තය වැනි රටවල් ශීඝ්‍ර සංවර්ධනයකට අවශ්‍ය යටිතල පහසුකම් ඇති කරමින් නිෂ්පාදනය කරා යනවා; ඒ ඉලක්ක හදනවා.

තමුන්නාන්සේලා දකින්න ඇති රුචිර් ශර්මා ලියපු අලුත් පොතක් තිබෙනවා, -කනගාටුයි ඒ පොත මට ගෙනෙන්න අමතක වුණා.- "Breakout Nations" කියලා. ඒකේ තිබෙන්නේ යුද්ධයකට පස්සේ ශීඝ්‍ර සංවර්ධනයකට යන රටවල් ගැනයි. ශර්මා කියන්නේ Morgan Stanley කියන, -ඇත්ත වශයෙන් බැංකුවක්- මුදල් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියෙක්. ලංකාව යුද්ධයට පස්සේ ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙන්න පුළුවන් රටක් බවට ඔහු හඳුනා ගන්නවා. ලංකාව ඒ තරම් බලාපොරොත්තු තියන්න පුළුවන් රටක් හැටියට එතුමා පිළිගන්නවා. අපි ඒ සඳහා යම් යම් දේවල් කරන්න ඕනෑ.

එකක් තමයි අපේ යටිතල පහසුකම්වලට ලෝස් නොවී අප වියදම් කරන්න ඕනෑ කියන එක. වෙන රටවල් එසේ කරන කොට අපි ඒවා නොකර කොහොමද? තමුන්නාන්සේලා දන්නවාද අද ඉන්දියාවේ අලුත් නැව් තොටුපොළවල් කීයක් හදනවාද කියලා. මම දැක්කා ගරු රෝහිත අබේගුණවර්ධන මහතා හැම දාම TV එකේ ඒවා පැහැදිලි කරනවා. අපි තනියම ඉන්න රටක් නොවෙයි. අද පාකිස්තානයේ ක්වෙටාවල අලුත් ගුවන් තොටුපොළක් හදනවා. නැව් තොටුපොළවල් වටේටම හදනවා. ඉන්දියාවට විශාල ශක්තියක් තිබෙනවා, ඒ ගොල්ලන්ගේ ලක්ෂ ගණනක් වූ Non-Resident Indiansලා පිට රටවල ඉඳන් සල්ලි එවන නිසා. අද ඉන්දියාවේ යම් යම් ගුවන් තොටුපොළවල්, නැව් තොටුපොළවල් NRIsලාට භාර දීලා තිබෙනවා, ඔයගොල්ලෝ ආයෝජනය කරලා මේවා හදන්න කියලා. ඒකයි යථාර්ථය.

මට මතකයි අපේ රටේ ටාජ් හෝටලය හදපු කාලය. මම ඒ කාලයේ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්. ටාජ් හෝටලයේ අයිතිකාරයෝ ඇවිල්ලා කිව්වා, "හරි වැඩේ නේ, අපට මේක කරන්න බැහැ. අපේ Indian Reserve Bank එක පරණ පන්නයේ Bank එකක්. ශතයක්වත් දෙන්න බැහැ කියනවා ලංකාවේ ආයෝජනය කරන්න. ඒවා ඔක්කෝම අපේ රට ඇතුළේ තියා ගන්න ඕනෑ ලු" කියලා. ඒ පාර මොනවා කරන්නද? එතකොට කිව්වා, "අපි මෙහෙම කරමු. දහස් ගණන් ඉන්දියන්කාරයෝ පිට රට ඉන්නවා; අප්‍රිකාවේ ඉන්නවා; එංගලන්තයේ ඉන්නවා; යුරෝපයේ ඉන්නවා. ඒ ගොල්ලන්ගේ සල්ලි ඇදලා ගනිමු" කියලා. එහෙම කියලා සියයට 60ක් ටාජ් හෝටලයට ගත්තා Non-Resident Indiansලාගෙන්. ඉතින් ඒ විධියට මුදල් සංසරණය වන කොට, ආයෝජනය සඳහා අප මුදල් හොයන කොට මේ විධියේ කටයුතු කරන්න අත්‍යවශ්‍යයි.

දැන් අපි ඉතා ආඩම්බරයෙන් කියන්න ඕනෑ, අපේ රජය කරන මහා පරිමාණයේ ආයෝජන ගැන. කවුරුත් ගත්තේ නැති විධියේ තීරණ අරගෙන අණපනත් මේ ගරු සභාවට ගෙනැල්ලා තිබෙනවා. එකක් තමයි Strategic Investment Law. මේ රටේ ආර්ථිකයට අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවලට මුදල් වැය කරනවා නම්, ඒ වාගේම ඇමෙරිකන් ඩොලර් මිලියන 500, 600, 700 හෝ බිලියනය වැය කරන මහා පරිමාණයේ ව්‍යාපෘති තිබෙනවා නම්, අප ඒකට නොයෙක් විධියේ බදු සහන ලබලා දෙනවා. ඒක ගැන අපි හංගන්නේ නැහැ. නමුත් වෙනස මොකක්ද? අපි ඒ පනත යටතේ ආරම්භ කරන ව්‍යාපෘතිය ගැන මේ ගරු සභාවට යෝජනාවක් ගෙනෙනවා. ගරු සභාවට සියලු දේම හෙළිදරව් කරලා, සභාවේ අනුමැතිය අරගෙන තමයි අප යෝජනාව ක්‍රියාත්මක කරන්නේ. ඒක ලෝකයේ වෙන කිසිම රටක කරන්නේ නැති දෙයක්. පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දීමෙන් ඒ ව්‍යවසායන් අපි ආරම්භ කරනවා. දැනටත් ෂැන්ග්‍රි-ලා එකට, හම්බන්තොට සංවර්ධනයට, Colombo Harbour එකේ Colombo South Port Development Project එකට අපි බදු සහන දීලා තිබෙනවා. තව ඉදිරියේදී දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා බදු සහන දෙන්න ඕනෑ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ සෑම දේටම බදු සහන දෙන්න බැරි එකයි.

BOI එක ආරම්භ කරන කාලයේ ඒ සහන ක්‍රමය අවශ්‍ය වුණා. උපාලි විජයවර්ධන මැතිතුමා යටතේ BOI එක ආරම්භ කරන කාලයේ ඒ වාගේ බදු සහන තිබුණා. ඒ සහන ගන්න අවශ්‍යයි. තවමත් ඒ බදු සහන තිබෙනවා. නමුත් මහා පරිමාණයෙන්, ඇමෙරිකන් ඩොලර් බිලියනයක් යට කරන්න කැමැති කොම්පැනියක් BOI එකේ තිබෙන නීතිරීති යටතේ ලබන බදු සහනවලින් සෑහීමකට පත් වන්නේ නැහැ. ඒ නිසා ඒක ගැන අපි අලුත් විධියට බලන්නට ඕනෑ. සමහරවිට මීටත් වඩා විස්තරාත්මකව අපට මේ ගැන බලන්න වෙනවා.

අපි ගිය සතියේ ගරු ජනාධිපතිතුමා එක්කත් මේ ගැන සාකච්ඡා කළා, විශේෂයෙන් චීනයේ වාගේ සෑම නැව් තොටුපොළක් වටාම development zones, investment zones හදන්න. මොකද, මිනිස්සු ජාත්‍යන්තර වෙළෙඳ පොළට භාණ්ඩ නිෂ්පාදනය කළත්, ඒවා පිට කරන්නට ගුවන් තොටුපොළක් නැත්නම්, නැව් තොටුපොළක් නැත්නම් ඒ අයට ඒ භාණ්ඩවලට මිලක් හදා ගන්න බැහැ. සමහර අය හම්බන්තොට වරායට නැව් එන්නේ නැහැ, අරවා මේවා කිව්වාට, අප ඒ වටා ලොකු ආයෝජන කලාප සහ අපනයන කලාප හදන්නට බලාපොරොත්තු වනවා. ඒ තීරණය අප පසු ගිය දවසේ ගත්තා. සෑම නැව් තොටුපොළක් වටාම විශාල අපනයන කලාප හදන්න, ආයෝජන කලාප හදන්න අපි කටයුතු කරනවා.

මේ බදු සහන ගැන අන්න ඒ පසුබිමෙන් තමයි අපට බලන්නට සිද්ධ වන්නේ. කරුණාකරලා තමුන්නාන්සේලා ඒකට සහයෝගය දෙන්න. මේ සහන සියල්ලේම, මේ හැම එකකම ලකුණ තමයි සංවර්ධනයට මුදල් වෙන් කිරීම. මේ කිසි දෙයක් පරිභෝජනය සඳහා නැහැ. සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, අපේ ගුවන් සේවාවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, ඒ වාගේම අපේ ඖෂධ කර්මාන්තයේ නිෂ්පාදනවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, ඒ සියල්ලක් පිළිබඳ සමස්ත සැලැස්මක් ගැන කල්පනා කරලා, conscious decision එකක් හැටියට තමයි අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ. එහෙම නැතිව මේවා නිකම් ආවාට ගියාට කරන ඒවා නොවෙයි. ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ .භා. 2.36]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින පැවැත්වෙන මෙම විවාදයේ දී ගරු සරත් අමුණුගම අමාත්‍යතුමාගේ කථාවෙන් පස්සේ මටත් වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම භාග්‍යයක්කොට සලකනවා. ඉතාම වැදගත් ආයතනයක් වන අපේ ශ්‍රී ලංකාවේ වරාය සම්බන්ධවත්, ඒ හා සමානවම ඉතාම වටිනා කියන වැදගත් ආයතනයක් වන ගුවන් තොටුපොළ සම්බන්ධවත් බලපාන නියෝගයක් තමයි අද මේ අවස්ථාවේ දී අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සරත් අමුණුගම මැතිතුමා කිව්වා වාගේ මේ ආයතනවල වටිනාකම මේ රටට අතිවිශාලයි. නමුත් අවාසනාව වන්නේ දිගින් දිගටම දිගින් දිගටම පාඩු ලබන, දිගින් දිගටම දිගින් දිගටම අසාර්ථක වන, මහජන මුදල් දිනෙන් දින නාස්ති කරන මෙම ආයතනවලට තව තවත් සහන ලබා දීමයි. එක පැත්තකින් ඒක ආන්දෝලනාත්මක හේතුවක්. මොකද මේවා අතීතයේදී ලාභ ලබපු ආයතන. ඉතිහාසයේ කවදාවත් ලෝකයේ වරායකින් පාඩු වුණාය කියලා අහන්න ලැබුණේ නැහැ.

ලංකාව භූගෝලීය පිහිටීම අනුව ඉතාම වැදගත් රටක්. ලංකාව මේ කලාපයේ hub එකක් හැටියට පත් කර ගන්න පුළුවන් කියන එක අප සියලු දෙනාම එකඟ වන කාරණයක්. නමුත් මේ අවස්ථාවේදී තේරුම් ගත යුතු දේ තමයි අපේ කළමනාකාරිත්වත්, අපේ කාර්යක්ෂමතාවත් පිළිබඳ අතිවිශාල ගැටලු තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 අය වැයට අනුව ඩොලර් මිලියන 100ක් අවුරුද්දක් පාසා වසර පහක් සඳහා SriLankan Airlines ආයතනයට ලබා දෙන්න තීරණය කළා. එහෙම තියෙද්දී මේ අවුරුද්ද මැද තවත් රුපියල් බිලියන 2.28ක් මුදල් අමාත්‍යාංශය විසින් SriLankan Airlines ආයතනයට ලබා දුන්නා. මේ විධියට දිගින් දිගටම මුදල් ලබා දෙනවා. අවසාන වරට SriLankan Airlines ආයතනය ලාභයක් ලැබුවේ 2008 දී, මිලියන 4,428ක්. නමුත් 2009 දී මිලියන 9,996ක්, 2010 දී මිලියන 6,034ක්, 2011 මිලියන 3,054ක් අලාභ ලබා තිබෙනවා. පුදුම කරුණ වෙන්නේ මේ SriLankan Airlines ආයතනයේ 2009 දී හිටපු staff එකට වඩා අද staff එකත් වැඩි වෙලා තිබෙන එකයි. එදා හිටියේ සේවකයන් 4,969 දෙනයි. නමුත් අද වන කොට ඒ ප්‍රමාණය 5,900ට වැඩි වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ ඒ ආයතනයට සේවකයෝත් වැඩියෙන් අරගෙන තිබෙනවා; තවත් බර වැඩියෙන් දාගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අනුව කල්පනා කරන කොට මේ ආයතන තව තවත් බදුවලින් නිදහස් කිරීමේ තේරුම මොකක්ද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. අපි දකිනවා අනවශ්‍ය, අසාධාරණ නාස්තියක්, දූෂණයක් මේ ආයතනවලින් සිදු වන බව. ඒකට මූලික වශයෙන් වග කියන්න ඕනෑ මේ ආණ්ඩුවයි. පසු ගිය දවසකදී -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේවා ඒ ආයතනයට දෙන සහනයක් නොවෙයි, ඒ සඳහා ගෙනෙන යම් යම් භාණ්ඩවලට දෙන සහනයක් පමණයි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
අනිවාර්යයෙන්ම.

මේ ආයතනවලට වෙලා තිබෙන පාඩුව සහ රජය ඒ ආයතන පාඩුවට දමලා තිබෙන හේතුවත් මේ එක්කම කියන්න ඕනෑ. ඔබගේ නායකයෝ මේ SriLankan Airlines ආයතනයේ යානා තමන්ගේ පෞද්ගලික යානා ලෙස පරිහරණය කරනවා කියලා අප සියලු දෙනාම දන්නවා. අපට තිබෙන්නේ ඉතාම පොඩි සම්පත් කීපයක්. අපට ගුවන් යානා කීපයයි තියෙන්නේ. Roster වෙලා තියෙන ගුවන් යානාවක් අරගෙන සතියකට රටින් පිට යන කොට ඒ සම්පූර්ණ කාල සටහන වෙනස් වෙනවා. ඒ නිසා කෝටි ගණනක පාඩුවක් වනවා. බ්‍රසීලය වාගේ රටකට යන කොට staff set තුනක් අරගෙන යන්න ඕනෑ. ඒ වාගේ ගමනක් යනකොට fly කරන්න පුළුවන් hours ගණනක් තිබෙනවා. සීමිත පැය ගණනට පස්සේ staff එක බස්සවන්න ඕනෑ. බස්සලා ඒ වෙනුවට වෙන කණ්ඩායමක් නඟින්න ඕනෑ. එහෙම යන කොට එක කණ්ඩායමක් ස්පාඤ්ඤයේ බැස්සුවා. එන කොට එක කණ්ඩායමක් South Africaවල බැස්සුවා. ඊට පස්සේ ඒ ගොල්ලන් එන්න ඕනෑ, ticketsවලට යන මුදල් අතින් ගෙවා ගෙනෙයි. ඒවා අතිවිශාල නාස්තියක්. මේ විධියට අතිවිශාල මුදල් කන්දරාවක් නාස්ති කිරීම මහා පාපයක්.

මේ දවස්වල ආන්දෝලනාත්මක සුරතල් බලු ප්‍රශ්නයක් ගැනත් පත්තරවල තිබෙනවා. බල්ලෝ ගෙන්වා ගන්නත් සමහර යානා භාවිත කළා; යානා වර්ගය වෙනස් කළා කියන කථා අහන්න තියෙනවා. මේවා සහගහන අපරාධ. මේ ආණ්ඩුව මේ ආයතනය අමු අමුවේ විකුණා දමන තත්ත්වයකට පත් කරලා තියෙනවා, මේ ආයතනවල කරන අසාධාරණ වැඩ නිසා.

මේ ආයතන මෙච්චර පාඩු ලබනවා. හැබැයි සමහර දේවලට අනුග්‍රාහකත්ව දෙනවා. හරිහරන් නමැති සිංදු කියන පුද්ගලයා ලංකාවට එනකොට එයාව නොමිලේ ගෙන්වනවා; රගර් ගහන්න කොණ්ඩ කණ්ඩායමක් එන කොට ඒ ගොල්ලන්ව නොමිලේ ඒ ගුවන් යානාවලින් ගෙනෙනවා. ඉතින් මේ ආයතන ලාභ ලබයිද? මේ ආයතන ලාභ ලබන තැනකට ගෙන යන්න පුළුවන් හැකියාවක් කවදාවත් තියෙයිද? ඒ වාගේම ස්විට්සර්ලන්තයේ සූරිච්වලට යන flight එක නවත්වලා මොස්කව්වලට හරවන්න යනවා. මේවාට හේතුව මොකක්ද? මේ ප්‍රතිපත්තිවල ප්‍රශ්නයක් තියෙනවා. ස්විට්සර්ලන්තයේ ඉඳලා අතිවිශාල සංචාරකයෝ පිරිසක් ආපු flight එකක් නවත්වලා, මොස්කව්වලට යවන්න හදනවා.

මේවා හරි අපරාධ වැඩ. ඒ විතරක් නොවෙයි. පත්තර, පොත්පත් කියවනකොට ඒවායේ පළ වෙලා තිබෙන දේවල් දකිනකොට තවත් තිත්ත වෙනවා. SriLankan Airlines ආයතනයේ වැඩ කරන සේවිකාවක් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ළඟ වැඩ කරනවා. රැකියාව තියා ගන්න ඕනෑ නිසා මාසයකට දවසක් flight එකට යනවා. ඉතිරි දවස් ටික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්යාලයේ වැඩ කරනවා. ඉතින් මෙවැනි ආයතන හැදෙයිද? මෙවැනි ආයතන හැදෙන්න හැකියාවක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි සිට මැයි දක්වා මාස පහකට වරාය සහ ගුවන් සේවා සංවර්ධන බද්දෙන් ලැබුණු ආදායම රුපියල් කෝටි 2,800යි. ඒ කියන්නේ බිලියන 28ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මෙය පසු ගිය අවුරුදු පහත් එක්ක බලනකොට සියයට 15ක වැඩි වීමක්. ඒක ඉතාමත්ම හොඳයි. අපි කියනවා, වරායවල් සංවර්ධනය වෙන්න ඕනෑ; ගුවන් තොටුපළවල් සංවර්ධනය වෙන්න ඕනෑ කියලා. නමුත් අප මතක තබා ගන්න ඕනෑ, ඒවායින් ආදායමකුත් ලැබෙන්න ඕනෑය කියන

කාරණය. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, මේවා තමයි ආණ්ඩුවේ ප්‍රතිපත්ති කියා. ඔව්, රටක් සංවර්ධනය කිරීම ගැන අපි සියලු දෙනාම එකඟයි. නමුත් එයින් රටට ප්‍රතිඵලයක් ලැබෙනවාද, ණයට මුදල් අරගෙන ආයෝජනය කරන එකෙන් අපට ලාභයක් තිබෙනවාද කියන බැරෑරුම් ප්‍රශ්න අප තුළ ඇති වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද අපේ සම්පූර්ණ බදු ආදායමෙන් සියයට 7.1ක් වෙනවා. ඒක ඉතාමත් සැලකිය යුතු බදු ප්‍රමාණයක්. සාමාන්‍යයෙන් ගුවන් සේවා සමාගමකින් බදු ගත යුතුයි; ලාභ ලැබිය යුතුයි. ජාතික ගුවන් සේවාවකින් දිගින් දිගටම අලාභ වීමට හැකියාවක් නැහැ. මෙසේ අලාභ වීමට මූලික හේතුව දේශපාලනයයි; මේ ගුවන් යානා තමන්ගේ පෞද්ගලික පරිහරණයට යොදා ගැනීමයි. මම නම් කියන්නේ මේ කාරණයයි. කිසිම ප්‍රශ්නයක් නැතිව අපත් ඒකට එකඟයි. ඇමෙරිකාවේ "Air Force One" වාගේ "Mahinda One" කියා එකක් හදා ගන්න. Plane එකක් ගන්න. තව Mihin Air එකක් හදා ගෙන ඒකේ මුහුණක් දමලා, වටේට සාටකයක් දමලා කෙළින්ම ගමන් යන්න ඒක තියා ගන්න. කට්ටියත් එක්ක යනකොට විමල් වීරවංශ ඇමතිතුමාට පිටුපස්සට වෙලා සින්දු කියන්න පුළුවන්; බයිලා කියන්න පුළුවන්. බජව්වක් දමා ගෙන යන එකයි තිබෙන්නේ.

SriLankan Airlines ජාතික ගුවන් යානා මෙහෙම නාස්ති කරන්න එපා. අද රටේ මිනිස්සුන්ට ජාතිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඉස්සර Air Lanka කිව්වාම රටේකමට ඒවායේ නැඟලා යනවා. අද මිනිස්සු එහෙම රටේකමට ඒ planeවලට නඟින්නේ නැහැ. මේ කරන මුදල් නාස්තියට මිනිසුන් තුළ ඒ තරමටම වෛරයක් තිබෙනවා. සේවාවත් අන්තිම සවුත්තුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගැනත් කථා නොකරම බැහැ. [බාධා කිරීමක්] අපි නරක නිසා නේ තමුන්නාන්සේලා එවා තිබෙන්නේ. තමුන්නාන්සේත් SriLankan Airlines එකේ වැඩ කරපු පුද්ගලයෙක් නේ. "ශ්‍රී ලංකා වරාය අධිකාරිය" මම ඉතාමත් ආස කරන මාතෘකාවක්. මම හිතනවා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය අලාභ ලබන්න පටන් අරගෙන තිබෙනවා කියලා. තව කාල වකවානුවක් යනකම් මේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය දිගින් දිගටම අලාභ ලබන ආයතනයක් බවට පත් වෙනවා නොඅනුමානයි. මේ ආණ්ඩුව වැටෙන දවස වෙනකම් ඒ ආයතනයට ලාභ ලබන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මම ඒකට හේතුවත් කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොළඹ වරායේ SAGT හා JCT කියලා පර්යන්ත දෙකක් තිබෙනවා. JCT පර්යන්තයේ පරිපාලන කටයුතු කරන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියයි. SAGT පර්යන්තයේ පරිපාලන කටයුතු කරන්නේ ජෝන් කීල්ස් සමාගම සහ P & O සමාගමයි. SAGT පර්යන්තයේ එහෙම නැත්නම් පෞද්ගලික අංශයෙන් පාලනය කරන පර්යන්තයේ ඉන්නේ සේවකයන් 620යි. නමුත් කාර්යක්ෂමතාව - productivity එක- බැලුවොත් අවුරුද්දකට container TEUs මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් මෙහෙයවනවා. JCT පර්යන්තයේ එහෙම නැත්නම් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් පාලනය වන පර්යන්තයේ සේවකයන් 14,000ක් ඉන්නවා. ඒත් මෙහෙය වන්නේ මිලියන දෙකක containers ප්‍රමාණයම තමයි. මෙතැන මහ ලොකු පරස්පරයක් තිබෙනවා. වැඩිපුර 12,000කට වැඩි පිරිසක් සේවය කරන තැනිනුත් එකම කාර්යක්ෂමතාව තමයි ලැබී තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා. දැන් කියනවා, අතිවිශාල සංවර්ධනයක් වෙනවාය; නැව් විශාල වශයෙන් එනවාය; මේ වරාය ඉතා ඉක්මනින් දියුණු වෙනවාය කියා.

මම අහගෙන හිටියා, මගේ ආදරණීය මිත්‍ර මන්ත්‍රීවරයෙක් අපට බණිනවා. අපට බඩේ අමාරුවලු. දැන් නැව් ගලා ගෙන ගලා ගෙන එනවා; නැව් අටක් ආවාය කියනවා. මෙවැනි කරුණු කාරණා රාශියක් රූපවාහිනී මාධ්‍ය හරහා කිව්වා. මම ඒකට හොඳ උත්තර ටිකක් දෙන්නම්. 2011 මැයි මාසය වෙනකොට ලංකාවට නැව් 364ක් ඇවිල්ලා තිබුණා. 2012 මැයි වෙනකොට ඇවිල්ලා තිබෙන්නේ නැව් 346 යි. ආපු නැව් ප්‍රමාණයෙනුත් නැව් දහඅටක් අඩු වෙලා තිබෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, ලංකාවේ තිබෙන්නේ transshipment-based business එකක්. ලංකාවේ import and export එක බොහොම අඩුයි. වැඩි හරියක් තිබෙන්නේ transshipments. ඔබතුමා කිව්වා, අද අපට තරගකාරිත්වයක් තිබෙනවාය කියා. ඉන්දියාවේ වල්ලාර්පඩම්, කොච්චින්, චෙන්නායි ආදී මේ සියලු වරායයන් හැදී ගෙන එනවා. Public-Private Partnership එකට ගිහින් තිබෙනවා. PSA Singapore එකෙන් එහෙම නැත්නම් DP World එකෙන් තමයි ඒවා පරිපාලනය කරන්නේ; ඒවායේ management එක කරන්නේ. ඒවායේ ඉතාමත් හොඳ කාර්යක්ෂමතාවක් තිබෙනවා. කොහොමද මේ transshipments ටික රටේ රඳවා ගන්නේ කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉදිරි කාලයේදී අපට ලොකු අභියෝගයක් තිබෙනවා.

සංවර්ධනය කෙරෙනවාය කියා කෑ ගැහුවත්, හම්බන්තොට වරාය හදද්දී මොනවාද කිව්වේ? හම්බන්තොට වරායෙන් නැව් 400ක් එහා මෙහා යනවා; ඕනෑ වෙලාවක අපේ වරාය ඇතුළට නැව් එනවා කියලා කිව්වත්, 2012 මැයි මාසය වන තුරු එකම නැවයි ඇවිත් තිබෙන්නේ. ඒකත් ඇමතිතුමා අපට පෙන්වන්න ගෙනැවිත් හරවාගෙන ගිය නැවයි. ඒ නැව තමයි ඇවිත් ගියේ. කිසිම දෙයක් බැවේ නැහැ. කිසිම දෙයක් කළේ නැහැ. අදටත් හම්බන්තොට වරායට රේගුව; එහෙම නැත්නම් ආගමන විගමන අවශ්‍යතා සඳහා ගාල්ලෙන් ගෙන්වන්න ඕනෑ. ගාල්ලෙන් tug vessel එක ගෙනෙන්න ඕනෑ. අද වන තුරු හම්බන්තොට වරායට tug vessel එකක්වත් නැහැ. වරාය විවෘත කළේ 2010 නොවැම්බර් 18වන දා. දැන් එතකොට අවුරුදු කීයද? මාස 20ක් කිට්ටු වෙන්න ගිහින් තිබෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, මේ සංවර්ධන කටයුතු ණයට කළේ කියා. අවුරුදු 11ක ණයක් අවුරුද්දක grace period එකක්. දැන් ණය ගෙවන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ ඇමතිතුමා මාත් සමඟ එකඟ වෙයි. පළමුවන නැව අවේ 13 වනදා. ඒක Ro/Ro නැවක්. "MV Cygnus Leader" කියන නැව තමයි ඉස්සෙල්ලාම ආවේ. ඇවිත් බාපු වාහන මොනවාද? පළමුවන වතාවේ 715යි. දෙවන වතාවේ 900යි. ඊට පසු 800යි; 795යි; 500යි; 1,700යි. Transshipments සමඟ වාහන ඔක්කොම 5,400යි. වරායේ වාහනයක් බාන කොට කොහොමද ආදායම එන්නේ? අපි ආදායම ගණනය කර බලමු. වාහනයක් දවස් 14ක් තිබුණොත් අය කරන්නේ 6,000යි.

මොකද, හම්බන්තොටට එනවාට මෙතුමන්ලා ලොකු discount එකක් දෙනවා. නැව් ආයතනවලටත් සියයට 20ක discount එකක් දෙනවා. සාමාන්‍යයෙන් නැවක කාර්ය පටිපාටිය ආදී සියලු දේ කරන්න ඩොලර් 20,000ක් විතර යනවා. ඒකටත් සියයට 20ක discount එකක් දෙනවා. නැව් 8කට ගණන් හදලා බැලුවොත් වාහන 5,000 බාන්න රුපියල් 5,000 ගණනේ charge වෙලා තිබුණොත් දවස් 14ක් දෙනවා. දවස් 14ට පසුව තමයි වැඩිපුර ගණනක් ගහන්නේ. ඒත් වාහන ටිකෙන් මාසයකට මිලියන 25ක් විතර තමයි එකතු කරන්න පුළුවන් වන්නේ. නැව් 8 ඩොලර් 20,000න් වැඩි කර ගත්තත් ගන්න පුළුවන් වන්නේ මිලියන 50යි. වරාය හදන්න පමණක් පළමුවන අදියරේදී -ගල නාගන්න ඉස්සෙල්ලා, ගල අපි පෙන්වා දෙන්න ඉස්සෙල්ලා, නැහැයි කියපු ගල කඩන්න ඉස්සෙල්ලා- ඩොලර් මිලියන 360යි ගියේ. ගල කඩන්න සහ නැවත වරක් re-design කරන්න, breakwater system හදන්න ඔක්කොමත් සමඟ තව ඩොලර් මිලියන 149ක් ගියා. ඔක්කොම ඩොලර් මිලියන 500යි. අපි සාමාන්‍ය විධියට ගණන් හදලා බැලුවොත් කෝටිවලින් ගත්තොත්

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

කෝටි 7,000යි. මිලියන 70,000යි. ඒකට සියයට 6.3ක interest එකක් තියෙනවා. මාසයකට ණය වාරිකය නැතුව පොලිය පමණක් අඩුම ගණනේ මිලියන 800ක් විතර වෙනවා. පොලිය විතරක් මිලියන 750ක් 800ක් වෙනවා. නැව් 8න් අද වන තුරු ඇවිත් තිබෙන්නේ මිලියන 50යි. මීට වඩා හොඳයි සයිකල් වින්කලයක් දමා ගත්තා නම්. [බාධා කිරීමක්] වික්‍රම මහත්මයාට කියලා - [බාධා කිරීමක්] ඔබතුමා කෑ ගහන්න එපා. ඔබතුමාටත් වින්කලයක් දමා දෙයි. ඊට වඩා හොඳයි සයිකල් වින්කලයක හුළං ගැහුවා නම්. සයිකල් වින්කලයක හුළං ගැහුවා නම් මීට වඩා ලාභයක් හම්බ වෙනවා. රටේ මිනිසුන් දිගින් දිගටම රවටන්න හදන්න එපා. ලාභ නැතුව අසාධාරණ ලෙස මුදල් නාස්ති කරමින් මේ ව්‍යාපෘති කිරීම අතිවිශාල අපරාධයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තේරුම් අරගෙන බලන්න. ඒ විතරක් නොවෙයි. හම්බන්තොට වරායේ Ro/Ro vessels වලට මේ දවස්වල ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒක පිළිගනීවිද දන්නේ නැහැ. මේ Ro/Ro vessels කන්ටේනර්වල නොවෙයි එන්නේ. පදවාගෙන තමයි එළියට බාන්න ඕනෑ. වාරකන් කාලයට අනිවාර්යයෙන්ම ප්‍රශ්නයක් ඇති වන්න ඉඩක් තිබෙනවා. වාරකන් කාලයට මුහුදේ වලනය වැඩි නිසා මේ Ro/Ro vesselsවලට ගැටලුවක් වෙන්න පුළුවන් කියා විශේෂඥ පුද්ගලයෝ ප්‍රකාශ කර තිබෙනවා. මේවා ගැන අවධානයක් යොමු කරන්න වෙනවා. ඔබතුමා කියනවා වාගේ industrial zone එකක් හදනවා. ඒ දෙවන අදියරේදී. ඒ දෙවන අදියරට - Second Phase එකට- තව ඩොලර් මිලියන 800ක් යනවා. First Phase එකේ ඕවා තිබුණේ නැහැ.

This is not a container port. This is going to be a bunkering port. That was the initial idea. Even the UNP had the same vision. Our vision was to make it an industrial port as well as a bunkering port.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
But, not to spend this much.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
Not to spend this much. Today, we are making constructive criticism. We are not criticizing with animosity or personal vengeance against anybody.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙලාවේදී තේරුම් ගත යුතු මූලිකම දේ තමයි මේ රටේ නාස්තිය, දූෂණය, වංචාව අඩු කරන්නේ නැතුව කිසි දෙයක් කරන්නට හැකියාවක් නැහැයි කියන එක. මතක තියා ගන්නට ඕනෑ, අද ලංකාව පූදුම රටක් බව. මේ තරම් දූෂණ වෙනවා, මේ තරම් සල්ලි හොරකම් කරනවා, මේ තරම් වංචා කරනවා. අද පත්තරේ බැලුවාමත් තියෙනවා, අවුරුදු 6ක දැරියක් දූෂණය කරලා පයිප්පයක් අස්සේ දාලා ගිහිල්ලා කියලා. [බාධා කිරීමක්] හැබැයි, ලංකාවේ ඉන්න ඇමතිවරුන්ගේ, මේ වාගේ කෑ ගහන ඇමතිවරුන්ගේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ websites. පොලීසිය යොමු කරන්නේ websites අල්ලන්න. පොලීසිය යොමු කරන්නේ websites පසු පස යන්න මිසක්, ජුලම්පිටිය අමරේගේ cases -සිය දහස් ගණනක් තිබුණා.- වාගේ ඒවා අල්ලන්න නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. රටක විනයක් තිබෙන්නට ඕනෑ. එහෙම නැති නිසා තමයි පරිපාලනයේ විනය නැත්තේ. නැත්නම් සුරතල් බල්ලාව plane එකෙන් ගෙන්වා ගනීවියැ. සුරතල් බල්ලා plane එකෙන් ගෙන්වනවා. අඩුම තරමින් ඔබතුමාටවත් ඒ විධියේ වාසනාවක් තිබෙනවාද ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි? බල්ලාට තිබෙන සැප නැහැනේ. [බාධා කිරීමක්] ඔබතුමා කෑ ගැහුවාට ඔබතුමාට ඒ වාසනාවවත් නැහැනේ. [බාධා කිරීමක්] ඔබතුමා ඔය කෑ ගැහුවාට වැඩක් නැහැනේ. සද්දේ විතරයිනේ ඔබතුමාගේ. ඔය කෑ ගැහුවාට සද්දේ විතරයිනේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ගරු සරත් අමුණුගම මැතිතුමා Southern Port එක ගැන කථා කළා. හොඳයි. Southern Port එක දියුණු වන එක හොඳයි. නමුත්, ඉස්සෙල්ලාම ඒක කරන්න හිටියේ Aitken Spence ආයතනය. අන්තිමට Aitken Spence ආයතනය ඒක දාලා ගිහිල්ලා Chinese company එකකට ඒක භාර දුන්නා. දැන් ඒ වැඩේ ඉදිරියට කර ගෙන යන්න Chinese company එක ඉදිරිපත් වෙලා තිබෙනවා. මේක Build-Operate-Transfer. ඒ කියන්නේ වැඩේ කරලා, අවුරුදු ගණනක් ඒකෙන් හම්බ කරලා ඊට පස්සේ අපට දීලා යනවා. මේ කියන්නා වූ සංවර්ධනයෙන් එක පාරටම මේ ආර්ථිකයට, එහෙම නැත්නම් වරායට ලාභයක් හොයන්න බැහැ. හොඳක් තිබෙනවා. ඒක සම්පූර්ණයෙන් අපට අයිති වෙනවා, ඒකේ සම්පූර්ණ වැඩසටහන අපට අයිති වෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
කාලීන සේවා සැපයුම වෙනුවෙන් වෙන් කරනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
කාර්යක්ෂමතාව වාගේම කාලයක් යන කොට ඒ business එකට යොමු වීමේ හැකියාව අපට තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් අපි මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ, මේ රටේ මුදල් දිගින් දිගට, දිගින් දිගට නාස්තිකාර වැඩසටහන්වලට යොදවනවා වෙනුවට, බල්ලෝ ගෙන්වන්න, එහෙමත් නැත්නම් බජව් දාන්න plane අරන් යනවා වෙනුවට, මේ රටේ කවුරුවත් සනසන්න වරායවල් හදනවාට වඩා, රුපියල් කෝටි ගණන් මුදල් වියදම් කරලා ඒවාට ණය පිට ණය ගෙවලා මේ රටේ ඉන්න අහිංසක අසරණ දුප්පත් දුගී ජනයා තව තවත් දුප්පත් කරන්නේ නැතුව, සම්පූර්ණ සාධාරණ වැඩසටහන්වලට,තමන්ගේ හීනමානය සනසා ගන්නා වැඩසටහන්වලට යන්නේ නැතිව ප්‍රායෝගික වැඩසටහන්වලට යොදවන ලෙසයි. ඒ වාගේම මේ රටේ අනාගතය වෙනුවෙන් නොයෙකුත් විනාශකාරී වැඩ කරන්නේ නැතිව රටේ සංවරත්වය රැකලා දෙන්න මූලික වශයෙන් කටයුතු කරන්න. හොරකම් කරන කොම්පැනිකාරයින්ට තවත් හොරා කන්න ඉඩ දෙන්න එපාය කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.54]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් සභා ගැබේ සිටියා නම් හොඳයි. එතුමා මේ නියෝගය ගැන ඉස්සෙල්ලාම කථා කරන්න දාපු මන්ත්‍රීතුමාගේ කථාවට දෙන පිළිතුර අහගන්න තිබුණු අවස්ථාව එතුමාට අහිමි වෙනවා. එතුමා මෙම සභාවෙන් පිට වෙලා යන එක ගැන මා අසතුට ප්‍රකාශ කරනවා. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාව තමයි පළමුවෙන්ම මේ නියෝග ගැන කථා කරන්න එක්සත් ජාතික පක්ෂය නම් කරලා තිබෙන්නේ.

සාමාන්‍යයෙන් අපි ගත්තොත්, අපේ රටේ සම්ප්‍රදාය අනුව ඉතිහාසය හා සංස්කෘතිය දිහා බැලුවාම අපේ රටේ පෙරහැරක් ගත්තාම ඒ පෙරහැර බලන්න ආපු ජනතාව හැම වෙලාවේම මුලින්ම දකින දෙයක් තිබෙනවා. පෙරහැරක් එන කොට මොකක්ද පෙරහැරේ තිබෙන පළමුවැනි අංගය? කසකාරයෝ, මල් ගස්, බෙරකාරයෝ. එහෙම තමයි පෙරහැර ස්ථානගත කරලා තිබෙන්නේ අපේ රටේ සම්ප්‍රදාය අනුව. සමහර පෙරහැරවල්වල අන්තිමට යනවා කාවඩිකාරයෝ. සමහර වෙලාවට ඒ අය පොඩි "ෂොට්" එකක් දාගෙනත් යනවා කාවඩි බෙර ගගහා. ඒ වාගේ අය තමයි අද මේ නියෝග ගැන කථා කරන කොට මුලින්ම ආවේ. කසකාරයෝ, මල් ගස්, ඇත්තු කවුරුත් නැහැ, කාවඩිකාරයෝ ආවා වාගේ තමයි මේ කථාව අහගෙන හිටියාට පස්සේ අපට දැනුණේ. මම හිතන හැටියට ඒ වෙලාවේ පාසල් දරුවෝත් හිටියා.

ගරු සරත් අමුණුගම ඇමතිතුමා මේ පනත යටතේ නියෝගය මඟින් බදු නිදහස් කරන භාණ්ඩ ගැන, ඒ තුළින් රටට ලැබෙන ආදායම ගැන, රටේ ඉදිරි සංවර්ධනය වාගේම ඉදිරි ගමන ගැන පැහැදිලි කිරීමක් කළා. මා නියෝජනය කරන අමාත්‍යාංශයට අදාළ වරාය ගැන කියද්දී හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දිගින් දිගටම ගණන් හදා පෙන්වූවා, හම්බන්තොට වරායේ පළමුවන අදියරට ගිය ඩොලර් මිලියන ගණන. ඒ ඩොලර් මිලියන ගණන ගණන් හදා ඊට පස්සේ කිව්වා, මේ වරායට නැව් ආවාය කියලා. ඒකේ වාහනයකට රුපියල් 5,000ක් අය කළාය කියලා එතුමා ගණනකුත් එකතු කළා. එහෙම එකතු කරලා ඒ ගණන හදා පෙන්වා කියනවා, "මේකද ලාභය? මීට වඩා හොඳයි චින්කලයක් දැම්මා නම්" කියලා. එතුමාගේ මනසේ තිබෙන්නේ ලාභ ලබන ආයතන ගැනයි. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ මනසේ තිබෙන්නේ ලාභ ලබන ආයතන ගැනයි. ඔව්, මේ රටේ පෞද්ගලික අංශයේ ලාභ ලබන ආයතන තිබෙනවා.

හොඳ bar එකක් දැම්මොත් ලාභ ලබන්න පුළුවන්. ගංජා, අබින් විකුණුවොත් ලාභ ලබන්න පුළුවන්. මොකක්ද, හේතුව? ඒකෙත් ඔය කියන විධියට ගණන හදන්න හරි ලේසියි; කරදරයක් නැහැ. ගෙනාපු ගල් බෝතල් සංඛ්‍යාව මෙච්චරයි, ගෙනාපු Old Arrack බෝතල් සංඛ්‍යාව මෙච්චරයි, ඒකෙන් එක බෝතලයක් විකුණුවාම ලැබෙන මුදල මෙච්චරයි කියලා ගණන් හදනවා. අයිතිකාරයාට තිබෙන්නේ සවසට ඇවිල්ලා, "තමුසේ බෝතල් 1,000ක් විකුණා තිබෙනවා. බෝතල් 1,000ට වැඩිපුර විකුණපු ගණන මට දෙනවා" කියන එකයි. එහෙම නැත්නම් හදන කොම්පැනිය නැතුව වෙන කොම්පැනියකින් එකතු කළොත් ලාභය වැඩියි. අර කොම්පැනියෙන් ගන්න ඕනෑ නැහැ. DCSL එකෙන් ගන්න ඕනෑ නැහැ. ඉතින් එහෙම මානසිකත්වයක නම් ඉන්නේ, රටක දැවැන්ත ව්‍යාපාරයක් වූ වරායක් සංවර්ධනය කරන දිහා බලන්නේ ඒ bar විධියට, අබින් විධියට, ගංජා විධියට නම්, ඉතින් කාවඩි මුලින් ඇවිල්ලා තිබෙනවාය කියා මා කියපු එක වැරැදිද? පෙරහැරේ මුලින් එන්න තිබෙන ඒවා පැත්තක තියලා කාවඩි ආපු ක්‍රමය නේ මේ උගන්වන්න හදන්නේ.

එතුමාට මා පිළිතුරු දෙන්නම්. එතුමා අද ඊයේ නොවෙයි, මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය හදන්න පටන් ගත්ත කාලයේ එතුමාගේ විපක්ෂ නායකතුමාත් එක්ක එකතු වෙලා කිව්වා, "ගොඩ බිම වළක් හාරනවා"යි කියලා. මුලින්ම කිව්වේ එහෙමයි. ඒක හාරන දිහා බලා ගෙන ඉඳලා කිව්වා, "අන්න, අලුතින්ම ආසියාවේ මහා පිහිනුම් තටාකය හැදුවා"යි කියලා. මේකේ පීනන්න විතරයි පුළුවන් කියලා කිව්වා. ඊට පස්සේ කිව්වා, "මේකට වතුර පිරෙයිද කියලා සැකයක් තිබෙනවා"යි කියලා. මා කිව්වා, "වතුර පිරෙන හැටි පෙන්වන්න, ඒවා ගැන බලන්න එහේට එන්න"යි කියලා. කිසි දවසක ආවේ නැහැ. ඊට පස්සේ කිව්වා, "මහා ගලක් මේක ඇතුළේ තිබෙනවා"යි කියලා. මේ වරාය සුදු අලියෙක් කියලා කිව්වා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
තිබ්බේ නැද්ද, ගලක්?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේක කිසි දවසක ක්‍රියාත්මක කරන්න බැරි අසාර්ථක ව්‍යාපෘතියක් කියලා කිව්වා. කිසි දවසක නැව් එන්නේ නැහැයි කියලා කිව්වා. එතුමා කියපු ඒ ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. මා ඒ හැන්සාඩ් වාර්තා ගෙනාවා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශයන් අඩංගු හැන්සාඩ් වාර්තා තිබෙනවා. ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කර තිබෙනවා, මේ හම්බන්තොට වරායට කිසි සේත් නැව් එන්න බැහැයි කියලා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගල තිබෙද්දී කොහොමද එන්නේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේ වරායට නැව් එන්න බැහැ, මෙය කවදාවත් රක්ෂණයක් ලැබෙන්නේ නැති වරායක්, මෙයට කිසි සේත්ම -[බාධා කිරීමක්] මා ඔබතුමාට බාධා කළේ නැහැ. මා අහගෙන සිටියා. මා ඔබතුමාට වෙලාවක් දෙන්නම්. පොඩ්ඩක් ඉන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මා කිව්වේ, ගල තිබෙද්දී නැව් එන්න බැහැ කියලායි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හරි. ඒකටත් උත්තර දෙන්නම්. දැන් මේ ගල් සංකල්පය ඔළුවෙන් යවන්න බැහැ නේ. මේ ගල් සංකල්පය පක්ෂයෙන්ම එන සංකල්පයක්. දැන් ඔය තිබුණාය කියන ගල -ගලක් තිබුණා නම්- කැඩුවා වුණත් එතුමාගේ ඔළුවෙන් ඒ ගල යන්නේ නැහැ. ඇයි? ඒ ගොල්ලන්ගේ ඒ සංකල්පය තිබෙනවා. ඒ ගොල්ලන්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පාෂාණ යුගයට අයිති කට්ටිය. මේ රටේ මෙවැනි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක් ගැන හැම දාම වෛරයෙන්, ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන්, දේශපාලනික වශයෙන් තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය මුල් කර ගෙන තමයි කථා කළේ.

එහෙම කිව්වා. අපි ඒ විවේචනවලට උත්තර දුන්නා; ඒ විවේචන පිළිගත්තා. අපි විවාදවලට එන්න කියලා කිව්වා; විවාදවලට මුහුණ දුන්නා. අද වන විට මම එතුමා ගැන සතුටු වනවා, එතුමා මගේ අමාත්‍යාංශයේ මාධ්‍ය ප්‍රකාශක වීම ගැන. මම අහ ගෙන හිටියා, ආපු නැව් ටිකයි, ඒවායින් ගෙනාපු වාහන සංඛ්‍යාව ගැනයි එතුමා බොහොම හොඳට කිව්වා. මගේ මාධ්‍ය ප්‍රකාශක වාගේ, නැව් 8ක් ආවා, නැව ආවේ කොහේ ඉඳන්ද, නැවෙන් ගෙනැල්ලා බෑවේ මොනවාද කියලා කිව්වා. එතුමා මේවා කියන ගමන් මේ සභාව තුළ වැරදි තොරතුරු ටිකකුත් කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කිව්වා ප්‍රතිඅපනයනය ගැන. විශේෂයෙන් මුහුදෙන් වට වුණු රටක ජීවත් වන මිනිසුන් හැටියට වරායන් කෙරෙහි, නාවික ක්ෂේත්‍රය කෙරෙහි අපේ දැඩි අවධානයක් යොමු වෙන්න ඕනෑ. අවුරුදු 30ක යුද්ධයත් එක්ක එහාට ගිය ඉතිහාසයේ එහෙම අවධානයක් යොමු වෙලා තිබුණේ නැහැ. ඒ, යුද්ධය නිසා වෙන්න පුළුවන්; නොයෙක් ආණ්ඩුවල ක්‍රියා කලාපය නිසා වෙන්න පුළුවන්. ඉතිහාසයේ නොදියුණු කාලයේ සේද මාවත ඔස්සේ ලෝකයේ නැඟෙනහිර සහ බටහිර රටවල් 62ක් අපේ නැංගුරම් පොලවල් සහ තොටවල් හරහා අපත් එක්ක ගනුදෙනු කරලා තිබෙනවා. හැබැයි ඊට පසුව කොළඹ වරායට විතරක් සීමා වෙලා සිටියා මිසක කොළඹ වරායේ ගෙන යන වැඩ පිළිවෙළට එහා යන යමක් ගැන හිතන්න වෙලාවක්, ඒ ගැන යොමු වෙන්න වෙලාවක් මේ රටේ කිසිම නායකයෙකුට තිබුණේ නැහැ; එහෙම යොමු වීමක් කරලා තිබුණෙත් නැහැ.

නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ශ්‍රී ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ වැඩ පිළිවෙළ තුළින් මේ රටේ වරායන් 6ක් දියුණු කිරීමේ වැඩ සැලැස්ම ක්‍රියාත්මක කළා. එසේ ක්‍රියාත්මක කළ නිසා තමයි තමුන්නාන්සේට ප්‍රතිඅපනයනය ගැන කියන්න පුළුවන් වුණේ. ප්‍රතිඅපනයනය ගැන කථා කරන විට මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. 2011 වර්ෂයේ -පසු ගිය අවුරුද්දේ- කොළඹ වරාය වාහන 562යි ප්‍රතිඅපනයනය කරලා තිබෙන්නේ. කොළඹ වරාය මුළු අවුරුද්දටම වාහන 562ක් ප්‍රතිඅපනයනය කරන විට, මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායෙන් මේ මාස දෙකහමාර තුළ අපි වාහන 2,553ක් ප්‍රතිඅපනයනය කරලා තිබෙනවා. තමුන්නාන්සේට දීපු යම් යම් කොළ කෑලිවල, ගණන් මිනුම්වල ප්‍රශ්න තිබෙනවා නම්, ඒ දීපු තොරතුරු සනාථ කර ගැනීමට අවශ්‍ය නම් මගේ මිත්‍ර මන්ත්‍රීතුමකු හැටියට දුරකථන පණිවුඩයක් හෝ දීලා මගෙන් අහන්න මේ කියන ගණන් ඇත්තද කියලා. එක පාරට ඕවා කියන්න එපා. මේක පාර්ලිමේන්තුව. මේ සියල්ල ඔප්පු කරන්න පුළුවන් සාධක. ලෝකයේ වාහන නිෂ්පාදනය කරන රටවල් සහ වාහන අපනයනය කරන සමාගම් තීරණය කරලා තිබෙනවා කොළඹ වරායට වඩා ප්‍රතිඅපනයනය සඳහා සුදුසුම ස්ථානය මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය කියලා. ප්‍රතිඅපනයනය සඳහා අපි මේ වරාය යොදා ගත්තා කියන එක ඔබේම කටින් කියවුණු නිසා මම දැන් ඒ ගැන තමුන්නාන්සේට පැහැදිලි කරන්නම්.

ඔබතුමන්ලා කියපු අසාර්ථක වරාය, ඔබතුමන්ලාගේ පක්ෂය විවේචනය කළ වරාය, දැන් ගණන් හදලා පෙන්වපු වරාය, වැඩක් නැහැයි කියපු වරාය වාහන 2,553ක් ප්‍රතිඅපනයනය කළා මාස දෙකහමාරක් තුළ. [බාධා කිරීමක්] අහගෙන ඉන්න. අහගෙන ඉන්න. දැන් ආයේ එන්න හදනවා ලාභය කියලා අර අරක්කු ගනුදෙනුවට. ඒක නොවෙයි අවශ්‍ය වන්නේ. අද උදේ ප්‍රශ්නවලට වාචික පිළිතුරු දෙන අවස්ථාවේදී ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නවලට ගරු සරත් අමුණුගම ඇමතිතුමා හොඳට උත්තර දුන්නා. අපේ ලංකාවේ සංවර්ධන ආර්ථිකය ශක්තිමත් කරලා, සංවර්ධන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරලා එය ක්‍රියාත්මක කරපු මාසයේ, අවුරුද්දේ, අවුරුදු පහ ඇතුළත මේ විධියට ලාභ ලබපු එකක් තිබෙනවා නම් මට පෙන්වන්න. තමුන්නාන්සේලාගේ අවුරුදු 17ක පාලන කාලය තුළ එවැනි දෙයක් තිබෙනවා නම් පෙන්වන්න. ඊළඟ කථිකයාට කියන්න එහෙම තිබෙනවා නම් කියන්න කියලා. මම මෙතැනට වෙලා ඉන්නම්. "මෙන්න අපේ අවුරුදු 17ක පාලන කාලය තුළ, අපේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා වාගේ අය මෙන්න මේ වාගේ දෙයක් කළා" කියලා පෙන්වා දෙන්න කියන්න. ඒකට වියදම් කරපු මුදල මෙච්චරයි, මේ අවුරුද්දේ ඒකේ ආදායම මෙච්චරයි කියලා පෙන්වන්න කියන්න. කොහේද පෙන්වන්න තිබෙන්නේ?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிලக்க)
(The Hon. Gayantha Karunatileka)
කොළඹ වරාය. ඔන්න එකක් කිව්වා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
කොළඹ වරාය. බොහොම හොඳයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ මිත්‍ර ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් දුවන කෝච්චිවලට බෙල්ල තියන්නේ නැහැ. නමුත් අද තිවුවා. එතුමා කියනවා, කොළඹ වරාය ඔවුන්ගේ කාලයේ හදපු, ලාභ ලබන එක ආයතනයක් කියලා. [බාධා කිරීම්] එතුමා ඉල්ලා ගෙන කෑවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ -මම ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඒ අයගේ නම් කියන්න කැමැති නැහැ- කොළඹ වරායට gantry cranes, transfer cranes, prime movers කියන සියලු දේවල් ගෙන ඒම සඳහා ජපානයෙන් ණය මුදල් අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ණය ගත්තේ 1987 වර්ෂයේදීයි. 1987 වර්ෂයේ ණය අරගෙන ගෙන්වපු ඒ දොඹකර එකක්වත් 2012 වර්ෂය වන කොට වරායේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ එකක්වත් නැහැ. භාවිතයට ගැනීමට සුදුසු කාල සීමාව ඉක්මවා තිබීම නිසා ඒ සියල්ල ඉවත් කරලා තිබෙනවා. ඒ ඉවත් කරපු සියලුම දේවලට 2040 අවුරුද්ද වන කල් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ණය ගෙවන්න ඕනෑ. යෙන්වලින් තමයි එදා ණය ගත්තේ. ඔය කථා කරන මන්ත්‍රීතුමන්ලා එතකොට එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි, අර කථාවට කියනවා වාගේ "කොහේදත්" නැහැ. කොහේදත් නැහැ කියලා තමයි ඒකට කියන්නේ. නමුත් අද කියනවා, ලාභ ලබන විධිය. එදා ඒ ගත්තු දේවල් අරගෙන තිබෙන්නේ යෙන්වලින්. අද තවමත් අපට පුළුවන්කමක් ලැබිලා නැහැ, ඒ යෙන්වලින් ගත්තු මුදල වෙනස් කිරීමක් කරන්න. මොකද යෙන් එකේ වටිනාකම ඉහළ යාමත් එක්ක 2040 වර්ෂය වන කල් අපට ණය ගෙවන්න සිදු වනවා. ලෝකයේ ඕනෑම රටක් ණයක් ගන්න කොට ඒ ණයවලින් ගන්න භාණ්ඩයේ ආයුෂ කාලයයි, ණය ගන්න කාලයයි අතර ගැළපීමක් කරනවා. ඒ ගැළපීමවත් එක්සත් ජාතික පක්ෂ රජයේ හිටපු උන්නැහේලාට කරන්න පුළුවන්කමක් තිබිලා නැහැ.

2010 වර්ෂය වනකොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මිලියන 4,222ක් ලාභ ලබනවා. නමුත් වාර්ෂිකව තමන්ගේ ආදායම, වියදම දෙක එකට ගළපන කොට ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඒ ලාභය ලබන්න බැහැ, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ගත්තු අර ණය ටික ජපානයට යවන්න සිද්ධ වන නිසා. ඒ ණය මුදල

එකතු කරන්න සිද්ධ වෙලා තිබෙන නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාඩු ලබන බව තමයි පෙනෙන්නේ. ඉතින් මෙන්න කෙරුවාව. මෙන්න, ඒ කාලයේ ඔවුන් ණය අරගෙන තිබිච්ච විධිය. මෙය පසු ගිය ඉතිහාසයේ කරපු එක කෙරුවාවක් විතරයි. මම ඉතුරු ටික කථා කරන්න යන්නේ නැහැ. ඔය එක කෙරුවාවක්.

අද අපට බොහොම පැහැදිලිව කියන්න පුළුවන්කමක් තිබෙනවා, කොළඹ වරායට විතරක් සීමා වෙලා තිබුණු මේ රටේ සියලුම ආනයන, අපනයන සහ ප්‍රතිඅපනයන අද මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය තුළින් කරන්න පුළුවන් වෙලා තිබෙනවාය කියලා. ඒ දැවැන්ත ජයග්‍රහණය අපි මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය තුළින් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාගම්පුර වරාය හදන්න කලින් ලංකා ඉතිහාසයේ කිසිම කෙනෙක් අලුත් වරායක් පළමුවෙන්ම හදනවා දැකලා නැහැ. එහෙම දැකපු කෙනෙක් මේ රටේ අද ජීවතුන් අතරත් නැහැ. කොළඹ වරාය හදනවා දැකපු ජීවතුන් අතර ඉන්න කෙනෙක් අද අපට දකින්නට හම්බ වෙන්නේ නැහැ. අවුරුදු සිය දහස් ගණනක කාලයක් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. සුදු අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ තමයි කොළඹ වරාය ඉදි වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි රටක ජීවත් වෙන මිනිසුන් හැටියට අද අපට ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවුරුදු තුනක කාලයක් ඇතුළත ගොඩබිම වරායක් හදලා, ඒ වරාය නැව් එන තත්ත්වයට පත් කරලා, ඉදිරියේදී ආදායම් ලැබීමේ පළමුවැනි තැනට එන වරායක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව ලබා දීම ගැන. දැන් මේක තමයි මෙතුමන්ලාට තිබෙන ප්‍රශ්නය. මොකද හේතුව, මේ කියන ඉතිහාසයේ අපේ රටේ වරායක් සම්පූර්ණයෙන්ම හදලා ඉවර කරලා තිබුණේ නැහැ. කොළඹ වරාය ගත්තාම තවම හදනවා.

දකුණු කොළඹ වරාය ගැන කිව්වා. දකුණු කොළඹ වරායේ පළමුවැනි පර්යන්තය ලබන අවුරුද්දේ අපි විවෘත කරනවා. දෙවන පර්යන්තය 2014 වර්ෂයේ විවෘත කරනවා. 2016 වන කොට දකුණු කොළඹ වරායේ පර්යන්ත තුනක් විවෘත වෙනවා. ඒ වාගේම හම්බන්තොට වරාය අපි නිදහස් වරායක් බවට පරිවර්තනය කරනවා. සමහර වෙලාවට "නිදහස් වරායක්" කියන එකත් අර්ථකථනය කර ගනීවිද දන්නේ නැහැ, මේ අද ගෙනැවිත් තිබෙන නියෝගයත් එක්ක. නිදහස් වරායන් ඇති කිරීම තුළින් ලෝකයේ සිංගප්පූරුව, ඩුබායි වැනි රටවල්වල ආර්ථික සංවර්ධනය වැඩිදියුණු වෙලා තිබෙනවා. අන්න ඒ ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීමේ වැඩ පිළිවෙළට තමයි අපි මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායේ දෙවැනි සහ තුන්වැනි අදියර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායට තවම ආගමන විගමන සේවා, රේගු සේවා ඒ වාගේම ටග් යාත්‍රා මේ කිසි දෙයක් නැහැ කියලා. ඉතින් දෙවියනේ! මේ කිසි දෙයක් නැතිව ඒ වරායට නැව් එන්නේ කොහොමද? නමුත් ඒ වරායට නැව් ආවාය කියලා එතුමාම කිව්වා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Now, wind up please.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මට තව විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාවෙන් විනාඩි හතරක කාලයක් එතුමාට ලබා දෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාගේ වරායවල්වලට නැව් එන්නේ නැති වුණාට අපි මොනවා කරන්නද? ඒවාට නැව් එන්නේ නැහැ. ඒ නිසා මේ ගොල්ලන් හුඟක් වෙලාවට කරන්නේ අනුන්ගේ වරායවල්වලට රිංගන එක. තමන්ගේ වරායට නැව් එන්නේ නැති වුණාම නැව් එන වරායවල් හොය හොයා රිංගනවා. ඒකට අපි මොනවා කරන්නද? හැබැයි කොයි වරායට රිංගුවත් කමක් නැහැ, ඒ නැව් ඇතුළේ බිත්තර දමන්න එපා. රිංගුවට කමක් නැහැ; නැව බැලුවාට කමක් නැහැ; නැව් ඇතුළේ බිත්තර දමන්න එපා. එහෙම වුණොත් සමහර විට ප්‍රශ්නයක් වේවි. [බාධා කිරීම්] සමහර විට එහෙම වෙන්න පුළුවන්. අපි දන්නේ නැහැ. ලැබෙන තොරතුරු අනුවයි අපි මේ කියන්නේ. ඔබතුමන්ලාගේම පැත්තෙන් ලැබෙන ඒවා. අපේ පැත්තෙන් නොවෙයි.

තමුන්නාන්සේලා අද විවේචනාත්මකව කථා කරන මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය විතරක් නොවෙයි, දකුණු කොළඹ වරාය, ගාල්ල සංචාරක වරාය, කන්කසන්තුරේ කර්මාන්ත වරාය, ඔලුවිල් වරාය, මේ සියලුම වරායන් ලංකාවේ අතිදියුණු වරායන් බවට පරිවර්තනය වන බව බොහොම පැහැදිලිව මතක් කරන්න කැමැතියි. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ගැන එදා තමුන්නාන්සේ කියාපු දේවල් හැන්සාඩ් වාර්තාවෙන් අද මම පෙන්නුවා. ඒ වාගේම තමුන්නාන්සේ අසාර්ථකයි කියාපු මේ වරායේ වැඩ කටයුතු අද ක්‍රියාත්මක කරගෙන යන ආකාරය අපි පෙන්නුවා. කවදා හෝ දවසක -තව අවුරුදු ගණනාවක් යන කොට- රට ආර්ථික වශයෙන් ගොඩ නැඟීමට ප්‍රධාන නාවුක කේන්ද්‍රස්ථානයක් බවට මේ වරාය පරිවර්තනය වෙනවා තමුන්නාන්සේලාට පෙනේවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගම ගැනත් එතුමා කථා කළා. ගරු පියංකර ජයරත්න ඇමතිතුමා මට වෙලාව දුන්නා. එතුමාට පිළිතුරු කථාව කරන්න වෙලාව ඉතිරි කරලා මා කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්නම්. ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගම ගැන එතුමා මොනවාද කථා කළේ? එතුමා ඒකේ සිටින ගුවන් සේවිකාවක් ගැන කථා කළා. [බාධා කිරීමක්] මොකක්ද නම?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
සොනාලි -

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
බලන්නකෝ, මේවා ළිඳ ළඟ කථා කරන ඒවානේ. මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ බදු පනතක් යටතේ වන නියෝගයක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී, ඒ තුළින් රටට අහේනියක් වෙනවාද, නැද්ද කියන එක ගැන කථා කරද්දී, එතුමා සොනාලි ගැන කථා කරනවා. මේකටද මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ? විපක්ෂයේ වටිනාකම තිබෙන්නේ ඕකටද? මේකට තමයි කියන්නේ -[බාධා කිරීම්]

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

දැන් කියනවා, අපේ රටේ ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවේ අය ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමේ යානාවලයි විදේශ සංචාර යන්නේ කියලා. ඉතින් විදේශ සංචාරවලට ගුවන් යානාවල යන්නේ නැත්නම් මොනවාවලද යන්න කියන්නේ? මෙතුමන්ලා කියන්නේ බක්කි කරත්තවල යන්නය කියලාද? ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පමණක් නොවෙයි, ලෝකයේ ඕනෑම රටක නායකයකුට ආත්ම අභිමානයක් තිබෙනවා, තමන්ගේ රටේ ව්‍යාපාරයකින් මෙවැනි සේවාවක් ලබා ගන්න. මෙතුමන්ලාගේ රාජ්‍ය නායකයොත් එහෙමයි කටයුතු කළේ. තමන්ගේ රටේ ව්‍යාපාරයේ අහස් යානා තමයි පාවිච්චි කරලා තිබෙන්නේ.

දැන් මිහින් ලංකා ගුවන් සමාගම ගැන විවේචනාත්මකව කථා කළා. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම මේ පාර්ලිමේන්තුව ඇතුළත මිහින් ලංකා ගුවන් සමාගම ගැන නොයෙකුත් විවේචන තමුන්නාන්සේ ඉදිරිපත් කළා. මිහින් ලංකා ගුවන් සමාගම පාඩු ලබලා තිබෙනවා. ඒක මම පිළිගන්නවා. මමත් එක්තරා කාල සීමාවකදී -මාස ගණනාවක්- ඒ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරපු හින්දා මමත් ඒ ගැන දන්නවා.

ලංකාවේ ප්‍රථම වතාවට අපේම දේශීය ගුවන් සමාගමක් වශයෙන් මිහින් ලංකා ගුවන් සමාගම පටන් ගෙන පාඩු ලැබුවා කියන ප්‍රමාණයන් ඔක්කොම එක තැනකට එකතු කරලා අපි එක බකට් එකකට දමමු. මෙන්න පළමුවෙන්ම මේ සමාගම පටන් ගන්න කොට අප විසින් වියදම් කරපු මුදල -ඒ සමාගම වෙනුවෙන් ගුවන් යානා ගන්න, යම් යම් ප්‍රශ්නවලට වියදම් වෙච්ච මුදල- මෙච්චරයි කියලා ඩොලර් මිලියනවලින් ගණන් හදලා අපි ඒක එක තැනකට තියලා කියමු, ඩොලර් මිලියන පණහක් පාඩුයි, ඒ නිසා මෙන්න මේ ඩොලර් මිලියන 50 තමයි මිහින් ලංකා ගුවන් සමාගමෙන් ලංකාවට පාඩු වෙලා තිබෙන්නේ කියලා. ගරු මන්ත්‍රීතුමනි, හෙට-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
රුපියල් මිලියන 5,548යි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කියනවා, මිහින් ලංකා ගුවන් සමාගමේ පාඩුව රුපියල් මිලියන 5,548ක් කියලා. එහෙම කියන කොට, හෙට ලෝක වෙළඳ පොළට ගිහිල්ලා විවෘතව, "මේ මිහින් ලංකා ගුවන් සමාගම පෞද්ගලික අංශයට අපි දෙනවා" කියන පණිවුඩය දුන්නොත් ඩොලර් මිලියන 150කට වැඩිය දීලා මේ සමාගම ලබා ගැනීමට නොයෙකුත් රටවල් අද උත්සාහ කරනවා ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගල් ගහලා පන්නයි, මොනවාද ඔය විහිළු කථා?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
දැන් අපේ රටේ වත්කමක් බවට පරිවර්තනය වෙලා තිබෙන මේ සමාගම ගැන හැම දාම ඔබතුමන්ලා විවේචනාත්මකව කථා කරනවා. ලෝකයේ ගුවන් සමාගම් තිබෙන රටවල් අතරින් ලාභ ලබන ගුවන් සමාගම් තිබෙන රටවල් ගණන කීයද කියලා මෙතුමන්ලාගෙන් මම අහනවා. මුළු ලෝකයම ගත්තොත් එහෙම වැඩි ප්‍රතිශතයක් තිබෙන්නේ පාඩු ලබමින් තමන්ගේ ගුවන් සමාගම් රැගෙන යන රටවල්.

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා බල්ලෝ ගැන කථා කළා. දැන් බල්ලෝ ප්‍රවාහනය කරනවා කිව්වා. ඔව්. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා බල්ලෝ ගැන වාගේම කෙල්ලෝ ගැනත් දැන් කථා කළා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
සුරතල් සුනඛයෝ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා අර වෙනදාට අඳින ඇඳුම ඇඳලා එනවා නම් මම හරි කැමැතියි. ඒ මොකක්ද? යුරෝපීය ඇඳුම. මොකද හේතුව, යුරෝපීය ඇඳුම ඇඳලා තමයි බල්ලෝ ගැන, කෙල්ලෝ ගැන, සැලුන් ගැන එහෙම කථා කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ජාතික ඇඳුම ඇඳලා ඒ ගැන කථා කළොත් ප්‍රශ්නයක් වනවා. යුරෝපීය ඇඳුම ඇඳලා ඔළුවෙන් හිට ගත්තත් ප්‍රශ්නයක් වන්නේ නැහැ, තමුන්නාන්සේ හොඳට ඉන්නවා. නමුත් ඔය ජාතික ඇඳුම ඇඳලා තමුන්නාන්සේ බල්ලෝ, කෙල්ලෝ ගැන කථා කරලා ඔළුවෙන් හිට ගත්තොත් අපටවත්, ගැලරියේ ඉන්න මේ අහිංසක දරුවන්ටවත්, මේ කිසි කෙනෙකුට පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන්කමක් නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඒකද ඔබතුමා කලිසම ඇන්දේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඒ නිසා ජාතික ඇඳුමට ගැළපෙන විධියටවත් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න ඉගෙන ගන්න කියලා මම තමුන්නාන්සේට මතක් කරනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ මේ රටේ ප්‍රබලව සිටි පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය සම්බන්ධව ඉන්න මන්ත්‍රීවරයා හැටියට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට අපි යෝජනා කරනවා, පාර්ලිමේන්තුවේ මෙවැනි විවාදයකට තමන්ගේ පක්ෂයෙන් කථා කරන්න මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන කොට අර පෙරහැරේ වාගේ පළමුවෙන්ම යන්න ඕනෑ අංග ටික යවනවා ඇරෙන්න පළමුවෙන් කාවාඩි යවන ක්‍රමය නවත්වලා පක්ෂයක් හැටියට නියම විධියට අදාළ දේ ගැන දන්නා කෙනෙක් යොදවලා කථා කරන්න කියලා. එසේ ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය නවත්වනවා. බොහොම ස්තුතියි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, රත්තරන් උපදෙස් ටික. කෝච්චියේ යන්න ඕනෑ.

[අ. භා. 3.21]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු සහන කීපයක් ලබා දීමට ගැසට් පත්‍රයේ පළ කර අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් වන නියෝගය සම්බන්ධ විවාදයේදී ගරු සරත් අමුණුගම මැතිතුමා අද මේ පාර්ලිමේන්තුවට කිව්වා, රටක සංවර්ධනය සඳහා නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍යයි කියලා. මම සන්තෝෂ වනවා කාලයකට පස්සේ එතුමා යථාර්ථයට ආපහු ඇවිල්ලා තිබෙන එක ගැන. එතුමාම වරෙක මුදල් අමාත්‍යවරයා ලෙසත්, වරෙක ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් ලෙසත් විටින් විට මේ පාර්ලිමේන්තුවට පැවසුවේ රටේ සංවර්ධනයට වඩාත් ඉවහල් වෙන්නේ නිෂ්පාදනය නොවෙයි සේවා ආර්ථිකයයි කියලා. නමුත් අද ආර්ථිකය කඩා ගෙන වැටිලා, බංකොලොත් තත්ත්වයට පත් වන කොට එතුමාටම පිළිගන්නට සිද්ධ වෙලා තිබෙනවා, සේවා ආර්ථිකය නොවෙයි නිෂ්පාදන ආර්ථිකය තමයි ඉස්සරහට එන්න ඕනෑ, ඒක තමයි ඇත්ත කියලා. එහෙම කියන ගමන් තමයි එතුමන්ලා මේ බදු සහන ලබා දෙන ගැසට් නිවේදනය අනුමත කරන්න ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ ගැසට් නිවේදනය අනුව එතුමන්ලා අපේක්ෂා කරනවා, විශේෂයෙන්ම සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගම, සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගම සහ ශ්‍රීලන්කන් කේටරින් සර්විසස් පුද්ගලික සමාගම කියන ආයතනවලින් ගෙන්වන භාණ්ඩ සඳහා බදු සහන ලබා දෙන්න. පසු ගිය කාලය පුරාවටම සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගමට, සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමට විවිධ වර්ගයේ බදු සහන ලබා දුන්නා. හැබැයි කොතරම් බදු සහන ලබා දුන්නත් අවසාන ප්‍රතිඵලය හැටියට සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගමත් රුපියල් කෝටි ගණනක් පාඩුයි; ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමත් රුපියල් කෝටි ගණනක් පාඩුයි. බදු සහන ලබා දීලාත් මේ ආයතන බංකොලොත් වෙලා තිබෙනවා; මේ ආයතන පාඩු ලබලා තිබෙනවා.

ඇත්තටම මේ රටේ ජනතාව මිහින් ලංකා කියලා අලුත් ගුවන් සේවාවක් ඉල්ලා සිටියේ නැහැ. ඒ වෙනුවෙන් උද්ඝෝෂණය කළේ නැහැ; පෙළපාළි ගියේ නැහැ. "අපට ගුවන් යානා සමාගමක් දෙන්න, මේ තිබෙන ගුවන් යානා සමාගම් මදි, අලුත් සමාගමක් දෙන්න, මිහින් ලංකා නමින් ආයතනයක් දෙන්න" කියා ජනතාව ඉල්ලා සිටියේ නැහැ. ඇත්තටම මේ ආයතන බිහි වුණේ කොහොමද? රෝහිත අබේගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "රටේ නායකයාට ජාතික අභිමානයක් තිබෙනවා. ඒ අභිමානය පෙන්වීමේදී වෙනම ගුවන් යානයකින් එතුමා යන්න ඕනෑ. එතුමාගේ පරිවාර සේනාව ලෙස ඇමතිවරු හතර පස් දෙනෙකුයි, තව හැත්තෑපහක් සීයක් විතර පිරිසකුයි එකතු කර ගෙන අභිමානය පෙන්වන්න ලෝකය වටේ යන්න ඕනෑ" කියලා.

නමුත් ඒක අභිමානය නොවෙයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[ Expunged on the order of the Chair.]*

නිසා රටේ ජනතාවගේ බදු මුදල් රුපියල් කෝටි ගණනක් නාස්ති කිරීමක් තමයි මේ හරහා සිද්ධ වෙන්නේ.

අද මේ බදු සහන ලබා දීම හරහා සාමාන්‍ය දුගී දුප්පත් ජනතාවට ලැබෙන සේවාවක් නැහැ. මේ බදු සහන හරහා මොකක්ද මේ කරන්නේ? තමන්ගේ නම පවත්වා ගෙන යන්න, හීනමානයෙන් පෙළෙන තමන්ගේ ඒ ලෙඩේ සුවපත් කර ගන්න කරන විකාර වැඩ, විකෘති වැඩ සඳහා කරන තවත් තල්ලුවක් තමයි මේ බදු සහනවලින් සිද්ධ වන්නේ. මේ දේ පසු ගිය ඉතිහාසයේම සිද්ධ වුණා.

පසු ගිය අය වැය කීපයෙන්ම ඒ බදු සහන ලබා දුන්නා. බදු සහන එකක් නොවෙයි, වරාය ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද විතරක් නොවෙයි, විවිධ වර්ගයේ බදු සහන මේ ආයතන සඳහා ලබා දුන්නා. එතරම් බදු සහන ලබා දීලාත් ඒ ආයතන රුපියල් කෝටි ගණනක් පාඩුයි. ඒ පාඩුව දැක දැක, පෙනි පෙනීයි මේ දේවල් කරන්නේ. මේ ආයතන 2009දී පාඩුයි; නැවත බදු සහන දුන්නා. ආපහු 2010දී පාඩුයි; නැවත බදු සහන දුන්නා. 2011 දී ඒ බදු සහන තවත් වැඩි කළා. මේ ආයතන සියයට 100ක් බදුවලින් නිදහස් කළා. ඒත් අවසානයේදී මේ ආයතනය බංකොලොත් වනවා; පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඇත්තටම අද මේ ආණ්ඩුව දිගින් දිගටම ඔප්පු කරලා තිබෙන්නේ, මිහින් ලංකා ආයතනය, එයාර් ලංකා ආයතනය හරහා තමන්ගේ පටු දේශපාලන වුවමනාවන්, පටු පෞද්ගලික දේශපාලන අභිලාෂයන් ඉෂ්ට කර ගැනීමක් මිසක් රටේ ජාතික ආදායම වැඩි කරන්න, රටේ ජනතාවගේ ආදායම එක සත පහකින් හෝ ඉහළ නග්ගන්න මේ ආයතන යොදවා ගෙන නැති බවයි. ඒ නිසා තමයි අපි පසු ගිය කාලයේ පුවත් පත්වල පළ වෙලා තිබෙනවා දැක්කේ, එක්තරා සභාපතිවරයකු ගැන. මේ සභාපතිවරයා කවුද? මස්සිනා. ඒ මස්සිනාගේ අතේ බඳින ඔර්ලෝසුවේ වටිනාකම රුපියල් ලක්ෂ 40ක්. ඒ මස්සිනාගේ වත්කම් ලෙසට තිබුණේ විදේශ විනිමය. ඒවා මේ මුළු රටේම ජනතාව දැක්කා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිරේ ඉන්න ඕනෑ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඔව්, හිරේ ඉන්න ඕනෑ. ඇත්ත වශයෙන් හිරේ ඉන්න ඕනෑ. විදේශ විනිමය ඒ තරම් ප්‍රමාණයක් තමන් සන්තකයේ තියා ගත්තේ කොහොමද? ඒ වත්කම් කොහේද එළිදරවු කරලා තිබෙන්නේ? වත්කම් බැරකම් ප්‍රකාශනවල ඒවා එළිදරවු කරලා තිබෙනවාද? කෝ, ඒවා පිළිබඳ පරීක්ෂණ? මස්සිනා බව දන්නේ නැතුව ඒ හොරා අහම්බෙන් තමයි ඒ ගෙදරට පැනලා තිබෙන්නේ. අහම්බෙන් හරි ඒ හොරා පැනලා තිබෙන්නේ මස්සිනාගේ ගෙදරට. බලා ගෙන යන කොට නියම හොරෙක්. [බාධා කිරීමක්] මොකද, මේ රටේ ජනතාවගේ සල්ලිවලින් බදු සහන දීලා මේ ආයතනවලට සභාපතිවරු පත් කරනවා. ඒ සභාපතිවරයා අතේ බඳින ඔරලෝසුව රුපියල් ලක්ෂ 40යි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොරුන්ගෙත් හොරු කම්බ හොරු තමයි. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[ Expunged on the order of the Chair.]*

කියාගෙන එන්නේත් හොරුන්ට ආවඩන හොරු. ඒ කම්බ හොරුන්ගේත් කම්බ හොරු. තවම නම් ඒ අය පොඩි හොරු. තවම ඔය "ස්පිරිට්" ටිකක් ගෙන්වන කොට විතරයි ඔය වාගේ පොඩි හොරකමක් දෙකක් කරන්නේ. ඒවායේ බදු කප්පාදු කරලා එහෙන් මෙහෙන් "ගේම්" දෙන්නේ. තවම ස්ප්‍රීතු ගෙනෙනකොට විතරයි එහෙම කරන්නේ. තවම ඊට වඩා ලොකු තැනකට ගියේ නැහැ. ඒ හොරකම් ගැන කිව්වාම මේ විධියට ආවැඩීමෙන් අපට හැඟෙන්නේ මේ අය ඒ දේවල් අනුමත කරනවාය කියන එකයි.

[ගරු විජිත හේරත් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ මේ බදු නොගෙවීමේ ප්‍රශ්නය මතු වෙන්න බලපාන ලද තත්ත්වයක් තිබෙනවා. මොකද, මේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ රටේ බදු අය කිරීමේදී සාමාන්‍ය දුප්පත් ජනතාවට එක නීතියක්, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට සහ මේ වාගේ ආයතනවලට තව නීතියක් ක්‍රියාත්මක වෙනවා. ඒක තමයි මේ තිබෙන ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත අනුව, ආයෝජන මණ්ඩලයේ ලියා පදිංචි වෙච්ච යම් කිසි ආයතනයක් අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා නම්, ඒ ඕනෑම භාණ්ඩයක් අපනයනය කිරීමේදී යම් යම් සීමාවලට යටත්ව බද්දෙන් නිදහස් කරන බව. නමුත් ආයෝජන මණ්ඩලයේ ලියා පදිංචි වෙච්ච ආයතනයක් ඒ භාණ්ඩ අපනයනය කරන්නේ නැතිව මේ රටේ වෙළෙඳ පොළට මුදා හරිනවා නම් ඒ ආයතනය අනිවාර්යයෙන්ම ඒ සඳහා බද්දක් ගෙවිය යුතුයි. ඒ බදු මුදල් රේගුවට හෝ ඒ අදාළ ආයතනවලට හෝ ආදායම් බදු දෙපාර්තමේන්තුවට හෝ ගෙවිය යුතුයි. නමුත් අපි දන්නා ඕනෑ තරම් උදාහරණ තිබෙනවා, දේශපාලන මැදිහත්වීම් නිසා එවැනි මහා පරිමාණ ව්‍යාපාර, ආයතන රජයට ගෙවිය යුතු බදු රජයට ගෙවන්නේ නැතිව පැහැර හැර තිබෙන බවට. ඒ පැහැර හැරීම පිටුපස්සේ පැහැදිලිව ඍජු දේශපාලන මැදිහත්වීමක් තිබෙනවා.

පසු ගිය කාලයේ -2007-2008 වාගේ වකවානුවේදී- වුණු එක සිද්ධියක් මා කියන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාල වකවානුවේදී Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනය marine crafts 21ක් නිෂ්පාදනය කළා. ඒවා බෝට්ටු වර්ගයක්. ඒවා සාමාන්‍ය පුංචි බෝට්ටු නොවෙයි. නැවක ප්‍රමාණයට ආසන්න මධ්‍යම ප්‍රමාණයේ බෝට්ටු වර්ගයක්. Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනය එවැනි marine crafts 21ක් නිෂ්පාදනය කළා. ඔවුන් ඒ බෝට්ටු නිෂ්පාදනය කරලා පිට රටට යැව්වේ නැහැ; අපනයනය කළේ නැහැ. ඒවා මේ රටේ වෙළෙඳ පොළට මුදා හැරියා. ආයෝජන මණ්ඩලයේ පනතට අනුව -ඒ ගිවිසුම් ප්‍රකාරව- නීතියක් තිබෙනවා ඒ බෝට්ටු මේ රටේ වෙළෙඳ පොළට මුදා හරිනවා නම්, ඒ මුදා හරින බෝට්ටුවලට අදාළ බද්ද Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනය විසින් රේගුවට - Customs Department එකට - ගෙවන්න ඕනෑ කියලා. ඒ බෝට්ටු 21 ලංකාවෙන් අපනයනය කරන්නේ නැතිව ලංකාවේ වෙළෙඳ පොළට මුදා හැරීම නිසා ලංකාවේ ආණ්ඩුවට, රජයට, රටට අය විය යුතු බද්ද රුපියල් මිලියන 619ක්. ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් ලක්ෂ 6,190ක්. ඒ කියන්නේ ආසන්න වශයෙන් රුපියල් කෝටි 62ක් පමණ. එදා ඒ marine crafts 21 ලංකාවේ වෙළෙඳ පොළට මුදා හැරීම නිසා ලංකාවේ රජයට ගෙවිය යුතුව තිබුණු රුපියල් මිලියන 619ක මුදල -රුපියල් කෝටි 62ක මුදල- රේගුවට ගෙව්වේ නැහැ. හැබැයි විකුණද්දී, ඒ විකුණුම්කරයේදී ඒ සියලුම බදු ඒ බෝට්ටු මිලදී ගත්ත ආයතනවලින් Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනය ලබා ගත්තා. නමුත් රජයට සත පහක්වත් ගෙව්වේ නැහැ. රේගුව මේ පිළිබඳව Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනයට විටින් විට දැනුම් දුන්නා. ඒ බදු මුදල ගෙවන්නය කියා පැමිණිලි කළා. නමුත් ඔවුන් ගෙවීම් පැහැර හැරියා. අවසානයේදි මොකක් ද කළේ? ශ්‍රී ලංකා රේගුව, රේගු ආඥාපනතේ 18A වගන්තියට අනුව උසාවිය ඉදිරියට ගියා. ඒ පිළිබඳව නඩුවක් යොමු කළා.

එවකට වැඩබලන නීතිපතිවරයා හැටියට ඒ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළේ පියසාද් ඩෙප් මහතායි. ඒ 2009 ජුනි මාසයේ 5 වන දායි. එතුමා එවකට සොලිසිටර් ජනරාල්වරයායි. නමුත් යම් යම් අවස්ථාවලදී නීතිපතිවරයා වෙනුවට වැඩ බැලීම් කර තිබෙනවා. සොලිසිටර් ජනරාල්වරයා හැටියට පියසාද් ඩෙප් මහතා Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනයෙන් අය විය යුතු රුපියල් මිලියන 619ක මුදල ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ගියා. ඒ මුදල ලබා ගැනීම සඳහා අංක SC/SLA Application 100/2009 දරන නඩුව පැවරුවා. නමුත් මොකක්ද සිද්ධ වුණේ? එවකට හිටපු නීතිපතිවරයා වන මොහාන් පීරිස් මහතා මුලදී මේ බදු අය කිරීම පිළිබඳව එකඟතාව පළ කළා. 2009 නොවැම්බර් මාසයේ 4 වන දා ඒ සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්වුණා. ඒ සාකච්ඡාවට සොලිසිටර් ජනරාල්වරයා හැටියට පියදාස් ඩෙප් මහතාත් සම්බන්ධ වුණා. Deputy Solicitor General, සංජය රාජරත්න මහතාත් සම්බන්ධ වුණා. ඒ වාගේම එවකට Director-General of Customs, සරත් ජයතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරින් කීප දෙනෙකුත් ඒ සාකච්ඡාවට සම්බන්ධවුණා. ඒ සාකච්ඡාවේදී මේ සියලු දෙනාම එකඟ වුණා, ඒකමතික අදහසකට ආවා, රුපියල් මිලියන 619ක මුදල Colombo Dockyard (Pvt.) Limited කියන ආයතනයෙන් ලබා ගැනීමට අදාළව නඩුව ඉදිරියට ගෙන යන්න; ඒ නඩුවට මැදිහත් වෙන්න. ඒ නඩුවට මැදිහත් වන්නට තීරණය කළා. රජයට අය වියයුතුව තිබුණු රුපියල් මිලියන 619ක මුදල ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට මැදිහත් වීමේ වගකීමක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට, රාජ්‍ය භාණ්ඩාගාරයට, රටට අය විය යුතු මුදලක් ගෙවීම ඒ සමාගම පැහැර හරිනකොට ඒ මුදල ලබා ගැනීම සඳහා මැදිහත් වීමේ වගකීම නීතිපති දෙපාර්තමේන්තුවට, නීතිපතිවරයාට තිබෙනවා. ඒ අර්ථයෙන් තමයි ඒ තීරණය අරගෙන මැදිහත් වුණේ. නමුත් අවසානයේදී සිද්ධ වුණේ මොකක් ද?

2010 අගෝස්තු මාසයේ 16 වන දා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වන පී.බී.ජයසුන්දර මහතා Director-General of Customs, සුධර්මා කරුණාරත්න මහත්මිය කැඳවා, නීතිපතිවරයා සහ ඒ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉදිරිපිටදී යම් උපදේශයක් දුන්නා, මේ රුපියල් මිලියන 619ක මුදල අය කර ගැනීම පිළිබඳ නඩුව ඉදිරියට ගෙනියන්න එපා, මේක නතර කරන්න කියලා; මේ නඩුව withdraw කර ගන්න කියලා. ඒ නඩුව withdraw කළාම මොකද වෙන්නේ? රජයට, රටට අය විය යුතුව තිබෙන රුපියල් මිලියන 619ක මුදලක් අහිමි වෙනවා. වාචිකව ඔහු ඒ උපදේශය දෙනවා. ඒ උපදේශය දෙන්නේ අගෝස්තු මාසයේ 16 වන දා. හැබැයි ඒ වෙනකොටත් -2010 අගෝස්තු මාසයේ 03 වැනිදා- සුධර්මා කරුණාරත්න මහත්මිය නීතිපතිතුමාට - මොහාන් පීරිස් මහතාට- ලිපියකින් -ලිඛිතව- දැනුම් දීලා ඉවරයි, මේ නඩුව කිසි සේත්ම withdraw කර ගන්න එපාය කියා. මේ නඩුව ඉදිරියට ගෙනියන්න, ඒ අය විය යුතු රුපියල් මිලියන 619 ක මුදල ලබා ගැනීම සඳහා උපරිම මැදිහත් වීමක් කරන්නය කියා ඒ වනකොටත් සුධර්මා කරුණාරත්න මහත්මිය නීතිපතිතුමාට දැනුම් දී තිබෙනවා. එතුමිය, එතුමියගේ පැත්තෙන් රාජකාරිය ඉෂ්ට කළා. එතුමියත් නිකම්ම නොවෙයි එය කිව්වේ, රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වෘත්තීය සමිතිවල මැදිහත් වීමෙන්. ඒ වෘත්තීය සමිතිවල ප්‍රබල මැදිහත් වීම නිසා සහ එතුමිය පෞද්ගලිකව මැදිහත් වෙලා නීතිපතිවරයාට කිව්වා, මේ නඩුව ඉල්ලා අස් කර ගන්න එපා, මේ නඩුව ඉදිරියට ගෙන යන්න කියා. හැබැයි මොකක් ද වුණේ?

2010 අගෝස්තු මාසයේ 3 වන දා එතුමිය මේ පිළිබඳව පැහැදිලිව ලිපියක් ඉදිරිපත් කර තිබියදී, 2010 අගෝස්තු මාසයේ 30වන දා මේ නඩුව විභාගයට ගත් වෙලාවේ නීතිපතිවරයා, කිසිම වග විභාගයක් නැතිව සුධර්මා කරුණාරත්න මහත්මිය තමන්ට දැනුම් දුන්නාය කියා ගරු උසාවියත් නොමඟ යවා මේ නඩුව ඉල්ලා අස් කර ගත්තා.

නඩුව ඉල්ලා අස් කර ගත්තා විතරක් නොවෙයි, ඊට පස්සේ සුධර්මා කරුණාරත්න මහත්මියට - රේගු අධ්‍යක්ෂ ජනරාල්වරියට- අගෝස්තු මාසයේ 26 වැනිදා දාතමින් ලිපියක් යවනවා. ඒ ලිපිය තැපෑලෙන් නොවෙයි යවන්නේ. Hand deliver කරනවා. අතේ ගිහිල්ලා භාර දෙනවා. ඒ අතේ ගිහිල්ලා භාර දෙන ලිපියේ දිනය සඳහන් කර තිබෙන්නේ 2010 අගෝස්තු 26. නමුත් ඇත්තටම ලිපිය ගිහිල්ලා භාර දෙන්නේ දවස් පහකට පස්සේ, අගෝස්තු 31 වැනිදා. අද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුව ඒ ලිපිය තිබෙනවා. එහි Customs date stamp එක ගහලා තිබෙනවා. ඒ date stamp එකේ තිබෙන්නේ අගෝස්තු 31 වැනිදා දිනයයි. හැබැයි, ලිපියේ සඳහන් කර තිබෙන දිනය අගෝස්තු 26යි. නමුත් අගොස්තු 31 වැනිදා ලිපිය භාර දෙන කොට - hand deliver කරන කොට- අගෝස්තු 30 වැනිදා උසාවිය නඩුව විභාගයට අර ගෙන ඉවරයි. අගෝස්තු 30 වැනිදා මේ මොහාන් පීරිස් මහතා -නීතිපතිවරයා- නඩුව ඉල්ලා අස් කර ගෙන ඉවරයි. ඒ නඩුව ඉල්ලා අස් කර ගත්තේ කාගේ අනුමැතියට යටත්වද? මේ රටේ ජනතාවට අය විය යුතුව තිබුණ රුපියල් මිලියන 619ක සල්ලි කන්දරාවක් එක්ක තමයි තනි පෞද්ගලික තීරණයට අනුව මේ සෙල්ලම් කරන්නේ. හරි පැහැදිලිව මෙතැන අත යට ගනුදෙනුවක් සිද්ධ වෙලා තිබෙන බවට සැකයක් තිබෙනවා. මේ හිටපු නීතිපතිවරයා කරපු වැරැද්ද. මේ රටේ නීතිය රකින්න, මේ රටේ නීතිය ආරක්ෂා කරන්න මැදිහත් වන, ජනතාව වෙනුවෙන් මැදිහත් වන එවකට හිටපු නීතිපතිවරයා වන මොහාන් පීරිස් මහතා කරපු වැරැද්ද තමයි මේ. මේක තමයි, නීතිය හෑල්ලුවට ලක් කිරීම. ඒ නිසා තමයි අද ජුලම්පිටියේ අමරේලා සෙල්ලම් කරන්නේ.

පසු ගිය දවස්වල මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ස්ත්‍රී දූෂණ චෝදනාවකට උසාවිය ඉදිරියට කැඳවපු වෙලාවකදී ඒ තිබුණ චෝදනාව ඉල්ලා අස් කර ගත්තේත් මේ හිටපු නීතිපතිවරයාම තමයි; මොහාන් පීරිස් මහතාම තමයි. ඉතින් අද ස්ත්‍රී දූෂණ, ළමා අපචාර සිදු වෙනවා. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු, තංගල්ලේ නගර සභාවේ මන්ත්‍රීවරු හැම තැනම අවුරුදු 14, 15 දැරියන්ව දූෂණය කරනවා. ඒ දූෂණය කරන කොට නීතිය හෑල්ලුවට ලක් වෙලා තිබෙනවා. ඒ විධියට නීතිය හෑල්ලුවට ලක් වන තැනට පත් කළේ වෙන කවුරුවත් නොවෙයි, උඩින්; ඉහළින් ඒ දීපු වැරදි ආදර්ශයන්. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සම්බන්ධයෙන් ස්ත්‍රී දූෂණයක් පිළිබඳව චෝදනාවක් ඉදිරිපත් වුණාම ඒ හිටපු නීතිපතිවරයා නඩුව ඉල්ලා අස් කර ගත්තා. ඒ මම කිව්වේ එක සිද්ධියක් ගැන විතරයි. එවැනි අපරාධ සම්බන්ධයෙන් ඔහු ඉල්ලා අස් කර ගත්ත නඩු ගොඩක් තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇතුළේ තමයි ප්‍රාදේශීය සභා සභාපතිවරු, සුනිල්ලා, ජුලම්පිටියේ අමරේලා, තංගල්ල නගර සභාවේ මන්ත්‍රීවරු පෝලිමේ මේ ක්‍රියාවලියේ නිරත වන්නේ. කොයි තරම් පාදඩ තත්ත්වයකට සමාජය වැටුණාද කියලා බලන්න. මාරපන සුනිල්ගේ; අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ මැතිවරණ තේමා පාඨය මොකක්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනායි ඉන්නේ. ඒ දෙදෙනාත් නිදි. වැදගත් විෂයයක් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, මීට වඩා ආණ්ඩු පක්ෂයේ අවධානය යොමු කරවන්නය කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සභාවේ ගණපූරණය නැහැ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***සුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have three more minutes.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
[බාධා කිරීම්] කොහේද හිටියේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව විහිළුවක් කර ගන්න එපා කියලා මම විරුද්ධ පක්ෂයට කියනවා. මේ වෙලාවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE එක- පැවැත්වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - Committee on Public Accounts - පැවැත්වෙනවා. උපදේශක කාරක සභා - Consultative Committees - පැවැත්වෙනවා. විරුද්ධ පක්ෂයේ නායකතුමා කෝ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you may carry on.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

Hon. Azwer, உங்களுக்கு மூளை இல்லையா? - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! - [*Interruption.*] Hon. Azwer do you want to raise a point of Order again? [*Interruption.*] කරුණාකර වාඩි වෙන්න කෝ. What is the point of Order? [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

If that is so, you bring to the notice of the Speaker that on Sitting days of Parliament, we must not have any Committees.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Yes, but we need the Quorum.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You cannot have the cake and eat it too. මහා ප්‍රෝඩාවක් කරන්නේ විරුද්ධ පක්ෂයේ නායකතුමා. [බාධා කිරීම්] කෝ එතුමා? අපි challenge කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක් තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරිය - Director-General of Customs - යවපු ලිපි මම **සභාගත*** කරනවා. එම ලිපියේ ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා නීතිපතිවරයාට දැනුම් දීලා, මේ පිළිබඳ මැදිහත් වෙන්න කියලා. එහි 47වැනි වගන්තියේ එය ඉතා පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

සභාව විහිළුවකට ගන්න හදනවා. ඒකට ඉඩ දෙන්න බැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ඔබතුමන්ලා දෙදෙනාම වාඩි වෙන්න. [බාධා කිරීම්] Hon. Azwer, please sit down.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ලජ්ජයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

කාටද ලජ්ජා? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

කරුණාකර වාඩි වෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ලිපියේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "47. Written instructions were given to the Hon. Attorney General by my letter dated 03.08.2010 stating that withdrawal of the appeal to the Supreme Court at this stage is not appropriate, $P_{13.}$ The Attorney General by his letter dated 26.08.2010 has acknowledged the receipt of $P_{13.}$"

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුධර්මා කරුණාරත්න මහත්මිය නීතිපතිවරයාට යවපු මේ ලිපියේ ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, මේ නඩුව withdraw කර ගන්නා එක කිසිසේත්ම සුදුසු වෙන්නේ නැහැ කියලා; "not appropriate" කියලා. මිලියන 619ක බදු නොගෙවීම, බදු පැහැර හැරීම පිළිබඳව නීතිමය ක්‍රියා මාර්ග ගන්න කියලා මේ ලිපියේ සඳහන් වෙලා තිබියදීත්, හිටපු නීතිපතිතුමා ඒ පිළිබඳ මැදිහත් වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳ මැදිහත් නොවුණ එක විතරක් නොවෙයි, මේ රජයට, ආණ්ඩුවට, රටට හිමි වෙන්න තිබිච්ච රුපියල් මිලියන 619ක බදු මුදලක් ගෙවීම පැහැර හරිනවා, පසු ගිය නීතිපතිවරයා කරපු ඒ වැරදි ක්‍රියා මාර්ගය නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ මෙකයි. ලස්සන වචන තිබුණාට වැඩක් නැහැ. මේ බදු සහන දෙන අතරේ රටේ දුප්පත් ජනතාව මත බදු පටවලා; බදු දඬ, ණය පටවලා. මේ වාගේ ආයතනවල මහා පරිමාණව සිදු වන වංචාවලින් රටට සෙතක් වෙන්නේ නැහැ. ලස්සන වචන දැම්මාට හරි යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාරපන සුනිල්ගේ තේමා පාඨය වුණේත් "සීමා මායිම් නැති මනුස්සකම" යන්නයි. ඒක තමයි අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ මැතිවරණ තේමා පාඨය. ඒ වාගේ ලස්සන වචනවලින් මේවා යට

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගහන්න බැහැ. මහා පරිමාණයෙන් සිදු වෙන මේ බදු වංචා පිටුපසින් ඉන්න, නීතිය රකින්න යැයි කියන හිටපු නීතිපතිවරයා කරපු වැරැදි වලින් දීලා තිබෙන ඒ නරක පූර්වාදර්ශ බලපා තිබෙනවා රටේ අද මේ තත්ත්වය මතු වෙන්න. අන්න ඒවා වළක්වන්න වහාම පියවර ගන්නා ලෙස අවධාරණය කරමින් මම නතර වෙනවා.

[අ. භා. 3.46]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ජාතික අය වැය හා සමගාමීව මුදල් අමාත්‍යාංශය හරහා මේ රටේ ප්‍රධාන අමාත්‍යාංශ දෙකකට, එනම් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට, වරාය අමාත්‍යාංශයට බදු සහන ලබා දීම සඳහා මේ ඉදිරිපත් කළා වූ නියෝගය, අදාළ සමාගම්වලට, විශේෂයෙන්ම මේ රටේ ගුවන් සේවා ක්ෂේත්‍රයට, ඒ වාගේම වරායට දුන්නා වූ අතිමහත් අත් වැලක් කියලායි අප හිතන්නේ.

අද විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා තේරුම් ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම ගුවන් සේවාව, එහෙම නැත්නම් වරාය වාගේ දේවල්, ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍යය ආදිය මේ රටේ ප්‍රධාන අංශයි; සේවා සපයන අංශයි. සමහර වෙලාවට පාඩු ලැබුවත් මේ රටේ හුදී මහ ජනතාව වෙනුවෙන්, අහිංසක ජනතාව වෙනුවෙන් මේ සේවාවන්, මේ ආයතන පවත්වා ගෙන යන්න ඕනෑ. එහිදී විශේෂයෙන්ම ප්‍රවාහන සේවයට ලොකු තැනක් ලැබෙනවා. මේ රට සිදු කරන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනුවලදී, මේ රටේ ජනතාව විදේශයන්ට යද්දී එද්දී - ගමනාගමනයේ යෙදෙද්දී භාණ්ඩ හුවමාරු වෙන කොට විශේෂයෙන්ම වරාය හා ගුවන් සේවා අංශය තමයි මේ රටේ ජනතාවට විශාල වශයෙන්ම බලපාන ප්‍රධානම අංශය වන්නේ. ඒ නිසා ආණ්ඩු පක්ෂය හැටියට අපි හිතනවා මේ ලබා දුන්නා වූ බදු සහන තුළින් මේ ආයතන ලොකු ශක්තියක් ලබා ගන්නවා කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පෙර ගුවන් සේවා ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටි කෙනෙක් නිසා විශේෂයෙන්ම අද එයාර් ලංකා සමාගම ගැන කථා කරන්න ඕනෑ. 1979 දී ශ්‍රීලන්කන් ගුවන් සේවය, නැත්නම් එයාර් ලංකා සමාගම එවකට පැවැති රජය පටන් ගත්තේ Air Ceylon කියන ආයතනය වහලා දාලා. Air Ceylon ආයතනය වහලා දැම්මේ තනිකර දේශපාලන පළි ගැනීමකට. Air Ceylon ආයතනය ඒ වෙලාවේ ණය බරින් මිරිකිච්ච, එහෙම නැත්නම් රටට පාඩුවක් ලබා දෙන ආයතනයක් බවට පත් වෙලා තිබුණේ නැහැ. නමුත් විවෘත ආර්ථිකයක් කර පින්නා ගෙන ආපු 1977 රජයට -මේ ගොල්ලන්ට- ඕනෑ වුණා අලුත් ගුවන් සේවාවක් පටන් ගන්න. අන්න ඒක තමයි උන්මාදය. ජේ.ආර්. ජයවර්ධනට තමයි අලුත් ගුවන් සේවාවක් පටන් ගන්නා උන්මාදය තිබුණේ. ඒ ගුවන් සේවාව තමයි Air Lanka කියලා පටන් ගත්තේ. Air Ceylon ආයතනයේ හිටපු සියලුම සේවක පිරිස දොට්ට දාලා තමන්ට බැළමෙහෙවරකම් කරන හෙංචයියලාව එකතු කර ගෙන තමයි එයාර් ලංකා සමාගම පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1997 වන කොට මේකේ පාඩුව මිලියන 2,700යි. මට කලින් කථා කරපු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එතකොට පොඩියි. එතුමා ඉපදිලාද, නැද්ද කියලාත් මම දන්නේ නැහැ. 1997 දී එයාර් ලංකා සමාගමේ පාඩුව මිලියන 2,700යි. [බාධා කිරීමක්] මම කියන්නම්. තමුන්නාන්සේ මට අවස්ථාව දෙන්න. 1997 දී පාඩුව මිලියන 2,700යි. [බාධා කිරීමක්] හරි, හරි කියන්නම්. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ රජයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ බෑනා කවුද? හියුබට් ජයකොඩි. ඔහුගේ හියුජේ කොම්පැනියෙන් නුවරඑළියේ මල් කපනවා. මල් ටික කොළඹට ගෙනෙන තුරු aircraft එක නවත්වා ගෙන ඉන්නවා. තමුන්නාන්සේ ඒවා දන්නේ නැහැ. ඒ කාලයේ තමුන්නාන්සේ බබෙක්. හරින් බබා දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පාස්කරලිංගම්, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම්. ඔහු එයාර් ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටියේ. ඔහු එනවා Airport එකට. බෑග් එක උස්සා ගෙන යන්න සභාපති එනවා. පැයක් නොවෙයි, පැය දෙක තුනක් flight එක delay කරනවා. කාටද මේ? පාස්කරලිංගම්ට යන්න. තමුන්නාන්සේලාගේ හිටපු විදේශ ඇමති, හමීඩ් මොනවාද කළේ? අද කථා කරනවා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ ගුවන් සේවාව පාවිච්චි කරලා විදේශ සංචාරවලට යනවා කියලා. ඒ යන්නේ රට වෙනුවෙන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

කොහේද රට වෙනුවෙන් යන්නේ?

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ඒ යන්නේ රටේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ රජයේ විදේශ කටයුතු ඇමති විධියට සිටි ඒ.සී.එස්. හමීඩ් කවදාකවත් Air Lanka flight එකක ගියේ නැහැ. හැම දාම සුපර් සොනික් ජෙට්වල ගියේ; දැවැන්ත මුදල් ප්‍රමාණයක් වියදම් කරලා සුපර් සොනික් ජෙට්වල ගියේ. නුවරඑළියේ ඉඳලා හියුබට් ජයකොඩිගේ මල් ටික එන තුරු aircraft එක ගාල් කරලා තිබ්බා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා තමයි Air Lanka එක පාඩු කළේ. හොඳට තිබුණු Air Ceylon එක වහලා Air Lanka එක පටන් අරගෙන SriLankan Airlines එකට, එහෙම නැත්නම් Air Lanka එකට අපේ රටේ මිනිසුන්ගේ මුදල් දාලා විනාශ කළා. එතකොට අපේ 1997 රජයට කර ගන්න දෙයක් නැතිව ගියා. මම මේ වෙලාවේ තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට විරුද්ධව 1992 මාර්තු මාසයේ 17 වැනිදා විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාය කියලා. කවුද ගෙනාවේ? රිචර්ඩ් පතිරණ මහතා. එතුමා පසුව අපේ හිටපු අධ්‍යාපන ඇමති; සභානායකතුමා. එතුමා ගෙනාවා විශ්වාස භංග යෝජනාවක්. ඒකේ ප්‍රධාන කරුණු 4ක් තිබුණා. ඒ කරුණු 4න් දෙකක්ම SriLankan Airlines එක ගැන. තමුන්නාන්සේලා මිලියන 700ක් වෙන් කරලා SriLankan Airlines එකට aircraft මිලදී ගන්න යනවාය කියන කාරණාව උඩ තමයි ඒ විශ්වාස භංගය ගෙනාවේ. තමුන්නාන්සේලා තමයි එයාර් ලංකා සමාගම විනාශ කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවය පෞද්ගලීකරණය කළා; එමිරේට්ස් ආයතනයට දුන්නා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

කවුද දුන්නේ?

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඒ වැඩේ හොඳද, නරකද?

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ඒ වෙලාවේ වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලා මේක විනාශ කළා. අද විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කළා. මගේ කථාවට පසුව සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කරන්නට බලා ගෙන ඉන්නවා, මේ Mihin Air ගැන. ඇයි, Mihin Air එක පටන් ගන්න සිදු වුණේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Mihin Air සමාගම පටන් ගන්න සිදු වුණු හේතුව මම කියන්නම්. ඒ වෙලාවේ ධර්මසිරි සේනානායක මැතිතුමා තමයි සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ. එතුමාට කර ගන්න දෙයක් තිබුණේ නැහැ. ජනාධිපතිතුමියටත් කර ගන්න දෙයක් තිබුණේ නැහැ. මිලියන 2,700ක ණයක් තිබුණා. මේ රට දවසින් දවස මේ ගුවන් සේවාවත් එක්ක ණයෙන් ණයට යන්නට වුණා. එමිරේට්ස් ගුවන් සේවය පටන් ගත්තා. හැබැයි, සම්පූර්ණ වටිනාකමකින් යුත් මේ ගුවන් සේවය තමන්ගේ ග්‍රහණයට අරගෙන, හරියට ඒක තමන්ගේ බූදලයක් වාගේ එම අවුරුදු 10 පුරාවටම තබා ගත්තා. ඒ මඟින් අපේ ගුවන් සේවයට තාක්ෂණික අංශයෙන් යම් යම් ලාභ ලැබෙන්නට ඇති; තාක්ෂණික අංශයෙන් දියුණු වන්නට ඇති. හැබැයි අපේ අභිමානය සම්පූර්ණයෙන්ම විනාශ කළා. අපට ගුවන් සේවයක් නැති වුණා. අපට අනන්‍යතාවක් නැති වුණා. අපේ මිනිසුන්ට අවශ්‍ය කරන වෙලාවට ටිකට් එකක් වෙන් කර ගන්නට බැරි වුණා. කොටින්ම කියනවා නම්, මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඒ අවස්ථාවේ ගුවන් යානයේ ආසනයක් වෙන් කර ගන්නට බැරි වුණා. කවුද ඒ? මේ රටේ වර්තමාන ජනාධිපතිවරයා.

තමුන්නාන්සේලාට මතක ඇති, පාර්ලිමේන්තුවේ මේ ගැන ලොකු සටනක් තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඒ වෙලාවේ ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ වෘත්තීය සමිතියේ ප්‍රධාන සංවිධායක හැටියට කටයුතු කළා. ඒ වෙලාවේ අපට අරගලයක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. සම්පූර්ණයෙන්ම අපේ වැටුප් කප්පාදු කරලා, අපේ තිබුණු වරප්‍රසාද සම්පූර්ණයෙන්ම කප්පාදු කරලා තිබුණා. අපට අරගලයක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අපේ වෘත්තීය අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම විනාශ කරලායි තිබුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්න එහෙම තත්ත්වයකුයි තිබුණේ.

අපට ගුවන් සේවාවක් නැති වෙලා තිබෙන කොට තමයි Mihin Air සමාගම පටන් ගත්තේ. අද මේ අය කථා කරන්නේ කටින් නොවෙයි. අනේ! මේ පුංචි දිවයිනේ නම ගෙනිච්ච ගුවන් සේවය සම්පූර්ණයෙන්ම විනාශ වනකොට, එමිරේට්ස් සමාගම සම්පූර්ණයෙන්ම මේක විනාශ මුඛයට ගෙන යනකොට, අපට කියලා ගුවන් සේවයක් නැති වනකොට තමයි Mihin Air ගුවන් සේවය පටන් ගත්තේ. [බාධා කිරීම්] Mihin Air පාඩු ලබන්න ඇති. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Mihin Air පාඩු ලබන්න ඇති. හැබැයි Mihin Air සමාගම පටන් ගන්න වුණු හේතුව ඒකයි. අද කියනවා, ජනාධිපතිතුමා උන්මාදයෙන් මේක පටන් ගත්තා කියලා. ජනාධිපතිතුමා උන්මාදයෙන් නොවෙයි, දේශානුරාගයෙන් මෙය පටන් ගත්තේ. [බාධා කිරීම්] අතිගරු ජනාධිපතිතුමා මේ ගුවන් සේවය පටන් ගත්තේ එහෙමයි. හැබැයි, මේ නායකයාට කොන්දක් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ නායකයාට කොන්දක් තිබුණු නිසා තමයි එක්සත් අරාබි එමීර් රාජ්‍ය මේ කුඩා දිවයිනට සියලු බලපෑම් එල්ල කරද්දී අවුරුදු 10ක කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන්ම අවසන් කරලා, තව එක දවසක්වත් දෙන්නේ නැහැයි කියලා මේ SriLankan Airlines ගුවන් සේවය නැවත වතාවක් මේ දේශයට පවරා ගත්තේ. අද -[බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේලා වාගේ මල් ගෙනෙන්න පැය ගණන් ගත කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ මාමා වුණු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ ගුවන් සේවාව පටන් ගත්තේ සම්පූර්ණයෙන්ම ද්වේෂයෙන්. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, අපි ඒ කාලයේ ඉඳලාම ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීමක්] පටන් ගත්තා නොවෙයි, විනාශ කළෙත් එහෙමයි. මම කිව්වා නේ ප්‍රේමදාස මහත්මයාගේ බෑනා මල් ගෙනෙන්න පැය ගණන් ගුවන් යානය නවත්වා ගෙන සිටියා කියලා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වනකොට මේ ගුවන් සේවය රටවල් 25ක් පුරා ගමනාන්ත 45ක් දක්වා ගමන් කරමින් සිටිනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, you have one more minute. විනාඩියක් තිබෙනවා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගුවන් තොටුපොළවල් ගත්තාම ඒවා එක්සත් ජාතික පක්ෂ රජයේ තමුන්නාසේලාගේ කාලයේ ගුවන් තොටුපොළවල් වාගේ නොවෙයි. තමුන්නාන්සේලාගේ කාලයේ තිබුණු ගුවන් තොටුපොළවල් නිකම් මස් කඩ වාගේයි. අද ඕනෑම කෙනෙකුට ලජ්ජාවක් නැතිව මේ රටට ගොඩ බහින්න පුළුවන්; ඕනෑම කෙනෙකුට මේ රටින් පිටව යන්න පුළුවන්; අපේ ගුවන් තොටුපොළ කියලා කියන්න පුළුවන්. ඒ වාගේ ගුවන් තොටුපොළක් නිර්මාණය වෙලා තිබෙනවා. ගුවන් සේවා ක්ෂේත්‍රවල හිටපු අය දන්නවා, alternative airport එකක තිබෙන වටිනාකම.

අතීතයේ හිටපු ගුවන් සේවකයෝ හැටියට අද මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කරපු එක ගැන අපි ඉතාම සතුටු වනවා. අද මත්තල ගුවන් තොටුපොළ ඇති කරලා තිබෙනවා. අද හැම තැනම -මහනුවර, නුවරඑළියේ- domestic airports ඇති කර ගෙන යනවා. අද මේක තමයි රටේ අවශ්‍යතාව. අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය මේක හඳුනා ගෙන තිබෙනවා. අර මම කිව්වා වාගේ අද මේ ගුවන් තොටුපොළ අපේ ගුවන් තොටුපොළ කියලා අපට කැත නැතිව කියන්න පුළුවන්. අද ගුවන් සේවිකාවක් ගැන කථා කරනවා. ගුවන් සේවිකාවෝ නොවෙයි අපට මතකයි ඒ කාලයේ කිව්වා, පාර්ලිමේන්තුවට දෝෂාභියෝගය ගෙනාපු වෙලාවේ කන්‍යාවියෝ ගෙනැල්ලා මොනවාද කළාය කියලා. දැන් එක ගුවන් සේවිකාවක් ගැන කථා කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, please wind up now.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බලු පැටව්, බලු පැටව්.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

පිස්සු කථා කරන්න එපා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම තමුන්නාන්සේගෙන් එක විනාඩියක් ඉල්ලනවා. එක්සත් ජාතික පක්ෂයේ අය තමයි ගුවන් සේවාව සම්පූර්ණයෙන් වෙනස් කළේ.

අද වරාය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා වරාය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වෙනවාය කියලා ද්වේෂයෙන් තමයි කථා කළේ. වරාය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවාය කිව්වා. මෙතැන වරායක් හැදෙන්නේ නැහැයි කියලා කිව්වා. නමුත් අද වරාය ඇති වෙලා තිබෙනවා. ඇස් කන් තියෙනවා නම් අද අර ගෝල්ෆේස් පිට්ටනියට ගිහිල්ලා බලන්න. ඔය salons අස්සේ යන්න එපා. ගෝල්ෆේස් පිටියට යන්න, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
අවසන් කරන්න, මන්ත්‍රීතුමා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගිහිල්ලා බලන්න, කොළඹ වරාය දියුණු වන හැටි. තමුන්නාන්සේලා නිකම් කවුරුවත් ලියලා දෙන එක කියවන්න එපා. අනික් අය බඳින ඔරලෝසු ගැන නොවෙයි කථා කරන්න ඕනෑ. ඇහැට පෙනෙන සංවර්ධනයක් වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
අවසන් කරන්න, මන්ත්‍රීතුමා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ රජය ගුවන් සේවා ක්ෂේත්‍රයෙන් මේ රට ඉහළම තැනකට ගෙනි යනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Niroshan Perera. Before that, will an Hon. Member propose the Hon. Perumal Rajathurai to take the Chair?

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)
I propose that the Hon. Perumal Rajathurai do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

[අ. භා. 4.01]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බඳු පනත යටතේ විවාද කරන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට මටත් අවස්ථාවක් ලබා දීම ගැන ප්‍රථමයෙන්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි සියලු දෙනාම දන්නවා, වරාය හා ගුවන් තොටුපොළ කියන්නේ ආර්ථිකයක ඉතා වැදගත් ස්ථාන කියලා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයත්, ආනයන අපනයන කර්මාන්තත් මේ තුළින් ඍජු ලෙස යැපෙනවා. ලෝක ආර්ථිකයේ උපරිම වාසි ලබා ගන්න ඕනෑ නම් මේ සේවාවන් පුළුල් කරලා, කාර්යක්ෂම කරලා, තරගකාරී මිලක් ලබා ගන්න පුළුවන් විධියට මේ ස්ථාන දියුණු කරන්නට අපට සිදු වෙනවා. මෙම අභියෝග ජය ගැනීමට සිංගප්පූරුව, ඩුබායි වැනි ආසියාවේ තිබෙන අනිකුත් රටවල් සමඟ තරග කරන්නට අද අපට සිදු වෙලා තිබෙනවා. එමෙන්ම අපි මතක තබා ගත යුතුයි, විශේෂයෙන්ම අපේ අසල්වැසි ඉන්දියාවේ ගුවන් තොටුපොළවල් හා වරායන් අද වන විට ඒ රට ශීඝ්‍රයෙන් දියුණුව කරා ගෙන එන බව. ශ්‍රීලන්කන් ගුවන් සේවය, මිහින් එයාර් ගුවන් සේවය, කොළඹ හා හම්බන්තොට වරායන් යන මේවා අද අභියෝග රාශියකට මුහුණ පා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිහින් එයාර් කියන්නේ මොකක්ද? මිහින් එයාර් කියන්නේ මේ රජයේ තිබෙන දූෂණයේ හා නාස්තියේ සංකේතයක්. මිහින් එයාර් ගුවන් සේවය ආරම්භයේ සිට අද වනකොට මිලියන 13,000ක් අපේ රටට අහිමි වෙලා තිබෙනවා. ගුවන් මඟියෙක් ගෙන යනකොට රුපියල් 21,000ක් අපේ රටට අහිමි වෙනවා. මෙම ගුවන් සමාගමේ ඉතිහාසය ගැන ඉස්සර මේ පාර්ලිමේන්තුවේදී කථා කරලා තිබුණත් අද නැවතත් ඒක මතක් කර දිය යුතුයි.

මෙම ගුවන් සේවය 2007 අප්‍රේල් මාසයේදී A320 Airbus දෙකක් lease කරලා තමයි වැඩ පටන් ගෙන තිබෙන්නේ. ඉතිහාසය පුරාම ඒ ගුවන් යානා lease කරපු සමාගම්වලට මුදල් ගෙවන්න බැරුව, ඒ වාගේම SriLankan Airlines එකට ground handlingවලට මුදල් ගෙවන්න බැරුව 2008 අප්‍රේල් මාසය වනකොට මිහින් එයාර් එකට තිබුණු අන්තිම යානයත් - ඒත් A320 එකක් - ආපහු ගත්තා. ඒකේ සියලුම operations නවත්වා දැම්මා. මිහින් එයාර් එකෙන් අපේ රටට අහිමි කරලා තිබෙන මුදල් ප්‍රමාණය ගැන බැලුවොත්, ආරම්භයේදී රජය මිලියන 250ක් යොදවා තිබෙනවා. ඊළඟට ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් මිලියන 300ක් ණයට අරගෙන තිබෙනවා. 2008 දී රජය තව මිලියන 500ක් මේකට යොදවා තිබෙනවා. 2009 දී රජය මිලියන 3000ක් යොදවා තිබෙනවා. 2009 දී රජය ආයෙත් මිලියන 2754ක් යොදවනවා. ඒ විතරක් නොවෙයි රජය ඇප වෙලා ලංකා බැංකුවෙන් මිලියන 250ක සහ මිලියන 1553ක ණයක් ලබා දී තිබෙනවා. Airport and Aviation Services (Sri Lanka) Limited එකට මිහින් එයාර්වලින් තිබුණු ණය ගෙවා ගන්න බැරුව රජය තව මිලියන 500ක් ගෙවා තිබෙනවා. 2011 අප්‍රේල් මාසයේ සිට 2012 ජනවාරි දක්වා මිහින් එයාර් එකේ පාඩුව තවත් මිලියන 1700ක් වෙලා තිබෙනවා. රජය විසින් තවත් ප්‍රකාශයක් කරලා තිබෙනවා, තව මිලියන 2400ක ණයක් මිහින් එයාර් එක වෙනුවෙන් ගෙවනවාය කියා. මිහින් එයාර් එකෙන් වුණේ එතැන හිටපු කෙනෙක් මේ පාර්ලිමේන්තුවට ආපු එක පමණයි. ඒකේ තිබුණු මුදල් කොයි තරම් නාස්ති කරලා තිබෙනවාද කිව්වොත්, කොයි තරම් හොරකම් කරලා තිබෙනවාද කිව්වොත්, Mihin Air ගුවන් සමාගම අපේ පාර්ලිමේන්තුවේ COPE එකට ලබා දුන් දත්ත සාවද්‍යයයි කියලා Auditor-General පවා පෙන්වලා දීලා තිබෙනවා. ඒක තමයි මේකේ තත්ත්වය.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

අපි අපේ ජාතිකත්වය ගැන කථා කරනවා. අපි කොහොමද අපේ ජනතාවට මේ සේවා ලබා දෙන්නේ කියලා කථා කරනවා. නමුත් මේකේ පාඩුව ගෙවන්නේ කවුද කියලා අපි කවුරුත් දන්නේ නැහැ. මේකේ පාඩුව අද ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ දුගී දුප්පත් ජනතාවටයි. මේකේ පාඩුව පියවන්න බදු ගහලා අපේ ව්‍යාපාර කඩා ගෙන වැටිලා, අපේ රටේ තිබෙන සම්පත් නැති වෙලා තමයි අද Mihin Air ගුවන් ගමන් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම SriLankan Airlines ආයතනය අරගෙන බලන්න. 2008 දී රුපියල් මිලියන 4,889ක් ලාභ ලැබුවා. අපි පිළිගන්නවා, පසු ගිය දවස්වල ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වුණා කියලා. ඒක අපි පිළිගන්නවා. නමුත් බලන්න, 2008 දී -ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මුළු විස්තරයම හරියට කිව්වේ නැහැ- එමිරේට්ස් සමාගම SriLankan Airlines පරිපාලනයෙන් ඉවත් වුණා. ඊට පස්සේ මොනවාද වෙලා තිබෙන්නේ කියලා බලන්න. 2009 දී එම ගුවන් සමාගම රුපියල් මිලියන 9,996ක පාඩුවක් ලබනවා. 2010 දී රුපියල් මිලියන 6,003ක පාඩුවක් ලබනවා. 2011 දී රුපියල් මිලියන 19,100ක පාඩුවක් ලබනවා. ඒ පාඩු සියල්ලම සිදු වෙන්නේ කටුනායක ගුවන් තොටුපළේ ground handling, catering සියල්ලම තියා ගෙනයි. අද SriLankan Airlines ආයතනය රුපියල් මිලියන 19,100ක පාඩුවක් ලබන කොට අපි ඒක ආසියාවේ තිබෙන අනෙකුත් ගුවන් සමාගම් එක්ක සන්සන්දනය කරලා බලමු.

අද වන විට SriLankan Airlines ගුවන් සේවයේ load factor එක අරගෙන බලන්න. ඒ කියන්නේ ගෙන ගිය මගීන්ගේ ගණන මුළු ආසන ගණනින් බෙදනවා. එහෙම තමයි කොච්චර ගෙනි යනවාද කියලා සාමාන්‍යයෙන් ප්‍රතිශතයක් වශයෙන් බලන්නේ. ඒක SriLankan Airlines ආයතනයේ සියයට 78ක් තිබෙනවා. නමුත් බලන්න, Singapore Airlines ආයතනය දෙස. අද අපි රුපියල් මිලියන 19,100ක පාඩුවක් ලබන කොට Singapore Airlines ආයතනය සියයට 78ක load factor එකක් එක්ක US Dollars මිලියන 878ක ලාභයක් ලබනවා. Emirates ආයතනය අරගෙන බලන්න. Emirates ආයතනය US Dollars මිලියන 1,600ක ලාභයක් ලබනවා. ඒ, 2011 දී. Qatar Airways ගුවන් සමාගම US Dollars මිලියන 205ක ලාභයක් ලබනවා. Cathay Pacific ගුවන් සමාගම US Dollars මිලියන 700ක ලාභයක් ලබනවා.

ඒ සියලුම ගුවන් සේවා එක්ක තමයි අපි තරග කරන්න ඕනෑ. මේවා කියන කොට ගරු ඇමතිතුමා හිනා වෙනවා. නමුත් ඒ සියලුම ගුවන් සමාගම්වල load factor එක අරගෙන බැලුවොත් ඒක අපේ SriLankan Airlines ගුවන් සමාගමේ load factor එක හා සමානයි. නමුත් අපේ ලාභය කොහේද ගියේ කියන එක අපට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒක මේ ආයතනයේ පරිපාලනයේ දුර්වලකමක්ද, නැත්නම් මේ airline එක දේශපාලනීකරණය වෙලාද කියලා අපට අද අහන්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ජනාධිපතිතුමාගේ විදේශ සංචාර අරගෙන බලන්න. අපි පිළිගන්නවා, රාජ්‍ය නායකයෙක් රට යන කොට plane එකේ තමයි යන්න ඕනෑ කියන එක. බස් එකේ යන්න බැහැනේ. නැව්වල යන්න ගියොත් ටිකක් කාලය ගත වෙනවා. මාසයක් විතර ජනාධිපතිතුමාව දකින්න හම්බ වෙන්නේ නැහැ. පංගුවක් වෙලාවට මාසයක් ගිහිල්ලා මාස තුනක් විතර පරක්කු වුණොත් පාර්ලිමේන්තුවට එන්නත් බැරි වෙයි. නමුත් අද සිද්ධ වෙලා තිබෙන්නේ මොනවාද කියලා බලන්න. අපි නොවෙයි මේවා කියන්නේ. මේවා පුවත් පත්වල පළ කරලා තිබෙනවා.

2012.06.17වන දින "ද සන්ඩේ ලීඩර්" පුවත් පතේ කියනවා, ජනාධිපතිතුමා SriLankan Airlines එක එතුමාගේ private jet එක හැටියට සලකනවා කියලා. මම ඒ පුවත් පත් වාර්තාව **සභාගත*** කරනවා.

ජනාධිපතිතුමා මේ ළඟදි තායිලන්තයේ සංචාරයකට ගියා. ඒ සංචාරය අතරතුර එතුමා නැවතත් ලංකාවට ඇවිත් තිබෙනවා, තොණ්ඩමන් ඇමතිතුමාගේ දුවගේ විවාහ මංගල්‍යයට. ඔන්න බලන්න වෙන දේ. ඒකට කවුද ගෙවන්නේ? ඒ වාගේම ජනාධිපතිතුමා ලන්ඩන් ගිය වෙලාවේ -

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ජනාධිපතිතුමා ලංකාවට ආවේ, ලංකාවට එන plane එකක seat එකක. ඒකට වැරදි අර්ථකථනයක් දෙන්න එපා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
හරි. හිටගෙන එන්න බැහැ නේ. දෙවන එක බලන්නකෝ, "ජනාධිපතිතුමා හා දූත පිරිස ලන්ඩන්වලට". ලන්ඩන්වලට ගිය ගුවන් යානය නැවත එන්නේ හිස් ගුවන් යානයක් හැටියට. මගීන් ගෙනෙන්නේ නැහැ. මම සභාගත කරපු ලියවිලිවල ඒක සඳහන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද SriLankan Airlines එකේ duty free products contract එකට මොනවාද වෙලා තිබෙන්නේ? ඒක Phoenix Rising Ventures සමාගමට ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ලබා දීලා තිබෙනවා. ඒක SriLankan Airlines සභාපතිතුමාත් අද පිළිගෙන තිබෙනවා. මොකක්ද ඒකෙන් වෙලා තිබෙන්නේ? ඒ වාගේ ප්‍රශ්න තියෙනකොට, කොමිස් මුදල් සම්බන්ධ බරපතළ චෝදනා තියෙනකොට අපි කොහොමද සාධාරණීකරණය කරන්නේ, රුපියල් මිලියන 19,100ක් පාඩු ලබන එක? ඒ සියලුම විස්තර තිබෙනවා. ඒ duty-free contract එකම රුපියල් මිලියන 487ක් වැනි විශාල මුදලක්. ඒ බව සඳහන් 2012.07.08 දින 'ද සන්ඩේ ලීඩර්' ප්‍රවෘත්තිය මම **සභාගත*** කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කොහොමද ගහන ගැහිල්ල. ටෙන්ඩර් නැහැ. [බාධා කිරීම්] ඔරලෝසු ගන්න බැරිද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බලන්න අද විදුලිබල ඇමතිතුමා මොනවාද කියලා තිබෙන්නේ කියලා. විදුලිබල ඇමතිතුමාට චෝදනාවක් තියෙනවාලු ලංකා තෙල් සංස්ථාවෙන්, විදුලිබල මණ්ඩලය නිසා තමයි ලංකා ඛනිජ තෙල් සංස්ථාව පාඩු ලබන්නේ කියලා. නමුත් එතුමා කියනවා මේ විධියට. මෙය පත්තරේ තමයි තිබුණේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මොකක්ද, පත්තරේ?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
"Ceylon Today" පත්තරේ. ඒ පත්තරේ තිබෙනවා, තෙල් සංස්ථාව පාඩු ලබන්නේ, විදුලිබල මණ්ඩලය නිසා නොව, ශ්‍රීලන්කන් ගුවන් සේවය හා මිහින් ගුවන් සේවය නිසාය කියලා. රුපියල් බිලියන 18ක් වැනි මුදලක් ඒ සමාගම් තවමත් තෙල් සංස්ථාවට ගෙවන්න තිබෙනවා කියලා තමයි එතුමා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බලන්න, පසු ගිය අවුරුද්දේ සැප්තැම්බර් 23වන දා SriLankan Airlines එකේ UL564 ගුවන් යානය Paris Airport එකේදී රඳවා ගත්තා. ඒක රඳවා ගත්තේ මොකද? ඒ plane එක European Safety Standardsවලට නැහැ, ඒ නිසා ඒ plane එක ගුවන් ගත කරන්න බැහැ කියලා ඒ ගොල්ලන් රඳවා ගත්තා. ඒකෙන් විශාල පාඩුවක් වුණා. මගීන් වෙන ගුවන් යානාවලට දමන්න සිද්ධ වුණා. ලන්ඩන් සිට කොළඹ එන plane එකට පැරිස් ගිහින් ඒ මගීන් කොළඹට ගෙනෙන්න සිද්ධ වුණා. ඒකෙන් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ කීර්ති නාමයට විශාල හානියක් වුණා. ඒ වාගේම අද වන විට වාර්තා වෙලා තිබෙනවා, මිහින් ලංකා ගුවන් නියමුවන් SriLankan Airlines entrance exam එක අරගෙන fail වෙලා තිබෙන බව. ඒ නිසා අද safety ගැන ඉතා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ විස්තර ජනතාව අතරට ගියොත් මේ සමාගම්වලට විශාල අපකීර්තියක් සිදු වෙනවා.

අපි දන්නවා, පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ඇමතිතුමා හොඳ සේවාවක් ඉටු කරන බව. ඔබතුමා හොඳ කීර්තිමත් දේශපාලනඥයෙක්. ඔබතුමාට අපි මේ ප්‍රශ්න කියන්නේ මේ අඩු පාඩු හදා ගන්නයි. මේ කටයුතුවලට දිගින් දිගටම ඇඟිලි ගහන බව මම දන්නවා. ඒ ඇඟිලි ගසන්නේ අමාත්‍යතුමාට වඩා ඉහළ කෙනෙක්. ඉහළ උදවිය තමයි මේවාට ඇඟිලි ගසන්නේ.

අද ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපතිතුමාට මොකද වෙලා තිබෙන්නේ. සභාපතිතුමාගේ ගෙදර හොරු කැඩුවා. ඒ හොරු කඩපු සිද්ධිය තමයි දැන් පුවත් පත්වල ප්‍රධාන ප්‍රවෘත්තිය වෙලා තිබෙන්නේ. ඒ ගෙදරින් ලක්ෂ 40ක ඔර්ලෝසු හම්බ වෙනවාය කියනවා.

විදේශ මුදල් රුපියල් ලක්ෂ ගණන්, රුපියල් කෝටි ගණන් හම්බ වුණාය කියනවා. මේ වාගේ බරපතළ ප්‍රශ්න තබා ගෙන මේ වාගේ ගුවන් සේවයක් පරිපාලනය කරන්න පුළුවන්ද? ඒ වාගේ පරිපාලනයක් සිල්ලර කඩයක manager කෙනකුට දෙන්න බැහැ; වෙන කොහේවත් ඉන්න manager කෙනකුට දෙන්න බැහැ. ඒ සඳහා දක්ෂ, පළපුරුද්දක් - experience - තිබෙන කෙනකුට තමයි දෙන්න ඕනෑ. මේ වාගේ බරපතළ ප්‍රශ්න අද ශ්‍රීලන්කන් ගුවන් සේවය ඇතුළේ හට ගෙන තිබෙනවා.

ඉතින් මා හිතන හැටියට අපි මේවා නතර කරන්න ඕනෑ; නිවැරැදි කරන්න ඕනෑ. ලෝකයේ තෙල් මිල වැඩි වුණු නිසාම මේ රුපියල් මිලියන 19,100ක පාඩුව සිද්ධ වුණාය කියලා අපට පිළිගන්න බැහැ. ආසියාවේ අනික් ගුවන් සමාගම් ලාභ ලබන කොට, අපට ඒ ගුවන් සමාගම් සමඟ තරග කරන්න තිබෙන කොට, ලංකාව aviation hub එකක් කරන්න උත්සාහ කරන කොට මේ වාගේ නාස්තියක්, මේ වාගේ දූෂණයක් අපට පාලනය කරන්න බැරිව ගියොත්, අපේ අරමුණට ළඟා වන්නේ කොහොමද කියලා බරපතළ ප්‍රශ්නයක් මතු වනවා.

ඒ විතරක් නොවෙයි. පිට රටින් බලු පැටියකු ගෙනෙන්න plane එකේ වර්ගය පවා මාරු කරන තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. මේ සිද්ධිය ලෝකයේ ජනමාධ්‍යවලත් ප්‍රචාරය වුණා. ඒකෙන් අද ලංකාවේ අනිකුත් රට වැසියන්ට දෙන ආදර්ශය මොකක්ද කියලා බලන්න. අපි පිළිගන්නවා, පිට රටින් බලු පැටියකු ගෙනෙන්න ඕනෑ නම්, ඕනෑ කෙනකුට තමන්ගේ මුදල් පාවිච්චි කරලා, SriLankan Airlines එකකින් නොවෙයි, වෙනත් airline එකකින් හෝ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මල් යවන්නේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මල් නොවෙයි, මේ බලු පැටියෙක්. [බාධා කිරීම්] ස්විට්සර්ලන්තයේ ඉඳලා බලු පැටියකු ගෙනෙන්න,- [බාධා කිරීම්] ඔව්. ඒ ගුවන් යානයේ ගිය pilot අමුතුම pilot කෙනෙක්. එතුමාට සුදුසුකම් තිබෙන්නේ A-330 ගුවන් යානයක් පදවන්න විතරයිලු. හැබැයි සාමාන්‍යයෙන් එම අවස්ථාවේ ගුවන්ගත වීමට නියමිතව තිබුණේ A-340 ගුවන් යානයක්. මේ තොරතුරු පත්‍රවල පළ වෙලා තිබෙනවා. මේවා අපි කියන ඒවා නොවෙයි. මේවා අසත්‍ය නම් නඩු දමන්න කියන්න. එච්චරයි. වෙන මොනවත් අසත්‍ය ප්‍රකාශ කරන්න ඕනෑ නැහැ නේ. කුණුහරුපයෙන් බණින්න ඕනෑ නැහැ, මාධ්‍යවේදීන්ට තර්ජනය කරන්න ඕනෑ නැහැ, මාධ්‍යවේදීන් ඝාතනය කරනවාය කියන්න ඕනෑ නැහැ. මොකද, ලංකාවේ නමත් එක්ක කෝටි මාධ්‍යය මේ තොරතුරු ගන්නවා. කෝටි මාධ්‍යය මේවා අරගෙන, ලංකාවේ මෙහෙමයි වෙන්නේ කියලා තමයි ලෝකයට පෙන්වන්නේ. ඊට පස්සේ අපි ජිනීවා ගියාම මේවාට උත්තර දෙන්නේ කොහොමද කියන එක අපට බරපතළ ප්‍රශ්නයක්. බලු පැටියකු ගෙනෙන්න ඕනෑ නම් ඒකට නියම ක්‍රමයක් තිබෙනවා. එහෙම නේද හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා? ඒක කිව්වා නම් හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට හෝ ලලිත් දිසානායක ඇමතිතුමාට හෝ ගෙනැවිත් දෙන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ නේ. බලු පැටියාව ඔඩොක්කුවේ තබා ගෙන හෝ ගෙනෙන්න තිබුණා. ඒක ප්‍රශ්නයක් නැහැ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, your time is over.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ.

SriLankan Airlines සමාගම කියන්නේ අපේ රටට විශාල සම්පතක් කියලා අපි පිළිගන්නවා. අපට මතකයි, යුද සමයේ පවා අනික් ගුවන් සමාගම් අපේ රටට එන්නේ නැතුව සිටියදී, ශ්‍රීලන්කන් ගුවන් සමාගම අපේ සංචාරක කර්මාන්තයටත්, ඒ වාගේම ආනයන, අපනයන සඳහාත් විශාල දායකත්වයක් දුන්නු බව. ඒක අපි පිළිගන්නවා. ඒ නිසා මා හිතන හැටියට ඒ සමාගම ආරක්ෂා කර ගැනීම අප සියලු දෙනාගේම යුතුකමක් වනවා. අපි මේවා පෙන්වා දෙන්නේ, පෞද්ගලික වෛරයකින් හෝ වෙනත් හේතුවක් නිසා නොවෙයි, මේ ආයතනය තුළ සිදු වන වැරදි

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

දේවල් නතර කර ගන්නයි. මොකද, පාර්ලිමේන්තුවට වඩා ජනතාව මේ තොරතුරු දන්නවා. ජනමාධ්‍යවලින් මේවා එළියට ගිහිල්ලායි තිබෙන්නේ. ඒ නිසා ජනතාව දන්නවා, මොනවාද වන්නේ කියලා. ඉතින් ඒවා නතර කර ගන්න කියමින්, සියලු දෙනාටම ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Piyankara Jayaratne, please. You have 10 minutes.

[අ. භා. 4.22]

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අපේ මිත්‍ර ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාව අහ ගෙන හිටියා. එතුමා සාවද්‍ය තොරතුරුත් සඳහන් කළා. බලු පැටියෙක් ගෙනාව කථාව මම විශ්වාස කරන්නේ නැහැ. මොකද, ඒ විධියට ගුවන් යානයක් මාරු කරලා, ගුවන් නියමුවෙක් මාරු කරලා යවන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිව කියන්න ඕනෑ, ශ්‍රීලන්කන් ගුවන් සමාගමත්, මිහින් ලංකා ගුවන් සමාගමත් අද පස් අවුරුදු සැලැස්මකට අනුව කටයුතු කර ගෙන යනවාය කියන කාරණය. ඒ වාගේම ගුවන් යානයක් පැදවීමට හැකි වන්නේ අදාළ පන්තියේ licence තිබෙන කෙනෙකුට පමණයි. අපි වෙනත් කෙනෙකු යවන්නේ නැහැ. එහෙම වෙලා තිබෙනවා නම් අපි ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්නට බලාපොරොත්තු වනවා. [බාධා කිරීමක්] ඕනෑම කෙනෙකුට බලු පැටියෙක් ගේන්න පුළුවන්. [බාධා කිරීම්] මම ඒ කථාව පිළිගන්නේ නැහැ. නීත්‍යනුකූලව බලු පැටියෙක් ගේන්න පුළුවන්. ඕනෑම රටක ඒ සඳහා නීත්‍යනුකූල ක්‍රියාවලියක් තිබෙනවා; Customs එක තිබෙනවා. බලු පැටියෙක් නොවෙයි මිනිස් පැටියෙක් වුණත් ගේන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අලි පැටියෙක් වුණත් ගේන්න පුළුවන්.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මුදල් ගෙවනවා නම් ගේන්න පුළුවන්. සාවද්‍ය දේවල් කියන්න එපා. අතිගරු ජනාධිපතිතුමා රට වෙනුවෙන් තමයි මේ දේවල් කරන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලු පැටියා රට වෙනුවෙන්ද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
බලු පැටවු තමයි කෑ ගහන්නේ. ඒකයි ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියන්නට ඕනෑ. අද ජාතික සංවර්ධනයට ශ්‍රීලන්කන් ගුවන් සමාගම අත ගහලා තිබෙනවා. මේ වන විට අපි ලෝකය පිළිගත්ත ආයතන තුනක් සමඟ සම්බන්ධ වෙලා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ටිකට් පතකින් ලෝකයේ ඕනෑම තැනකට ගමන් කිරීමේ හැකියාව ඇති කරලා තිබෙනවා. යම් කිසි කාල පරිච්ඡේදයකදී මේ සේවාව පසු බෑමකට ලක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ ගුවන් සේවා ආයතන කඩා වැටිලා තිබෙනවා. සමහරු කියයි ලාභ ලබනවා කියලා. අපි දන්නවා Air Arabia, Fly Dubai, Emirates, Qatar වාගේ සමහර ගුවන් සේවා ආයතන ලාභ ලබනවා. ලාභ ලබන්නේ නැහැ. ලාභයක් පාඩුවක් නැතිව ගෙන යනවා. මොකද, ඒ රටේ තිබෙන ඉන්ධන සහනයන් ඒ ගුවන් ආයතනවලට දෙනවා. අපිට එහෙම නැහැ. ඉන්ධන ප්‍රශ්නයේදී අපේ ගුවන් සමාගම් පොඩ්ඩක් පස්සට යනවා. නමුත් අපි ඒ සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොයිම රටකවත් ඉන්ධන සහනයක් දෙන්නේ නැහැ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
නැහැ, අනෙක් රටවල දෙනවා. ටිම් ක්ලාක් එමිරේට්ස් ආයතනයේ සභාපතිතුමා අපට කිව්වා, අපි මේ ගුවන් සමාගම් අර ගෙන යන්නේ අපට රජයෙන් යම් කිසි ඉන්ධන සහනයක් ලැබෙන නිසායි කියලා. ඒ අය ලාභ ලබනවා වාගේම ලෝකයේ අනෙක් ගුවන් සමාගම් පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත් අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඉදිරි වර්ෂ 5 තුළ අලාභය අඩු කරලා ලාභ ලබන තත්ත්වයට ගේන්න අපි දැන් සැලසුම් සකස් කිරීමේ කටයුතු කර ගෙන යනවා. ඒ නිසා අපි අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, අපට බදු සහනයක් දෙන්න කියලා.

අපි ආසියාවේ ආශ්චර්යය කරා යද්දී, -තමුන්නාන්සේලා පිළිගන්නේ නැති වුණත් අපි ඒ ආශ්චර්යය කරා යද්දී- අපේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමට ලෝකයේ ඉල්ලුමක් තිබෙනවා. මිහින් ලංකා ආයතනයට වෙන්න පුළුවන්, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට වෙන්න පුළුවන්, ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමට වෙන්න පුළුවන් යම් කිසි කාරණා කිහිපයක් කේන්ද්‍ර කර ගෙන අපි බදු සහනයක් ඉල්ලා තිබෙනවා. ඒ බදු සහනය ලබා දීම ගුවන් සේවයටත්, අපේ අමාත්‍යාංශයටත්, මේ ආයතනයටත් ලබා දෙන මහා සහනයක් හැටියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් කාරණයක් සඳහන් කළ යුතුව තිබෙනවා. අද අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකාව ආසියාවේ ගුවන් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට කටයුතු කරනවා. මේ වර්ෂයේ අවසානයේ අපි මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ වන විට අපි බලාපොරොත්තු වන මගී ධාරිතාව මිලියන 6යි. අද අපේ ගුවන් තොටුපොළට ඇවිල්ලා

තිබෙන මගී ධාරිතාව මිලියන 6.2යි. වර්තමානයේ ගුවන් තොටුපළ පරිහරණය කරන පිරිස වැඩිවීම අනුව, 2015 දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ මිලියන 12ක පමණ මගී ධාරිතාවක් හසුරවන්න පුළුවන් ස්ථානයක් බවට පත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ කටයුතු ඉතා සාර්ථකව මේ වන විට ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අපි වාහනවලට හැර සියලු බදු සහන ලබා ගත යුතුව තිබෙනවා. ඒ සඳහා තමයි වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ මෙම නියෝගය ඉදිරිපත් කර සාකච්ඡාවට භාජනය කර තිබෙන්නේ. මෙම නියෝගය සම්මත කර ගත්තාට පසුව අපට මේ කටයුත්ත කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ ජාතික ගුවන් සේවය සෘජුව ගමනාන්ත 34ක් සහ රටවල් 22ක පියාසර කරනවා. ඒ වාගේම තවත් රටවල් 33ක්, ගමනාන්ත 60ක් සඳහා ඉදිරි කාල සීමාව තුළ පියාසර කිරීමට සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම සිවිල් ගුවන් සේවයේ වර්ධනය ගැනත් අපි විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

ආරක්ෂාව පිළිබඳව කථා කළා. ආසියා ශාන්තිකර කලාපයේ හොඳම ගුවන් සේවය සහ ගුවන් සංසරණ මධ්‍යස්ථානය බවට අද ලංකාව පත් වෙලා තිබෙනවා. අපි ලෝකයේ 14 වෙනි ස්ථානයට ඇවිත් තිබෙනවා. ඒ නිසා අපි ගුවන් සේවයක් හැටියට ලබාපු ලොකු උන්නතියක් ලෙසයි මෙය දකින්නේ. ඉදිරියේදී මෙම සේවාව ආසියා ශාන්තිකර කලාපයේ පළමුවෙනි තැනට ගේන්නට මේ වන විටත් සැලසුම් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ යානා නඩත්තු කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ ඒ වෙනුවෙන් දරන්න සිදු වන පිරිවැය දිනෙන් දින ඉහළ යන එක වළක්වන්න අපට බැහැ. ඒ නිසා බදු සහන ලබා දීමෙන් මේ නඩත්තු සඳහා යන ඒ වියදම අපට පාලනය කරන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම ලංකාව තුළ තවත් අභ්‍යන්තර ගුවන් තොටුපොළ දහයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය උපකරණ -රේඩාර් යන්ත්‍ර ආදිය- මිල දී ගන්න ඕනෑ. ඒ වාගේ විශාල උපකරණ රාශියක් අපට මිල දී ගන්න සිදු වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට ලැබෙන බදු සහන ඒ සඳහා විශාල සහනයක් බවට පත් වේවි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජාතික ගුවන් සේවයත්, මිහින් ලංකා ගුවන් සමාගමත් මෙසේ විවිධ අභියෝග සමඟ ඉදිරියට යන විට එම ආයතන සඳහා බදු සහන ලබා දීමෙන් ඔවුන් විසින් දැරිය යුතු පිරිවැය අවම කර ගන්න පුළුවන් වෙනවා. ඒ තුළින් අන්තර් ජාතික ගුවන් සේවය තුළ ඔවුන්ට තරගකාරීව මුහුණ දීමේ හැකියාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සේවය ගුවන් යානා සඳහා දැනටමත් ඉංජිනේරු සේවාවන් සපයමිනුයි ඉන්නේ. එම නඩත්තු සේවාවන් පිළිබඳව කලාපය තුළ මෙන්ම ජාත්‍යන්තරව ද ඉතා ඉහළ මට්ටමේ පිළිගැනීමක් තිබෙනවා. දැනට එම කාර්යය සඳහා ඔවුන්ට ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ අමතර කොටස් මිලදී ගැනීමේදී පවතින බදු ඉහළ මට්ටමක තිබීමයි. එම අමතර කොටස් මිලදී ගැනීමට අවශ්‍ය බදු සහන ලබා දීමෙන් ශ්‍රී ලාංකික අපේ ඉංජිනේරුවන්ට මෙම ඉංජිනේරු සේවා වෙළෙඳ පොළ තුළ ඉහළ මට්ටමේ සේවාවක් ලබා දී විශාල විදේශ විනිමයක් ලබා ගත හැකි වෙනවා. ශ්‍රම වෙළෙඳ පොළ තුළ රැකියා ලබා දීමේ හැකියාවක්ද ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගුවන් සේවාව ශ්‍රී ලංකාවට අභිමානයක් ලබා දෙන ආයතනයක් බවට පත් කිරීමේ පදනම දමා අවසන්. මේ පිළිබඳ විවිධ විවේචන තිබෙන්න පුළුවන්. ඒ වාගේම අභියෝග තිබෙන්න පුළුවන්. කුඩා රටක් ලෙස එම තත්ත්වයට අපි මුහුණ දිය යුතු වෙනවා. ලෝකයේ සමහර ගුවන් සමාගම් බිඳ වැටී ඒවා අක්‍රිය තත්ත්වයට පත්වන විට, අපි දවසින් දවස අපගේ ගුවන් සේවා ශක්තිමත් කර ගනිමිනුයි ඉන්නේ. මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් සහන ලබා දීම තුළ ශක්තිමත් ලෙස මේ ආයතන ගොඩ නැඟී ශ්‍රී ලංකාවේ යහපත් ගුවන් සේවාවක් ස්ථාපිත කිරීමට අපට ඉදිරි කාල සීමාව තුළ හැකියාව ලැබෙනවා. සිවිල් ගුවන් සේවා ආයතනයට මේ බදු සහන ලැබිය යුත්තේ ඉදිරි වසර පහක කාල සීමාව තුළ අපට වැය වන වියදම අඩු කරගෙන, යහපත් මිත්‍රශීලී ගුවන් සේවාවක් ආරම්භ කරන්නටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා විපක්ෂයේ විවේචන අපි පිළිගන්නවා. හැබැයි සමහර වේලාවට සාවද්‍ය විවේචන -බොරු විවේචන- කරනවා. මෙතැනට ඇවිල්ලා රූපවාහිනියට වෙන්න පුළුවන්, පත්තරයට වෙන්න පුළුවන් කථා කරනවා. නමුත් අපි ඒ සමහර විවේචන පිළිගන්නවා. ඒවා නිවැරැදි වෙන්න ඕනෑ. නමුත් ඇත්ත කථා කරලා අපි රටක් හැටියට, ශ්‍රී ලාංකිකයන් හැටියට මේ කටයුත්ත සාර්ථක කර ගන්න ඕනෑය කියන ඉල්ලීම මම කරනවා. මගේ මිත්‍ර නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා මේ ගරු සභාවේදී සඳහන් කළ කරුණ ගැන අපි අවධානය යොමු කරලා යම් වරදක් වෙලා තිබෙනවා නම් එය නිවැරදි කිරීමට අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අපේ රජය කටයුතු කරනවා.

මේ රටේ අනන්‍යතාව විනාශ කරන්න එපා. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ගුවන් යානයකින් ලෝකේ කොහාට ගියත් ඒකේ වාසිය අපේ ශ්‍රී ලාංකිකයන්ට ලැබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ විවිධ විවේචන නිසා ශ්‍රීලන්කන් ගුවන් සේවයත්, මිහින් ලංකා ගුවන් සේවයත්, අපේ රටට ලැබෙන සම්පත් ටිකත් වළක්වන්න එපාය කියන ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා. මොකද එහෙම වුණොත් අපේ ඉදිරි සැලැස්ම -මේ අවුරුදු පහක සැලැස්ම- තුළ මේ ගුවන් සේවාව නඟා සිටුවන්න බැරි වෙනවා. ශ්‍රී ලාංකික අනන්‍යතාව යටතේ ගමන් කිරීමේදී අපට තමුන්නාන්සේලාගෙන් ලැබෙන සහාය අපි ඉතාමත් අගය කොට සලකනවා. අපේ ගුවන් සේවාවටත් ඒ වාගේම සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමටත් ලැබෙන බදු සහනවලින් ඉදිරි කාල සීමාව තුළ අපේ ගුවන් සේවාවත්, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමත් ලංකාවේ ලාභ ලබන තත්ත්වයට පත් කරලා එහි ලාභය ජාතික නිෂ්පාදනයට එකතු කරන්න පුළුවන් වේවිය කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යවරයා හැටියට, මේ සඳහා අපට ශක්තිය දුන්නු අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මගේ ගෞරවණීය ප්‍රණාමය පුද කරමින්, මේ බදු සහන තුළින් මෙම ආයතන ලාභ ලබන තත්ත්වයට පත් වී ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලාත් එක්ක අත්වැල් බැඳ ගන්නවාය කියන පණිවුඩය තබමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Sujeewa Senasinghe. You have 25 minutes.

[අ. භා. 4.31]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම සන්තෝෂ වෙනවා, අද මට විනාඩි 25ක් ලැබීම පිළිබඳව. ඊයේ මට විනාඩි 20ක් ලැබුණත් විනාඩි 16යි කථා කරන්න ලබා දුන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමා පක්ෂග්‍රාහී නොවී හරියාකාරව කටයුතු කරාවි කියලා. මට ඒ වේලාව සම්බන්ධයෙන් පැහැදිලි කරන්න තත්පරයක්වත් අවස්ථාව ලබා දුන්නේ නැහැ. කථානායකතුමාගේ ආදර්ශය ලබා ගෙන එතුමාත් පක්ෂග්‍රාහී නොවී ක්‍රියා කළා නම් අපට මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය රැකගෙන වැඩ කටයුතු කරන්න අවස්ථාව ලැබෙන බවයි මට සඳහන් කරන්න තිබෙන්නේ.

කෙසේ වෙතත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ආණ්ඩුවේ ගොඩාක් අමාත්‍යවරු, මන්ත්‍රීවරු ගුවන් සේවය හා වරාය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේ ගණපූරණයක් නොමැති බවයි පෙනී යන්නේ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වුයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Now, we have a Quorum. Hon. Sujeewa Senasinghe, you can proceed with your speech.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. Please record this and send it to the Hon. Speaker immediately. There are several Committees - [*Interruption.*] Let me finish. That is the point of Order which I have raised.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ කථා කරනවා. Sir, that day, the Hon. Leader of the Opposition raised a Question in Parliament and told the Hon. Speaker that all the Hon. Members must be present. - [*Interruption.*] Wait. They must agree not to have Committees -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The COPE is meeting now and with the participation of the Minister of Economic Development, we have another important Committee going on.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Sujeewa Senasinghe, you proceed with your speech.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
If you do not want to have Committees on the days of Sitting, please - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිව්වේ, ගණපූරණයක් නැහැ කියලා විතරයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එන්නය කියලා කිව්වේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I will inform the Hon. Speaker. You proceed with your speech.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම වැදගත් ගුවන් සේවාව සහ වරාය ගැන කථා කරද්දී, බොහොමයක් චෝදනා එල්ල වුණේ එක කොට්ඨාසයකටයි. මා දන්නා විධියට මේ ලබන පාඩුව ගැන, මේ කරන විනාශය ගැන කථා කරද්දී, ආණ්ඩුවේ ඇමතිවරුනුත් අහගෙන ඉන්න බැරි තරමේ අප්‍රියතාවක් දක්වනවා. විශේෂයෙන්ම අපේ සන්තෝෂය ප්‍රකාශ කරනවා, ගරු පියංකර ජයරත්න ඇමතිතුමා ඒ අවස්ථාවේ සභාවේ සිටීම ගැන. අපේ ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධයෙන් සාවධානව සවන් දීලා යම් කිසි වරදක් සිදු වී තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වන බවත් එතුමා පැවසුවා.

ගරු ඇමතිතුමනි, අපි ද්වේෂයෙන් හෝ කාටවත් මඩ ගහන්න කථා කරනවා නොවෙයි. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මල් ගෙන යන්න සමහර වෙලාවට අහස් යානා විනාඩි පහක්, දහයක් පරක්කු කළාය කියලා. [බාධා කිරීමක්]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
විනාඩි? විනාඩි නොවෙයි, පැය.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම හොයලා බැලුවා. එහෙම දෙයක් සිදු වුණේ නැහැ කියලා කියනවා. හැබැයි එහෙම දෙයක් සිදු වුණා නම් ඒකත් වැරදියි කියන එකයි අපි කියන්නේ. කොයි ආණ්ඩුවකින් හෝ තමන්ගේ රටේ තිබෙන ගුවන් සේවාව තමන්ට අවශ්‍ය පරිදි, පෞද්ගලීකරණය කර ගන්නවා නම් ඒක වැරදියි. ජනාධිපතිතුමා මේ රටේ යුද්ධය ඉවර වෙන කොට "පළමුවත් මගේ රට, දෙවනුවත් මගේ රට, තුන්වනුවත් මගේ රට" කියලා වැඩ කටයුතු පටන් ගත්තේ පොඩි එකාට ගහන්න නොවෙයි; අහිංසක දුප්පත් මනුෂ්‍යයාට ගහන්න නොවෙයි; තමන්ගේ ගමන යන්න වෙනම ගුවන් යානාවක් වෙන් කරගෙන ඒ මුදල් කාබාසිනියා කරන්න නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටට ආදරයක් තිබෙනවා නම්, තමන්ගේ රටේ පැවැත්ම, දුප්පත් ජනතාවගේ පැවැත්ම පිළිබඳ ආදරයක් තිබෙනවා නම් හිටපු ජනාධිපතිවරු කටයුතු කළා වාගේ ticket එකක් අරගෙන යන plane එකක නැඟලා යන්න එතුමාට හැකියාව තිබෙන්න ඕනෑ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
කවුද එහෙම කළේ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ආර්. ප්‍රේමදාස මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, මේ සියලු දෙනාම-

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
නැහැ, නැහැ-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා දන්නේ නැත්නම් කරුණු හොයලා බලන්න. [බාධා කිරීමක්] ඔබතුමා pilot කෙනකු වශයෙන් සිටි නිසා ඔබතුමා දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න අද SriLankan Airlines සේවාවට මොකද වෙලා තිබෙන්නේ කියලා. අද කවුද ඒ ගුවන් සමාගමේ සභාපති වශයෙන් ඉන්නේ? ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙන් ඇහුවා නම් එතුමාත් එකඟ වෙනවා මා එක්ක. කවුද ඉන්නේ? නිශාන්ත වික්‍රමසිංහ මැතිතුමා. මොකක්ද එතුමාට තිබෙන සුදුසුකම?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඉතින් මොකද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා ඉඳ ගන්නකෝ, කහින්නේ නැතිව. [බාධා කිරීමක්] අපට කථා කරන්න අයිතිය තිබෙනවා. මා කියන කරුණු අහගෙන ඉන්න කියලායි කියන්නේ. රාජපක්ෂ මහත්තයාට මොකක් හෝ සම්බන්ධයක් තිබෙන පුද්ගලයකු ගැන කථා කළොත් මෙතුමාට කහනවා, ඉන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේ? විනාඩියකට රුපියල් 250ක් ගෙවලායි මෙතුමා එවන්නේ. ඉඳගෙන ඉන්න බැහැ. [බාධා කිරීම්] ඉඳ ගන්න. නිශාන්ත වික්‍රමසිංහට මොකක්ද තිබෙන සුදුසුකම? එතුමා හිටපු වතු අධිකාරිවරයෙක්. එකම සුදුසුකම තමයි- [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා කිව්වා හොරකමක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් චෝදනාවක් නඟන්නය කියලා. මීට වැඩිය චෝදනා මොනවාටද? ගෙදරට හොරු පැන්නාට පස්සේ දැන ගන්න ලැබුණා, එතුමාගේ ඔරලෝසුවේ වටිනාකම රුපියල් ලක්ෂ 45යි කියලා. ගෙදර තිබූ විදේශ විනිමය ලක්ෂ 45යි. ගෙදරක තියා ගන්න පුළුවන් යම් කිසි විදේශ විනිමය ප්‍රමාණයක් තිබෙනවා. ඊට වැඩිය ප්‍රමාණයක් තිබුණා නම් හිරගත කරන්න ඕනෑ, රටේ නීතියක් තිබෙනවා නම්. ජනාධිපතිතුමා අණ කරන්න ඕනෑ, තමන්ගේ නෑයෙක් කියලා බලන්නේ නැතුව. මේ පුද්ගලයෝ මේ වාගේ ස්ථානවලට දමන්න එපාය කියලා අපි කිව්වේ ඒකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සුදුසුකමක් නැහැ. තිබෙන සුදුසුකම නෑකම විතරයි. පවුල වගා කර ගන්නවා. පවුලෙන් කනවා. මේක නවත්වන්න කියලායි අපි කියන්නේ. එහෙම නැතිව ද්වේෂයකින් කියනවා නොවෙයි. බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය ලක්ෂ - [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, this Member is making wild allegations against the Chairman of the SriLankan Airlines which he cannot substantiate or prove in this House. They are the people who are helping the Government to go. Therefore, he cannot make these wild allegations. It is very unfair by the person concerned. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, he is taking my time. He cannot raise anymore points of Order. All this is nonsense. He is raising unnecessary points of Order and there are no merits in them.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සාමාන්‍යාධිකාරි කපිල චන්ද්‍රසේන මැතිතුමාට තිබෙන සුදුසුකම මොකක්ද? මොබිටෙල් ආයතනය බංකොලොත් කළා. මෙන්න මේකයි සුදුසුකම. අද මොනවාද මේ අය කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ නෑදෑයන්ට, ඒ වාගේම රාජාණ්ඩුවට තමන්ගේ සහයෝගය ලබා දෙනවා මිසක් රට වෙනුවෙන් එයාර් ලංකා ගුවන් සමාගම දියුණු කරන්න කිසිවක් කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බලන්න, මානව සම්පත් අංශයේ කැකුණවෙල මහතා අද බුරුතු පිටින් මේ අලාභ ලබන එයාර් ලංකා සමාගමට සේවකයන් ගන්නවා. මේ එයාර් ලංකා සමාගමෙන් වන පාඩුව බලන්න. මේ ආයතනය 2003-2004 වර්ෂයේ රුපියල් මිලියන 3,347ක ලාභයක් ලැබුවා කියලා. ඒ වාගේම 2004 වර්ෂයේත් රුපියල් මිලියන7,424ක ලාභයක් ලැබුවා කිව්වා. මෙය ලාභ ලබපු ආයතනයක්. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කියනවා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ සමාගම එමිරේට්ස් ආයතනයට ලබා දුන්නා, ඒක වැරැද්දක් කියලා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ඒක වැරැද්දක් නොවෙයි. ඒකයි කිව්වේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එහෙම කියනවා. එතුමාගේ කථාව එතුමාට තේරෙන්නේ නැහැ. එතුමා කිව්ව දේ තමයි ඒ. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගෙන තමයි මේ සමාගම එමිරේට්ස් ආයතනයට ලබා දුන්නේ. අපි ඒකට එකඟ වන්නේ නැහැ.

ඔබතුමා කියවලා බලන්න, රාවය පත්තරේ තිබෙනවා, "2004 වසරේ බංගලාදේශයේ, ඩකා නුවරදී ජාත්‍යන්තර සම්මේලනය පැවැති සිවිල් ගුවන් සේවා ප්‍රතිව්‍යුහගතකරණය, පෞද්ගලීකරණය, ගෝලීයකරණය සම්බන්ධයෙන්- [බාධා කිරීමක්] මම දන්නවා ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා හිටපු pilot කෙනෙක් බව. එයාර් ලංකා ආයතනයේ ගුවන් යානාවක් හැසිරෙව්වා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් engineer කෙනෙක් කියලාත් අපි දන්නවා. ඔබතුමාට මේ සම්බන්ධයෙන් යම් කිසි දැනුමක් තිබෙන්න ඕනෑ. ඔබතුමා දන්නවා, අපි මේ ආයතනය ලබා දෙන කොට ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක් අපට ලැබුණාය කියලා. ඔබතුමා කියනවා, අපේ රටේ ගරුත්වය ආරක්ෂා කරන්න මේ ආයතනය ආපහු ගත්තාය කියලා. ආපහු මේ ආයතනය ගන්න අපි ඩොලර් මිලියන 150ක් ගෙව්වා. ආපහු මේ ආයතනය අරගෙන මොකක්ද කළේ? මේ ආයතනය අද බංකොලොත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එමිරේට්ස් ආයතනයට එයාර් ලංකා ගුවන් සමාගම භාර දුන් ආකාරය සම්බන්ධව විශේෂයෙන්ම අපේ පක්ෂය එකඟ වන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Mr. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී එමිරේට්ස් ආයතනයට එයාර් ලංකා ගුවන් සමාගම ලබා දීම සම්බන්ධයෙන් අපි එකඟ වුණේ නැහැ. චෝදනාවක් තිබුණා විශාල මුදල් ප්‍රමාණයක් කොමිස් මුදල් වශයෙන් ගත්තා කියලා. අපි ඒකට විරුද්ධ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි එක්සත් ජාතික පක්ෂය පවසා සිටියා, එමිරේට්ස් ආයතනයට ආපහු මේ කාලය දික් කර ගන්න ඕනෑ නම් ලාභ ලබලා පෙන්වන්න කියලා. එමිරේට්ස් ආයතනය ඒක කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාවය පුවත් පතේ සඳහන් වනවා, "අවුරුදු දහයක කාල සීමාවකට ශ්‍රීලන්කන් ගුවන් සමාගම මිලදී ගත් එමිරේට්ස් සමාගම එහි අතිරික්ත සේවකයන් වන්දි ගෙවා ඉවත් කළේය. වියදම් කපා හැරියේය. මෙහෙයුම් පද්ධති, තාක්ෂණික මෙවලම් හඳුන්වා දුන් අතර, ස්වකීය ගුවන් සේවා සමඟ සම්බන්ධ කර මගී ප්‍රවාහනයේ දුර්වල පැති අවම කර ගත්තේය." කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැරදි වැඩක් වුණත් ඒ අවස්ථාවේදී එමිරේට්ස් ආයතනය එය ලාභ ලබන ආයතනයක් ලෙස පවත්වා ගෙන යන්න තමන්ගේ උත්සාහය යෙදුවා. ඒ අවස්ථාවේදී විශේෂයෙන්ම ඒ ආයතනය ලාභ ලැබූ බව අපට මේ දත්තවලින් පෙනී යනවා. අනතුරුව ඔබතුමන්ලා මේ ආයතනය භාර ගත්තාට පස්සේ මොකද වුණේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පිළිගන්නවා, ජනාධිපතිතුමා රට යන්න ඕනෑ; දූත පිරිස අරගෙන යන්න ඕනෑ කියලා. විශාල පිරිසක් නොවෙයි, 10ක්, 05ක් වාගේ ප්‍රමාණයක් අරගෙන යන්න ඕනෑ. හැබැයි එතුමාට පුළුවන් සාමාන්‍ය ගුවන් යානාවක ආසනයක් වෙන් කර ගෙන - Business Class එකක් වෙන් කර ගෙන- යන්න. අපට First Class නැහැ, First Class එයාර් ලංකා ආයතනයේ නැහැ. ඒ සියලුම පහසුකම් ලබා ගෙන එතුමා විදේශවලට ගියාට අපේ විරුද්ධත්වයක් නැහැ. එතුමා මේ රටේ පළමුවැනි පුරවැසියා. එතුමාට ඒ ගෞරවය හිමි වන්න ඕනෑ. හැබැයි මේ පුංචි, දුප්පත් රටේ අපට හුස්ම ගන්න බැරිව ඉන්න අවස්ථාවක ඇමෙරිකාවේ ජනාධිපති ඔබාමා කරන කාර්ය භාරය අපේ රටේ ජනාධිපතිතුමාට කරන්න බැහැ. විශේෂයෙන් රටේ ජනතාව ගැන හිතන ජනාධිපති කෙනෙක් නම් එහෙම කටයුතු කරන්න බැහැ. පළමුවත් මගේ රට, දෙවනුවත් මගේ රට, තුන්වෙනුවත් මගේ රට කියලා එතුමා පපුවට ගහ ගන්න ගමන්ම අපේ අහිංසක මනුස්සයාට සීනි, අල, සුදුලූනු වාගේ දේවල්වලට බදු ගහන කොට එතුමාට හිතෙන්න ඕනෑ මම මේ යන aeroplane එකකට ගෙවන මුදල කීයද, ඒ ගුවන් යානාව වෙන් කර ගෙන සියලුම ආසන ටික හිස්ව අරගෙන යන කොට අපට ලැබෙන පාඩුව කීයද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නොවෙයි මේක කියන්නේ. මේක කියන්නේ එයාර් ලංකා ගුවන් සමාගමේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාට යන්න කියන්න එළියට.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
රුපියල් 250යි විනාඩියකට.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එයාර් ලංකා ආයතනයේ සේවකයන්-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, he is wasting my time.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Order is by the Chair. You cannot challenge the Chair. කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, over and over again he is casting aspersions on the Executive President of this country, which he cannot do. In other countries, Presidents have their own aircraft. It is so even in Maldives.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, if there is any reference contrary to the Standing Orders, such portions of the speech will be expunged from Hansard. කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මෙහිදී එයාර් ලංකා ආයතනයේ සේවකයන් පවසා සිටිනවා, එයාර් ලංකා ආයතනය පාඩු ලබන්න එය ප්‍රධාන හේතුවක් බව. අපි නොවෙයි කියන්නේ. විශේෂයෙන්ම එතුමාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරවනවා.

ජනාධිපතිවරු දිගටම ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුණා. රටේ සංවර්ධනය, ඒ වාගේම රටේ ආයතනවල සංවර්ධනය සඳහා තමන් කැපවීම් කරන්න ඕනෑ. තමන් කැපවීම් නොකර අහිංසක ජනතාවට කැපවීම් කරන්න කියනවා. එහෙම කරන්න බැහැ. කෝටි ගණනින් විශාල මුදලක් මේ ආකාරයෙන් කාබාසිනියා වෙන්න ඉඩ දෙන්න බැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම එයාර් ලංකා ආයතනය අපි ගත්තාට පසුව පාඩුව කීයද කියලා බලන්න. මේ ආයතනයෙන් ලාභයක් ලබලා දුන්නා නම් අපිත් ආඩම්බර වෙනවා, අපේ එයාර් ලංකා ආයතනය මේ වාගේ ලාභයක් ලබනවා කියලා. මොකක්ද ගත්තාට පස්සේ තත්ත්වය? 2006 දී ගන්නකොට රුපියල් මිලියන 476ක ලාභයක් ලබලා තිබෙනවා. 2007 දී රුපියල් මිලියන 568ක ලාභයක් ලබලා තිබෙනවා. ඊට පස්සේ වර්ෂයේ අලාභය බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රුපියල් මිලියන 4,428යි. කජු ඇටද, කොස් ඇටද මේවා? මේ මුදල් උපයා ගන්න අපි කාගෙන්ද බදු අය කරන්නේ? 2008 දී අලාභය රුපියල් බිලියන 5යි. 2009 දී අලාභය රුපියල් බිලියන 10යි. 2010 දී අලාභය රුපියල් බිලියන 6යි. 2012 දී ඇස්තමේන්තුව රුපියල් බිලියන 20යි. මේ දූප්පත් රටේ මේ විනාශය කරන්න අපට අයිතිවාසිකමක් හෝ හැකියාවක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම ගුවන් යානා වැඩි වුණොත් අනිවාර්යයෙන්ම තව ගුවන් තොටුපොළවල අවශ්‍යතාව එනවා. හැබැයි මේ අවස්ථාවේදී මත්තල ගුවන් තොටුපොළක් හදන්න ඇති අවශ්‍යතාව මොකක්ද? කලින් අපි බලාපොරොත්තු වුණා, අවුරුද්දකට සංචාරකයන් ලක්ෂ 12ක්, ලක්ෂ 15ක් විතර ලංකාවට පැමිණේවි කියලා. හැබැයි තවම ලක්ෂ අටක සීමාවට එහා සංචාරකයන් ඇවිල්ලා නැහැ. කටුනායක ගුවන් තොටු පොළට ගියොත් ගුවන් තොටු පොළේ එහෙම තදබදයක් දකින්න නැහැ; එහෙම වාර්තාවක් ලැබිලාත් නැහැ. විශේෂඥයෝ අපට ප්‍රකාශ කර තිබෙන ආකාරයට බැරි වෙලාවත් කාලගුණික තත්ත්වයක් මත කුනාටුවක් වැනි එකක් කටුනායකට ආවොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක හම්බන්තොටටත් බලපානවා. විශේෂඥයෝ ප්‍රකාශ කරලා තිබෙනවා, තවත් ගුවන් තොටු පොළක් අවශ්‍යම නම් එවැනි ගුවන් තොටුපොළක් ඇති කරන්න හොඳම තැන සීගිරිය කියලා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කවුද කිව්වේ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විශේෂඥයෝ කියලා ඔබතුමාට කිව්වේ ඒක නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කවුද, විශේෂඥයෝ කියන්නේ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තේරෙන්නේ නැහැ කවුද විශේෂඥයෝ කියලා කිව්වාට. තේරෙන මිනිසුන්ට තේරෙනවා කවුද විශේෂඥයෝ කියන්නේ කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම මේ කියන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, නැහැ. මගේ දැන ගැනීම පිණිස ඔබතුමා පසුව කථා කරන්න. ඔබතුමාට අපි බාධා කළේ නැහැ නේ. ඔබතුමාගේ විශේෂඥ දැනුම පස්සේ පාවිච්චි කරන්න. මට කථා කරන්න දෙන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා සීගිරිය ගැන කිව්වා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාගේ වෙලාවේ ඔබතුමා කථා කරන්න. ඔබතුමාගේ දැනුවත් කිරීමට අපි කථා කළා. අපි ඔබතුමාට කථා කරන්න ඉඩ දුන්නා. ඔබතුමා කරුණාකරලා ඉඳ ගන්න. අපි ඔබතුමාට බාධා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම ගුවන් තොටුපොළක් අවශ්‍යම නම් එය සීගිරියේ හදන්න පුළුවන්. එහෙම අවශ්‍යතාවකුත් නැහැ. බලන්න දැන් වියදම් කළ ප්‍රමාණය. ඩොලර් මිලියන 30ක්. ඒ කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශාල මුදලක්. අපි විශාල මුදලක් යට කරනවා. එහෙම කරන්න අපට හැකියාවක් නැහැ.

අපට අවශ්‍ය කරන්නේ යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමක්. පාරවල් ටික හදා ගන්න පුළුවන් නම්, කොළඹ ඉඳන් මාතරට, කොළඹ ඉඳන් මහනුවරට අපේ විශේෂ මාර්ග පද්ධතිය හදා ගන්න පුළුවන් නම් ඒකයි අපට අවශ්‍ය. ටැන්සානියාවේ, සිම්බාබ්වේ වාගේ නොදියුණු රටවලත් අද විශාල පාරවල් ගොඩ නැඟෙනවා. හැබැයි අද විශේෂ කොට්ඨාසයක් මුල් කර ගෙන එක පිරිසක් පොහොසත් වීම සඳහා මේ ව්‍යාපාර ටික ඇති කර ගෙන යනවා. මේවා නවත්වන්න කියලායි අපි කියන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Rubbish.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Rubbish නොවෙයි, foolish. It is a very foolish thing.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 මහා භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 100ක් ආපහු ගිනි තියනවා; ආපහු පූජා කරනවා, මේ විනාශයට. ඒ වාගේම 2013 වෙනුවෙන් තවත් රුපියල් බිලියන 100ක් මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනවා ඇස්තමේන්තු අනුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කඩා වැටුණු එයාර් ලංකා ගුවන් සේවාව ආපහු පණ නංවන්න නම් ඇමෙරිකානු ඩොලර් බිලියන 275ක් අවශ්‍ය බවට සඳහන් වනවා. මේ පාඩුව ලබද්දීත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට විශාල පාඩුවක් දරා හෝ මේ ගුවන් සේවා පවත්වා ගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා.

සමහර කථිකයෝ මේ ගරු සභාවේ ප්‍රකාශ කළා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිහින් එයාර් ගුවන් සේවය පටන් ගත්තේ ඇයි කියලා. මිහින් එයාර් ගුවන් සේවය පටන් ගත්තේ ඇත්තටම උන්මාදයකට නැත්නම් ඔළුවේ තිබෙන යම් කිසි අමාරුවකට. මිහින් එයාර් සේවාව පටන් ගන්න කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. අද වන කොට පාඩුව රුපියල් බිලියන 13යි. හොටු පෙරා ගෙන ඉන්න අහිංසක දූ දරුවෝ කන්න නැතිව පාරේ වැටිලා මැරෙනවා.

විශේෂයෙන්ම progressive, මේක ජනතාවට ආදරය කරනවා කියන ආණ්ඩුවක් විසින් කරන දෙයක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මිහින් එයාර් එකේ පාඩුව රුපියල් බිලියන 13යි. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 13,000ක්. මේ ගුවන් සේවය ඇති කළේ කාගේ දොළ දුක නිවන්නද? මිහින් එයාර් ගුවන් සේවය ඇති කරපු පුද්ගලයෝ, ඒ මන්ත්‍රීවරු අද මොනවාද කරන්නේ? හෙලිකොප්ටර් 3යි, ගුවන් යානා 4යි. කොහේ හිටපු පුද්ගලයන්ද මේ? කාගේ වුවමනාවටද ඇති කළේ? ඒ ආයතනය මේ පාඩුව ලබන්නේ ඇයි? මේ ගුවන් යානාවල ගිය මගියෝ කවුද? අහිංසක අම්මලා තාත්තලාට දඹදිව යන්න කියලා තමයි මේ ගුවන් සේවය පටන් ගත්තේ. කෝ, දඹදිව ගිය අම්මලා තාත්තලා කවුද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
යනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා වාගේ දෙපැත්තට පැන පැන එක එක පක්ෂවලින් වරප්‍රසාද ගත්ත පුද්ගලයන්ට නම් යන්න පුළුවන්. ඒ වුණාට හරි ප්‍රතිපත්තියක් අනුව දේශපාලනය කරන මිනිසුන්ට නම් ඔහොම යන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිහින් එයාර් ආයතනය එක මගියෙකුට රුපියල් 15,000ක් නිකම් විනාශ කරනවා. මේකෙන් අපට ලැබෙන ආර්ථික ලාභය මොකක්ද? මේකෙන් අපට ලැබෙන සංස්කෘතික ලාභය මොකක්ද? "මිහින්" කියලා කාගේවත් නමක් මේකට දැම්මා. මොකට දැම්මාද දන්නේ නැහැ. තමන්ට තිබෙන දොළ දුකක් සංසිඳුවා ගන්න අපේ රටේ අහිංසක ජනතාවගේ මුදල් මේ විධියට කාබාසිනියා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දූෂණය සඳහා අප අවුරුද්දකට රුපියල් බිලියන 100ක් අයින් කරනවා. මේ දූෂණය නවත්වා ගත්තා නම් අපේ අය වැය පියවා ගන්න පුළුවන්. මහාචාර්ය ඉන්ද්‍රරත්න මැතිතුමා - President of the Sri Lanka Economic Association - කියා තිබෙනවා මේ ආණ්ඩුවේ තිබෙන දූෂණය නින්දා අපේ ආර්ථික සංවර්ධනය සියයට 2ක් පළුදු වෙනවා කියලා. අපේ ආර්ථික වර්ධන වේගය සියයට 6.5ක් නම් ඒ අනුව එක්කෝ එය සියයට 8.5ක, නැත්නම් සියයට 9ක මට්ටමේ තිබෙන්න ඕනෑ. යම් කෙනෙක් කිව්වා එක්සත් ජාතික පක්ෂයේ ගෝල බාලයින්ට ඉඩම් දුන්නා කියලා. එහෙම දුන්නා නම් වැරැදියි. හැබැයි මේක කාගේවත් ගෝල බාලයින්ට නොවෙයි, එක පිරිසක් -එක පවුලක්- තමන්ගේ සුඛ විහරණය සඳහා ගෙන යන ක්‍රියාදාමයක්. කෙනෙකුට යම් ව්‍යාපාරයක් සඳහා අවශ්‍යතාවක් තිබෙනවා නම් එය පටන් ගන්න ඉස්සර වෙලා ඩොලර් මිලියන හයක්, හතක් පගාව ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආකාරයේ විනාශයක් කරලා තමන්ගේ රටේ තිබෙන රාජ්‍ය ආයතන කාබාසිනියා කරනවා නම් ඒ පුද්ගලයෝ රටට ආදරය කරන පුද්ගලයෝ නොවෙයි. විශේෂයෙන්ම මෙහි සඳහන් වෙනවා ඒ සියයට දෙක

අප ඉතිරි කර ගත්තා නම්, ඒ සියයට දෙකේ ආර්ථික වර්ධනයත් අපට ලබා ගන්න පුළුවන් නම්, මේ දූෂණය, අල්ලස නවත්වා ගන්න පුළුවන් නම් අපට සැහෙන ආර්ථික දියුණුවක් ලබන්න පුළුවන් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු ප්‍රමාණයෙන් දෙන අල්ලස් ගැන නොවෙයි මේ කථා කරන්නේ; සුළු ප්‍රමාණයෙන් වන දූෂණ ගැන නොවෙයි කථා කරන්නේ. විශේෂයෙන්ම වරායන් සම්බන්ධයෙන් බලන්න. හම්බන්තොට වරාය පටන් ගත්තා. ඒ ගැන අපට කිසිම අමාරුවක් නැහැ. ඒ පරිසරයට අවශ්‍ය කරන ආකාරයේ වරායක් එතැන හැදුවා නම් අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙහි හම්බන්තොට වරාය සම්බන්ධයෙන් සඳහන් කර තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හම්බන්තොට වරායට මේ දක්වා වියදම් වුණු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 70යි. දැනට හදලා ඉවර කරපු ප්‍රමාණය රුපියල බිලියන 45කින් හදන්න තිබුණා. ගල කඩන්නම රුපියල් බිලියන 20ක් විතර ගියා. අප මුලින් දිගින් දිගටම මේ පිළිබඳව ප්‍රකාශ කළා. මේක සුදුසු වැඩක් නොවන බව අපේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මුල ඉඳන්ම ප්‍රකාශ කළා. මෙහි මොනවාද සඳහන් කර තිබෙන්නේ? හම්බන්තොට වරායේ ප්‍රධාන පහසුකම් - principal facilities - කිසිවක් නැති බව ලෝකයේ නම ගත්ත ලොයිඩ් ආයතනය සඳහන් කරනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා කිව්වා, "ලොයිඩ් ආයතනය අපට ඕනෑ නැහැ" කියලා. අපට ඕනෑ නැහැ කිව්වාට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලොයිඩ් ආයතනයේ අවසරය නැතිව, එහි මහ පෙන්වීම නැතිව ප්‍රධාන නැව් සංස්ථා මේ රටට එන්නේ නැහැ; ඒ වරායට එන්නේ නැහැ. මොකක්ද එහි සඳහන් කරලා තිබෙන්නේ? Bunkers නැහැ ලු. කොළඹ වරායේ තිබෙනවා වාගේ cruise, dry bulk, dry dock, other liquid bulk, petroleum, railway, Ro/Ro towage, repair and maintenance and general cargo යනාදි පහසුකම් මේ ස්ථානයේ නැති බවත් සඳහන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි බලන්න, මේකේ විනාශය. මේකේ බෙර ගහන්න පමණක් රුපියල් මිලියන 30ක් වියදම් කර තිබෙනවා. ඇමතිතුමා තමයි මේ අදහස් ප්‍රකාශ කර තිබෙන්නේ. හම්බන්තොට වරායේ ආරම්භක දිනයට පමණක් අප රුපියල් මිලියන 30ක් විනාශ කර තිබෙනවා. මේ වාගේ විනාශයක් කරන්න පුළුවන් ආර්ථික හැකියාවක් මේ රටට තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප දන්නවා යුද්ධය අවසන් කිරීමේ ගෞරවය අනිවාර්යයෙන්ම ජනාධිපතිතුමාටත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, විශේෂයෙන්ම සරත් ෆොන්සේකා මැතිතුමාටත්, ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියටත්, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාටත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටත් යන මේ සියලු දෙනාටම හිමි වන්න ඕනෑ බව. මේ සියලු දෙනාම රටට ආදරය කරන නායකවරු. ඒ සියලුම නායකවරු ඒ පියවර ගත්තා. අන්තිමට හැකියාව ලැබුණේ, ඒ try එක දීමේ හැකියාව ලැබුණේ ජනාධිපතිතුමාටයි. අප එය පිළිගන්නවා. [බාධා කිරීමක්] අප කථා කරන කොට ඔබතුමන්ලා අහගෙන ඉන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා. මම ඊයේ දවසේත් ඔබතුමා කථා කරන විට කිව්වා, ඔබතුමාට විනාඩියක් තිබෙනවා කියලා. ඔබතුමාට පක්ෂයෙන් වෙන් කරන ලද කාලය දීලා තිබෙනවා. ඊයේ දවසේ ඔබතුමා මෙතැන ප්‍රකාශයක් කර තිබෙනවා පක්ෂග්‍රාහීව කාලය කැපුවා කියලා. එසේ පක්ෂග්‍රාහීව කිසිම මන්ත්‍රීවරයකුගේ කාලය කැපීමට සූදානම් කර නැහැ. ඔබතුමාට සහයෝගයක් හැටියට විනාඩියකට කලින් දැනුම් දීමකුත් කර තිබෙනවා. නැවතත් මා එය ඔබතුමාට දැනුම් දෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

He has 25 minutes.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Yes. He has started at 4.30 p.m. and now it is 4.54 p.m. So, he has one minute more.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I cautioned him yesterday also. I have not been bias to any Hon. Member when allocating time.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනාඩියක් තිබෙනවා කිව්වාට මට ඊයේ ඒ විනාඩියත් හම්බ වුණේ නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් බාධා කිරීමක් ඇති වුණා. ඒ බාධා කිරීමෙන් පස්සේ මගේ කථාව නැවැත්තුවා. ඒක දැකපු කට්ටිය තේරුම් ගනීවි. මගේ අදහස් මම ප්‍රකාශ කළා. ඔබතුමාගේ අදහස් ඔබතුමා ප්‍රකාශ කළා. අනික් කට්ටිය ඒ සම්බන්ධයෙන් තීරණයක් ගනීවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට වරාය සම්බන්ධයෙන්, මේ විනාශය සම්බන්ධයෙන් කථා කරද්දි මට බාධාවක් පැමිණුනා. නිසි ආකාරයෙන් තමන්ගේ ඥානය යොදලා, ඩොලර් බිලියන 10ක්, 15ක් වියදම් කරලා හම්බන්තොට වරාය තෙල් සම්බන්ධයෙන් සහ නාවික බල කොටුවක් වශයෙන් පමණක් පවත්වා ගත්තා නම් විශේෂ වාසියක් අත්පත් කර ගන්න තිබුණා.

හැබැයි අද වෙනකොට කොමිස් මුදලට මේ ව්‍යාපාර පටන් අර ගෙන බිලියන 70ක් වාගේ ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. ඒවා අමාත්‍යවරුන්ට භාර දේවල් නොවෙයි. අමාත්‍යවරුන්ට පසුවයි පැවරෙන්නේ. වෙනම පිරිසක් -එක පවුලක්- මේ ව්‍යාපාර සම්බන්ධයෙන් අවධානය යොමු කර ඒ ව්‍යාපාරවල ලාභයත් ලබා ගන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවසාන වශයෙන් මට තත්පර 20ක් කථා කරන්න දෙන්න. මේ විනාශය නොකොට රටේ අනාගතය සඳහා ඔබතුමන්ලා සියලු දෙනාම කැප වෙන්න. මොකද මේ රජ සැප හැම දාම තිබෙන්නේ නැහැ. ජනතාව අන්තිමට බලන්නේ ඒ අය මේ රටට මොකක් ද කළේ කියන එක පමණයි. තමන්ට හම්බ කර ගන්නට පුළුවන්. පරම්පරා ගණනකට හම්බ කර ගන්නට පුළුවන්. හැබැයි මිය යනකොට තමන්ට අන්තිමට හිමි වෙන්නේ මේ රටට කළ සේවය පමණයි කියන එක සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.56]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SriLankan Airlines ආයතනය ගැනත්, මිහින් එයාර් ආයතනය ගැනත් එතුමා කිව්වා. මා ළඟ සංඛ්‍යා ලේඛන ටිකක් තිබෙනවා. ඒ අනුව SriLankan Airlines ආයතනය සඳහා 2010 වර්ෂයේදී තෙල් සඳහා වූ වියදම ඔබතුමා අහ ගන්න. රුපියල් බිලියන 31.9යි. 2011 වර්ෂය වෙද්දී කීයද? 2011 වර්ෂයේදී බිලියන 48.27යි. වාර්ෂිකව තෙල් මිල ඉහළ යාමේ ප්‍රතිශතය සියයට 16.8යි. අප කවුරුත් දන්නා සත්‍යයක් තිබෙනවා. පාඩුව, පාඩුව කියා කියනවා. පාඩුවටත් හේතුවක් තිබෙන්නට එපායැ. මිනිස්සු කියනවා පාඩුයි කියා. ඔව්. පාඩු වන්නට පුළුවන්. නමුත් ඒ පාඩුව, වළක්වා ගත හැකි පාඩුවක් ද නැත්නම් අපට මුහුණ දෙන්නට වෙන පාඩුවක්ද කියා බලන්න ඕනෑ. අප නිෂ්පාදනය නොකරන යම් කිසි ද්‍රව්‍යයක් මිල දී ගනිද්දී අපට සිදු වන පාඩුව අපට දරා ගන්නට වෙනවා. ඒක තමයි ඇත්ත. එම නිසා මේ වියදම විතරක් රුපියල් බිලියන 16.8ක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු මොනවා කථා කළත්, aircraft operations එකේදි තුනෙන් දෙකක මුදලක් වැය වෙන්නේ තෙල්වලටයි. ඉතිරි තුනෙන් එක තමයි අනෙක් වියදම් වලට තිබෙන්නේ. තුනෙන් දෙකක් තෙල්වලට ගිහින් වියදම වැඩි වුණාම, ඒක වළක්වා ගන්නට නම් අපට මෙහෙ තෙල් ළිං සහ තෙල් සම්පත තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් අපට තෙල් ටික කවුරු හෝ නිකම් දෙන්නට ඕනෑ. ගඩාෆි හිටියා නම් ගඩාෆිට කියලා නිකම් ඉල්ලා ගන්නට තිබුණා. [බාධා කිරීම්] මොකද හේතුව? ඉන්න මම කියන්නම්. එතුමාට තීන්දුවක් ගන්නට පුළුවන්. ඒකාධිපති කෙනෙකුට විතරයි එහෙම තීන්දු ගන්නට පුළුවන්. එහෙම තීන්දු ගන්නට වෙන අයට බැහැ. කාටවත් බැහැ. එම නිසා පොඩ්ඩක් ඔය කරුණු කාරණා ගැන යථාර්ථය දැන ගන්නටය කියා මම මන්ත්‍රීතුමාට කියනවා.

SriLankan Airlines ආයතනය දැන් ගුවන් යානා සංඛ්‍යාව 25 දක්වා වර්ධනය කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වියදම කොහොමද යන්නේ කියා ඔබතුමාගේ කථාවෙන් පස්සේ මට කියන්න හිතුණා. අප මේකට support එකක් දෙන්නට ඕනෑ. දැන් ව්‍යාපාරයක් වැටෙනවා නම්, තවත් ඒ වාගේ ව්‍යාපාරයකින් මුක්කුවක් දෙන්නට ඕනෑ. ඒක තමයි යථාර්ථය. එයට සම්බන්ධ, තමන්ටම ආවේණික, ඒකට ගැළපෙන තවත් ආයතනයකින් තමන්ගේ ව්‍යාපාරයට support එකක් ගන්නවා. අප එතැන කටුනායකට බද්ධව ලොකු duty-free shop එකක් හදන්න යනවා. මම සභාපතිතුමා එක්කත් කථා කළා. මිනිස්සු මොකටද ඩුබායි යන්නේ? මොනවා බලන්නද? කාන්තාරය බලන්නද? නැහැ. රත්රන් ටිකක් ගන්න, duty-free බඩු ගන්න. එහෙ කොටසක් duty-free කර තිබෙනවා. ඒවා ගන්න එහෙ යනවා. අපිත් කටුනායක එහෙම එකක් හදනවා. එතකොට සංචාරකයෝ වැඩි වෙනවා. එතකොට කටුනායක ධාරිතාව දරා ගන්නට බැරි නිසා සම්පූර්ණයෙන්ම කටුනායක අයින් කරන්නේ නැතිව ධාරිතාව දරා ගන්නට පුළුවන් තවත් විකල්පයක් අප හදන්නට ඕනෑ. එකකින් පමණක් මදියි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Runway එක-

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Runway එක එතැන තිබෙනවා. මේක තමයි ඇත්ත. තමුන්නාන්සේලා කොපමණ විවේචනය කළත් මේ ඇත්තට අප මුහුණ දෙන්නට ඕනෑ.

ඊළඟ කාරණය තමයි, දැන් අප pilotsලා පුහුණු කරන ආයතනයක් කටුනායක හදනවා. අන්න බලන්න, තවත් support එකක්. දැන් හම්බන්තොට වරාය ගැන කිව්වා. මම ඉස්සර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ -අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ අමාත්‍යාංශයේ- නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ bunkering පටන් ගන්න ඕනෑය කියන මතයක් මට තිබුණා. නැව් 450ක් ඔය හම්බන්තොට හරහා යනවා. ඒ නැව්වලට තෙල් ගහන්නට යන්නේ කොහේටද? ඒ නැව් වලට තෙල් ගහන්නට යන්නේ සිංගප්පූරුවට. සිංගප්පූරුවට යන එක අපට වළක්වා ගන්නට පුළුවන්. මුහුද මැද්දට නැව ගෙනැල්ලා නැවට තෙල් ගැහුවාම ඒක duty-free. අර ගණනටම ගන්නවා. යන ගමන් තෙල් ගහගෙන යන්න කවුද අකැමැති? නමුත් ඒ නැව් ටික අතැනට ගිහිල්ලා park කළාම, පොඩි පොඩි, ලොකු ලොකු ගණන් එතැනට ගෙවන්නට වෙනවා.

අපේ ආර්ථික සංවර්ධනය වඩාත් ඵලදායක, ලාභදායක ක්‍රමවලට යොමු කරන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ චින්තනය ඒකයි. මහින්ද චින්තනයේ ඉදිරි දැක්මක් තිබෙනවා. මහින්ද චින්තනය කියන්නේ තවන එකක්වත්, තැවෙන එකක්වත් නොවෙයි. ඒක තවන, තැවෙන එකක් නොවෙයි, ඉදිරි දැක්මක්. යමක් දැකලා ඉදිරියේදී යම් ඵලයක් නෙලා ගන්න නිකම් ආයෝජනයක් කරලා පුළුවන්ද? හෝටලයක් හදන්න දැන් මගේ හිතේ තිබෙනවා කියලා හිතමු. එතකොට මම කරන්න ඕනෑ මොනවාද? ඒ සඳහා සැලැස්මක් හදලා, ඒකට ආයෝජනය කරන්න ප්‍රතිපාදන ලබා ගන්න ඕනෑ. නැත්නම් ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ. ඒ නිසා අර මම කලින් කිව්වා වාගේ මේ පාඩුව අවම කර ගැනීමට සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගම backup supports අර ගන්න තව රුපියල් බිලියන ගණනක් වියදම් කරන්න හදනවා. එතකොට මේ සියලුම ප්‍රශ්න ඉවර වෙනවා. සාමාන්‍යයෙන් වියදම යන්නේ එච්චරයි. වියදමෙන් තුනෙන් දෙකක්ම තෙල්වලට. තුනෙන් එකයි අනෙක් වියදම් යන්නේ. ඒ තුනෙන් එකෙන් නඩත්තු වන්නේ කවුද? ඒ තමයි අපේ pilotsලා, අපේ air hostessesලා. එතකොට සීමාසහිත ශ්‍රීලන්කන් කේටරින් පුද්ගලික සමාගම කොහොමද කියලා බලන්න. අද මේ දීලා තිබෙන බදු සහන මොනවාද? මේ බදුවලින් PAL එක අයින් කරලා තිබෙනවා. මොනවාටද අයින් කරලා තිබෙන්නේ? එක් එක් භාණ්ඩවලින් PAL එක අයින් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේ මූලාසනය සඳහා ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ PAL එක අයින් කිරීම ගැනයි. මේ PAL එක අයින් කරලා ගෙන්වන භාණ්ඩ මිල එදාම අඩු කරන්නේ නැහැ. ඒවා පාවිච්චි කරලා ඔප්පු කළාට පස්සේ තමයි මුදල අඩු කරන්නේ. ඒක අද මේ බදු සහන දීමේ එක්තරා අරමුණක් කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊළඟට මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ප්‍රතිපත්ති මූලෝපායයන් ක්‍රියාත්මක කිරීමට තමයි රජය බලාපොරොත්තු වන්නේ. ඒක නිකම් ප්‍රතිපත්තියක් නොවෙයි. යම්කිසි මූලෝපායයක් - strategy එකක්- තියෙන්න ඕනෑ. උදාහරණයක් හැටියට "දිවි නැඟුම" ගන්නකෝ. දිවි නැඟුමේ මූලෝපායයක් තිබෙනවා. දිවි නැඟුමේ මූලෝපාය මොකක්ද? අපට වවා ගන්න පුළුවන් එළවළු ටික කඩෙන් ගන්නේ නැතුව තමන්ගේ ගෙවත්තේ වවා ගත්තාම, පස විසින් ඒවා නඩත්තු කරනවා නම්, අපි වතුර ටිකක් දමනවා නම්, බලා ගන්නවා නම් අනේ මොකටද market යන්නේ? එහේ මෙහේ යන්නේ මොකටද? ගෙවත්තෙන්ම කඩා ගත්තාම three-wheeler එකේ සල්ලි හරි ඉතිරි වෙනවා. අන්න ඒකයි මූලෝපාය; strategy එක. මේ strategy එක තමයි බලන්න ඕනෑ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත්වූ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාල සීමාව තුළ යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ආනයනයේ දී එකතු කළ අගය මත බද්ද, රේගු බද්ද , සෙස් බද්ද සහ වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද, යටතේ අය විය යුතු බදු මුදල විලම්බනය කරන ලද්දේ නම් එම භාණ්ඩ නිදහස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සපුරාලීමෙන් පසුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ නිර්දේශය මතයි. නිකම් ආවට ගියාට බදු සහන දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 දී යෝජනා අනුව වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම ගැන අපට පුළුල් අත් දැකීමක් තිබෙනවා. මෙන්න මේ කරුණු ටික තමයි අපි කරන්නේ. තමුන්නාන්සේලා චෝදනා කරනවා, චෝදනා කරනවා. ඒ මොන චෝදනා කළත් අපට ශ්‍රී ලංකාවේ සමාජ දර්ශකයක් තිබෙනවා නේ. අපි ඒ සමාජ දර්ශකයේ හොඳ තත්ත්වයක ඉන්නවා. 1946 දී අපේ රටේ වැඩිහිටි සාක්ෂරතාව තිබුණේ සියයට 58යි. ආයුෂත් එහෙමයි. 1953 දී සාක්ෂරතාව සියයට 65යි. 1963 දී සියයට 72යි. 1973 දී සියයට 78යි. 1980 දී සියයට 86යි. 1990 දී සියයට 88යි. 2000 දී සියයට 90යි. 2010 වෙද්දී සියයට 92ක් විතර තත්ත්වයකට වැඩිහිටි සාක්ෂරතාව - ලියන්න කියන්න පුළුවන් හැකියාව- වර්ධනය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය වශයෙන් අපි Ceylon Electricity Board එක ගැන කථා කරනවා. ඒක පාඩු තමයි. නමුත් මොනවා කරන්නද? තෙල් මිල වැඩි වුණාම පාඩු විඳින්න වෙනවා. මොකද, අපේ ජල විදුලි නිෂ්පාදන ධාරිතාව තිබෙන්නේ මෙගා වොට්ස් 1200ක් විතර ප්‍රමාණයක්. එතකොට 1200ට වැඩි වෙන ඒවා දෙන්නේ කොහෙන්ද? එක්කෝ heavy oil පාවිච්චි කරන්න ඕනෑ. නැත්නම් ගල් අඟුරු පාවිච්චි කරන්න ඕනෑ. එහෙමත් නැත්නම් පරමාණු බලය පාවිච්චි කරන්න ඕනෑ. මේ පිළිබඳව ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමාගෙන් අහන්න. එතුමා මේ පිළිබඳව හොඳට දන්නවා.

පැය විසිහතරම current එකත් දෙන්න ඕනෑ නම්, ගමටත් power supply එක ගෙන යන්න ඕනෑ නම්, television එක බලන්න ඕනෑ නම්, මේ පාර්ලිමේන්තුවේ කරන කථා ජනතාවට අහන්න ඕනෑ නම් රජය යම්කිසි පිරිවැයක් දරාගන්න ඕනෑ.

දුම්රිය සේවය දිහා බැලුවත් එහෙමයි. පාඩුයි! පාඩුයි!! පාඩුයි!!! කිව්වාට, ආණ්ඩුව ඒ පාඩුව දරා ගන්නේ ජනතාව වෙනුවෙන්. ඒ පාඩුව නැති කර ගන්න නම් බදු අය කරන්න ඕනෑ. බදු අය කර ගැනීමේදී අපි කල්පනා කරන්න ඕනෑ. නමුත් ජනතාව පඩිත් ඉල්ලනවා; බඩුත් අඩු කරන්න කියනවා; විදුලියත් දෙන්න කියනවා.

අපට එපාද අපේම ගුවන් සේවාවක්? අපට අභිමානයක් නැද්ද? රටක නායකයකු විදේශයකට යද්දී තමන්ගේ රටේ ගුවන් සේවයකට අයත් ගුවන් යානයක තමන්ගේ රටේ කොඩිය ගහගෙන ගිහින් බැස්සේ නැත්නම් මොකක්ද අභිමානය? පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වන තමුන්නාන්සේලා යද්දී bodyguardsලා දෙදෙනකු දමා ගෙන යන්නේ මොකටද? ඔන්න මන්ත්‍රීතුමා එනවා කියලා හඟවන්න. VIP කියන අකුරු ගහගෙන යන්නේ මොකටද? මන්ත්‍රීතුමා කියලා දැන ගන්න. එහෙම යනවා නේ කට්ටිය. එහෙම යන කට්ටියම තමයි අර විධියටත් කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා නිකම් ගමන් යන්නේ නැහැ. එතුමා ගිය ගමනකින් මොනවාද අපට නොගෙනාවේ කියලා කියන්න කෝ ඉස්සර වෙලාම. අපට විරුද්ධ වෙච්ච විදේශ රටවල් දැන් ටික ටික අපට හීලෑ වෙන්නේ නැද්ද කියා බලන්න කෝ. විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මම ඒ ගැන ඇහුවා. ඉස්සර -මා ධීවර ඇමති කාලයේ- එතුමා හිටියේ මගේ නියෝජ්‍ය ඇමතිතුමා විධියට. දැන් එතුමා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා. මම එතුමාගෙන් ඇහුවා කොහොමද ජාත්‍යන්තර තත්ත්වය කියලා. එතුමාත් තමුන්නාන්සේලාගේ පැත්තේ හිටපු කෙනෙක් ඉස්සර. එතුමා මට කිව්වා, "ෂා! දැන් හොඳයි. ජනාධිපතිතුමා පිට රටවලට ගියාට පස්සේ තත්ත්වය ටික ටික හොඳ වෙනවා." කියලා. මොකටද ජනාධිපතිතුමා පිට රට යන්නේ එතකොට? ෆුට් බෝල් ගහන්නද? රගර් ගහන්න නොවෙයි යන්නේ. එතුමා යන්නේ අපේ අභිමානය ආරක්ෂා කරන්න. මේ රට -අපි- නිදහස ලබා ගත්තාට පස්සේ නොදැනුවත්ව රටට එක එක කෙනෙහිලිකම් කරන අයට යථාර්ථය අවබෝධ කර දීලා, අපේ රටේ ජන ජීවිතය නිදහස් කරලා තමුන්නාන්සේලාට අභිමානය සලසන්න. ඉතින් ඕක තමයි මට කියන්න තිබෙන්නේ. අපි එතුමා ගැන පමණක්ම කියනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සමස්තයක් වශයෙන් සන්සන්දනය කර බලන්න, ඇමතිවරුන් රට යන්නේ නැද්ද කියලා. ඇයි එතුමාම target කරන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

විරුද්ධ පක්ෂයේ නායකතුමා?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

විරුද්ධ පක්ෂයේ නායකතුමා කී සැරයක් රට යනවාද? ඇයි එතුමා target කරන්නේ නැත්තේ? "ඔවා දෙනු අනුන්හට තමා සම්මතෙහි පිහිටා සිට" කියලා තිබෙනවා නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ අය ඒක දන්නේ නැහැ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්, ඒක දන්නේ නැහැ. අස්වර් මන්ත්‍රීතුමාගෙන් අහන්න ඕනෑ නම්. "අර්ස්කින් මේ" සියලු දේවල් එතුමා දන්නවා. එතුමා නොදන්න දෙයක් නැහැ ඒ සම්බන්ධයෙන්. ඒ ගැන එතුමාගෙන් ඇහුවා නම් කියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න කෝ, අපේ ආර්ථිකය සම්බන්ධයෙන් අපි බොහෝ විට කරන්නේ මොකක්ද කියලා. අපේ ආර්ථිකය ආනයනයට නේ සල්ලි දෙන්නේ. හැම එකම වාගේ ආනයනය කරනවා. එහෙම නම්, පරිභෝජන ආර්ථිකයත් ශක්තිමත් කරන්න නේ අපි උත්සාහ කරන්නේ. පරිභෝජන ආර්ථිකය කියන්නේ මොකක්ද? අපි පරිහරණය කරන්න ඕනෑ අපේ ගුවන් යානයක්. ඒකත් පරිභෝජන රටාවක් එක්තරා විධියක. ඇයි අපි Emiratesවල යන්නේ? ඇයි අපි Cathay Pacificවල යන්නේ? ඇයි  අපි British Airwaysවල යන්නේ? යන්න කෝ අපේ එකේ. මිහින් එයාර් එකේ යන්න කෝ. මිහින් එයාර් එකේ යන්න පුරුදු වෙලා එහි වැඩි පිරිසක් යද්දී, අපි වියදම් කරන ප්‍රමාණය අනෙක් පැත්තෙන්  අපේ රටට ලැබෙනවා වක්‍රව. තෙල්වලට වියදම් යනවා ඇත්තයි. නමුත් තෙල් මිල අඩු වුණොත්, තෙල් මිල පහතට ගියොත් ලාභය එනවා. මා කිව්වේ, තෙල් මිල වැඩි වුණාට පස්සේ වියදම බිලියන 16යි කියලා. දැන් තමුන්නාන්සේලා දන්නවා නේ ඉන්ධන වියදමට -ඩීසල් වියදමට- අපි කොච්චර ගෙවනවාද කියලා. ඉස්සර ගණනද දැනුත් ගෙවන්නේ කියලා දන්නවා නේ. ඉතින් මේකට කාටද ඇඟිල්ල දිගු කරන්න පුළුවන්? ආණ්ඩුවටද? නැහැ. මේවා කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉස්සර ඉරානයෙන් බඩු ගෙනාවා. පස්සේ ඇමෙරිකාව කිව්වා එහෙන් බඩු ගන්න එපා කියලා. දැන් ඔන්න ඇමෙරිකාව කියනවා,  දැන් ගත්තාට කමක් නැහැ කියලා. "ගන්න එපා" කියපු මතය වෙනස් කරලා "ගත්තාට කමක් නැහැ" කියන මතය හැදුවේ කවුද? ඒ මතය හැදුවේ අතිගරු ජනාධිපතිතුමායි. එතුමා කරුණු පැහැදිලි කරලා දුන්නාම, "ඔව් ඒක ඇත්ත තමයි" කියලා "දැන් බඩු ගත්තාට කමක් නැහැ" කිව්වා. අපේම කට්ටිය ගිහිල්ලා කියනවා නේ අපේ රජය මෘග රජයක්, මේ රටේ මානව හිමිකම් නැහැ, අර හිමිකම් නැහැ, මේ හිමිකම් නැහැ කියලා. එහෙම කියලා ඒ පැත්තේ NGOsවලින් කීයක් හරි අරගෙන එනවා. ඕක තමයි කරන්නේ. එහෙම නේද ගරු සරත් අමුණුගම ඇමතිතුමා?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி  சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්, ඔව්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කීයක් හරි අරගෙන එනවා. ඒක වෘත්තියක් කරගන්නවා. ඒක වෘත්තියක් කරගත්තු අය තමයි පිට රට ගිහින් එහෙම කටයුතු කරන්නේ. මම ඒ අය දන්නවා. නම් වශයෙනුත්  කියන්න පුළුවන්. ඒ වුණාට මා කියන්නේ නැහැ. වෙනත් වෙලාවක අපි කථා කරමු ඒ ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න කෝ, අපි අපේ සීනි අවශ්‍යතාවෙන් සියයට පහයි නිෂ්පාදනය කරන්නේ. තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයකුත් සීනි නිෂ්පාදනය කෙරුවා. නමුත් සියයට පහ තමයි මෙච්චර කල් රටේ නිෂ්පාදනය තිබුණේ. ඒ සියයට පහේම හිටියොත් මොකද වෙන්නේ? ඉතිරි සියයට අනූපහට මොකද කරන්නේ?

මේ කර්මාන්තයේ නියැලිලා හිටපු එක් කෙනෙක් මගේ හිතවතෙක්. ජා-ඇල ඉන්න අපේ හැරී ජයවර්ධන මහත්මයාත් ඒ කර්මාන්තයේ නියැලිලා සිටියා නේ. නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්න ඒ ගොල්ලන්ට අවස්ථාවක් දීලා තිබුණා. ඒ ධාරිතාව වැඩි වෙන්නේ නැත්නම් ඒ දිහා බලලා ඒ අවස්ථාව continue කරනවාද, එහෙම නැත්නම් ඒක නවත්තලා වෙනත් විකල්පයකට යනවාද?

ප්‍රශ්නය ඒකයි. උදාහරණයක් වශයෙන් කිව්වොත්, මට අමාත්‍ය තනතුරක් දීලා මම ඒක හරියට කරන්නේ නැත්නම් ජනාධිපතිතුමා බැඳිලා ඉන්නවා ඒ ධුරය තියා ගන්න. කරන්න බැරි නම් යන්න, පුළුවන් එක් කෙනෙකුට දෙනවා. එහෙම කියන්න අයිතියක් එතුමාට තිබෙනවා. ඒක තමයි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,  මම කියන්න කැමැතියි, අපි රාජ්‍ය අංශයේ ආයෝජන දිරිමත් කරන්න කටයුතු කරලා තිබෙන බව. දැන් හම්බන්තොට ගැන කථා කරනවා, කථා කරනවා. ලොයිඩ්ස් රක්ෂණ සමාගමෙන් බැහැයි කියනවා insure කරන්න. නැව් භාරසිය ගණනක් හම්බන්තොට වරායෙන් යද්දී අපි bunkering කරනවාට අමතරව තවත් සේවාවන් සපයන්න පුළුවන්. අපේ රටට එහා පැත්තේ තිබෙනවා බංග්ලාදේශය. අපේ ඇඟලුම් කර්මාන්තය වාගේ 40 ගුණයකින් විශාලයි දැන් බංග්ලාදේශයේ ඇඟලුම් කර්මාන්තය. බංග්ලාදේශය දුප්පත් රටක් කියලා සහන සේරම දුන්නා. අපේ මිනිස්සුත් දැන් ඒ රටට ගිහිල්ලා ඇඟලුම් කර්මාන්තශාලා පටන් අරගෙන. සියලු දෙනාම ඒ රටට යනවා. ඒ රටේ තමයි කර්මාන්තශාලා දාලා තිබෙන්නේ. එතකොට දැන් ඔක්කෝම බංග්ලාදේශයට ගියාට පස්සේ බංග්ලාදේශයට එන shipment ටික කොහොමද ගෙනෙන්නේ? බංග්ලාදේශයේ හොඳ, පුළුල් වරායක් නැහැ. ඒ නිෂ්පාදන සිංගප්පූරුවට ගෙනෙනවා ලොකු ship එකකින්. ඊට පස්සේ feeder shipsවලින් තමයි අරගෙන යන්නේ; පුංචි පුංචි නැව්වලින් තමයි බංග්ලාදේශයට අරගෙන යන්නේ. එතකොට වියදම් දෙකක් දරන්න වෙනවා.  අපේ රටයි බංග්ලාදේශයයි අතර  ඉතාම කිට්ටු ප්‍රදේශය හම්බන්තොට.  එතැනින් පටන් ගත්තොත් අපෙන් වැය වුණු පිරිවැය අවුරුදු 2කින්, 3 කින් හොයා ගන්න පුළුවන් වෙනවා. ඒක මහා ලොකු කාර්යයක් නොවෙයි. ඒවා ගැන අපි කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි ශ්‍රී ලංකාවේ poverty level එක බලමු. දැන් මොනවා කිව්වත් අපේ රටේ ආදායම් ව්‍යාප්තිය බැලුවාම මහ බැංකුවෙන් දීලා තිබෙන දත්තයන් අනුව 1953 දී ධනවත්ම සියයට 20ට තමයි රටේ ධනයෙන් සියයට 56.7ක් තිබුණේ. දිළිඳුම සියයට 20ට රටේ ධනයෙන් සියයට 5යි තිබුණේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජාත්‍යන්තර දත්තයන් අනුව බලද්දී අපි හොඳ තැනක ඉන්නවා. නරක තැනක නැහැ. නමුත් තමුන්නාන්සේලාට ඒවා පෙනෙන්නේ නැහැ. මේක නම් කොහොමත් පෙනෙන්නේ නැහැ. උදාහරණ වශයෙන් අපිට හුඟක් දේවල් කියන්න තිබෙනවා. රජය බදු පනවන්නෙත් ආර්ථික අරමුණු ඇතිව. බදු අයින් කරන්නෙත් ආර්ථික අරමුණු ඇතිව. බදු වෙනස්වීම්වලට භාජනය කරන්නෙත් ආර්ථික අරමුණු ඇතිව. රජය ඊයේ පෙරේදා මාළුවලට දමා තිබුණු බද්දත් සියයට ගණනකින් අඩු කළා. මොකද ඒ? මාළු මිල ඉහළ ගිය නිසා ජනාධිපතිතුමා කල්පනා කළා, මිල අඩු කරන්න ඕනෑ කියලා. සැමන්වලත් බදු අඩු කළා. අර්තාපල්වලත් බදු අඩු කළා. ජීවන වියදම වැඩියි කියලා එතුමාට තේරුණොත් එතුමා බදු අඩු වැඩි කරලා ඒක adjust කරනවා. දැන් අල එළදාව නෙළන කාලයේදී ආනයනය කරන අලවලට අය කරන බදු ප්‍රමාණය වැඩි කරනවා. ඊළඟට අස්වැන්න අඩු කාලයට පාරිභෝගික ජනතාවගේ පැත්තෙනුත් බලනවා. මේ දෙකම balance කරන්න ඕනෑ. ඒක තමයි රජයක වගකීම. රජය ඒ වගකීම ඉටු කරනවා.

ඊළඟට අපිට ඉල්ලුම හා සැපයුම අනුව මුදලුත් පාවිච්චි කරන්න වෙනවා. දැන් කියනවා, අපි ණය ගන්නවා කියලා. අපි ණය ගන්නේ මොනවාටද? අපි ණය ගන්නේ රට සංවර්ධනය කරන්න. දැන් ණය අරගෙන මේ රටේ කරන සංවර්ධනය අපට පෙනෙනවා නම්, ණය ගැනීම සංවර්ධන ඉලක්ක සපුරා ගන්නා මෙවලමක් නම්; ඒ සඳහා උපයෝගී කර ගන්නා යන්ත්‍රණයක් නම් අපි ණය අරගෙන ආයෝජන කරන්න ඕනෑ. මොකද, ආයෝජනයන් කළාම අපට පුළුවන් දීර්ඝ කාලීන වශයෙන් ඒවායින් ප්‍රතිඵල ලබා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් බොහෝ කරුණු කියන්න තිබෙනවා. උදාහරණයක් වශයෙන් මුළු ආනයන ප්‍රභවය ගැනත් මට කියන්න පුළුවන්. ආනයන ප්‍රභවය ගැන බලද්දී අපි ඒ පැත්තෙන් යහපත් තත්ත්වයක නොවෙයි ඉන්නේ. මොකද, අපි හැම විටම අපේ මත වෙනස් කරලා බොහොම ලෙහෙසි විධියට පිට රටින් ගෙනෙන දේවල්වලට තමයි හොඳයි කියන්නේ. ඒවාට තමයි අපේ ලොකු උද්යෝගයක්, ආශාවක්, ඇල්මක්, බැල්මක් තිබෙන්නේ. එංගලන්තයෙන් ගෙනාවා නම් හොඳයි. අපේ රටේ මිනිහෙක් යමක් කිව්වාම, උපදේශයක් දුන්නාම ඒක පිළිගන්නේ නැහැ. සුද්දෙක් ඇවිල්ලා කිව්වොත්, "අනේ! හරි ෂෝක් නේ." කියලා පිළිගන්නවා. "මහාචාර්ය" කියලා නිකම් නමක් ගහ ගෙන ආවොත් එයාව පිළිගන්නවා. අත් දැකීම් තිබෙන මිනිසුන් කියන ඒවා පිළිගන්නේ නැහැ. ඒ මත අපි වෙනස් කරන්න ඕනෑ.

උදාහරණයකට අපේ සරත් අමුණුගම ඇමතිතුමාව ගනිමු. එතුමා ආර්ථිකය ගැන ලොකු දැනුමක් තිබෙන කෙනෙක් නේ. මම එතුමාත් සමඟ මේ පිළිබඳව යම් යම් කාරණා ගැන කථා කරද්දී මට තේරුණා, එතුමාට ලොකු දැනීමක් තිබෙන බව. ඉතින් ඒ දැනුම අපි ප්‍රයෝජනයට ගන්න ඕනෑ. තමුන්නාන්සේලා එහෙම නොවෙයි කියන්නේ. අහවලා කිව්වා; අර ලොක්කා කිව්වා; අර රටේ මෙහෙමයි; මේ රටේ මෙහෙමයි කියලා ඒ පැත්තෙන් උදාහරණ අරගෙන අපේ අයව condemn කරනවා.

ඒක වැරැදියි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් මේ රටේ දකුණු පළාතේ ඉපදුණු, ඉදිරිය බලා කටයුතු කරන, අවදානමක් ගන්න පුළුවන් කෙනෙක්. අවදානම ගත්තේ නැත්නම් යුද්ධය දිනන්න බැරි වනවා. ආර්ථිකයටත් අවදානමක් ගන්නට ඕනෑ. අවදානමක් ගන්නේ නැති මනුෂ්‍යයෙකුට කිසි දවසක සංවර්ධනයක් කරන්නත් බැහැ; ව්‍යාපාරයක් කරන්නත් බැහැ. මොකද, බයයි. ආයෝජනයක් කළොත් හරි යයිද, ආයෝජනය කරන මුදල නැති වෙයිද, වැරදෙයිද කියලා හිතනවා. ඔය ප්‍රතිපත්ති අපි ඔළුවෙන් බැහැර කරලා දමන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි යන ක්‍රමය ගැන අපට කිසිම බාධාවක් නැහැ කියලා මම කියන්නේ ඒ නිසයි. අපි තවදුරටත් මේ ක්‍රමයේ ඉදිරියට යනවා. අපේ ගුවන් තොටුපොළ අපට ලොකු ආඩම්බරයක්. ඒ වාගේම SriLankan Airlines ගුවන් යානයකින් ගමන් කරනවායි කියන එකත් අපට ලොකු ආඩම්බරයක්. සියලු දේම විදේශ රටවලට දෙන්න කියලා තමයි අපේ කට්ටිය කියන්නේ. "වහලා දමන්න, වහලා දමන්න. පාඩුයි, පාඩුයි," කියලා තමයි කියන්නේ. පාඩුවට හෝ පටන් අරගෙන ලාභ ලබන තත්ත්වයකට ගේන්න පුළුවන් නම් අන්න ඒක තමයි දක්ෂකම. ඒ කාරණයත් මා මතක් කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන් කර තිබෙන කාලය අවසන් බැවින් ඔබතුමාට ගරු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.17]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාව තුළ ගණපූරණය නැහැයි කියා විපක්ෂයෙන් කිහිප වතාවක්ම මූලාසනයට දැනුම් දුන්නා. ඒ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කිරීමට කටයුතු කළා. මා කියන්නට ඕනෑ, මාසයේ පාර්ලිමේන්තුව පැවැත්වෙන මේ සීමිත දින ගණන තුළ මන්ත්‍රීවරුන් විශාල සේවයක් ඉටු කරන බව. එතුමන්ලා මේ ගරු සභාව තුළ පැවැත්වෙන විවාදවලට සම්බන්ධ වෙනවා විතරක් නොවෙයි, අනෙකුත් කාරක සභා වලටත් සහභාගි වනවා. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අනෙකුත් සියලුම කාරක සභාවලට ගරු මන්ත්‍රීතුමන්ලා සහභාගි වනවා. ඒ නිසා සමහරවිට එතුමන්ලා මේ ගරු සභාව තුළ නොසිටියත් මේ පාර්ලිමේන්තුව තුළ එතුමන්ලා විසින් යම් කාර්ය භාරයක් ඉටු කරනවා. අපේ ගරු මන්ත්‍රීවරයකු කිව්වා වාගේ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් නොවෙයි, අර පිටුපසින් යන කාවාඩිකාරයෝ වාගේ අය සම්ප්‍රදායකින් තොරව මොනවා හරි කාරණයක් ඉදිරිපත් කරලා මේ සභාවේ කටයුතු කඩාකප්පල් කරන්නට උත්සාහ කරනවා. මා හිතන්නේ ඒක හොඳ සම්ප්‍රදායක් නොවෙයි කියලායි. අපි කටයුතු කාරණා පිළිබඳව වගකීමකින් යුතුව කථා කළ යුතුයි කියලායි මා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවට පැමිණීමට නොහැකි පුද්ගලයකු වන SriLankan Airlines සමාගමේ සභාපතිතුමා ගැන වැරැදි කරුණු සඳහන් කළා කියලා මා හිතනවා. එතුමා මේ රටේ රාජ්‍ය නායකයකුට සම්බන්ධකම් ඇති පුද්ගලයෙක්. එතුමාට ලොකු ආරක්ෂාවක් ඇතිව ඉන්න පුළුවන්. කුඩු කාරයෙක් එතුමාගේ ගෙට පැනලා භාණ්ඩ සොරකම් කරගෙන ගිහින් තිබෙනවාය කියන මේ සිද්ධියෙන්ම පෙනෙනවා, එතුමා සාමාන්‍ය පරිදි ජීවත් වන කෙනෙක් බව. යම් කිසි උසස් පුද්ගලයෙකුට යම් කිසි කරදයක් සිදු වුණාම එය ඉලක්ක කරගෙන පාර්ලිමේන්තුව වාගේ තැනකට ඇවිල්ලා ඒ ගැන විවේචනය කිරීම වැරැදියි. එතුමා ළඟ රුපියල් ලක්ෂ 40ක් වටිනා රොලැක්ස් වර්ගයේ ඔරලෝසුවක් තිබුණාය කියමින් විවේචනයන් කිරීම හරිම වැරැදියි කියලා මා කියනවා. SriLankan Airlines සමාගමේ සභාපතිතුමා වැටුපක් ලබා ගන්නේ නැතිව සේවය කරන කෙනෙක් බව අපි මේ අවස්ථාවේ කියන්නට ඕනෑ. එතුමා නිකම් මනුෂ්‍යයෙක් නොව, පෞද්ගලික අංශයේ ව්‍යාපාර ගණනාවකම මෙහෙයුම් කරපු නිලධාරියෙක් බවත් මා මේ අවස්ථාවේ කියන්නට ඕනෑ. ඒ නිසා තමන්ගේ වරප්‍රසාදවලට මුවා වෙලා, මේ රටට යම් කිසි සේවාවක් කරන පුරවැසියන් සම්බන්ධයෙන් එලෙස ද්වේෂ සහගත කෝණයකින් බැලීම වැරැදියි කියන එක මා මේ අවස්ථාවේ දී ප්‍රකාශ කර සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ලලිත් දිසානායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඇත්තෙන්ම SriLankan Airlines සමාගම ගැන දීර්ඝ වශයෙන් කථා කළා. මා විශේෂයෙන්ම කියන්නට ඕනෑ, ශ්‍රී ලංකාව ආසියාවේ ගුවන් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ගුවන් සේවාවේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රජය කටයුතු කර ගෙන යන බව. මේ රජය 2006 - 2011 කාලය තුළ රුපියල් මිලියන 23,978ක් මේ ගුවන් සේවාව සඳහා ආයෝජනය කර තිබෙනවාය කියන කාරණයත් මා කියන්නට ඕනෑ. 2000 - 2005 දක්වා කාලයත් සමඟ සංසන්දනය කරනවිට එහි සියයට 43ක වැඩි වීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගුවන් සේවාවක් රටකට අවශ්‍ය ඇයි? එම අත් දැකීම අපට තිබෙනවා. පසුගිය යුද සමයේ කටුනායක ගුවන් තොටුපොළට බෝම්බ ප්‍රහාර එල්ල වනකොට මොකක්ද සිදු වුණේ? විදේශ රටවලට අයත් ගුවන් යානා -KLM වන්නට පුළුවන්; British Airways වන්නට පුළුවන්; Swiss International Air Lines වන්නට පුළුවන්- ඒ අවස්ථාවේ අපේ රටට පැමිණීම නවතා දැමුවා. එතකොට මොකක්ද සිද්ධ වන්නේ? මෙවැනි ව්‍යසනයකදී විදේශ රටවල ගුවන් සේවා ශ්‍රී ලංකාව තුළට ඒම නැවැත්තුවොත් මේ රටින් පිටවන සහ මේ රටට එන ගුවන් මඟීන් ගෙන්වා ගන්න තිබෙන එකම ආයතනය තමයි අපේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම. අන්න ඒ නිසා තමයි ශ්‍රීලන්කන් ගුවන් සමාගම, මිහින් ලංකා ගුවන් සමාගම වාගේ සමාගම් අපට තියෙන්න ඕනෑ. ඒවා කෙටි කාලයක් තුළ පාඩු ලබන්න පුළුවන්. රජය සතු ගුවන් සමාගම් සහ ජාතික ප්‍රවාහන සේවාවන් පාඩු ලබන තත්ත්වයට පත් වෙනවා. මොකද, ජනතාවගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යන ආයතන බවට තමයි ඒවා බොහෝ දුරට පත් වෙලා තිබෙන්නේ. අන්න ඒ නිසා මෙන්න මේ කෝණය දිහා අපි වැදගත් විධියට බලන්න ඕනෑ.

අද ශ්‍රීලන්කන් ගුවන් සේවාවට විශේෂයෙන්ම අභියෝග දෙකකට මුහුණ දෙන්න වෙනවා. එකක් තමයි ඉන්ධන මිල ගණන් ඉහළ යාම. අනික් එක තමයි තරගකාරී ජාත්‍යන්තර ගුවන් සේවාවන් පැවතීම. එහෙම නම් මේ ඉන්ධන මිල ගණන් ඉහළ යාමත්, ජාත්‍යන්තර වශයෙන් තරගකාරී ගුවන් සේවාවන් පැවතීමත් නිසා ජනතාවට සේවාවක් සපයන ඒ වාගේම රටට ගාම්භීරත්වයක් ගෙන දෙන මේ ජාතික ආයතනයට රජයක් හැටියට අපි පහසුකම් සපයන්න ඕනෑ. ඒ පහසුකම් සැපයීම තමයි මා හිතන හැටියට මේ බදු සහන මඟින් කෙරෙන්නේ. SriLankan Catering Services Limited කියන්නේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ඉතාම ලාභදායී ආයතනයක්. මොකද ඒ සේවාව සැපයීම කරන්නේ ශ්‍රීලන්කන් ගුවන් සේවාවට විතරක් නොවෙයි. ජාත්‍යන්තරව එන ගුවන් සේවාවන් තමන්ගේ ආහාර ද්‍රව්‍ය ලබා ගන්නේත් එම සේවාව තුළිනුයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමට විතරක් නොවෙයි, වෙනත් ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා ඒ පහසුකම් සැපයීම තුළින් අපට ලාභයක් උපයා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේ ලාභ අතීතයේ අප ලබලා තියෙනවා. විශේෂයෙන්ම SriLankan Catering Services Limited වැනි ආයතනවලට මේ පහසුකම් ලබා දෙන්න ඕනෑ, විශේෂයෙන්ම කාර් ගෙන්වන්න නොවෙයි. අනිකුත් පහසුකම් සැපයීම සඳහා මා හිතන්නේ මෙවැනි සහනයන් ලබා දීම ඉතා වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශ්‍රීලන්කන් ගුවන් සේවය ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. අද අපට ඒ ගැන සතුටු වෙන්න පුළුවන්. විශේෂයෙන් නව ගුවන් අන්තයන් සඳහා අවස්ථාවන් ලබා ගෙන තිබෙනවා. ෂැංහයි, ග්වන්ෂොව්, කොචින් සහ රුසියාව තමයි ඒ ගුවන් අන්තයන්. මා හිතන්නේ රටවල් 32ක් එක්ක ගමනාන්ත 51ක් දක්වා මේ ශ්‍රීලන්කන් ගුවන් සේවාව ව්‍යාප්ත වෙලා තිබෙනවා. මේක වැදගත්. මොකද, මෙයට ආයෝජනය කරන මුදල තුළින් මේ ආයතනය වර්ධනයක් පෙන්නුම් කරලා තිබෙනවා. රජය ආයෝජනය කරන මුදල් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. මිලියන 23,978ක් 2006, 2011 කාලය තුළ මේ ආයතනයට ආයෝජනය කරලා තිබෙනවා. මේ ආයතනය තමන්ගේ ගුවන් සේවාවන් පුළුල් කරලා තිබෙනවා. ඒ තුළින් අවශ්‍ය සේවාවන් ටික මා හිතන හැටියට ජනතාවට සපයලා තිබෙනවා.

ඊ ළඟට අපි බලාපොරොත්තු වනවා, තව අවුරුදු තුනක් යන කොට සමස්ත සංචාරකයින් සංඛ්‍යාව මිලියන දෙකකින් පමණ වැඩි කිරීමට. අද අතිගරු ජනාධිපතිතුමා යුද්ධය නැත්නම් ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය නවත්වලා තිබෙනවා. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඊයේ නම් ටිකක් කියා ගෙන ගියා. මේ යුද්ධය නවත්වන කොට රනිල් වික්‍රමසිංහ මහත්මයා -ඒ ගොල්ලන්ගේ නායකයාත්- මේකට සම්පූර්ණයෙන්ම සහාය දුන්නාය කියලා. නැහැ, ඒක නොවෙයි අපි කියන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ තමයි මේ යුද්ධය අවසන් වුණේ. අනික් නායකයෝ හිටියා. ජනතාව බලය දුන්නා. නමුත් ඒ අයට මේ යුද්ධය නවත්වා ගන්න බැරි වුණා. නමුත් නිවැරැදි ක්‍රියා මාර්ගයක් රැගෙන ගිහිල්ලා යුද්ධය නවත්වලා තිබෙනවා. සාමය රටට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම මිලියන දෙකක ඉලක්කයට යන කොට අපට කියලා ගුවන් සේවාවක් තියෙන්න ඕනෑ. එතකොට මේ ආයෝජනය කරන මුදලේ ප්‍රතිලාභය අපට ගන්න පුළුවන් වනවා. මොකද, ශ්‍රීලන්කන් ගුවන් සේවාව හරහා නැත්නම් මිහින් ලංකා ගුවන් සේවාව හරහා සංචාරකයින්ට මේ රටට එන්න පුළුවන්. මේවා බලලා තමයි මේ ආයෝජනය කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි වැදගත් වූ විවාදයකදී විපක්ෂයෙන් මොකක්ද කිව්වේ? සභාපතිතුමාගේ ගේ කඩපු එකයි, ඔර්ලෝසුව ගැන තමයි කිව්වේ. කවුද ගුවන් සේවිකාවක් ගැන කිව්වා. වැදගත් වූ විවාදයකදී විපක්ෂයක මාතෘකාව වෙන්න ඕනෑ ඒක නොවෙයි. හොර මැරකම් ගැන කිව්වාට ඒවා ලිඛිත ලියවිල්ලකින් ඔප්පු කළේ නැහැ. නිකම් කියාගෙන යනවා. නමුත් අපි මේ දිහා බලන්න ඕනෑ, දේශපාලන කෝණයෙන් නොවෙයි. මේ රටේ සාමයත් එක්ක ඇති වන සංවර්ධනයට අපි දායකත්වය ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා රජය අවශ්‍ය කටයුතු කිරීම තුළින් තමයි මිහින් ලංකා වාගේ ආයතන දියුණු වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගුවන් යානා 6ක් අරගෙන තිබෙනවා. මෙතැනදී වැදගත් දේ මෙයයි. විශේෂයෙන්ම මේ ගුවන් යානා හය අපි ගත්තේ මුදල් දීලා නොවෙයි.

මැද පෙරදිග ගුවන් සමාගම් ගැන බැලුවොත් ඔවුන්ට, ඔවුන්ගේම ගුවන් යානා තිබෙනවා. නමුත් අපේ රටේ ආදායම අනුව බලනකොට සංවර්ධනය වන රටක් හැටියට අපට එච්චර මුදලක් වියදම් කරන්න බැහැ. ඒ නිසා කල් බදු ක්‍රමය යටතේ -lease කරලා- තමයි අපි ඒවා ගන්නේ. කල් බදු ක්‍රමය යටතේ ගත්තාම අපි උපයන මුදලින් විශාල කොටසක් කල් බදු සඳහා ගෙවන්න වෙනවා. ඒ නිසා අපට මෙතැනදී ලාබයක් පෙන්වන්න අමාරුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට එන මගීන්ගෙන් සියයට 60කට පමණ සේවාවන් සපයන්නේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙනුයි. එහෙම බලනකොට මේ ආයතනය පැවැත්වීමේ වැදගත්කමක් තිබෙනවා. ජාතික ගුවන් සේවාවක් නැති වුණොත් අපට මේ සේවාවන් ටික නැති වෙලා යනවා. ඒ නිසා රජය විශාල මුදලක් වැය කරලා හෝ ශ්‍රීලන්කන් ගුවන් සේවාව ඉහළ නංවන්නට කටයුතු කිරීම ගැන අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් වැදගත් කරුණක් තිබෙනවා. 2010 වර්ෂයේදී ලැබුණු රුපියල් මිලියන 62,363ක ආදායම 2011 දී රුපියල් මිලියන 77,125 දක්වා වැඩි කිරීමට අපි සමත් වෙලා තිබෙනවා. එය සියයට 24ක වැඩි වීමක්. එහෙම බලනකොට මේ ආයෝජනයේ ප්‍රගතියක් තිබෙනවා. ලාබයක් උපයා තිබෙනවා. ඒ නිසා මේක මුදල් කාබාසිනියා කරන ආයතනයක්ය කියා හඳුන්වා දෙන එක හොඳ නැහැ. මේ ආයතනය තුළින් ජාතික මට්ටමෙන් සේවාවන් කිරීම නිසා රටට ගාම්භීරත්වයක් ලබා දීම තුළින් මෙහි වර්ධනයක් ඇති කර තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා කියන්නේ මොකක්ද? ජනාධිපතිතුමා මේ ගුවන් යානාවකින් ලන්ඩන්වලට ගිහින් ඒ යානය හිස්ව ආපහු එච්චාය කියන එකයි තමුන්නාන්සේලා කියන්නේ. ඒක නොවෙයි මෙතැනදී වැදගත් වෙන්නේ. අපේ රටේ නායකයා අපට වටිනවා. ගුවන් යානාවක් හිස්ව ආවාය කියන එකට වඩා අපේ රටේ නායකයා -අපේ රටේ ජනාධිපතිතුමා, අපේ රටට සාමය උදා කළ නායකතුමා, මේ රට ත්‍රස්තවාදයෙන් මුදා ගත් නායකතුමා- අපට වටිනවා. ගුවන් යානාවක් එක් ගමනාන්තයක් කරා ගොස් හිස්ව ආපසු ආවත්, එතුමාට ආරක්ෂාව සලසන එක අපට වටිනවා. පසු ගිය කාලයේදී එවැනි ආරක්ෂක ක්‍රියාවලියක් ගෙන ගිය නිසා තමයි අපට යුද්ධය දිනන්න පුළුවන් වුණේ. නමුත් ඒක නොවෙයි අප තේරුම් ගන්න ඕනෑ. මේ සමාගම තුළින් කරන ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභය මොකක්ද, රටේ ආර්ථික වර්ධනයත් එක්ක මෙවැනි ගුවන් සමාගමක අවශ්‍යතාවය මොකක්ද කියන එකයි.

අද ගුවන් තොටුපළ පුළුල් කර තිබෙනවා. ඒ වාගේම landing සඳහා අපට තව පර්යන්තයක් අවශ්‍ය වෙලා තිබෙනවා. එය ඉදි කිරීමට කටයුතු කරගෙන යනවා. අපි එදා දැක්ක ගුවන් තොටුපළ නොවෙයි අද තිබෙන්නේ. අද ඒකට ජාත්‍යන්තර ගුවන් සමාගම්වල සුපිරි තත්ත්වය ඇවිල්ලා තිබෙනවා. ඒ කෝණයෙන් තමයි අපි බලන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන තමයි අපි සතුටු වෙන්න ඕනෑ. මේ කෙරෙන සංවර්ධනයත් එක්ක ඉදිරියේදී මේ ආයතනයේ කාර්ය සාධනයේ වර්ධනය සඳහා රජය ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක මුදලක් 2012 වර්ෂයේ පටන් වර්ෂ පහක කාලයක් තුළ මේ සමාගමට ආයෝජනය කරන්න කටයුතු කරගෙන යනවා. ඒක ඉතා වැදගත්.

මහින්ද චින්තනය අනුව මුදල් ඇමතිතුමා හැටියට අපේ ගරු ජනාධිපතිතුමා ගෙන යන මේ වැඩ පිළිවෙළ දැකලා මේ රටට සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා. ගුවන් තොටුපළ සේවාවන් පුළුල් වෙලා තිබෙනවා. ඒ නිසා ගුවන් සේවාවන් පුළුල් කිරීමේ සැලැස්මක් මත 2012 පටන් වර්ෂ පහක කාලයක් තුළ ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක මුදලක් ලබා දෙමින් ඒ ආයතනය පුළුල් කිරීම සඳහා කටයුතු යොදා තිබෙනවා. ඒ වාගේම 2016 වනකොට මෙම ගුවන් තොටුපළට පැමිණෙන ගුවන් මගීන්ගේ සංඛ්‍යාව සම්පූර්ණයෙන් වැඩි කර ගන්න බලාපොරොත්තු වෙනවා. මේ අනුව බලනකොට ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඉදිරියට යන ජාතියට ප්‍රෞඪත්වයක් එකතු කරන අංගයක් බව කියන්න ඕනෑ. සිංහල භාෂාවෙන් කථා කරන කාර්ය මණ්ඩලයක් ඉන්න නිසා අපට ඒ ගුවන් යානාවක යනකොට අඩු ගණනේ අපේම කියන හැඟීමක් ඇති වෙනවා. ඒ නිසා ඒකත් අපට ඉතා වැදගත් වෙනවා.

මිහින් ලංකා ආයතනය ගැන බැලුවොත්, තමුන්නාන්සේලා එය දකින්නේ සුදු අලියෙක් විධියටයි. නමුත් අපි කලින් කිව්වා වාගේ මෙවැනි ආයතන බිහි වෙන්න ඕනෑ. Budget Airline එකක් විධියට තමයි ඒක ආරම්භ කළේ. ඒ වාගේම ගුවන් යානා දෙකකින් තමයි ඒ ආයතනය පටන් ගත්තේ. 2009 - 2010 කාලය තුළ අලාභය මිලියන 1221ක් වෙලා තිබුණත් ඒ අලාභය මිලියන 940 දක්වා අඩු කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එහෙම නම් අපි මේ ගැන සුබවාදීව බලන්න ඕනෑ.

රජය ඒ සඳහා මුදලක් යට කරන බව ඇත්ත. අපට පෙන්වන්න පුළුවන් භාණ්ඩාගාරයෙන් මෙන්න මෙච්චර මුදලක් මිහින් ලංකා ආයතනයට වැය කළාය කියා. නමුත් ඒ ආයතනය යම් ක්‍රමවේදයන් ඇති කර ගෙන තිබෙනවා. ඔවුන් ගුවන් යානා මිලට අරගෙන තිබෙන්නේ යම් යම් ලීසිං ක්‍රම යටතේයි. ඒ සඳහා ලාභදායී ලීසිං ක්‍රම යොදා ගෙන තිබෙනවා. ගුවන් නියමුවන්ගේ ගෙවීම් ප්‍රමාණය අඩු වන විධියට කටයුතු කරලා තමයි ඔවුන්ට මේ අලාභය රුපියල් මිලියන 940 දක්වා අඩු කර ගන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. මේක අවශ්‍යයි. මොකද, වන්දනාකරුවන් සඳහා සහ සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහා -සියලුම සංචාරකයෝ සුපිරි සංචාරකයෝ නොවෙයි- ක්‍රමවේදයක් හැටියට අපට මිහින් ලංකා ආයතනය යොදා ගන්න පුළුවන්.

අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ පසු ගිය අය වැය තුළින් රට තුළ අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් ආරම්භ කරන්නට කටයුතු කරනවාය කිව්වාම බොහෝ අය එය විහිළුවට එහෙම නැත්නම් සමච්චලයට ලක් කළා. ඒවා තියෙන්න ඕනෑ. මේ වන විට අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් 10ක් ආරම්භ කර තිබෙනවා. ඒ ගැන අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේවා අවශ්‍යයි. සමහරු මහනුවරට එවැනි ගුවන් තොටුපොළක් ඇති කරනවාය කිව්වාම හිනා වුණා. ඒක අවශ්‍යයි. ඒක තියෙන්න ඕනෑ. නුවරඑළියට අවශ්‍යයි. මොකද, ඉදිරි කාලය තුළ පැමිණෙන සංචාරකයන්ට දේශීය වශයෙන් ගමනක් යන්න අවශ්‍ය වුණාම ඒ පහසුකම් තියෙන්න ඕනෑ. අපි පිට රට ගියාම අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් තිබෙන බව දකිනවා. මෙහි වටිනාකම තේරුම් අරගෙන කටයුතු කිරීම ගැන අපි සතුටු වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වරායන් ගැන කථා කරනකොට සාමාන්‍යයෙන් මේ ක්ෂේත්‍රය තුළින් ලංකාවට නැව් 4,200ක් පමණ පැමිණෙන බව කියන්නට ඕනෑ. මහින්ද චින්තන වැඩ පිළිවෙළේ මූලික ප්‍රතිපත්තියක් තමයි විශේෂයෙන්ම වරාය හා ගුවන් ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ඒ තුළින් ලෝකය හා සමඟ සම්බන්ධ වීම සඳහා නව දොරටු විවෘත කිරීමේ හැකියාව ගැන සලකා බැලීම, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳ හා නාවික ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම. අපේ අරමුණක් තිබෙනවා. අන්න ඒ අරමුණ කරා යන්නේ කොහොමද කියා අපි බලන්න ඕනෑ. ඒ සඳහා මේ ක්ෂේත්‍රය පුළුල් විය යුතුයි. ශ්‍රී ලංකාවට වාර්ෂිකව පැමිණෙන නැව් සංඛ්‍යාව 4,200ක් වෙනවා. මෙහෙයුම් අංශයේ මුළු භාණ්ඩ සංඛ්‍යාව ගත්තොත් 2000 වසරේදී මෙට්‍රික් ටොන් 27.5ක් වුණු එක 2005 වන විට මෙට්‍රික් ටොන් 37.3 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2011 වර්ෂය වන විට ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 65.1 දක්වා වැඩි වෙලා තවත් ඉස්සරහට ඇවිත් තිබෙනවා. බහලුම් මෙහෙයුම ගත්තාම 2005 අවුරුද්දේ බහලුම් ඒකක මිලියන 2.4ක් තිබුණු එක 2011දී බහලුම් ඒකක මිලියන 4.26 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. මෙන්න මේ වර්ධනය තුළ මම හිතන්නේ නාවික ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනයක් අවශ්‍ය වෙනවා. මේ රජයේ සංඛ්‍යා ලේඛන අනුව බැලුවාම නාවික මෙහෙයුම් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව වරායවල පහසුකම් සැපයීම අවශ්‍ය වෙලා තිබෙනවා. එහෙම නම් වරාය සංවර්ධනය කිරීම සඳහා අපි කටයුතු කළ යුතු වනවා. දකුණු ආසියාවේ සමස්ත වාර්ෂික ප්‍රතිනැව්ගත කිරීම් ගත්තාම එයින් සියයට 15ක්, ඒ කියන්නේ බහලුම් ඒකක මිලියන 3.12ක් කොළඹ වරාය මඟින් සිදු කරනවා. මම හිතන්නේ ඒක ඉතාම වැදගත් දෙයක්. එහි උපරිම ධාරිතාව ලබා ගන්න තමයි දියකඩනය ඉදි කිරීම, ප්‍රවේශ මාර්ගය ගැඹුරු කිරීම, මුහුදු පත්ලේ එලා ඇති නළ පද්ධතිය නැවත සකස් කිරීම, පැති බැම් ඉදි කිරීම ආදී වරාය පුළුල් කිරීමේ කටයුතු කරන්නේ. 2007 වර්ෂයේදී ආරම්භ වුණු දියකඩනය ඉදි කිරීමේ කටයුතු දැන් නිම වෙමින් පවතිනවා. 2013 වන විට මේ සංවර්ධනය අවසන් වෙනවා. දිනෙන් දින වර්ධනය වන මෙහෙයුම්වලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න මේ වරායට පුළුවන්කම ලැබී තිබෙනවා.

[ගරු ලලිත් දිසානායක මහතා]

කොළඹ වරාය විතරක් නොවෙයි. වරායවල් පහක් සංවර්ධන කිරීම සඳහා මේ රජය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මාගම්පුර වරායේ පළමු අදියර 2010 වර්ෂයේදී ඇමෙරිකන් ඩොලර් මිලියන 360ක වියදමෙන් නිම කර තිබෙනවා. එහි දෙවන අදියර සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 600ක් වැය වෙනවා. මේක 2011 ආරම්භ කරලා 2014 වර්ෂයේදී නිම කිරීමට නියමිතයි. මුලින් කිව්වා, මේක කන්ටේනර් බහලුම් ඒකකයක් විතරයි කියා. ප්‍රධාන වශයෙන්ම අපි කියන්න ඕනෑ, ඉන්ධන සැපයුම් ගබඩා කිරීම සහ අනෙකුත් ව්‍යාපෘතීන් සඳහාත් මේ වරායේ ඉඩකඩ සැලසෙනවාය කියා.

විපක්ෂයේ ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දැක්කේ මේ වරායට එක නැවක් ඇවිත් ඒ නැවෙන් බාපු වාහන සංඛ්‍යාව විතරයි. මේක නොවෙයි වෙන්න ඕනෑ. අපි පළමුවෙන්ම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, 1948 දී නිදහස ලැබුවාට පස්සේ මේ වන තෙක් මෙවැනි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති මේ රටේ ආරම්භ කර තිබුණේ නැහැ.

හම්බන්තොට කියලා කියන්නේ මේ රටේ තිබෙන දුෂ්කර ප්‍රදේශයක්. අපි ඉතිහාසය අරගෙන බැලුවොත්, රජවරු තමන්ගේ ප්‍රදේශය අගනුවර හැටියට අරගෙන -උදාහරණයක් විධියට අනුරාධපුරය ගැන කියන්න පුළුවන්- ඒ ප්‍රදේශය සංවර්ධනය කරලා තිබෙනවා. හම්බන්තොට කියලා කියන්නේ මේ රටේ සම්පත් අනුව බැලුවාම අඩු සම්පත් ප්‍රමාණයක් තිබෙන, ඒ වාගේම ජනතාවගේ පැත්තෙන් බැලුවාම බොහොම පීඩනයකින් සිටින ජනතාවක් ඉන්න ඉතා දුෂ්කර ප්‍රදේශයක්. එහෙම නම් වරාය, ඒ වාගේම ගුවන් තොටුපළ වාගේ දේවල් ඉදි කරලා අද හම්බන්තොට සංවර්ධනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට කිව්වා, තමුන්නාන්සේගේ ප්‍රදේශයේ තොරතුරු ගැන මම කථා කරනවා කියලා. එතුමා කිව්වා, විශේෂයෙන්ම හම්බන්තොට ආශ්‍රිතව ආයෝජන කලාපයක් ඇති කර, දැවැන්ත අධිවේගී මාර්ගත් සම්බන්ධ කරලා හම්බන්තොට ඉතාම දියුණු ප්‍රදේශයක් බවට පත් කරන්න කටයුතු කරනවා කියලා. අපි හම්බන්තොට වරායක් හැදුවා. එතකොට ඒකට පිහිනුම් තටාකයක් - swimming pool එකක් - කියලා කිව්වා; ඒකට වැලි ඇවිල්ලා පිරෙනවා කියලා කිව්වා. විපක්ෂය දැක්කේ එහෙම දෙයක් විතරයි. නමුත්, අද එය සමස්ත ජාතියට ප්‍රාග්ධනයක් වෙලා තිබෙනවා. අද දවසේ දරුවකුට පෙන්වන්න තිබුණේ කොළඹ වරාය විතරක් නම් හෙට දවසේ ඒ දරුවාට, මුනුපුරෙකුට මෙන්න පුතේ හම්බන්තොට වරාය කියලා මේ වරායත් පෙන්වන්න පුළුවන්. එක දවසින් ඒකට නැව් එන්නේ නැහැ, කාලයක් ගත වෙනවා. නමුත්, ඒක දීර්ඝ කාලීන ආයෝජනයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියලා මගේ කථාව අවසන් කරනවා. අපි ණය ගන්නවා කියලා කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, අපි යම් පුද්ගලයෙකුට ණය මුදලක් දෙන්නේ ආපහු ගන්න පුළුවන් නම් විතරයිනේ. අඩුම වශයෙන් ණය මුදල වෙනුවෙන් උකසට ගන්න පුළුවන් දෙයක් තිබෙනවාද කියලා බලනවා. චීනයේ විශාල මූල්‍ය සමාගම් මේ රටේ ආයෝජනය කරලා තිබෙන්නේ ඒවා ආපසු අය කර ගන්න පුළුවන් නිසායි. ඔවුන් නිකම් ණයක් දෙන්නේ නැහැ. ව්‍යාපෘතීන් තුළ තිබෙන ඵලදායිතාව, දීර්ඝ කාලයක් තුළ කොහොමද ආපසු අය කර ගන්නේ කියන ඒවා ගැන බලලා තමයි ඒ ණය ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා අපට සතුටු වෙන්න පුළුවන්, ලෝකයේ පිළිගත් බැංකු අපේ ව්‍යාපෘති පිළිඅරගෙන අපේ රටට මුදල් ලබා දීම ගැන. මේ තුළ තිබෙන්නේ විපක්ෂය දකින බොඳ වූ සිහින නොවෙයි.

ඉදිරි මැතිවරණය සඳහා අපි නාම යෝජනා පත්‍ර භාර දීලා තිබෙනවා. සැප්තැම්බර් මාසයේ 09වැනිදා වන විට සබරගමුව පළාත් සභාවත්, ඒ වාගේම නැඟෙනහිර පළාත් සභාවත්, උතුරු මැද පළාත් සභාවත් අපි ජයග්‍රහණය කරන කොට මෙතුමන්ලාට දැන ගන්නට පුළුවන්කම ලැබෙයි අපේ මේ ක්‍රියාමාර්ග හරිද වැරදිද කියා. කතිරය තමයි ප්‍රධාන වෙන්නේ. දින වකවානු ගැන කථා කරනවා. කවදා ඡන්දය පැවැත්වුවත් ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව ඒක අනුමත කරනවා. සැප්තැම්බර් 09වැනිදා වෙන කොට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මේ රටේ ගෙන යන ක්‍රියාමාර්ගය හරිද වැරදිද කියලා ජනතාව තීන්දුව දෙයි. එතකොට මෙතුමන්ලාට ඒක පිළිගන්න වෙනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට කථා කරන්නේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

කරුණාකර නිශ්ශබ්ද වන්න. ඊට මත්තෙන් කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANTHA BANDARA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 5.39]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලසුන දරන වෙලාවේ කථා කරන්න ලැබීම ඉමහත් භාග්‍යයක්, ඒ වාගේම සතුටක්, ඉමහත් නිදහසක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

එහෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදය තුළ SriLankan Airlines ගැන, ඒ වාගේම නාස්තිකාර වරාය ව්‍යාපෘතීන් ගැන කථා කරන විට ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ කාරණය දැක්කේ පෞද්ගලික මඩ ගැසීම්, ජනාධිපතිතුමාගේ පවුලේ සාමාජිකයන්ට මඩ ගැසීම්, ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට මඩ

ගැසීම් හැටියටයි. ඒක ඒ ප්‍රශ්නය දිහා බලන්න පුළුවන් එක විධියක්. නමුත්, රාජ්‍ය පාලනය පිළිබඳව ලෝකය පිළිගත් මූල ධර්ම හරහා මේ දිහා බලන කොට, ලෝකයම පිළිගත් යහ පාලනය - good governance - ගැන, ලෝකය පිළිගත් මූල ධර්ම දිහා බලන කොට වර්තමාන රාජපක්ෂ පවුල් පාලන ව්‍යාපෘතිය තුළ ලෝකය පිළිගත්, වැදගත්, කවුරුත් අනුමත කරන ඒ යහ පාලන මූල ධර්මයන් අනුව රට පාලනය නොකරනවාය කියන කාරණය පෙන්වා දීමට තමයි විපක්ෂයේ කථිකයන් හැම දෙනාම උත්සාහ කළේ.

SriLankan Airlines ආයතනයේ සභාපති නිශාන්ත වික්‍රමසිංහ මැතිතුමා ගැන අද දවසේ විවිධ විවේචන ඇති වුණා. එතුමා ගැන පෞද්ගලිකව අපට විවේචනයක් නැහැ. එතුමා ජීවිතයේ සැඳෑ සමය ගත කරන වැවිලිකරුවෙක්. දැනට ජීවිතයේ සැඳෑ සමය ගත කරන, වැවිලිකරුවකු විධියට අත් දැකීම් ලබපු එතුමාව මේ රටේ තිබෙන විශාලතම සමාගමේ සභාපති ධුරයට පත් කරන එක යහ පාලනය පිළිබඳව තිබෙන කුමන මූල ධර්මයට ගැළපෙනවාද කියන ප්‍රශ්නය මතු කරන්න සුදුසුම තැන මේ ගෞරවනීය සභාවයි. රටේ තිබෙන ලොකුම සමාගම පාලනය කරන්න එතුමාට තිබෙන සුදුසුකම මොකක්ද? සමාගම් පාලනය පිළිබඳව එතුමාට තිබෙන පළපුරුද්ද මොකක්ද? මේ තරම් ලොකු සමාගමක් පාලනය කරන්න; මේ වාගේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳව ලොකු වගකීම් සහිත සමාගමක් පාලනය කරන්න එතුමාට තිබෙන සුදුසුකම් මොනවාද? එකම සුදුසුකම තමයි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[ Expunged on the order of the Chair.]*

සහෝදරයා වීම.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I think I have to warn you that that must be withdrawn.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියා ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවේ කියන්න බැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කවුද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? කවුද, ඒ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විධායකය කියන්නේ කවුද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[ Expunged on the order of the Chair.]*

සහෝදරයා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මූලාසනයෙන් කියන එක භාර ගෙන ඒ කොටස නැතිව කථා කරන්න. එය හැන්සාඩ් වාර්තාවෙන් කපා හරිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද, කපා හරින්නේ? නිශාන්ත වික්‍රමසිංහ කපා හරිනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක ඔබතුමා මට කියන්න ඕනෑ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත වික්‍රමසිංහ කියන පුද්ගලයා SriLankan Airlines සමාගමේ සභාපතිකමට පත් වන්නේ නෑදෑකම නිසායි. අපේ රට යුද්ධයෙන් පස්සේ යහපත් තැනකට ගෙන යනවා නම්, මේ රටේ රාජ්‍ය ව්‍යාපාර නිසි පරිපාලන ක්‍රමවේදයන් පාවිච්චි කරලා දියුණු තැනකට, අල්ලසින්, දූෂණයෙන් තොර තැනකට ගෙන යනවා නම්, පවුලේ සාමාජිකයන්ට සංග්‍රහ කිරීම, පවුල් පාලනය නතර කෙරෙන්න ඕනෑ. ඒ වෙනුවට රටේ ඉන්න දක්ෂම, හොඳම, පළපුරුදුම, පෞද්ගලික අංශයේ හෝ රජා අංශයේ ඉන්න විධායක නිලධාරින් ඒ තනතුරු දරන්න ඕනෑ. රටේ තිබෙන ප්‍රධානම සමාගමේ ප්‍රධාන ධුරයට තෝරා ගන්නේ පවුල් සබඳතා මතයි කියලා අපට පෙනෙනවා නම් මේ රජයේ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ පොදුවේ මේ රටේ රාජ්‍ය පාලනය පිළිබඳව තිබෙන දර්ශනය ගැන අපට සැකයක් ඇති වනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් වරාය ගැන කථා කරද්දී මා කියන්න ඕනෑ, එහි වගකීම් භාර දී තිබෙන සභාපතිවරයා ආචාර්ය ප්‍රියාත් බන්දු වික්‍රම කියලා. ආචාර්ය ප්‍රියාත් බන්දු වික්‍රමගේ ආචාර්ය උපාධිය තිබෙන්නේ මොන විශ්වවිද්‍යාලයකින්ද කියලා මේ ගෞරවනීය සභාවෙන් මා අහන්න කැමැතියි. ඒ ආචාර්ය උපාධිය ගත්තේ මොන වසරේද, කවදාද, පූර්ණ කාලීන අධ්‍යාපනයකින් පසුවද, කුමන විශ්වවිද්‍යාලයකින්ද, ඒ විශ්වවිද්‍යාලය ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාලයක්ද කියන කාරණා ගැන දැන ගන්න මේ සභාවට අයිතියක් තිබෙනවා. මොකද, සමහර බොරු ආචාර්යවරු මේ ගෞරවනීය සභාවේත් ඉන්න බව අපි දන්නවා. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ඒකට හිනා වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හිනා වෙන්න නොවෙයි තිබෙන්නේ, අඬන්නයි. මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ තමන්ගේ නම්වලට ඉදිරියෙන් "ආචාර්ය" කියා යොදා ගන්නා සමහර අයට -හැම දෙනාම නොවෙයි. ඇත්ත ආචාර්යවරු ඉන්නවා- ඒ තනතුරු ලැබී තිබෙන්නේ විශ්වවිද්‍යාලවලින් නොවෙයි. නමුත් ඒවා මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේත් පාවිච්චි කරනවා. දැන් අපට

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

තේරුම් ගන්න තිබෙන්නේ, බොරු සුදුසුකම් නම මුලට දමා ගන්නා අයට, නම අගට දමා ගන්නා අයට රටේ ප්‍රධානම ආයතන වන වරාය, ගුවන් තොටුපොළ, ගුවන් සේවය භාර දීම සුදුසුද කියන එකයි. ඒ අය පිළිබඳව තිබෙන විශ්වසනීයත්වය මොකක්ද? මේ අය රුපියල් බිලියන ගණන්, ඇතැම් විට ඩොලර් බිලියන ගණන් මුල්‍ය පාලනය පිළිබඳව වගකීම් භාර දෙන්න සුදුසු පුද්ගලයන්ද? එම නිසා යහ පාලනය - good governance - පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආණ්ඩුවේ ඉන්න වැදගත් ඇමතිවරුන්ට -අපේ ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා ඇත්ත ආචාර්ය උපාධියක් තිබෙන කෙනෙක්. රට ගැන බොහොම අවංකව කල්පනා කරන කෙනෙක්- මා කියන්නේ මේ ගැන ඔබතුමන්ලා ප්‍රශ්න කරන්න ඕනෑය කියලායි. අඩු ගණනේ, "විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ දේවල් පාර්ලිමේන්තුවේදී අහනවා. අපට ලජ්ජාවේ ඉන්න බැහැ"යි කියලා ඔබතුමන්ලා ප්‍රශ්න කරන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ උසස් තනතුරු ගැන කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. අපේ පාර්ලිමේන්තුවේ Committee on High Posts එකක් තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුයි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුනුයි දෙගොල්ලෝම ඒ කමිටුවේ ඉන්නවා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුනුත් හත්දෙනෙක්, අටදෙනෙක් විතර ඒ කමිටුවේ ඉන්නවා. එම අවස්ථාවේදී මේ කරුණු ඉදිරිපත් කරන්න එපායැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමා, මේ පත්වීම් හැම එකක්ම පළමුව අමාත්‍ය මණ්ඩලය තමයි අනුමත කරන්නේ. මේ ඉහළ පත්වීම් හැම එකක්ම අමාත්‍ය මණ්ඩලය පළමුව අනුමත කරනවා. ඒ අමාත්‍ය මණ්ඩලයේදී ඔබතුමා වැනි ඇත්ත ආචාර්ය උපාධියක් තිබෙන කෙනෙකුට මේවා ගැන ප්‍රශ්න කරන්න බැරිද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ Committee on High Posts එකට ඇත්ත වශයෙන්ම ඒ පත්වීම් නවත්වන්නට පුළුවන්. ඔබතුමාට මතක ඇති එක කාලයක උපාලි විජේවර්ධන මැතිතුමාගේ පත්වීම -ප්‍රේමදාස අගමැතිතුමාගේ කාලයේ- ඒ විධියට නැවැත්වූ බව. එතුමා Committee on High Posts එකට ආවා. Committee on High Posts එකේ සරත් මුත්තෙට්ටුවෙගම වැනි දක්ෂ අය විරුද්ධ පක්ෂයෙන් හිටියා මට මතකයි. ඒ අය කිව්වා අපට මෙතුමාගේ නම අනුමත කරන්න බැහැ කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බොහොම හොඳයි. ඔබතුමාගේ පළපුරුද්ද-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ කරුණත් අපි සටහන් කර ගනිමු. ඔබතුමාගේ කථාවට බාධා කරන්න මම කැමති නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඒ කරුණත් අපි සටහන් කර තබමු. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මේ අයට මේ සුදුසුකම් තිබෙනවාද, නැද්ද? මේ අයට මේ රාජකාරිය හරියට කරන්න පුළුවන්ද, බැරිද? එච්චරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අනෙක් ප්‍රශ්නය මෙයයි. මේ ආණ්ඩුව කරන්නේ එක්සත් ජාතික පක්ෂය නොවෙයි නේ. මේ ආණ්ඩුව කරන්නේ බුලත් කොළයේ ලකුණින් මැතිවරණයට ඉදිරිපත් වුණු සන්ධානය. ඒ සන්ධානය කෑලි කෑලිවලට කැඩිලා ගිහින් අද නාම යෝජනා භාර දීමේත් ප්‍රශ්න තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔය වාගේ විවේචන නිසා තමයි පාර්ලිමේන්තුවේ සම්මුතියෙන් Committee on High Posts එකක් හැදුවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසර දෙන්න. ගරු ඇමතිතුමාට මගේ වෙලාව දෙන්න කැමති නැහැ. ඒ වාගේම අද සාකච්ඡාවට ලක් වුණා, ශ්‍රීලන්කන් ගුවන් සේවාවේ කටයුතු රජයේ ඉහළ බලධාරින්ගේ පෞද්ගලික සුඛවිහරණයට පාවිච්චි කරන එක ගැන. බලු පැටියෙක් පිළිබඳ ප්‍රශ්නය-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன )
(The Hon. Piyankara Jayaratne)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

There is a point of Order being raised by the Hon. Piyankara Jayaratne.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මොකක්ද point of Order එක? එතුමාට පිළිතුරු දෙන්න පුළුවන්. මගේ කාලය ගන්න බැහැ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

මට point of Order එකක් අර ගෙන කථා කරන්නට අයිතිය තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

What is your point of Order? Let us listen to his point of Order.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනවශ්‍ය බොරු කථා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලායි මම කියන්නේ. මේ වන විට ශ්‍රීලන්කන් ගුවන් සමාගම නීත්‍යනුකූලව කටයුතු කරනවා. කිසිම කෙනෙකුගේ සුබවිහරණයට වැඩ කරන්නේ නැහැ. කරුණාකරලා ඒක අයින් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක Standing Orders අනුව ප්‍රශ්නයක් නොවෙයි නේ. ඔබතුමා ඒ ගැන තීරණය කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. That is noted; his objection is noted. Hon. Ajith P. Perera, you carry on.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි දන්නා ප්‍රශ්නය තමයි ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ගුවන් යානයක සාමාන්‍ය ගමන් මඟ වෙනස් කරලා-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
එහෙම කරන්න බැහැ. එහෙම කරන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සාමාන්‍යයෙන් යොදන ගුවන් යානයට වඩා අඩු ධාරිතාවෙන් යුතු ගුවන් යානයක් යොදලා බලු පැටියෙක් අරගෙන ඒම සඳහා කටයුතු කළා. [බාධා කිරීමක්] ඒ පිළිබඳ ප්‍රශ්නය අදාළ පුද්ගලයාගෙන් විමසන විට මාධ්‍යවේදිනී ෆෙඩ්රිකා ජැන්ස් මැතිනියට කුණුහරුප අහන්න සිද්ධ වුණා. [බාධා කිරීමක්] පුවත් පත්වල ඒ පිළිබඳව පළ වෙලා තිබුණා. ඒ වාගේම ඒ පිළිබඳව සමාවත් ගත්තා නේ. [බාධා කිරීමක්] සමාවත් ගත්තා නේ. ඔබතුමා මෙතැන ඒ පුද්ගලයා ආරක්ෂා කරන්න යනවා. ඒ පිළිබඳව අදාළ පුද්ගලයෝ සමාවත් ගත්තා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ආයතනවල ප්‍රධානීන්ගේ වත්කම්, ඔවුන්ගේ මූල්‍ය උපයා ගැනීම් සහ ඒ වාගේම දූෂිත ක්‍රියාකාරකම් ගැන සොයලා බලන්න රටට යුතුකමක් තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපති නිශාන්ත වික්‍රමසිංහ මහත්මයාගේ ගෙදර ආපහු සැරයක් හොරු කැඩුවා. මේ සභාවේදී අදහසක් ඉදිරිපත් වුණා, "හොරුන්ගෙත් හොරු කම්බා හොරු" කියලා. ඇත්ත වශයෙන්ම හොරකම් කිරීම නරකයි. පොලීසියට කළ පැමිණිල්ල අනුව, හොරකම් කළ ධනය උපයා ගත්ත ක්‍රමය පැහැදිලි කරන්නට අවශ්‍යයි නේ. ඒ වාගේම මේ රටේ පුද්ගලයෙකුට ප්‍රකාශයට පත් නොකර අවම වශයෙන් තබා ගන්නට පුළුවන් විදේශ විනිමය ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් තමන්ගේ නිවසේ තබා ගත්ත බව තමන්ගේම පොලිස් පැමිණිල්ලෙන් හෙළිදරව් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේම පැමිණිල්ලෙන් අපරාධයක් හෙළිදරව් වුණාම -ඔබතුමා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ධුර දරන මන්ත්‍රීවරයෙක්- ඒ වෙලාවට පොලීසියට අමුතුවෙන් වෙනත් පැමිණිල්ලක් ඕනෑ නැහැ. එතැනදී අපරාධකරු පොලීසියට ඇවිල්ලා. එතකොට පොලීසිය ඊ ළඟ පියවර ගත යුතුයි. ඒ විදේශ විනිමය පිළිබඳව නීතිය ඉක්මවලා තිබෙනවා නම් සුදුසු බලධාරීන්ට දැනුම් දීලා පියවර ගන්න ඕනෑ. මොකද, අපි දැක්කා සරත් ෆොන්සේකා මැතිතුමාගේ බෑනණුවන්ගේ මවගේ බැංකුවක locker එකේ ප්‍රකාශයට පත් නොකළ විදේශ විනිමය තිබුණා කියන චෝදනාව මත එතුමියට විරුද්ධව නඩු පැවරුවා; අධි චෝදනා ඉදිරිපත් කළා. එතකොට එක් කෙනෙකුට එක විධියක්; තවත් කෙනෙකුට තවත් විධියක්. එතකොට මේ රටේ සාධාරණය කොහේද, යුක්තිය කොහේද කියලා අහන්න අපට සිද්ධ වෙනවා. මේවා පෞද්ගලික මඩ ගැසීම් නොවෙයි. වැරදි කරනවා නම්, වැරදි ජේනවා නම් ඒවා හෙළිදරව් කරන එක මහජන නියෝජිතයෝ වශයෙන් අපේ යුතුකම. ඒ නිසා මම නැවත නැවතත් එකම කරුණ කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ රටේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ යහ පාලනය -good governance- ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි මේ රටේ ඒකාධිපති පාලනයක් අරගෙන යන එක. මේ රටේ උත්තරීතර ව්‍යවස්ථාදායක මණ්ඩලය -පාර්ලිමේන්තුව- ගණන් ගන්නේ නැහැ; ඒකට සලකන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව රබර් seal එකක් විධියටයි පාවිච්චි කරන්නේ කියන කාරණය මේ පාර්ලිමේන්තුවට මම ආපු පසු ගිය අවුරුදු දෙකකට වැඩි කාලය තුළ හැම දාමත් මට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ මම කථා කරන මේ මොහොතත් සමඟ තුන්වැනි වතාවටත් ගණපූරණය නැහැ. ඒ නිසා මම ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය මතු කරනවා. ගණපූරණය ඇති වෙන තුරු මම කථා කරන්නේ නැහැ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***
*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*
*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is a Quorum now. The Hon. Member can continue with his speech now.

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is a point of Order being raised by the Hon. Mahinda Amaraweera.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගණපූරණය ගැන ප්‍රශ්න කරපු එක ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ඔබතුමාත් දන්නා පරිදි නිරන්තරයෙන් ගණපූරණය විමසීම නිසා අද අපට කාරක සභා පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ වෙලාවේ කොහේද කාරක සභා තිබෙන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Let me hear his point of Order as well.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමන්ලාම දන්නවා, COPE එකේ සාකච්ඡා කරන්න රාජ්‍ය ආයතන සිය ගණනක් තිබෙන බව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, that is not a point of Order. He is wasting my time.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
He is making a point for the Chair to listen. Yes, Hon. Amaraweera, you continue with your point of Order.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මට කථා කරන්න අවස්ථාව දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකේ සාකච්ඡා කරන්න ආයතන සිය ගණනක් තිබෙනවා. [බාධා කිරීමක්] මෙහෙම වෙන කොට COPE එක කරගෙන යන්න බැරි තත්ත්වයක් අද අපට උදා වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Ajith Perera, please guard your tongue.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ වාගේම පාර්ලිමේන්තු උපදේශක කාරක සභා තියන්න කියලා විපක්ෂයම තමයි ඉල්ලීම් කරන්නේ. ඒ නිසා හිතාමතාම මේ කටයුත්ත කරනවා නම් ඔබතුමා තීන්දුවක් දෙන්න COPE එක තියන්න ඕනෑ නැහැ කියලා. මේ පාර්ලිමේන්තුවේ COPE එක තියන්න එපා කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I am seized of the point now. Hon. Ajith Perera, you can continue with your speech.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ වෙලාවේ කොහේද COPE එකක් තියෙන්නේ? [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා කියපු ඒ කාරණය මම ගරු කථානායකතුමාගේ අවධානයට ගේනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ පාර්ලිමේන්තුවේ කිසිම කමිටුවක් නැහැ. [බාධා කිරීමක්] මම මේ වෙලාවේයි ගණපූරණ ප්‍රශ්නය මතු කළේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගෞරවනීය පාර්ලිමේන්තුව කාගේවත් රබර් seal එකක් කරන්න දෙන්න බැහැ. මේ ගෞරවනීය පාර්ලිමේන්තුව විධායකයේ රබර් seal එකක් නොවෙයි. මේ ගෞරවනීය පාර්ලිමේන්තුව එක එක අයට අවශ්‍ය විධියට පාවිච්චි කරන්න බැහැ. මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ ඉන්න හැම මන්ත්‍රීවරයෙකුටම -පක්ෂ, විපක්ෂ හැමෝටම- යුතුකමක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුවට එන්න. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ නොවෙයි, හැම මන්ත්‍රීවරයෙකුටම ඒ යුතුකම තිබෙනවා. නමුත් 161ක් මන්ත්‍රීවරු ඉන්න ආණ්ඩුවේ කාටද අපි අද කථා කරන්නේ? අපි මොකටද මෙතැන රැඳිලා ඉන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලාගේ කී දෙනෙක් ඉන්නවාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විපක්ෂයේ අපගේ ප්‍රශ්නයක් නොවෙයි ඒක. ආණ්ඩුවේ මන්ත්‍රීවරු 161 දෙනෙක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ Quorum එක පවත්වා ගන්න එක විපක්ෂයේ වගකීම නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ Quorum එක පවත්වා ගැනීම ආණ්ඩුවේ වගකීමයි. මේ පාර්ලිමේන්තුවේ නරක පුරුදු ඇති කරගෙන තිබෙනවා. ඒ නරක පුරුදු නැති කර ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඉන්නේ ඒ නරක පුරුදු ආරක්ෂා කරන්න නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225 දෙනාම තමන්ගේ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! "Order, please!" කිව්වාම නිශ්ශබ්ද වෙන්න ඕනෑ. Parliament belongs to both the Government and the Opposition. So, both the Government and the Opposition must honour the dignity of Parliament.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇත්ත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිනිස්සු අතිමහත් සංඛ්‍යාවක් බුලත් කොළයට ඡන්දය දීලා පත් කරපු අය වාගේම, අපේ පැත්තෙනුත් පිරිසක් අරගෙන මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු 161 දෙනෙක් හදලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නයි. එතකොට මේ පාර්ලිමේන්තුවේ අද දවසට තුන් සැරයක් සණපූරණය නැති වුණා. මේක අලුත් දෙයක් නොවෙයි. ඒ නිසා මේ ප්‍රශ්නය ඉවර කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව මේ තරම් පහළට දාන්න බැහැ. මේක ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට ඕනෑ විධියට රබර් seal එකක් කරන්න දෙන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනෑ. ඒක තමුන්නාන්සේලාගේත් වගකීම; අපේත් වගකීම. ඒ නිසා අපි මේ සංස්කෘතිය වෙනස් කරලා, මේ ඇති වෙලා තිබෙන පහත් තත්ත්වය වෙනස් කරලා මේ රටේ මිනිසුන්ට කියන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවට එන්නේ කවුද, එන්නේ නැතුව ඉන්නේ කවුද, එනවා කියලා වෙන වෙන තැන්වල යන්නේ කවුද කියලා. ඒවා පෙන්වලා දෙන්න ඕනෑ. කාරක සභා තිබෙනවාය කියලා මේ සභා ගැබට එන්නේ නැතුව ඉන්නේ කවුද, පාර්ලිමේන්තුවේ කාරක සභා තිබෙන්නේ කීයටද, මොන වේලාවටද, ඒවාට සහභාගි වුණේ කී දෙනෙක්ද කියලා කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ හැම දෙයක් ගැනම යම් යම් වාරණ ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කරනවා. නමුත් පාර්ලිමේන්තුවේ කිසි දෙයක් යථාර්ථවාදීව සිද්ධ වෙන්නේ නැහැ. ඉහළින් හදලා එවන පනත් කෙටුම්පත් ඔහේ pass වෙනවා. මේ සභා ගැබේ කථා කරන කිසිම දෙයකට සවන් දෙන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරන දේවල්වලට ඇහුම් කන් දෙන්න සමහර දවස්වලට ඇමතිවරයා මේ සභා ගැබේ ඉන්නේ නැහැ. අද ගරු ඇමතිතුමා ඉන්නවා. බොහොම ස්තුතියි. අද ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා- බොහොම ස්තුතියි. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම හිටියා-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා ඉන්නවා. ඔබතුමා උගත්, පාර්ලිමේන්තුවට ගරු කරන කෙනෙක්. ඔබතුමා ගැන වාදයක් නැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සම්පූර්ණ කාල වේලාව තුළ හිටියා. ඒකට බොහොම ස්තුතියි. හැබැයි ප්‍රශ්නය මොකක්ද? අද වරාය ගැනත් කථා කරනවානේ. කෝ, වරාය විෂයය භාර ඇමතිවරයා?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන්න අවශ්‍යයි. මේ පාර්ලිමේන්තුවට තමයි මූල්‍ය පාලනය පිළිබඳ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් භාර දීලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට තමයි යහපාලනය පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම භාර දීලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට තමයි fiscal governance ගැන වගකීම භාර දීලා තිබෙන්නේ. මේ ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ ඒ යුතුකම් ඉෂ්ට කරන්නේ නැත්නම්, තමන්ට ලැබෙන දීමනා, පඩිය ගැන සලකා ඒ වගකීම් ඉෂ්ට කරන්නේ නැත්නම් මේ පාර්ලිමේන්තුව වහලා දමන්න ඕනෑ. නැත්නම් ජනතාව ඇවිල්ලා මේකට ගිනි තියලා දමයි. මොකක්ද මේකේ තේරුම? අද මේක විහිළුවක් කරගෙනයි තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔච්චර දරුණු වෙන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක විහිළුවක් නොවෙයි. ඒ නිසා අපි ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය දිගින් දිගටම මතු කරනවා. ඒක පක්ෂ පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, අපේ යුතුකමක්. මේ රටේ මිනිස්සු දහස් ගණනක් අපට ඡන්දය දීලා එවා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න. ඒ නිසා අපි ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය මතු කරනවා විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ වගකීම් ඉෂ්ට කරන්නේ නැති මන්ත්‍රීවරුන් කවුද කියන එකත් හෙළිදරව් කරනවා. මේ පාර්ලිමේන්තුවට එන්නේ නැති ඇමතිවරු කවුද, මාස හයකට, හතකට වතාවක්වත් එන ඇමතිවරු කවුද, ප්‍රශ්නවලට උත්තර දෙන්න කිව්වාම දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ලවා උත්තර දීලා පැනලා යන අය කවුද කියන ඔය ඔක්කෝම අපි හෙළිදරව් කරනවා. EPF, ETF ගැන විස්තර ඇහුවාම ඒවා දෙන්නේ නැති ඇමතිවරු කවුද, ඒවා හංගන ඇමතිවරු කවුද කියලා අපි හෙළිදරව් කරනවා. මෙතැන සම්පූර්ණයෙන්ම විහිළුවක්නේ වෙන්නේ. අපි ප්‍රශ්න යොමු කරනවා සිය ගණනක්. හැබැයි උත්තර දෙන්නේ කවුද? ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා තමයි උත්තර දෙන්නේ. එතුමා දන්නේ නැහැ ඒ ඒ විෂයයන් ගැන. එතුමාගේ විෂයය ගැන කවුරුත් ප්‍රශ්න අහන්නේ නැහැ. වෙන වෙන කාරණා ගැන තමයි එතුමාගෙන් අහන්නේ. ඉතින් මොකක්ද මේ පාර්ලිමේන්තුවේ තිබෙන අගය? මොකක්ද මේකේ තිබෙන වටිනාකම? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන එක ඔබතුමාගේත්, මගේත්, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් -අපි හැමෝගේම- වගකීමක්ය කියන කාරණය මා මතක් කරනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Adjournment Motion is to be moved by the Hon. Shantha Bandara.

## ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව
சிரேஷ்ட பிரஜைகளுக்கான கொடுப்பனவு
ALLOWANCE FOR SENIOR CITIZENS

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මුදල් අමාත්‍යතුමා වශයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2012 අය වැය යෝජනා යටතේ වයස අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රුපියල් දහසක මාසික දීමනාවක් ගෙවීම සඳහා කටයුතු කිරීමට ගරු සමාජ සේවා අමාත්‍යතුමා දැනටමත් කටයුතු කර තිබීම පිළිබඳව පළමු කොටම මෙම ගරු සභාවට ප්‍රකාශ කර සිටිමි.

මෙම දීමනාව 2012 ජුනි මස සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර, 2012.01.01 දිනට වයස අවුරුදු 70 ඉක්මවූ, මහජනාධාර වශයෙන් මාසිකව රු.250/- ලබන්නා වූ හා මාසිකව රු.350/- සමෘද්ධි දීමනාව ලබන්නා වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මේ සඳහා සුදුසුකම් ලබයි.

තමන්ට හැකියාව ඇති කාලය තුළදී තම අඹුදරුවන්ට, ගමට, ප්‍රදේශයට, ජනතාවට සේවය කොට, එසේ කිරීමට නොහැකිව වයෝවෘද්ධ වූ විට තම ජීවිතය ගෙන යාම සඳහා මහින්ද චින්තනය අනුව යමින් මෙවැනි සහනාධාරයක් ලබා දීමට ක්‍රියා කිරීම මෙම ගරු සභාවේ ප්‍රශංසාව හිමි විය යුතු බවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මේ ගරු සභාවට ඇවිල්ලා 2012 අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේදී, අපේ රටේ වයස අවුරුදු 70 ඉක්මවූ, ඒ වාගේම අඩු ආර්ථික මට්ටමක සිටින පවුල්වල වැඩිහිටි දෙමාපියන්ට රුපියල් දහස බැගින් ආධාරයක් ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කළා. අය වැය කථාවෙන් කියපු ඒ කාරණය යථාර්ථයක් බවට පත් කරමින් ජනතාවාදී ආණ්ඩුවක මානවවාදී නායකයකු හැටියට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ දයාබර වැඩිහිටියන් වෙනුවෙන් අද මේ දීමනාව ලබා දෙන්න කටයුතු කිරීම ප්‍රශංසාවට ලක් විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර දේශපාලන නායකයන් තීන්දු තීරණ ගන්නේ හුදෙක් ඡන්දය බලාගෙනයි. මේ අවුරුදු 70ට වැඩි, විවිධ අපහසුතා තිබෙන, ආර්ථික ප්‍රශ්න තිබෙන, සමහර විට දරුවන්ගේ නොසැලකිල්ලට ලක් වුණු, ඒ වාගේම විවිධ හේතූන් නිසා දරුවන් අහිමි වෙච්ච, ඥාතීන්ගෙන් උදව් උපකාර නොලැබෙන, රටට විශාල සේවාවක් කරපු අහිංසක වැඩිහිටියන් දෙස දේශපාලන නායකයෙක් බලන්නේ නැහැ.

ඒ දේශපාලන නායකත්වය බලන්නේ ඡන්ද පදනමක් එක්කයි. අවුරුදු 70ට වැඩි ඒ වයෝ වෘද්ධ අය සමහර විට ඇඳේ ඉන්න පුළුවන්, හැරමිටියෙන් ගමන් කරන්න පුළුවන්, ඡන්ද පොළට ගිහිල්ලා ඡන්දයක් දමන්න බැරි අය වන්න පුළුවන්. හතළිස් වසරකට වඩා දේශපාලන අත් දැකීම් තිබෙන නායකයෙක් හැටියට, ගමේ ජනතාවගේ පන්නරය ලබා ගෙන පියවරෙන් පියවර ඉදිරියට ආපු නායකයෙක් හැටියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ කවුරුත් නොබලපු පැත්තක්, කවුරුත් නොදකින පැත්තක් දිහා සානුකම්පිතව හා සංවේදීව බලා වැඩිහිටියන් වෙනුවෙන් මෙවැනි පියවරක් ගැනීම සම්බන්ධව මේ මුළුමහත් සභාවේම සහ අපේ මහ ජනතාවගේ ගෞරවය එතුමාට හිමි වෙනවාය කියන කාරණය මේ වෙලාවේදී විශේෂයෙන්ම මම මතක් කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දන්නවා, දළ වශයෙන් ගත්තාම මේ රටේ අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් 425,000ක් ඉන්නවා කියලා. මේ 425,000ට මම මුලින් කියපු සුදුසුකම් අනුව එක් අයෙකුට රුපියල් 1,000කට වැඩි දීමනාවක් ලබා දීම සඳහා 2012 වසර සඳහා වූ අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 911ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම 2013 අවුරුද්ද වෙන කොට ඒ මුදල වැඩි කිරීම සඳහා අවශ්‍ය යෝජනාත් මේ වෙන කොට සාකච්ඡා කරමින් පවතිනවා. මේ වෙන කොට අවුරුදු 70ට වැඩි වැඩිහිටියන්ට රුපියල් 1,000 බැගින් ලබා දීලා ඒ යුතුකම් කොටස ඉටු කරනවා වාගේම, පූර්ණ ආබාධිත තත්ත්වයේ සිටින පුද්ගලයන්ටත් රුපියල් 3,000 බැගින් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් අවම වශයෙන් පූර්ණ ආබාධිත තත්ත්වයේ සිටින පුද්ගලයන් 34 දෙනෙකුටවත් මේ සහනය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ අදාළ පවුල් තෝරා ගෙන ඒ පවුල්වල ගෘහ මූලිකයා පූර්ණ ආබාධිත තත්ත්වයේ ඉන්නවා නම් ඒ පවුලකට රුපියල් 3,000 බැගින් ලබා දෙන ඒ වැඩ පිළිවෙළ මේ වෙන කොට සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන්න අතිගරු ජනාධිපතිතුමා අවස්ථාව උදා කර දීලා තිබෙනවා. අපි නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසවල, ඒ වාගේම අපි නියෝජනය කරන දිස්ත්‍රික්කවල සිටින ආබාධිත පවුල් දිහා කවුරුත් බැලුවේ නැහැ. අර මම මුලින් කිව්වා වාගේ සමහර විට ඒ ආබාධිත අය ඡන්දය දමන්නවත් යන්න පුළුවන් අය නොවෙයි. මේ රටේ බොහෝ දේශපාලනඥයින් සමහර අවස්ථාවලදී ඡන්ද පදනම බලාගෙන තීන්දු තීරණ ගන්නවා. ඒ නිසා එවැනි ඡන්ද පදනමක් බලන්නේ නැතිව වැඩිහිටි වාගේම, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වෙච්ච ඒ පවුල් සඳහාද අද රුපියල් 3,000ක දීමනාවක් ලබා දෙන්න කටයුතු කිරීමත් මේ අවස්ථාවේදී පැසසුමට ලක් කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

I propose that the Hon. Janaka Bandara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශාල ලෙස අන්ත අසරණ තත්ත්වයට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් ශ්‍රවණාධාර, ශ්‍රවණ උපකරණ, ඇස් කණ්ණාඩි, කාච ආදී දේවල් ලබා දීම වැනි කටයුතු ගණනාවක් අද අපේ රජය ක්‍රියාත්මක කරනවා. මේ සමාජයට, රටට පොදු කාර්යයන්වලදී, ගමේ වැඩ කටයුතුවලදී කර ගහලා, උර දීලා වැඩ කරලා අතිවිශාල සේවාවන් කරපු අපේ දෙමව්පියන්, වැඩිහිටියන් අද අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න වෙලාවේ, ඇඳට වැටිච්ච වෙලාවේ, බෙහෙත් ටිකක් ගන්න කවුරුත් උදව් කරන්නේ නැති වෙලාවේ, මේ රටේ රාජ්‍ය නායකයා හැටියට අතිගරු ජනාධිපතිතුමා ගත් ඒ තීරණය ඉතාම වැදගත් තීන්දුවක් කියන කාරණයත් මා මේ අවස්ථාවේදී සනිටුහන් කරන්න ඕනෑ.

ජනතාවාදී ආණ්ඩුවක් හැටියට, ජනතාවාදී තීන්දු අරගෙන, මානව හිතවාදී ආණ්ඩුවක, මානව හිතවාදී නායකයෙක් යටතේ කටයුතු කරන නිසා තමයි අද ඕනෑම වෙලාවක ජනතාව ඉදිරියට යන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ. එක පැත්තකින් ජාතික සංවර්ධනය, අනෙක් පැත්තෙන් ග්‍රාමීය සංවර්ධනය, තව පැත්තකින් රටේ ආර්ථිකය යන මේ සියල්ලම කළමනාකරණය කරලා ධනාත්මක දිශාවට, දියුණුවේ දිශාවට අපේ රට අද හරවලා තිබෙනවා. ඒ නිසා මැතිවරණවලට භය වන්නේ නැතිව ජනතාව ඉදිරියට ගිහිල්ලා තමන්ගේ මතය ප්‍රකාශ කරන්න අද අපට අවස්ථාව සලසා දීලා තිබෙනවා. අහිංසක ජනතාවට සහන ලබා දෙන්න ක්‍රියා කරන මේ මොහොතේත් අපේ රට විනාශ කරන්න, නැවතත් මේ රටේ බෙදුම්වාදී සංකල්ප ගෙන එන්න, නැවතත් ඊළාම් සිහිනය සැබෑ කර ගන්නට වෙර දරන විශාල කණ්ඩායමක් ජාත්‍යන්තරය තුළත්, අපේ රට තුළත් ඉන්නවා.

හෙටින් පස්සේ මැතිවරණ සමයක් උදා වනවා කියලා අපි දන්නවා. අපි විශේෂයෙන්ම කියන්නේ මේ පළාත් සභා ජයග්‍රහණය කිරීම තුළිනුත් ජාත්‍යන්තරයෙන් අපට එල්ල වන කුමන්ත්‍රණ පරාජයට පත් කරන්න පුළුවන් කියලායි. මොකද අද දමිළ ඩයස්පෝරාව ඇතුළේ සිටින කණ්ඩායම්වලට විශේෂ වුවමනාවක් ඇති වෙලා තිබෙනවා, ආණ්ඩුවත් සමඟ ජනතාව නැහැ කියලා ලෝකයටත්, ඇතැම් එල්ටීටීඊ හිතවාදීන්ටත් පෙන්වන්න.

ඒ පෙන්වීම තුළින් ඔවුන්ගේ පරමාර්ථ ඉෂ්ට කර ගන්න අද උත්සාහයක් දරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව එදා විශේෂයෙන්ම බෙදුම්වාදී ත්‍රස්තවාදයෙන් මිරිකිලා හිටපු ජනතාව අද නිදහසේ ගන්නා හුස්ම නැවත පාවා දෙන්න උත්සාහ කරන්නේ නැහැ. ඒ නිසා ඉදිරියේදී කුමන් අවස්ථාවක මැතිවරණ ආවත් ඒ මැතිවරණවලදී, මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව සමඟ ජනතාව තවමත් ඉන්නවාය කියන පණිවුඩය ඒ ඉදිරි පළාත් සභා මැතිවරණවලදී ලබා දෙන්නේ වෙන මොනවාත් නිසා නොවෙයි අප ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළවල් ඉදිරියට ක්‍රියාත්මක කරන්නයි; රටේ සංවර්ධනය සඳහා ඒ සියලු වැඩ පිළිවෙළවල් සාර්ථක කර ගන්නා ගමන් අද ජනතාවට ලබා දෙන සහනයන්ට සහ ශුභ සාධන කටයුතුවලට තවදුරටත් දොර විවෘත කර දීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව යමින් විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු සමාජ සේවා අමාත්‍ය ෆීලික්ස් පෙරේරා මැතිතුමා මේ කරුණු කෙරෙහි හොඳින් අධ්‍යයනය කරලා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ගිහිල්ලා, දිස්ත්‍රික්වලට ගිහිල්ලා, ඒ ප්‍රදේශවල මහජන නියෝජිතයන්, නිලධාරින් එක්ක සාකච්ඡා කරලා මේ වැඩ කටයුතු ඉතාම කාර්යක්ෂමව ඉදිරියට කර ගෙන යෑම සඳහා විශාල කැපවීමකින් කටයුතු කරනවා; ඒ වාගේම එතුමාගේ නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු නිලධාරිනුත් කැපවීමෙන් මේ කටයුතු කරනවාය කියන කාරණය මේ අවස්ථාවේදී ප්‍රශංසාත්මකව සඳහන් කරන්න කැමැතියි.

මේ විධියට අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළ යෝජනා යථාර්ථයක් බවට පත් කරමින්, ඒ වාගේම 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' යථාර්ථයක් බවට පත් කරමින් විශේෂයෙන්ම රටේ සියලු දෙනාම අගය කරන මෙවැනි ශුභ සාධන කටයුතුවලට නායකත්වය දීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට නැවතත් අප සියලු දෙනාගේම ප්‍රශංසාව පුද කරමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි, යෝජනාව ස්ථිර කිරීමට ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

අතිගරු ජනාධිපතිතුමා 2012 අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට මෙම ගරු සභාවේදී කිව්වා, වයස අවුරුදු 70ට වැඩි අයට රුපියල් 1,000 බැගින් දීමනාවක් ලබා දෙනවාය කියලා. අද එම දීමනාව ලබා දෙන්නට කටයුතු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, රජයටත් මා ස්තුතිවන්ත වෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඒ වාගේ හොඳ යෝජනාවක් ගෙනෙන කොට විරුද්ධ පාර්ශ්වයේ කිසිම මන්ත්‍රීවරයකු මෙම සභා ගර්භයේ නැහැ. මේ යෝජනාව ක්‍රියාවට නැංවුණේ නැත්නම් තව ටික දවසක් ගිහිල්ලා අසාවි, එදා අය වැය ඉදිරිපත් කරන කොට කරපු යෝජනා ඉටු කර තිබෙනවාද කියලා. හොඳ වැඩක් කරන කොට විරුද්ධ පාර්ශ්වයේ යුතුකමක් තිබෙනවා, ඒ හොඳ දේට හොඳයි කියන්න. අනෙක් හැම වෙලාවකම කෑ ගැහුවත් හොඳ දේට හොඳයි කියන්න; වයස අවුරුදු 70ට වැඩි මේ රටේ අහිංසක දුප්පත් මනුෂ්‍යයන් වෙනුවෙන් රුපියල් 1,000 බැගින් දීමනාවක් ගෙවන්න ජනාධිපතිතුමා කටයුතු කළ මොහොතේ එය හොඳයි කියන්න විපක්ෂයට පුළුවන්කමක් නැහැ. මහජන ආධාර ලබන, සමෘද්ධි සහනාධාර ලබන වයස අවුරුදු 70ට වැඩි පුද්ගලයකුට රුපියල් 1,000ක දීමනාවක් ලැබීම ලොකු සහනයක්. මේ රටට වැඩදායි දරු පරපුරක් හැදුවත්, සමහර දරුවන් වයසක දෙමව්පියන්ට සලකන්නේ නැහැයි කියලා අපි දන්නවා. බොහෝ වෙලාවට අනාථ නිවාසවලට ගිහින් දෙමව්පියන්ව භාර දෙනවා. එහෙම නැත්නම් ඒ වයසක දෙමව්පියන් කඩ පිළක හෝ වෙනත් තැනක ජීවත් වනවා. අඩුම ගණනේ බස් එකකවත් යන්න විධියක් නැතුව ඉන්න එවන් වයසක කෙනකුට රුපියල් 1,000ක දීමනාවක් ලැබුණාම අඩුම ගණනේ ඒ දරුවන් හෝ සලකනවා. ඇයි, තාත්තාට එහෙමත් නැත්නම් සීයාට මාසයකට රුපියල් 1,000ක් හම්බ වෙන නිසා. ඒ නිසා ඒ වයසට ගිය උදවියට කීයක් හෝ මාස්පතා ලැබෙනවා නම් ඒ අය සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් අඩුම ගණනේ පූර්ණ ආබාධිත පුද්ගලයන් 34 දෙනකුට රුපියල් 3,000 ගණනේ ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. එම මුදල් අපි ලබා දෙන කොට මම දැක්කා, අවුරුදු විස්සක් විසිපහක් වුණු දරුවන් අත් දෙකෙන් අල්ලා ගෙන ඒ අයව අරගෙන එන අන්දම. තවත් අහිංසක කෙනෙකුට එහෙම කෙනකු

[ගරු ජානක වක්කුඹුර මහතා]

රැක බලා ගැනීම අමාරු කාර්යයක්. ඒ නිසා රුපියල් 3,000ක මුදලක් ලබා දීමෙන් එවන් කෙනෙකු රැක බලා ගැනීමට පුළුවන් වනවා. ඒ නිසා අපේ ආණ්ඩුවෙන්, අතිගරු ජනාධිපතිතුමා අය වැයෙන් කියූ පොරොන්දු රාශියක් ඉෂ්ට සිද්ධ කරලා තිබෙනවා. පසු ගිය ජූනි මාසයේ සිට වයස අවුරුදු 70ට වැඩි අයට මේ රුපියල් 1,000ක දීමනාව ලබා දෙන්න අපේ රජය, අතිගරු ජනාධිපතිතුමා ඒ වාගේම සමාජ සේවා අමාත්‍ය ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා, එතුමාගේ අමාත්‍යාංශය හරහා සෑම ගමකින්ම සුදුසු අයව තෝරා ගෙන ඒ අයට මේ සහනාධාරය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ රටේ අහිංසක මිනිසුන් වෙනුවෙන් මේ මොහොතේ එවන් සහනයක් ලබා දීම පිළිබඳව මේ රටේ නායකතුමාට මේ පාර්ලිමේන්තුවේ සිටින අප සියලු දෙනාගේම ස්තුතිය හා ගෞරවය පුද කරන්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමාට ඉදිරි කාලයේත් මේ රටේ ඉන්න මේ වාගේ අහිංසක අය වෙනුවෙන් කටයුතු කරන්න ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අපි දැකලා තිබෙනවා, අපේ ගරු සමාජ සේවා ඇමතිතුමා මේ වැඩ කටයුතුවලට ගොඩක් මහන්සි වෙමින් ඒ අහිංසක අයට යම් උදව්වක් කරන්නට කටයුතු කරනවා. එතුමාටත් ඒ කටයුතු කරන්න ධෛර්යය හා ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*"Bismillahir Rahmanir Raheem."*

Sir, it is a privilege for me today to speak a few words on the Adjournment Motion moved by my good Friend, the Hon. Shantha Bandara. This is a subject that every community would agree with, because it is said in all religious teachings that all elders must be well looked after.

The Holy Prophet of Islam *(Sal.)* has enjoined upon us as a prime duty to look after the old aged parents. The Holy Quran also says, "Do not despise them. Do not neglect them. Do not look hard at them. Do not even say *chee* to them" because they are people who brought us into this world. They looked after us when we were young. They gave us food, educated us, clothed us and made us good citizens, as a result of which, the community developed and became virtuous So, it is the training that parents give that makes a person, good or bad.

Therefore Sir, *Bismillahir Rahmanir Raheem*, the Holy Quran clearly states: "*RABBIGH FIRHUMA KAMA RABBAYANI SAGHIRA ...*" It says to look after our parents as they looked after us when we were young. These are virtuous qualities that one should follow. That is why His Excellency the President in all his wisdom, through the "Mahinda Chintana" has taken steps to help various strata of the community. That is why he has not forgotten this section of the population - the old people.

In the 2012 Budget Proposals presented in Parliament, His Excellency the President, in his capacity as Minister of Finance, has said to pay a monthly allowance of Rs. 1,000 to senior citizens who are above 70 years of age. His Excellency the President has not neglected the old. He is following the *dhamma*. He is following the Islamic teachings. He is following the *Vedantha* - Hindu Script - and also Christianity. It is mentioned in Christian history that annually during a certain period, Jesus Christ looks after the lepers, goes to them, cares for them and even washes their feet. This is a lesson for everybody to learn. It is not just that what a great religious leader did.

The Adjournment Motion presented by the Hon. Shantha Bandara states, I quote:

> "Action has already been taken to put the payment of the aforesaid allowances into effect from June, 2012 and senior citizens who are over 70 years of age as at 01.01.2012 and who receive Rs. 250/- monthly as public donations and receive Rs. 350/- monthly as Samurdhi assistance are eligible for this."

My good Friend further says;

> "It is moved in this House that taking such action, in keeping with Mahinda Chinthana, to grant relief .."

Sir, I have got the "Mahinda Chintana" with me . I will read the relevant section :

> "To grant relief to the elders who have served their families, villages, areas and the public when they had the ability to do so, and have become physically weak at their old age, deserves commendation of this august Assembly."

Now, you simply throw them - these old people - into Homes for the Aged. Sir, it is not a good nomenclature because if you look after your parents, if everybody does it, there is no need for Homes for the Aged. It has been the practice in the West. When they retire and when they are able to live another 20 - 50 years, the children despise them. They do not look after them. Sir, if you go to London, in the Oval Park, Hyde Park and in other parks, you will see elderly people - husband and wife - going around the park taking a dog. When somebody asks them, "Where is your son?" They say, "Oh! He is there". When they are asked, "How are you living?" They say, "We are living on the dole given by the Government". That is their culture. We despise that culture. We do not want that culture to come into our society. Whether we be Buddhists, Muslims, Christians or Hindus, we all have our own culture - a rich culture and a great heritage. This is why we must value the teachings of our religious leaders.

There is a very interesting letter written to me by a great journalist who wrote the book titled, "Dossier Corea", Mr. Firoze Sameer Effendi. Now, he writes a very interesting letter to Mr. Lalith Weeratunga, Secretary to the Executive President dated 18th April, 2012. It states: "Last year on Saturday, 13th August, 2011, my maternal grand aunt, Ummu Zaneera Marzook nee Shariff, passed away in London. Sadly, she would have

celebrated her 100th birthday if she had lived upto Wednesday, 31 August, 2011", and Queen Elizabeth would have sent her the traditional greetings. "The Queen's office was in touch with her..."

Sir, I visited one of his relatives, Mr. Ahmed Sheriff Noordeen, who completed 100 years. He is a centenarian. The former Mayor, Mr. Omar Kamil and Mr. Firoze Sameer took me to see him. What does Mr. Firoze Sameer recommend? He recommends to honour them like the Queen of England does to honour the elderly when they reach 100 years of age. You can get the details and the statistics of those who have reached such a milestone.

The letter addressed to the Secretary to the President goes on to state: I thought I would share this incident with your goodself with a view that you might think it fit to suggest to His Excellency the President Mahinda Rajapaksa of a similar scheme to honor any Sri Lankan citizen who reaches to such a unique milestone".

In another paragraph, he goes on to state: "I have just returned from Suhail Marzook's place. His mother would have reached 100 years on 31st August...." There is an Award given by the British Government and the Queen also sends a letter congratulating.

Now, for His Excellency the President, there is no need of recommending this to him. He does that. If it is your birthday tomorrow, the first call you will receive early in the morning would be from our President even before the crow crows, "Happy Birthday to You and Many Happy Returns of the Day!"

The letter goes on to say, "Incidentally, this granduncle of mine is also related to two of our Royal College -'61 Group (English Medium) members, namely, Omar Kamil and Mazhar Ghouse..." This is spotlighted because such greetings will make them feel very happy at that age.

There was another Tamil gentleman who reached 114 years of age. It is reported that he has just passed away.

Therefore, Sir, I think this is a Motion that should be well taken by everyone and it must be implemented. Sir, I will conclude my speech since the Hon. Minister is going to reply. I should also mention one other important matter. Although we do not like people to be dumped into a Home for the Aged, there is a Lady Fareed Home for Elders established long ago by Sir Razik Fareed, one of our great Moor leaders, in Makola. When Mr. A.A.M. Marleen was the Ambassador in Saudi Arabia, he got the assistance from the UAE Government. Sir, you must go and see that. If you can set up Homes like that, even we would like to go and stay now before we become too old.

It is so well mainatained like a Guest House. There are rooms, beds, separate bathrooms and a sprawling garden. Now, it is looked after by a special Committee at the Moors' Islamic Cultural Home headed by Alhaj Mohideen Rajabdeen. Mr. Omar Kamil, Chairman of MICH guides the Committee well. There is one close to Parliament. It is called "Victoria Home for the Elders". It is also well looked after but very much crowded now.

So, what do these children do? They go either to the United States, Arabian countries, Canada, New Zealand or Australia. They send some money as to say their obligation is over.

"අපේ දෙමවුපියන්ට අපි කරන්නට ඕනෑ දේවල් කරලා ඉවරයි, දැන් කරදරයක් නැතිව අප හම්බ කරන දෙයින් මොනවා හරි එවමු" කියන ඒ system එක නොවෙයි අපේ සංස්කෘතිය; අපේ සහාත්වය; අපේ ආගමික අනුදැනුම සහ ක්‍රියාකලාපය. එම නිසා අප මේ චින්තනය අනෙක් අයටත් දෙන්නට ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා මේවා සලකා තමයි මේ payment එක දීමට උත්සුක වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ අප ඉදිරියේදීම ඒ ගැන ප්‍රකාශ කළා. අපට ඒ වෙනුවෙන් හොඳ ඇමතිවරයෙක් ඉන්නවා; ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා. එතුමාට ඕනෑ subject එකක් පුළුවන්. අදත් එතුමාගේ සමාජ සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට මම ගියා. බලනකොට එතුමා විශේෂඥයෙක්. හොඳ නිපුණත්වයක් තිබෙනවා. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා දාර්ශනිකයෙක් කියා කියන්නට පුළුවන්. එතුමාට කථා කරන්නට ඉඩ සලසමින් මම සමුගන්නවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. පිළිතුරු කථාව, සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන, ස්ථිර කිරීම ගැන ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට සහ ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මෙය කාලීන යෝජනාවක්. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාත් දේශපාලන වශයෙන් වේගයෙන් ඉදිරියට යන මන්ත්‍රීවරයෙක්. එතුමාට හොඳ අදහස්, හොඳ චින්තනයක් තිබෙන බව මම මේ අවස්ථාවේදී ප්‍රශංසාත්මකව කියන්නට ඕනෑ. " වාදපිටිය", "රතු ඉර " වැනි වැඩසටහන්වල එතුමා ඉන්නවා අප දැක්කා. පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් පත් වෙලා පළාත් සභාවේ විපක්ෂ නායක හැටියටත්, පළාත් සභා ඇමතිවරයකු හැටියටත් කටයුතු කරලා පාර්ලිමේන්තුවටත් ආවා. දිර්ඝ ගමනක් යාමට මේ දෙපළටම අවකාශය සැලසෙන්නටය කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව ආරම්භ කරනවා.

ඒ දවස්වල මා කටයුතු කළේ දඩි බිඩි අමාත්‍යාංශවලයි. මා ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ වාගේම විදුලිබල නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් යුද්ධ කාලයේ රත්වත්තේ ඇමතිතුමාට උදවු වෙමින් කටයුතු කළා. ඊට පස්සේ ධීවර අමාත්‍යාංශයත් භාර ගත්තා. කෙසේ වෙතත් දැන් මේ අමාත්‍යාංශය භාර ගත්තායින් පස්සේ මගේ සිතත් වෙනස් වුණා; වෙනම සිතුවිලි සමුදායක් මගේ සිත තුළට ඇතුළු කර ගන්නට පුළුවන් වුණා.

අද මේ රටේ සංවර්ධනය වේගයෙන් කර ගෙන යනවා. ඒ වාගේම පුද්ගල සංවර්ධනයත් කරන්නට ඕනෑය කියන මතයේ අතිගරු ජනාධිපතිතුමා ඉන්න බව ප්‍රශංසාත්මකව කියන්නට ඕනෑ. ඒ පිරිස බලා ගන්නට එතුමා සුවිශාල කාර්ය භාරයක්

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

කරනවා. එම නිසා තමයි එතුමා ඒ සඳහා ප්‍රතිපාදන වැඩි කර කර දුන්නේ. මේ පිළිබඳව අප මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා එක්කත් නිතරම සාකච්ඡා කර, ජනාධිපතිතුමාගේත් ආශිර්වාදය ලැබී අය වැය ලේඛනයේ තවත් පොරොන්දුවක් අද ඉෂ්ට කර තිබෙනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගැන මම වැඩිපුර කථා කරන්නේ නැහැ. ගරු අස්වර් මන්ත්‍රීතුමා ඒ ගැන කිව්වා. ඒ අය අතර හොඳ අත් දැකීම් තිබෙන, බහුශ්‍රැත -දැනීමක් තිබෙන- පිරිසක් ඉන්නවා.

1985 දී ඉපදුණු කෙනෙකු 1956 දී වුණේ මොනවාද කියා දන්නේ නැහැ. 1956, 1970, 1980 පසු කරලා, ඊළඟට මේ යුද්ධය දැකලා තිබෙන අයට මේ වෙනස තේරුම් ගන්නට පුළුවන්. අලුතින් ඉපදෙන අයට මේ රණ විරුවන් විශාල වැඩ කොටසක් කරලා යුද්ධය ජයග්‍රහණය කළාය කියා අප කොච්චර කිව්වත් ඔවුන්ට ඒ පිළිබඳ අවබෝධයක් නැති වේවි. මොකද හේතුව? ඒ අයට අත් දැකීම් නැහැ. වැඩිහිටියෙකු කියන්නේ වැඩි කාලයක් ජීවත් වෙච්ච කෙනෙක්. ඒ වාගේම වැඩි දැනුම් සම්භාරයක් තිබෙන අයත් මේ අතර ඉන්නවා.

වැඩිහිටියන් වෙනුවෙන් අප බොහෝ දේවල් කර තිබෙනවා. දැන් වැඩිහිටි සමාජවලට ස්වංං රැකියා මාර්ගයෙන් මුදල් සොයා ගන්න ක්‍රමයක් සකස් කර දී තිබෙනවා. ඒගොල්ලන්ට කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරන්නට ඉඩකඩ සලසා දී තිබෙනවා. ඒක හරි හොඳයි. අප කිහිප දෙනෙක් ගැන සෝදිසි කර බැලුවා. ඉංජිනේරුවරු ඉන්නවා, ගුරුවරු ඉන්නවා. ඒගොල්ලෝ ප්‍රමිතියට අනුව පාරවල් ටික හදන්න, බොහොම සද්භාවයෙන් ගිහින් සමාජ සත්කාරයක් විධියට කටයුතු කරනවා.

රුපියල් 3000ක දීමනාවක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක 34 දෙනෙකුට දෙන්නට අප කටයුතු කළා. ඒ වාගේම ගෙවල් හදා ගන්න මෙච්චර කල් ලබා දුන්නේ රුපියල් ලක්ෂයක මුදලකුයි. ඒ මුදල ලක්ෂ දෙකහමාර දක්වා වැඩි කර ගත්තා. සංවර්ධන ලොතරැයියෙන් සියයට 7.5ක් අප අරගෙන දැන් ගෙවල් හදනවා. මේ නිවාස ව්‍යාපෘතිය ඉතාමත් සාර්ථකයි. කිසිම දෙයක් කොන්ත්‍රාත් දෙන්නේ නැහැ. මේ නිවාස ව්‍යාපෘතියේ සමාජය එකතු වෙලා කරන කාර්ය භාරයේ වටිනාකමත් එකතු වුණාම ලක්ෂ පහකට හයකට ගෙයක් නිර්මාණය කර ගන්නට පුළුවන්.

ශ්‍රමය, සමාජ සහභාගිත්වය ඒ සියල්ලම ඒ නිවෙස්වලට ලැබෙනවා. ඒක ලොකු වාසනාවක්. සමහර අය පුටු අර ගෙන දෙනවා. මමත් බලන්න ගියා. දැනට ආසන 126කට මේ සමාජ සත්කාරය සඳහා ගිහිල්ලා තිබෙනවා. ඒ අය ළඟට ගෙන්වා ගන්නේ නැතිව අපි ආබාධිත අයගේ, වැඩිහිටි අයගේ ළඟට ගිහිල්ලා උදවු කරන ප්‍රතිපත්තියක් තිබෙනවා. අපේ අමාත්‍යාංශය ඒ සඳහා ලොකු කාර්ය භාරයක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ මහජන ආධාරය - සමහර අය "පිං පඩිය" කියනවා. අපි නම් එහෙම කියන්නේ නැහැ- සම්බන්ධයෙනුත් මම කියන්නම්. පළාත් අනුව බලන කොට උතුරු මැද පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 10,385ක් ඉන්නවා. ඒ වාගේම වයස අවුරුදු 70ට වැඩි තනි පුද්ගල සමෘද්ධිලාභීන් 2,105ක් ඉන්නවා. එතකොට මුළු ගණන 12,000ක් විතර වෙනවා. නැඟෙනහිර පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 14,864ක් ඉන්නවා; සමෘද්ධිලාභීන් 7,032ක් ඉන්නවා. වයඹ පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 21,000ක් ඉන්නවා; සමෘද්ධිලාභීන් 8,383ක් ඉන්නවා. සබරගමු පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 13,521ක් ඉන්නවා; සමෘද්ධි ආධාර ලබන අය 7,164ක් ඉන්නවා. ඌව පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 15,620ක් ඉන්නවා; සමෘද්ධි ආධාරය ලබන අය 4,229ක් ඉන්නවා. දකුණු පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 17,258ක් ඉන්නවා; සමෘද්ධි ආධාර ලබන අය 9,338ක් ඉන්නවා. උතුරු පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 18,929ක් ඉන්නවා. පළාත් අනුව බලන විට ජන ප්‍රතිශතය අනුව වැඩිම ප්‍රමාණය ඉන්නේ උතුරු පළාතේයි. 18,929ක් ඉන්නවා. වයස අවුරුදු 70ට වැඩි, තනි පුද්ගල සමෘද්ධි ආධාර ලබන අය 3,592ක් ඉන්නවා. මේ හැම කෙනකුටම අපි රුපියල් 1,000 බැගින් ලබා දෙනවා. වයස අවුරුදු 70ට වැඩි අය වැඩි පිරිසක් ඉන්නේ බස්නාහිර පළාතේ. 20,724ක් ඉන්නවා. සමෘද්ධි ආධාර ලබන අය 13,441ක් ඉන්නවා. මධ්‍යම පළාතේ වයස අවුරුදු 70ට වැඩි, මහජන ආධාරය ලබන අය 21,000ක් ඉන්නවා. මේ මහජන ආධාරය ලබන අයගේ මුළු එකතුව 2,29,862ක් වෙනවා. පොඩි ගණනක් නොවෙයි. අපි මේ අයට රුපියල් 1,000 බැගින් දෙන්න තීරණය කළා. ඉස්සර නම් දුන්නේ රුපියල් 100යි, නැත්නම් 200යි. හම්බ වුණු වැඩිම මුදල රුපියල් 350යි. ඒක ගන්න සමහර වෙලාවට ත්‍රීවීලර් එකක් අර ගෙන යන්න වෙනවා. නැත්නම් බස් එකේ යන්න වෙනවා. එතකොට ඊට වඩා වියදමක් යනවා. අපි මේ ගැන දිගින් දිගටම සාකච්ඡා කළා. මේ ගැන අතිගරු ජනාධිපතිතුමාට කිව්වාම එතුමාගේ හිත උණු වෙලා "හරි අපි මොනවා හරි කරමු, මම සල්ලි ටික දෙන්නම්, ඔබතුමා වැඩේ පටන් ගන්න" කිව්වා. එහෙම කියලා තමයි එතුමා අපට මේ මුදල් ප්‍රමාණය දුන්නේ.

අපි මෑතකදී ජන සංගණනයක් පැවැත්වූවා. ජනගහනය මිලියන 20.27ක් ඉන්නවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ දත්තයන් අපි මේ ගරු සභාවේ කිව්වොත් ඒක කොහේ හරි ලියැවෙනවා. අවුරුදු 60ට වැඩි ජනගහනය 19,10,000ක් ඉන්නවා. අවුරුදු 70ට වැඩි ජනගහනය 8,16,000ක් ඉන්නවා. අවුරුදු 75ට වැඩි ජනගහනය 4,44,000ක් ඉන්නවා. අවුරුදු 80ට වැඩි ජනගහනය 2,06,000 ක් ඉන්නවා. අවුරුදු 60ට වැඩි ජනගහනය ප්‍රතිශතයක් විධියට බැලුවොත් සියයට 9.2ක් වෙනවා. අවුරුදු 70ට වැඩි අය සියයට 3.95ක් වෙනවා. අවුරුදු 75ට වැඩි අය සියයට 2.14ක් වෙනවා. අවුරුදු 80ට වැඩි අය සියයට 1ට අඩුයි. සියයට දශම 99ක්. ඒ කියන්නේ වයස අවුරුදු 80ට වැඩි අය සියයට 1ට පොඩ්ඩක් අඩුවෙන් ඉන්නවා. දැන් අපේ රටේ ජනතාවගේ ආයුෂ ප්‍රමාණය එන්න එන්න වැඩි වෙනවා. සාක්ෂරතාව හොඳට තිබෙනවා. දැනීම තිබෙනවා. ඉස්සර මිනිස්සු මැරුණේ බෝවන රෝගවලින්. දැන් බෝවන රෝගවලින් මැරෙන්නේ නැහැ. දැන් මිනිස්සු මැරෙන්නේ බෝ නොවන රෝගවලින්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විපක්ෂයටත් බෝවන රෝගයක් හැදිලා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
බෝවන රෝගයක් හැදිලා. ඒක තමයි වෙලා තිබෙන්නේ.

1948 දී අපේ ආයුෂ තිබුණේ අවුරුදු 48යි. දැන් කීයද? කාන්තාවන්ගේ නම් අවුරුදු 76යි, පිරිමි පක්ෂයේ අවුරුදු 73යි. අවුරුදු 3ක් අඩුයි. පිරිමි ඉස්සර වෙලා මිය යන නිසා වැන්දඹුවන් ප්‍රමාණයත් වැඩියි. අපේ පවුල් සංඛ්‍යාවෙන් සියයට 23ක් තනි මවුවරු ඉන්නවා. ඉතින් මේවා සමාජ ප්‍රශ්න. අපි මේ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කරනවා. මේ ප්‍රශ්නවලට උත්තර සපයනවා. අපි මේ ගැන කටයුතු කරන නිසා මෙවර රුපියල් මිලියන 911ක් අපට දීලා තිබෙනවා. ලබන අවුරුද්ද වෙද්දී රුපියල් මිලියන 2,100ක් වෙන් කරන්නට අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අලුත් යෝජනා කීපයක් තිබෙනවා. දැනට මහජන ආධාර නොලබන, එහෙත් වයස අවුරුදු 70 ඉක්ම වූ පොරොත්තු ලේඛනයේ සිටින 79,200ක්

වන පිරිසට ලබන අවුරුද්දේ අප මේ දීමනාව දෙනවා. දැනට පොරොත්තු ලේඛනයේ ඉන්න අයට තව මාස හයකින් මෙම දීමනාව දෙනවා. ඊළඟට 2013 වසරේ ජනවාරි පළමුවැනි දා ඉඳලා අවුරුදු 70 ඉක්ම වන නව ප්‍රතිලාභීන්ද මේ යෝජනාවට ඇතුළු කරනවා. දැනට මෙම ආධාරය ලබන ප්‍රතිලාභියා මිය ගියොත්, ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාගේ වයස අවුරුදු 70 ඉක්ම යන්නේ නම් ඉන් පසු ඔවුන්ද මෙම යෝජනාවට ඇතුළු කරනවා. පුරුෂයෙක් සහ කාන්තාවක් කසාද බඳින්නේ ඒ දෙන්නා අතර වයස් පරතරය අවුරුදු 5ක්, 6ක්, නැත්නම් සම මට්ටමක තිබෙන විධියට නේ. මහ ලොකු වයස් පරතයක් ඇතිව දෙන්නෙක් බඳින්නේ නැහැ නේ. අවුරුදු 60ක එක් කෙනෙක් අවුරුදු 20ක කෙනෙක් බඳින්නේ නැහැ නේ. ඒ දෙන්නා අතර අවුරුදු 5ක, 6ක වාගේ පරතරයක් තිබෙනවා. කොයි වෙලාවේත් කාන්තාවට වඩා පිරිමියා වයස ප්‍රමාණයෙන් වැඩියි. අවුරුදු 5ක්, 6ක් හෝ 10ක් තමයි maximum යන්නේ. සාමාන්‍යයෙන් සමාජයේ චාරිත්‍රය ඒකයි. ඒ නිසා පවුල්වල ඒ වයස් ප්‍රමාණය අනුව යනවා නම් එයින් එක් කෙනෙක් මිය ගියොත් ඒ ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවටත් මේ දීමනාව හම්බ වෙනවා. ඇත්තටම මේක pension එකක් හම්බ වෙනවා වාගෙයි. ඒ අදහසත් අප යෝජනා කර තිබෙනවා. ඒකත් අපේ සැලසුම් අංශයට ඇතුළු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට අපට තව අයදුම්පත් 1,04,163ක් ලැබී තිබෙනවා. මේ දීමනාවට හිමිකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් මා කියන්නම්. පළමුවෙනි එක අවුරුදු 70 හෝ ඊට වැඩි වීම. අනික් කාරණය මහජන ආධාරය රුපියල් 250 හෝ 350 ලබන සමෘද්ධිලාභියකු වීම. දැන් ඒ ගොල්ලන්ට අමතර මුදලක් හම්බ වෙනවා. සමෘද්ධිය ලබන අයට මේක අහිමි වෙනවාද කියලා කෙනෙකුට ප්‍රශ්නයක් අහන්න පුළුවන්. එහෙම එකක් නැහැ. මොකද අප තෝරා ගෙන තිබෙන්නේ දෙන්නෙකුගෙන් යුතු පවුල් ඒකකයක්. එතකොට රුපියල් 1,000ක් ලැබෙනවා.

අනික් කාරණය මේකයි. මේ රුපියල් 1,000 ගන්න ඔවුන් එදාටම යන්න ඕනෑ නැහැ. අප ඒක බැංකු පොතක දමනවා. බැංකු පොතක දමලා ඒ පොත post office එකට අරිනවා. අන්න එතකොට ගිහින් ඒ මුදල ගන්න පුළුවන්. බලන්න අප ඒක කොච්චර කළමනාකරණය කරනවාද කියලා. අප හුඟක් දේවල් waste වෙන්න ඉඩ අරිනවානේ. අපි මෙහෙම හිතමු. අපිට මොකක් හරි ලියවිල්ලක් ගන්න අවශ්‍ය වුණාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කොහේ හරි ඈතක තිබෙනවා නම් ඒ සඳහා බස් එකට යන වියදම, ගත වන කාලය බලන්න. අපි අවුරුදු 50ක් ජීවත් වෙනවා කියලා හිතමු. එතකොට පැයවලින් බැලුවොත් පැය 3,75,000ක් විතර තමයි අප ජීවත් වන්නේ. ඒ කාලයෙන් තුනෙන් එකක් අප නිදා ගන්නවා. තුනෙන් එකක් අපි ඉගෙන ගන්නවා. අපට ජීවිතය ගත කරන්න තිබෙන්නේ බොහොම සුළු කාලයයි. බාල විය, මැදි විය සහ වැඩිහිටි විය වශයෙන් අපේ ජීවිතය ගෙවී යනවා. ඉස්සර වාගේ නොවෙයි, දැන් අපේ වැඩිහිටියෝ ශක්තිමත්. මම ළඟදී යාපනයට ගියා. එහේ අවුරුදු 70 ඉක්ම වූ අයට පුදුම ශක්තියක් තිබෙන්නේ. මම ඇහුවා,"මේකට හේතුව මොකක්ද?" කියලා. අප නිකම් විමසීමක් කළා. මොකද එක එක පැතිවල ගවේෂණයක් කරන්න ඕනෑ නේ.

මොකක්ද ඒකට බලපා තිබෙන හේතුව? ඒ අය grass-roots level එකේ, එහෙම නැත්නම් පොළොවේ පය ගහලා යන කට්ටිය. ඒ ගොල්ලන් පයින් යනවා වැඩියි. ඒ අය මේ වාගේ සංකර වෙලා නැහැ. Pastry කන්නේ නැහැ. Fast food කන්න කැමැති නැහැ. එළවලු කෑමට ගන්න කැමැතියි. ස්වභාව ධර්මයේ දලු ටික, කොළ ටික, බත් ටික කාලා, පයින් ගිහිල්ලා, යුද්ධයත් එක්ක පීඩාවට පත් වුණාට පස්සේ ඒ අය බහුතරයකට හොඳ ශක්තියක් තිබෙනවා. ඒක හරි පුදුම වැඩක්. ඉතින් මේකෙන් අපට තේරුම් ගන්න පුළුවන් දෙයක් තිබෙනවා. අපේ ජීවිතයට කකුල් දෙකක් දීලා තිබෙන්නේ ඇවිදින්න නේ. අපි කීයෙන් කීදෙනාද හරියට ඇවිදින්නේ? අපේ බොහෝ දෙනෙකු කරන්නේ මොනවාද? අප ගැන බැලුවත් එහෙමයි. අපි වැඩි වෙලාවක් කාර් එකේ පිටු පස seat එකේ යනවා. අපි travel කරන ප්‍රමාණය වැඩියි. ඒ වාගේම අපේ ඉරියව්, අපි ජීවත් වන විධිය නිසා ඇති වන අමතර බාධා තිබෙනවා. Pressure, blood sugar වාගේ නොයෙකුත් දේවල් අපට තිබෙනවා. බෝ නොවෙන රෝගවලට අපි ගොදුරු වෙනවා. එම නිසා අපේ සංස්කෘතියත්, සභ්‍යත්වයත් ග්‍රාමීය මට්ටමට හැඩ ගස්වා ගන්න නැවත වරක් හිතුවොත් හොඳයි. බුදු හාමුදුරුවෝත් කියලා තිබෙනවා නේ මධ්‍යම ප්‍රතිපදාවට යන්න ඕනෑ කියලා. මුස්ලිම් ආගමේ අයත් මාස ගණනක් fasting ඉන්නවා නේ. එහෙම නේද, ගරු අස්වර් මන්ත්‍රීතුමා?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Fasting ඉන්නවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Fasting ඉන්නවා. එහෙම fasting සිටීමෙන් මොනවාද කරන්නේ? ශරීරයට විවේකයක් දීම නේ කරන්නේ. ඒ කාලයේදී කන්නේ නැහැ. එතකොට අපේ ඉන්ද්‍රියයන් හොඳට activate වෙනවා. නමුත් අපි පැය 24 ම කාලා, පැය 24 ම වෙහෙස වෙලා ඉන්නේ. අපේ ඉන්ද්‍රියයන්ටත් විවේකයක් ඕනෑ නේ. මනසට විවේකයක් ඕනෑ. ශරීරයට විවේකයක් ඕනෑ. අපේ ජීවිතයට විවේකයක් ඕනෑ. ඔය සේරම ඕනෑ.

නමුත් ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. දැන් පවුල් ඒකක කුඩා වෙලා. ඉස්සර කොහොමද? ඉස්සර පවුලේ පහක් හයක් හිටියා. මහ ගෙදර කියලා එකක් අපේ තිබුණා නේ. මහ ගෙදර කවුරු හරි හිටියා. අර අයියා ඕස්ට්‍රේලියාවට ගියා, මේ අයියා තවත් දිහාවකට ගියා, අනෙක් අයියා කොළඹ. නමුත් නංගි ගෙදර ඉන්නවා. නංගි එක්ක තාත්තා ඉන්නවා. දැන් එහෙම නැහැ. දැන් තිබෙන අලුත්ම සංස්කෘතිය හැටියට කාන්තාවන්ටත් රස්සාවක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා නේ, පවුල නඩත්තු කරන්න. පවුලේ දෙදෙනකු ඉන්නවා නම් දෙදෙනාම රස්සා කරන්න ඕනෑ. ඉස්සර, කාන්තාව කිච්චාම කොහොම කෙනෙක්ද? අපි ඒ අය ගෙදර තමයි තැබුවේ, ළමයින් බලා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර සමාජය ගැන පොඩ්ඩක් හොයලා බලන කොට මට පෙනුණු දෙයක් තිබෙනවා. ඉස්සර සමාජයේ විවාහයක් කර ගන්න මූලික සුදුසුකම වුණේ මොකක්ද? රජයේ රස්සාව. දැන් මොකක්ද? හොඳ ව්‍යාපාරිකයකු වීම, කාර් එකක් තිබීම. ඒ වාගේ ආර්ථික පැත්ත බලලා තමයි දරුවා දෙන්නේ. දුප්පත්කම දොරෙන් එද්දී ආදරය ජනේලයෙන් පැනලා යනවා කියන මතය අප සමාජයේ ස්ථාපිත කරලා තිබෙනවා. ඒකත් එක්තරා හේතුවක්. ඉස්සර එහෙම නොවෙයි. ඉස්සර රජයේ රස්සාවක් තිබෙනවා නම්, විවාහයට ඕනෑ තරම් අය හොයා ගන්න පුළුවන්. ගුරුවරයකුට තමයි වැඩියෙන්ම ගෞරවය තිබුණේ. ඒ ක්‍රම දැන් යල් පැන ගිහිල්ලා.

තාක්ෂණයත් එක්ක අපි ඉස්සරහට යන්න ඕනෑ. මේ විධියට බලන කොට දැන් කාන්තාව දරුවන් හදා ගන්නේ නැහැ. දැන් පිරිමින්ට වැඩිය කාන්තාව වැඩ කරනවා. කවුද ගෙදර වැඩියෙන් වැඩ කරන්නේ? කාන්තාව. මොකද, ඇය රස්සාවට යනවා. ඊට පස්සේ ගෙදර ගිහිල්ලා ඉවුම් පිහුම් කරනවා. ඒ වාගේම ඇය ළමයින් බලා ගන්නවා. ළමයින් ඉස්කෝලේ යවන්න, පන්තියට යවන්න උදෙන්ම ඇහැරෙනවා. උදේට කෑම ටික හදලා දෙනවා. ඉතින් කාන්තාවෝ දැන් ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පාර්ලිමේන්තුවේත් එහෙමයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ආ, පාර්ලිමේන්තුවේත් දැන් ඉන්නවා නේ අපේ අලුත් සහකාර මහ ලේකම්තුමිය. ඉතින් මේ කරුණුවලින් තේරෙන්නේ කාන්තාව කියන කෙනා අද කාර්ය බහුල චරිතයක් බවයි. ඉස්සර ඒ අය දෙවැනි පරපුරක් විධියට හිටියේ. එහෙම නැත්නම් ඒ අය සීමා වෙලා හිටියේ ගෙදරට විතරයි. දැන් එහෙම නොවෙයි. තවමත් මුස්ලිම් රටවල කාන්තාවන්ට drive කරන්න දෙන්නේ නැහැ. එහෙම නේද ගරු අස්වර් මන්ත්‍රීතුමනි?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හුඟක් රටවල දැන් ඉඩ දෙනවා. සෞදිය ඇරෙන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
සෞදිය ඇරෙන්න අනෙක් රටවල් දැන් ඉඩ දෙනවාලු. මොකද, ඒක දැන් අවශ්‍යයි. කාන්තාවට සම තැන අවශ්‍යයි. ඒ ගොල්ලන්ට ලොකු කාර්ය භාරයක් කරන්න තිබෙනවා. අපේ ළඟට ඇවිල්ලා වැඩියෙන්ම රස්සා ඉල්ලන්නේ කවුද? පිරිමි නොවෙයි වැඩියෙන්ම රස්සා ඉල්ලන්නේ, කාන්තාවන්. මේවා සමාජ ප්‍රශ්න. මේ සමාජ ප්‍රශ්න දිහා බලලා තමයි අපේ අතිගරු ජනාධිපතිතුමා ඔය කටයුතු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වයස අවුරුදු 70ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්ගේ විස්තර ඇතුළත් list එක මා ළඟ තිබෙනවා. මම එය **සභාගත*** කරනවා. එතකොට තමුන්නාන්සේලාට අද හැන්සාඩ් එක බලලා ඒ විස්තර ගැන දැන ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ list එකේ සඳහන්ව තිබෙන මාස්පොත කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් 91ක් ඉන්නවා. අවුරුදු 70ට වැඩි 704ක් ඉන්නවා. සේරම 980ක් ඉන්නවා. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනය -කුරුණෑගල- ගෙන බැලුවොත්, ඒකෙත් ඒ වාගේ තොරතුරු තිබෙනවා. ආසනයක නමක් කිව්වාම මට කියන්න පුළුවන් ආ, එහි මෙච්චර ඉන්නවා කියලා. මා සභාගත කරපු මේ list එක බලන්න. සුදුසු කෙනාට හම්බ වෙච්චා කියන එක තමයි අපේ ප්‍රාර්ථනාව.

ඒකට අපි ලස්සන වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, පොඩ්ඩක්වත් එහාට මෙහාට වෙන්නේ නැතුව ඒ අයට යුක්තිය හා සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අලුත් pattern එකක් තිබෙනවා. ටිකක් වයසට ගියාම දෙමවුපියන් වැඩිහිටි නිවාසයකට දමනවා. ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ දරුවෝ පිට රට ගිහින් ඒකට සල්ලි ටිකක් එවනවා. සල්ලිවලින් විතරක් කොහොමද මේ අය නඩත්තු කරන්නේ? මම ගියා ළමා නිවාසයක් බලන්න. ඒ විෂයය මට අයිති නැහැ. නමුත් මම ගියා බලන්න. මොකද, මටත් ජීවිතය ගැන යමක් ඉගෙන ගන්න ඕනෑ නේ. මම තෑගි වශයෙන් ටොෆි, චොක්ලට්, සෙල්ලම් බඩු වාගේ දේවල් ගොඩක් අරගෙන ගියා. ඒ පුංචි ළමයි ඒ තෑගි අරගෙන ඊට පස්සේ මොකක්ද දන්නවාද කළේ? අත් දෙක උස්සලා කිව්වා වඩා ගන්න කියලා. චොක්ලට් එකට වඩා ඒ ගොල්ලන්ට වඩා ගන්නා එක වටිනවා. මොකද, ඒ ළමයින්ට සෙනෙහස අවශ්‍යයි. සෙනෙහස නැතුව පුළුවන්ද? දැන් අපිට සෙනෙහස නැහැ. දෙමවුපියන්ට සෙනෙහස නැහැ. සෙනෙහස දෙන්න දරුවෝ නැහැ. දරුවෝ වැඩ. ඒ වාගේම වයසක දෙමවුපියන් ගෙදර මුරකරුවන් බවට පත් වෙලා තිබෙනවා. දුවයි, පුතයි shopping යනවා; supermarkets යනවා; films බලන්න යනවා. හැබැයි අම්මායි, තාත්තායි ගෙදර මුරකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඒක බොහොම නරක දෙයක්. අපි දැන් ඒවා වෙනස් කරන්න ඕනෑ. ඒක නිසා අපි දැන් උපදෙස් - counselling - දෙනවා. අපට පුළුවන් උපදෙස් දීම තුළින් ඒක වෙනස් කරන්න. මම කිව්වා ඒ කාර්යය පුළුල්ව කර ගෙන යන්න කියලා. මොකද, සමාජ විෂමතා, සමාජ දූෂණ, පුංචි ළමයින් දූෂණය කරන ඒවා සේරම මනසේ ඇති වන විකෘති අදහස් නේ. මේකට හේතුව මොකක්ද? උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඊයේ පෙරේදා මම website එකක් බලද්දී දැක්කා sex ගැන websites තිබෙනවා. ඒවා බැලුවාම ගෙවල්වල ඉන්න අයටත් නිරායාසයෙන්ම අමුතු ආශාවක් ඇති වෙලා අත් හදා බලන්න යනවා. එතකොට කාගෙත් එක්කද අත්හදා බලන්න යන්නේ? ඒකට පිටින් කෙනෙක් ගෙනෙන්නේ නැහැ. ගෙදරින්ම අත්හදා බලනවා, එක්කෝ තමුන්ගේ දුව එක්ක. එක්කෝ සහෝදරිය එක්ක. මේවා අහපු නැති දේවල්.

ඊළඟට homosexuality legalize කරලා තිබෙනවා. ඒ සුන්දර රූප, කොටට ඇඳ ගෙන ඉන්න photos බලපුවාම වෙන වැඩේ ඒකයි. ඒ නිසා ඇත්තටම ඒ ජරා websites ටික වහලා දමන්න ඕනෑ, විශේෂයෙන්ම sex තිබෙන නිසා. නැත්නම් මේ සමාජය කුණු වෙලා යයි. මොකද, අපේ රට බෞද්ධ රටක් නිසා විවෘතව ඒවා කරන්න ස්ථාන නැහැ. ඒවා සිංගප්පූරුවේ තිබෙනවා; තායිලන්තයේ තිබෙනවා; මැදපෙරදිග තිබෙනවා. ආශාවක් තිබෙනවා නම් ඒ තැන්වලට යන්න පුළුවන්. ඒ අය දොස්තරලා test කරලා තිබෙනවා. කර්තව්‍යය කරලා ගෙදර යන්න පුළුවන්. ලංකාවේ එහෙම ස්ථාන නැති නිසා අපේ අය අත් හදා බැලීම් කරනවා. අන්න ඒක නිසා ළමා අපචාර වැනි දේවල් වැඩියි. මේවාත් අපි හොඳට හිතන්න ඕනෑ.

ඊළඟ කාරණය වශයෙන් මම කියන්න කැමැතියි වැඩිහිටියන් ගැන. අපේ වැඩිහිටියෝ ගැන මම පොඩි අදහසක් ඉදිරිපත් කළාම පිළිගත්තා අවුරුදු 60 කියන්නේ ලොකු වයසක් නොවෙයි කියලා. අවුරුදු 60 කියන්නේ හොඳට ශක්තිමත්ව වැඩ කරන්න පුළුවන් වයසක්. අපේ අය අවුරුදු 60න් pension යනවා නේ. නමුත් අවුරුදු 60 දී ඒ අයට තිබෙන experience ප්‍රයෝජනයට ගන්න ඕනෑ. අවුරුදු 60 වුණාම අලුත් අයට තැන දෙන්න ඕනෑ කියන තර්කයක් ඇති වෙනවා. නමුත් අවුරුදු 60ක experience එක ගන්න අලුත් අයට තව අවුරුදු කීයක් ඉන්න ඕනෑද? ඒ අත් දැකීම් තිබෙන අය එළියට දැම්මාට පස්සේ ඔවුන් මානසිකව ඇද වැටෙනවා. ඊළඟට මොනවාද වෙන්නේ? මානසික ආතතිය ඇති වෙනවා. ඒ ගොල්ලන්ට මොනවාද කරන්න ඕනෑ? ඒ ගොල්ලන්ට සෙනෙහස, දයාව දක්වලා, ඒ අය ගැන රජයෙන් බලනවාය කියන කතන්දරය කියනකොට පුංචි තෘප්තියක් ඇති වෙනවා. දැන් අපි දකලා තිබෙනවා,- [බාධා කිරීමක්] මම කියන්නේ, අවුරුදු 60 කියන්නේ ගැට වයස කියලා. හැට පිරුණත් වඳුරා බිම යන්නේ නැහැ නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වහල උඩ යන්නේ.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

වහල උඩ ඉන්නේ. ඉතින් අවුරුදු 60 කියන්නේ මොකක්ද? අවුරුදු 60 කියන්නේ වයසට යෑමක් නොවෙයි. අනෙක් එක මිනිහෙකුගේ ශරීර වයසයි, age එකයි different. ඒ දෙක අතර ලොකු වෙනසක් තිබෙනවා. Metabolic age කියලා එකක් තිබෙනවා. Metabolic age එක කියන්නේ, අවුරුදු 60 වුණත් අවුරුදු 45ක, 50ක ශරීර වයස තියාගත හැකියි. ප්‍රශ්නයක් නැහැ. එහෙම කට්ටිය ඉන්නවා. වයස අවුරුදු 60යි, නමුත් ශරීරය ක්‍රියාත්මකයි. හැබැයි වයස අවුරුදු 40 වුණාට අනෙක් පැත්තටත් වෙන්න පුළුවන්. ඕනෑ නම් අවුරුදු 80 කෙනෙකු විධියට ජීවත් වෙන්නත් පුළුවන්. දැන් මත්පැන් බොන අය දිහා බලන්න. ඇස් දෙක පෙනෙන්නේ නැහැ; ඇවිද ගන්න බැහැ. කට ගොත වෙනවා. මුහුණ මිරිකපුවාම අරක්කු කාලක් විතර ගතහැකියි. මුහුණ මිරිකපුවාම කෙළින්ම filter වෙලා එන අරක්කු කාලක් විතර ගතහැකියි. ඒ මුහුණ බලද්දී ඒක කියන්න පුළුවන්. මට නම් ඒක කියන්න පුළුවන්. මට ඒ ගැන experience තිබෙනවා. මිනිහෙකුගේ බඩ බලද්දී කියන්න පුළුවන්, හොඳට බොන එකෙක් කියලා.

මටත් වාහන කීපයක් තිබෙනවා. ඒ ප්‍රමාණය කියන්නේ නැහැ. මම ඩ්‍රයිවර්ස්ලා ගන්නේ හුඟාක් පරීක්ෂා කරලා බලලායි. මම ඔහුට කියනවා, "ඇඟිල්ල මෙහෙම දික් කරපන්" කියලා. ඇඟිල්ල හෙල්ලුණොත් මම ඔහුව ඩ්‍රයිවර් කෙනෙක් විධියට ගන්නේ නැහැ. මොකද, එක්කෝ ඔහුට blood sugar තිබෙනවා. නැත්නම් මත් පැන් බොන කෙනෙක්. ඒ නිසා ඔහුට ඇඟිල්ල කෙළින් තියා ගෙන ඉන්න බැහැ. ඒ නිසා ඩ්‍රයිවර් කෙනෙක් විධියට මම ඔහු ගන්නේ නැහැ. අපේ experience අනුව තමයි ඒක කරන්නේ. ඇත්තම කතන්දරය ඕකයි. සමහර අය ඉන්නවා - රියදුරෙක් කියලා කියමු කෝ - blood sugar තිබෙනවා නම්, blood pressure තිබෙනවා නම්, ඒ අයට රාත්‍රියේ වාහන එළවන්න බැහැ, නින්ද යනවා. අනිවාර්යයෙන්ම නින්ද යනවා. අපි හරියට කල්පනා කරනවා නම් වෘත්තීය සුදුසුකම් කියන්නේයි, අධ්‍යාපන සුදුසුකම් කියන්නේයි දෙකක්. හරි නම් ඒ පුද්ගලයාගේ blood sugar බලන්නට ඕනෑ. ඒක නියමිත level එකට තිබෙනවා නම් හරි. එහෙනම් ඔහු fit. එතකොට රථ වාහන එළවන්න පුළුවන්. නැත්නම් රථ වාහන එළවන්න බැහැ. වැඩියෙන්ම අනතුරු සිදු කර ගන්නේ blood sugar තිබෙන කට්ටිය, වාහන එළවද්දී නින්ද යෑම නිසා. පාර හොඳ නම් නින්ද යනවා. ඉතින් නින්ද යෑම වළක්වා ගන්න බුලත් විටක් හපනවා, නැත්නම් වෙන මොකක් හරි කරනවා. ඉතින් මේවා අපි කථා කරන්න ඕනෑ සමාජ ප්‍රශ්න.

පවුල් ඒකකය ගැන බලන්න. චීනය ගත්තොත්, චීනය දැන් ආර්ථික අතින් හුඟක් දියුණුයි. ඇමෙරිකාවටත් ණය දෙනවා. චීනයේ එක ළමයෙක් හුරතල් කරන්න කී දෙනෙක් ඉන්නවාද? හය දෙනෙක් ඉන්නවා. දරුවාගේ අම්මයි, තාත්තයි දෙන්නා ඉන්නවා. දරුවාගේ අම්මාගේ අම්මායි, අම්මාගේ තාත්තායි දෙන්නා ඉන්නවා. දරුවාගේ තාත්තාගේ අම්මායි, තාත්තාගේ තාත්තායි ඉන්නවා. එතකොට ඒ ළමයා හුරතල් කරන්න හය දෙනෙක් ඉන්නවා. මොකද, ඒ ගොල්ලන්ට ළමයි හදන්න බැහැ නේ. එක්කෙනා නේ හදන්නේ. අපේ රටේත් දැන් ඒ තත්ත්වයට පත් වෙනවා.

"පුංචි පවුල රත්තරන්" කියලා අපේ රටේ මොකක්ද කෙරුවේ? ඒ නිසා දැන් ජනගහන ප්‍රතිශතය අඩු වෙලා. ඒ නිසා තවත් එකක් සිදු වෙලා වැඩිහිටි ජනගහනය වැඩි වෙලා. වැඩිහිටි ජනගහනය වැඩි වුණාම අපේ ආර්ථිකය හසුරුවන්නට ඕනෑ කොහොමද කියන එක ගැන විශ්ලේෂණයක් කරන්න ඕනෑ. මම ඒකටත් උදාහරණයක් කියන්නම්. මම මේ ගැන කල්පනා කරලා තිබෙනවා. වැඩිහිටියන් වුණාම අපේ කාන්තාවන් කොටට අඳිනවාද? අතැනින්, මෙතැනින් කැලි පෙනෙන්න අඳිනවාද? නැහැ. එක්කෝ මේ පැත්තෙන් එල්ලිලා, අර පැත්තෙන් එල්ලිලා, නැත්නම් හම රැළි වැටිලා තිබෙනවා. ඒ නිසා වහගන්න තමයි බලන්නේ? එතකොට ඇඟලුම් නිෂ්පාදනයත් ඒ අනුව සිදු වන්නට ඕනෑ. ආහාර නිෂ්පාදනයත් එහෙමයි. ඉස්සරහට එහෙම කරන්න සිදු වෙනවා. ඉදිරියේ දී ආර්ථිකය කළමනාකරණය කරද්දී ජනගහනය අනුව තමයි නිෂ්පාදන ක්‍රියාවලිය සිද්ධ වෙන්න ඕනෑ. උදාහරණයක් විධියට සිංගප්පූරුව ගත්තොත්, සිංගප්පූරුවේ භූමි ප්‍රමාණය අනුව තමයි වාහන තියා ගන්න පුළුවන්. එක පවුලකට එක වාහනයයි. අපිට වාගේ හතරක් පහක් නැහැ.

අද මන්ත්‍රීතුමන්ලා කියපු කථා මා අහගෙන සිටියා. පුදුම කථා ටිකක් ඇහුණා, මේ Rolex ඔරලෝසුවක් ගැන. මම පාටිවලට ගියාම මේවා දැකලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරයෙක් අත් කොට ෂර්ට් එකක් ඇඳ ගෙන ආපු දවසට වෙලාව කීයද කියලා අහන්න. ඒ අයගේ අත්වල වැඩියෙන්ම තිබෙන්නේ මොනවාද? Rolex ඔරලෝසු. මේ අය අර සභාපතිතුමාට බැන්නාට ඒ අයගේ අත්වල වැඩියෙන්ම තිබෙන්නේත් Rolex ඔරලෝසු. ගෙදර තව කීයක් තිබෙනවාද? තාත්තාට එකයි, වයිෆ්ට එකයි, දරුවාට එකයි, තමන්ට එකයි. සේරම පහක් හයක් තිබෙනවා. පසු ගිය අවුරුදු දෙකට මේ රටට ලක්ෂ 10ක් වාහන ගෙනාවා. ඒ කියන්නේ මිලියනයක් වාහන ගෙනාවා. රටේ පාරවල් තිබෙන්නේ කිලෝ මීටර් 1,23,000යි. වාහන මිලියනයක් මේ රටට ගෙනාවා. ඉතින් අප විසින් ඇති කර ගත්ත පුරුදු නිසා තමයි මේ ප්‍රශ්න ඇති වන්නේ.

අපේ වැඩිහිටි අයට ඉස්සෙල්ලාම ඕනෑ සෙනෙහස, දයාව, කරුණාව, මෛත්‍රිය. අපේ අම්මා, තාත්තා නැත්නම් අපි අද මෙතැන ඉන්නවාද? නැහැ නේ. අපි දෙදෙනෙකුට අම්මා කියනවා. එක්කෙනෙක් තමයි අපේ අම්මා. අනෙක් එක්කෙනා අපේ පාසල් මව. ඒ දෙදෙනාටවත් සලකන්නේ නැති කට්ටිය ඉන්නවා. බෞද්ධ දර්ශනයද, කතෝලික දර්ශනයද කියලා නොවෙයි, මේවා ගැන අපි හොඳින් කල්පනා කරන්නට ඕනෑ. ගරු ජනාධිපතිතුමා මේවා ගැන හොඳට බලනවා.

මට තව පොඩි කතන්දරයක් කියන්න තිබෙනවා. ඒ තමයි 1980 ජූලි වර්ජකයන් ගැන. මේ ගැනත් පොඩ්ඩක් බලන්නට ඕනෑ. 1980 ජූලි වැඩ වර්ජකයන් ගැන බලද්දී සාමාන්‍යයෙන් ඒ කාලයේ වයස අවුරුදු 30ක කොල්ලෙක් හිටියා නම් ඔහුට දැන් අවුරුදු 62ක් වෙනවා. ජූලි වැඩ වර්ජනය වෙලාත් දැන් අවුරුදු 32ක් වෙනවා නේ. ඒ කාලයේ වයස අවුරුදු 40 නම් දැන් අවුරුදු 72යි. ඒ කාලයේ වයස අවුරුදු 50 නම් දැන් අවුරුදු 82ක් වෙනවා. එදා මේ අය ඉල්ලුවේ රුපියල 10ක පඩි වැඩි කිරීමක්. ඒ රුපියල් දහය දුන්නේ නැහැ. ලක්ෂ ගණනක් එළියට දැම්මා. මමත් ඒ දවස්වල ඒ සටනේ සිටියා. දේශපාලන සටන්වලදී මමත් ගිහිල්ලා ඒවාට විරුද්ධව වැඩ කළා. තොග පිටින් සේවකයින් අස් කළා. අනේ! කට්ටියක් ජීවත් වෙන්න කරවල විකුණුවා. කට්ටියක් බුලත් විඩ විකුණුවා. තවත් කට්ටියක් එහේ මෙහේ ගියා. පවුල් සංස්ථාවම අකර්මණ්‍ය වෙලා ගියා. ඔවුන් හොඳ උගත් අය. මේ පුංචි ඉල්ලීමට තුඃ ගාලා එළියට දැම්මා. අපේ අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මම කියනවා, මේ කාරණය ගැන අපේ ජනාධිපතිතුමාත් දැනුවත් කරන්න කියලා. ඒ වැඩ වර්ජනයෙන් තව ටික දෙනෙක් ඉතුරු වෙලා ඉන්නවා. ඒ ගොල්ලන්ට අපි මොනවා හරි කරමු. මොකද ඒ අයට මොනවා හරි කරපුවාම -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

පිනක්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

අන්න! හරි. පිනක්. මොකද තාවකාලික ලෝකයේ අපි මොනවා කළත් ජීවිතය සදාකාලික නැත්නම් බලය සදාකාලිකත් නැහැ. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයයි කියලා අපි අහලා තිබෙනවා. කතෝලික ධර්මයේත් කියන්නේ දූවිල්ලෙන් ඉපදුණු අය දූවිල්ලට පරිවර්තනය වෙනවා කියලායි. ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ධර්මයේ මොනවාද තිබෙන්නේ? යද්දී මොනවාද ගෙනි යන්නේ? පොඩි රෙදි කෑල්ලක් පොරවාගෙන තමයි අරගෙන යන්නේ. පෙට්ටියකවත් දමන්නේ නැහැ. ඒක හොඳයි. පැය 24ක්වත් තියා ගන්නේ නැහැ. උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. මමත් ඒ ගැන දැන් හිතන්න පටන් ගෙන තිබෙනවා. මගේ තාත්තාත් මිය ගිහිල්ලා; අම්මාත් මිය ගිහිල්ලා. තාත්තා මිය ගියාට පස්සේ body එක ගෙනෙන කොට "මගේ තාත්තා ගෙදරට එනවා." කියලා නොවෙයි නේ කියන්නේ. "තාත්තාගේ body එක ගෙනෙනවා." කියලායි කියන්නේ. "අම්මාගේ body එක ගෙනෙනවා." කියලායි කියන්නේ. අපේ ආගමේ හැටියට නම් භූමදානය කරනවා මිස ආදාහනය කරන්නේ නැහැ. නමුත් ආදාහනය කරන කොට අළු ටික ගෙදරට ගෙනෙනවාද? අළු ටික තියා ගන්නවාද? නැහැ. දාලා එනවා.

බලන්න, මිනිස්සු කල්පනා කරන විධිය. කොටියා මැරුණාම දත මාලෙට දා ගන්නවා, හොඳයි කියලා. කිඹුල් හමෙන් සපත්තු දෙක හදනවා. හරක් හමෙන් සපත්තු දෙක හදනවා. මේ අපේ රටේ හැටි. ලෝකයේ හැටි. හැබැයි මේවා ලෝකයෙන් ඉගෙන ගන්න ඕනෑ. අපට මේ උත්තරීතර සභාවට එන්න ලැබුණේ කෝටි දෙකක ජනතාවගේ ඡන්දයෙන්. අපේ විපක්ෂය බොරුවට කයිවාරු ගැහුවාට, එක්කෝටි අනූනවලක්ෂයක ජනතාවගෙන් 225 දෙනාටයි පාර්ලිමේන්තුවට එන්න ලැබෙන්නේ. 225යි එන්නේ, ගරු අස්වර් මන්ත්‍රීතුමා. මේ එක්කෝටි අනූනවලක්ෂයක ජනතාවගෙන් 225 දෙනාටනේ පාර්ලිමේන්තුවට එන්න ලැබෙන්නේ. ඒ පිනම මේ ගොල්ලන්ට මදිද? 225ටයි එන්න ලැබෙන්නේ. ඒ 225දෙනාගෙනුත් ඇමතිවරුන් ඉන්නේ කී දෙනාද? 30යි නැත්නම් 40යි. කාලයක් ඇමතිවරුන් 21දෙනෙකුත් සිටියා. මෙතැනට එන්න ලැබීමත් එක්තරා පිනක්. අපි මොනවාද කරන්න ඕනෑ? මේ පාර්ලිමේන්තුවට එනවාද නොඑනවාද කියන එක නොවෙයි කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට එන ප්‍රමාණයට වඩා විශේෂ වෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන් අණපනත් ටික පනවලා මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් අලුත් ක්‍රමවේද කීපයක් හදන එකයි. එතකොට තමයි අපේ භූමිකාව හරි යන්නේ. තාවකාලික ලෝකයේ ජීවිතය සදාකාලික නැත්නම් බලයත් සදාකාලික වෙන්නේ නැහැ. බලය සදාකාලික නැත්නම් තනතුරුත් සදාකාලික නැහැ. එම නිසා අපි කරන දේවලින් කවදා හරි දවසක අනාගත පරපුරට යමක් ලැබේවාය කියලා ප්‍රාර්ථනා කරමින් නැවත වරක් ගරු අස්වර් මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා.

***සභාමේසය මත තබන ලද ලැයිස්තුව:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் :*
*List tabled:*

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | වයඹ | | ආරච්චිකට්ටුව | 180 | 495 | 675 |
| | | පුත්තලම | ආණමඩුව | 264 | 592 | 856 |
| | | | කරුවලගස්වැව | 137 | 202 | 339 |
| | | | කල්පිටිය | 62 | 205 | 267 |
| | | | පුත්තලම | 137 | 163 | 300 |
| | | | නාත්තන්ඩිය | 316 | 668 | 984 |
| | | | දංකොටුව | 276 | 651 | 927 |
| | | | මාදම්පෙ | 206 | 469 | 675 |
| | | | මහකුඹුක්කඩවල | 158 | 372 | 530 |
| | | | මහවැව | 286 | 624 | 910 |
| | | | මුන්දලම | 155 | 402 | 557 |
| | | | නවගත්තේගම | 102 | 261 | 363 |
| | | | වනාතවිල්ලුව | 85 | 293 | 378 |
| | | | වෙන්නප්පුව | 298 | 662 | 960 |
| | | | හලාවත | 244 | 579 | 823 |
| | | | පල්ලම | 171 | 286 | 457 |
| පුත්තලම දිස්ත්‍රික්කයේ එකතුව | | | | 3,077 | 6,924 | 10,001 |

එච්. චිත්‍රානි ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
සමාජසේවා අමාත්‍යාංශය
5 වන මහල "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

2012/07/23

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පලාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | වයඹ | කුරුණෑගල | අඹන්පොල | 110 | 412 | 522 |
| | | | අලව්ව | 208 | 646 | 854 |
| | | | ඇහැටුවැව | 103 | 367 | 470 |
| | | | ඉබ්බාගමුව | 179 | 311 | 490 |
| | | | උඩුබද්දාව | 170 | 516 | 686 |
| | | | කුලියාපිටිය නැ. | 137 | 358 | 495 |
| | | | කුලියාපිටිය බ. | 176 | 413 | 589 |
| | | | කොටවෙහෙර | 187 | 508 | 695 |
| | | | කුරුණෑගල | 244 | 367 | 611 |
| | | | කොබෙයිගනේ | 129 | 370 | 499 |
| | | | නිකවැරටිය | 226 | 524 | 750 |
| | | | ගිරිබාව | 40 | 514 | 554 |
| | | | ගනේවත්ත | 99 | 284 | 383 |
| | | | ගල්ගමුව | 182 | 448 | 630 |
| | | | රිදීගම | 262 | 722 | 984 |
| | | | බිංගිරිය | 100 | 522 | 622 |
| | | | බමුණාකොටුව | 145 | 413 | 558 |
| | | | මාවතගම | 276 | 704 | 980 |
| | | | මාස්පොත | 91 | 270 | 361 |
| | | | මහව | 424 | 856 | 1,280 |
| | | | නාරම්මල | 198 | 498 | 696 |
| | | | මල්ලවපිටිය | 140 | 325 | 465 |
| | | | වාරියපොල | 173 | 442 | 615 |
| | | | වීරඹුගෙදර | 122 | 417 | 539 |
| | | | පඩුවස්නුවර නැ. | 106 | 615 | 721 |
| | | | පඩුවස්නුවර බ. | 173 | 500 | 673 |
| | | | රස්නායකපුර | 177 | 378 | 555 |
| | | | පන්නල | 230 | 402 | 632 |
| | | | පොල්ගහවෙල | 204 | 636 | 840 |
| | | | පොල්පිතිගම | 295 | 706 | 1,001 |
| | කුරුණෑගල දිස්ත්‍රික්කයේ එකතුව | | | 5,306 | 14,444 | 19,750 |
| | වයඹ පලාතේ එකතුව | | | 8,383 | 21,368 | 29,751 |

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පලාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 2 | ඌව | බදුල්ල | බදුල්ල | 213 | 1,383 | 1,596 |
| | | | බණ්ඩාරවෙල | 301 | 719 | 1,020 |
| | | | ඇල්ල | 156 | 649 | 805 |
| | | | හල්දුම්මුල්ල | 117 | 615 | 732 |
| | | | හැලි ඇල | 480 | 1,544 | 2,024 |
| | | | හපුතලේ | 134 | 667 | 801 |
| | | | කන්දකැටිය | 148 | 615 | 763 |
| | | | මහියංගනය | 37 | 352 | 389 |
| | | | මීගහකිවුල | 175 | 347 | 522 |
| | | | පස්සර | 307 | 498 | 805 |
| | | | රිදීමාලියද්ද | 288 | 365 | 653 |
| | | | සොරණාතොට | 240 | 657 | 897 |
| | | | ඌව පරණගම | 237 | 1,245 | 1,482 |
| | | | වැලිමඩ | 212 | 528 | 740 |
| | | | ලුණුගල | 224 | 613 | 837 |
| | බදුල්ල දිස්ත්‍රික්කයේ එකතුව | | | 3,269 | 10,797 | 14,066 |
| | ඌව | මොණරාගල | බඩල්කුඹුර | 125 | 209 | 334 |
| | | | බිබිල | 164 | 537 | 701 |
| | | | බුත්තල | 192 | 449 | 641 |
| | | | කතරගම | 24 | 121 | 145 |
| | | | මඩුල්ල | 54 | 411 | 465 |
| | | | මැදගම | 130 | 272 | 402 |
| | | | මොණරාගල | 100 | 568 | 668 |
| | | | සියඹලාණ්ඩුව | 25 | 685 | 710 |
| | | | තණමල්විල | 31 | 215 | 246 |
| | | | වැල්ලවාය | 94 | 1,232 | 1,326 |
| | | | සෙවනගල | 21 | 124 | 145 |
| මොණරාගල දිස්ත්‍රික්කයේ එකතුව | | | | 960 | 4,823 | 5,783 |
| ඌව පලාතේ එකතුව | | | | 4,229 | 15,620 | 19,849 |

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

### වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 3 | සබරගමුව | කෑගල්ල | අරණායක | 4 | 2,530 | 2,534 |
| | | | දෙහිඕවිට | 176 | 685 | 861 |
| | | | දැරණියගල | 374 | 214 | 588 |
| | | | ගලිගමුව | 305 | 620 | 925 |
| | | | කෑගල්ල | 423 | - | 423 |
| | | | මාවනැල්ල | 347 | 693 | 1,040 |
| | | | රඹුක්කන | 351 | 1,198 | 1,549 |
| | | | රුවන්වැල්ල | 183 | 553 | 736 |
| | | | වරකාපොල | 428 | 724 | 1,152 |
| | | | යටියන්තොට | 199 | 384 | 583 |
| | | | බුලත්කොහුපිටිය | 112 | 156 | 268 |
| කෑගල්ල දිස්ත්‍රික්කයේ එකතුව | | | | 2,902 | 7,757 | 10,659 |
| | සබරගමුව | රත්නපුර | අයගම | 219 | 194 | 413 |
| | | | බලංගොඩ | 396 | 484 | 880 |
| | | | ඇහැලියගොඩ | 218 | 217 | 435 |
| | | | ඇලපාත | 244 | 480 | 724 |
| | | | ඇඹිලිපිටිය | 499 | 627 | 1,126 |
| | | | ගොඩකවෙල | 427 | 527 | 954 |
| | | | ඉඹුල්පේ | 301 | 48 | 349 |
| | | | කහවත්ත | 104 | 172 | 276 |
| | | | කලවාන | 168 | 225 | 393 |
| | | | කොලොන්න | 290 | 394 | 684 |
| | | | කුරුවිට | 220 | 399 | 619 |
| | | | නිවිතිගල | 202 | 149 | 351 |
| | | | ඕපනායක | 153 | 110 | 263 |
| | | | පැල්මඩුල්ල | 261 | 593 | 854 |
| | | | රත්නපුර | 245 | 376 | 621 |
| | | | වැලිගෙපොල | 211 | 369 | 580 |
| | | | කිරිඇල්ල | 104 | 400 | 504 |
| රත්නපුර දිස්ත්‍රික්කයේ එකතුව | | | | 4,262 | 5,764 | 10,026 |
| සබරගමුව පළාතේ එකතුව | | | | 7,164 | 13,521 | 20,685 |

### වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 4 | මධ්‍යම | මාතලේ | අඹන්ගඟ කෝරළය | 193 | 370 | 563 |
| | | | දඹුල්ල | 189 | 553 | 742 |
| | | | ගලේවෙල | 411 | 532 | 943 |
| | | | ලග්ගල - පල්ලේගම | 88 | 420 | 508 |
| | | | මාතලේ | 342 | 575 | 917 |
| | | | නාඋල | 251 | 1,166 | 1,417 |
| | | | පල්ලෙපොල | 168 | 720 | 888 |
| | | | රත්තොට | 317 | 1,450 | 1,767 |
| | | | උකුවෙල | 345 | 689 | 1,034 |
| | | | විල්ගමුව | 118 | 259 | 377 |
| | | | යටවත්ත | 174 | 175 | 349 |
| මාතලේ දිස්ත්‍රිකයේ එකතුව | | | | 2,596 | 6,909 | 9,505 |
| | මධ්‍යම | මහනුවර | අකුරණ | 283 | 391 | 674 |
| | | | ගඟ ඉහළ කෝරළේ | 376 | 425 | 801 |
| | | | හාරිස්පත්තුව | 456 | 894 | 1,350 |
| | | | මහනුවර - කඩවත්සතර | - | - | - |
| | | | කුණ්ඩසාලෙ | 537 | 948 | 1,485 |
| | | | මැදදුම්බර | 270 | 739 | 1,009 |
| | | | මිණිපේ | 151 | 248 | 399 |
| | | | පතවිල | 68 | 167 | 235 |
| | | | පස්බාගෙ කෝරළය - ත | 223 | 326 | 549 |
| | | | පාතදුම්බර | 420 | 618 | 1,038 |
| | | | පාතහේවාහැට | 439 | 659 | 1,098 |
| | | | පූජාපිටිය | 341 | 412 | 753 |
| | | | තුම්පනේ | - | - | - |
| | | | උඩුදුම්බර | 269 | 469 | 738 |
| | | | උඩපලාත | 301 | 240 | 541 |
| | | | උඩුනුවර | 368 | 969 | 1,337 |
| | | | වැලිගල්ල | - | - | - |
| | | | යටිනුවර | 364 | 1,000 | 1,364 |
| | | | දොළුව / ගම්පොල | 181 | 546 | 727 |
| | | | දෙල්තොට | 111 | 474 | 585 |
| | | | හතරලියැද්ද | 226 | 487 | 713 |
| | | | ගලගෙදර | 173 | 450 | 623 |
| | | | ගඟ වට කොරළේ | 242 | 34 | 276 |
| මහනුවර දිස්ත්‍රික්කයේ එකතුව | | | | 5,799 | 10,496 | 16,295 |

### වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | මධ්‍යම | නුවර එළිය | අඹගමුව කෝරළය | 380 | 247 | 627 |
| | | | හඟුරන්කෙත | 773 | 1,261 | 2,034 |
| | | | කොත්මලේ | 360 | 1,482 | 1,842 |
| | | | නුවර එළිය | 156 | 200 | 356 |
| | | | වලපනේ | 377 | 903 | 1,280 |
| මහනුවර දිස්ත්‍රික්කයේ එකතුව | | | | 2,046 | 4,093 | 6,139 |
| මධ්‍යම පළාතේ එකතුව | | | | 10,441 | 21,498 | 31,939 |

### වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 5 | දකුණ | හම්බන්තොට | අම්බලන්තොට | 163 | 320 | 483 |
| | | | අඟුණකොලපැලැස්ස | 140 | 273 | 413 |
| | | | බෙලිඅත්ත | 485 | 440 | 925 |
| | | | හම්බන්තොට | 156 | 172 | 328 |
| | | | කටුවන | 295 | 284 | 579 |
| | | | ලුණුගම්වෙහෙර | 48 | 94 | 142 |
| | | | ඕකේවෙල | 120 | 271 | 391 |
| | | | සූරියවැව | 56 | 137 | 193 |
| | | | තංගල්ල | 319 | 445 | 764 |
| | | | තිස්සමහාරාමය | 208 | 318 | 526 |
| | | | වීරකැටිය | 256 | 274 | 530 |
| | | | වලස්මුල්ල | 109 | 301 | 410 |
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ එකතුව | | | | 2,355 | 3,329 | 5,684 |
| | දකුණ | මාතර | මාතර | 278 | 304 | 582 |
| | | | දෙව්නුවර | 410 | 422 | 832 |
| | | | දික්වැල්ල | 304 | 363 | 667 |
| | | | හක්මන | 275 | 175 | 450 |
| | | | කඹුරුපිටිය | 204 | 379 | 583 |
| | | | කොටපොල | 60 | 164 | 224 |
| | | | මාලිම්බඩ | 81 | 272 | 353 |
| | | | මාතර | 528 | 877 | 1,405 |
| | | | මුලටියන | 125 | 122 | 247 |
| | | | පස්ගොඩ | 113 | 210 | 323 |
| | | | පිටබැද්දර | 59 | 289 | 348 |
| | | | තිහගොඩ | 260 | 554 | 814 |
| | | | වැලිගම | 316 | 626 | 942 |
| | | | වැලිපිටිය | 186 | 210 | 396 |
| | | | අතුරලිය | 94 | 329 | 423 |
| | | | කිරින්ද - පුහුල්වැල්ල | 168 | 210 | 378 |
| මාතර දිස්ත්‍රික්කයේ එකතුව | | | | 3,461 | 5,506 | 8,967 |

### වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | දකුණ | ගාල්ල | අක්මීමණ | 221 | 510 | 731 |
| | | | අම්බලන්ගොඩ | 263 | 880 | 1,143 |
| | | | බද්දේගම | 190 | 619 | 809 |
| | | | බලපිටිය | 328 | 607 | 935 |
| | | | බෙන්තොට | 207 | 351 | 558 |
| | | | බෝපේ පොද්දල | 193 | 435 | 628 |
| | | | ඇල්පිටිය | 198 | 675 | 873 |
| | | | ගාල්ල කඩවත්සතර | 206 | 76 | 282 |
| | | | හබරාදුව | 271 | 675 | 946 |
| | | | හික්කඩුව | 428 | 1,213 | 1,641 |
| | | | කරන්දෙණිය | 45 | 520 | 565 |
| | | | නාගොඩ | 192 | 252 | 444 |
| | | | නෙළුව | 20 | 78 | 98 |
| | | | නියාගම | 148 | 172 | 320 |
| | | | තවලම | 80 | 84 | 164 |
| | | | යක්කලමුල්ල | 104 | 225 | 329 |
| | | | ඉමදූව | 198 | 438 | 636 |
| | | | වැලිවිටිය දිවිතුර | 109 | 361 | 470 |
| | | | ගෝනපිනුවල | 121 | 252 | 373 |
| ගාල්ල දිස්ත්‍රිකයේ එකතුව | | | | 3,522 | 8,423 | 11,945 |
| දකුණු පළාතේ එකතුව | | | | 9,338 | 17,258 | 26,596 |

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 6 | බස්නාහිර | කළුතර | අගලවත්ත | 187 | 323 | 510 |
| | | | බණ්ඩාරගම | 387 | 1,051 | 1,438 |
| | | | බේරුවල | 439 | 676 | 1,115 |
| | | | බුලත්සිංහල | 240 | 650 | 890 |
| | | | දොඩන්ගොඩ | 257 | 685 | 942 |
| | | | හොරණ | 146 | 1,137 | 1,283 |
| | | | කළුතර | 439 | 1,625 | 2,064 |
| | | | මදුරාවල | 165 | 349 | 514 |
| | | | මතුගම | 360 | 668 | 1,028 |
| | | | පානදුර | 515 | 1,414 | 1,929 |
| | | | වලල්ලාවිට | 103 | 376 | 479 |
| | | | මිල්ලනිය | 299 | 792 | 1,091 |
| | | | බදුරලිය - පාලින්ද නුවර | 170 | 269 | 439 |
| | | | ඉංගිරිය | 166 | 484 | 650 |
| **කළුතර දිස්ත්‍රික්කයේ එකතුව** | | | | **3,873** | **10,499** | **14,372** |
| | බස්නාහිර | කොළඹ | දෙහිවල | 166 | - | 166 |
| | | | කොළඹ | 300 | - | 300 |
| | | | හංවැල්ල - සීතාවක | 293 | 690 | 983 |
| | | | හෝමාගම | 390 | 673 | 1,063 |
| | | | කඩුවෙල | - | 140 | 140 |
| | | | කැස්බෑව | 245 | 650 | 895 |
| | | | කොලොන්නාව | 304 | 344 | 648 |
| | | | මහරගම | 297 | 347 | 644 |
| | | | මොරටුව | 174 | 791 | 965 |
| | | | කෝට්ටේ | 194 | 249 | 443 |
| | | | තිඹිරිගස්යාය | 318 | - | 318 |
| | | | පාදුක්ක | 321 | 667 | 988 |
| | | | රත්මලාන | 71 | 283 | 354 |
| **කොළඹ දිස්ත්‍රික්කයේ එකතුව** | | | | **3,073** | **4,834** | **7,907** |

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | බස්නාහිර | ගම්පහ | අත්තනගල්ල | 416 | 1,570 | 1,986 |
| | | | කටාන | 551 | 1,384 | 1,935 |
| | | | බියගම | 551 | 1,193 | 1,744 |
| | | | දිවුලපිටිය | 831 | 1,675 | 2,506 |
| | | | දෙම්පෙ | 555 | 883 | 1,438 |
| | | | ගම්පහ | 588 | 1,108 | 1,696 |
| | | | ජා ඇල | 429 | 295 | 724 |
| | | | (කැලණිය) | 360 | 572 | 932 |
| | | | මහර - | 600 | 1,030 | 1,630 |
| | | | මීරිගම | 441 | 1,777 | 2,218 |
| | | | මිනුවන්ගොඩ | 483 | 1,953 | 2,436 |
| | | | මීගමුව | 578 | 1,425 | 2,003 |
| | | | වත්තල | 112 | 526 | 638 |
| **ගම්පහ දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 6,495 | 15,391 | 21,886 |
| **බස්නාහිර පළාතේ එකතුව** | | | | 13,441 | 30,724 | 44,165 |

## වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 7 | උතුරු මැද | අනුරාධපුර | ගල්නෑව | 25 | 476 | 501 |
| | | | ගලෙන්බිඳුණුවැව | 91 | 470 | 561 |
| | | | තලාව | 50 | 295 | 345 |
| | | | තිරප්පනේ | 94 | 737 | 831 |
| | | | තඹුත්තේගම | 18 | 300 | 318 |
| | | | ඉපලෝගම | 79 | 350 | 429 |
| | | | නොච්චියාගම | 77 | 324 | 401 |
| | | | හොරොව්පතාන | 13 | 380 | 393 |
| | | | නාච්චාදූව | 36 | 250 | 286 |
| | | | නැගෙනහිර නුවරගම් ප | 88 | 302 | 390 |
| | | | කැබිතිගොල්ලෑව | 99 | 413 | 512 |
| | | | කැකිරාව | 100 | 764 | 864 |
| | | | කහටගස්දිගිලිය | 131 | 930 | 1,061 |
| | | | පලාගල | 55 | 559 | 614 |
| | | | පලුගස්වැව | 52 | 145 | 197 |
| | | | පදවිය | 21 | 226 | 247 |
| | | | මිහින්තලේ | 95 | 429 | 524 |
| | | | රාජාංගනය | 22 | 105 | 127 |
| | | | රඹෑව | 118 | 559 | 677 |
| | | | මැදවච්චිය | 124 | 506 | 630 |
| | | | මධ්‍යම නුවරගම් පළාත | 206 | 693 | 899 |
| | | | මහවිලච්චිය | 41 | 214 | 255 |
| | | | වැලිඔය | 11 | - | 11 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කයේ එකතුව** | | | | **1,646** | **9,427** | **11,073** |
| | උතුරු මැද | පොලොන්නරුව | මැදිරිගිරිය | 82 | 82 | 164 |
| | | | දිඹුලාගල | 18 | 196 | 214 |
| | | | හිඟුරක්ගොඩ | 80 | 218 | 298 |
| | | | තමන්කඩුව | 94 | 135 | 229 |
| | | | ලංකාපුර | 103 | 117 | 220 |
| | | | වැලිකන්ද | 54 | 40 | 94 |
| | | | ඇළහැර | 28 | 170 | 198 |
| **පොලොන්නරුව දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 459 | 958 | 1,417 |
| **උතුරු මැද පළාතේ එකතුව** | | | | 2,105 | 10,385 | 12,490 |

## වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 8 | නැගෙනහිර | මඩකලපුව | එරාවූර් නගරය | 132 | 531 | 663 |
| | | | එරාවූර් පත්තු | 319 | 617 | 936 |
| | | | කාත්තන්කුඩි | 225 | 342 | 567 |
| | | | කොරළේපත්තු | 87 | 224 | 311 |
| | | | කොරළේපත්තු උතුර | 19 | 292 | 311 |
| | | | කොරළේපත්තු දකුණ | 94 | 395 | 489 |
| | | | කොරළේපත්තු බටහිර | 148 | 284 | 432 |
| | | | කොරළේපත්තු මධ්‍යම | 112 | 193 | 305 |
| | | | මන්මුනෙයිපත්තු | 201 | 372 | 573 |
| | | | මන්මුනෙයිපත්තු උතුර | 350 | 512 | 862 |
| | | | මන්මුනෙයිපත්තු දකුණ හා එරාවූර්පත්තු | - | - | - |
| | | | මන්මුනෙයිපත්තු තිරිත | 172 | 540 | 712 |
| | | | මන්මුනෙයිපත්තු බටහිර | 79 | 310 | 389 |
| | | | කලවන්කුඩි | 284 | 985 | 1,269 |
| | | | පෝරතිව්පත්තු | 248 | 796 | 1,044 |
| **මඩකලපුව දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 2,470 | 6,393 | 8,863 |
| | නැගෙනහිර | අම්පාර | අඩ්ඩාලචේනයි | 293 | 471 | 764 |
| | | | අලියාඩිවෙම්බු | 124 | 337 | 461 |
| | | | අම්පාර | 85 | 150 | 235 |
| | | | දමන | 72 | 140 | 212 |
| | | | දෙහිඅත්තකණ්ඩිය | 13 | 62 | 75 |
| | | | ඉරක්කාරමම් | 98 | 105 | 203 |
| | | | කල්මුනේ | 314 | 570 | 884 |
| | | | කල්මුනේ - දෙමළ | 174 | 120 | 294 |
| | | | කාරතිවු | 140 | 203 | 343 |
| | | | අක්කාරෙයිපත්තු | 279 | 364 | 643 |
| | | | ලාහුගල | 55 | 150 | 205 |
| | | | මහඔය | 114 | 170 | 284 |
| | | | නාවිදන්වාලි | 114 | 315 | 429 |

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | නැගෙනහිර | අම්පාර | නාමල් ඔය | - | - | - |
| | | | සයින්දමරතු | 282 | 380 | 662 |
| | | | නින්දවූර් | 202 | 404 | 606 |
| | | | පදියතලාව | 77 | 144 | 221 |
| | | | පොතුවිල් | 185 | 282 | 467 |
| | | | සමන්තුරෙයි | 412 | 567 | 979 |
| | | | තිරුකිකොවිල් | 78 | 211 | 289 |
| | | | උහන | 59 | 64 | 123 |
| **අම්පාර දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 3,170 | 5,209 | 8,379 |
| | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ගෝමරන්කඩවල | 55 | 70 | 125 |
| | | | කන්තලේ | 107 | 153 | 260 |
| | | | කින්නියා | 220 | 671 | 891 |
| | | | කුච්චවේලි | 61 | 930 | 991 |
| | | | මොරවැව | 27 | 5 | 32 |
| | | | මූත්තූර් | 350 | 604 | 954 |
| | | | පදවි ශ්‍රී පුර | 18 | 160 | 178 |
| | | | සේරුවාවිල | 47 | 147 | 194 |
| | | | තඹලගමුව | 108 | 245 | 353 |
| | | | ත්‍රිකුණාමලය කඩවත්සත | 361 | 134 | 495 |
| | | | වෙරුගල් | 38 | 143 | 181 |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 1,392 | 3,262 | 4,654 |
| **නැගෙනහිර පළාතේ එකතුව** | | | | 7,032 | 14,864 | 21,896 |

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| 9 | උතුරු | යාපනය | වාටකච්චේරි | 476 | 1,050 | 1,526 |
| | | | වාතකකානෙයි | 164 | 870 | 1,034 |
| | | | ඩෙලෆ් | 21 | 120 | 141 |
| | | | කරෙයිනගර් | 188 | 227 | 415 |
| | | | කරවෙඩ්ඩි | 314 | 983 | 1,297 |
| | | | පේදුරුතුඩුව | 197 | 627 | 824 |
| | | | සන්දිලිප්පායි | 311 | 1,115 | 1,426 |
| | | | යාපනය | 137 | 331 | 468 |
| | | | කයිට්ස් | 57 | 530 | 587 |
| | | | නල්ලූර් | 277 | 858 | 1,135 |
| | | | තෙලෙප්පාලෙයි | 68 | 785 | 853 |
| | | | වඩුවිල් | 495 | 1,216 | 1,711 |
| | | | වඩමාරච්චි නැගෙනහිර | 157 | 1,484 | 1,641 |
| | | | වෙලානෙයි | 54 | 382 | 436 |
| | | | වගිකාමම් නැගෙනහිර | 361 | 350 | 711 |
| **යාපනය දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 3,277 | 10,928 | 14,205 |
| | උතුරු | වවුනියාව | වවුනියා | 105 | 754 | 859 |
| | | | වවුනියා උතුරු - නෙදුක | 55 | 116 | 171 |
| | | | වව්නියා දකුණ | 102 | 773 | 875 |
| | | | වෙන්ගල චෙඩ්ඩිකුලම් | 53 | 458 | 511 |
| **වවුනියාව දිස්ත්‍රික්කයේ එකතුව** | | | | 315 | 2,101 | 2,416 |
| | උතුරු | කිලිනොච්චි | කන්ඩාවලයි | - | 1,222 | 1,222 |
| | | | කරච්චි | - | 1,298 | 1,298 |
| | | | පච්චිලයිප්පල්ලි | - | 200 | 200 |
| | | | පූනකරි | - | 402 | 402 |
| **කිලිනොච්චි දිස්ත්‍රික්කයේ එකතුව** | | | | - | 3,122 | 3,122 |

වයස අවුරුදු 70 ට වැඩි සමෘද්ධි හා මහජනාධාර ලාභීන්

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි ලාභීන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර ලබන වැඩිහිටියන් ගණන | වයස අවුරුදු 70 ට වැඩි මහජනාධාර හා සමෘද්ධි ලබන වැඩිහිටියන් ගණන |
|---|---|---|---|---|---|---|
| | උතුරු | මන්නාරම | මඩු | - | 243 | 243 |
| | | | මන්නාරම | - | 182 | 182 |
| | | | මාන්තායි බටහිර | - | 216 | 216 |
| | | | මූසලි | - | 93 | 93 |
| | | | නානාට්ටාන් | - | 571 | 571 |
| **මන්නාරම දිස්ත්‍රික්කයේ එකතුව** | | | | **-** | **1,305** | **1,305** |
| | උතුරු | මුලතිව් | මන්තායි නැගෙනහිර | - | 202 | 202 |
| | | | මුහුදුබඩ පත්තුව | - | 436 | 436 |
| | | | ඔඩ්ඩුසුඩ්ඩාන් | - | 253 | 253 |
| | | | වැලිඔය | - | 46 | 46 |
| | | | පුදුකුඩුරිප්පු | - | 359 | 359 |
| | | | තුනුක්කායි | - | 177 | 177 |
| **මුලතිව් දිස්ත්‍රික්කයේ එකතුව** | | | | - | 1,473 | 1,473 |
| **උතුරු පළාතේ එකතුව** | | | | 3,592 | 18,929 | 22,521 |
| **මුළු එකතුව** | | | | 65,725 | 164,167 | 229,892 |

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.55ට, 2012 ජුලි මස 19 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 6.55 மணிக்கு பாராளுமன்றம், 2012 யூலை19, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.55 p.m. until 1.00 p.m. on Thursday, 19th July, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.